319 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 319 - இல. 15
Volume 319 - No. 15

2025 ජුනි 18 වන බදාදා
2025 யூன் 18, புதன்கிழமை
Wednesday, 18th June, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත්:
ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 2509]

"නිර්බාධිත සමාජ ජීවිතයක් උදෙසා" මැයෙන් වන සංවේදීකරණ වැඩසටහන [තීරුව 2509]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 2511]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2512-2550]

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත:
නියම [තීරු 2555-2630]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலங்கள்:
உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 2509]

"தடையற்ற சமூக வாழ்வு ஒன்றை நோக்கி" எனும் தொனிப்பொருளிலான உணர்வூட்டல் நிகழ்ச் சித்திட்டம் [ப: 2509]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 2511]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2512-2550]

வெளிநாட்டு தீர்ப்புகளைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவு செய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டம்:
கட்டளைகள் [ப: 2555-2630]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Budgetary Relief Allowance of Workers (Amendment) Bills:
Petitions to the Supreme Court [Col. 2509]

Sensitization Programme Themed “For an Unhindered Social Life” [Col. 2509]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 2511]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2512-2550]

RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS ACT:
Orders [Cols. 2555-2630]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ජුනි 18 වන බදාදා
2025 யூன் 18, புதன்கிழமை
Wednesday, 18th June, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත්: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலங்கள்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILLS: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 ජුනි 17 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් දෙකට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, එල්.ඩී.- ඕ 19/2025 දරන "සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සහ එල්.ඩී.- ඕ 20/2025 දරන "සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් දෙකක පිටපත් 2025 ජුනි 17 දින, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

"නිර්බාධිත සමාජ ජීවිතයක් උදෙසා" මැයෙන් වන සංවේදීකරණ වැඩසටහන
"தடையற்ற சமூக வாழ்வு ஒன்றை நோக்கி" எனும் தொனிப்பொருளிலான உணர்வூட்டல் நிகழ்ச்சித்திட்டம்
SENSITIZATION PROGRAMME THEMED "FOR AN UNHINDERED SOCIAL LIFE" :

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දසවැනි පාර්ලිමේන්තුවේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය විසින් "නිර්බාධිත සමාජ ජීවිතයක් උදෙසා" යන මැයෙන් සංවිධානය කර ඇති සංවේදීකරණ වැඩසටහනක් 2025 ජුනි 18 වැනි බදාදා, එනම් අද දින පෙර වරු 11.00 සිට පස් වරු 12.30 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 03හිදී පැවැත්වීමට නියමිතය. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මෙම වැඩසටහනට සහභාගි වීමට හැකි බව දැනුම් දෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුවේ) වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 28 දිනැති අංක 2429/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, අපරැක්ක, බද්දේගම්මැද්ද, 'හංසිප්‍රභා' යන ලිපිනයෙහි පදිංචි අනිල් හේවා බන්දුල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, නිශ්ශංකමල්ලපුර, රන්කොත් වෙහෙර මාවත, අංක 19/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්. සුනිල් අධිකාරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, ලේනව, හිරියාල, පිටපහමුණ, අංක 114 දරන ස්ථානයෙහි පදිංචි ඊ.පී. චන්ද්‍රසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, තඹලගමුව, ලක්විජයගම, 13 කණුව යන ලිපිනයෙහි පදිංචි එච්.පී. ආනන්ද ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -515/2025- (2), ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

"ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ ව්‍යාපෘති: මධ්‍යම පළාත
"அருகிலுள்ள பாடசாலை - சிறந்த பாடசாலை" நிகழ்ச்சித்திட்டத்தின் கீழான கருத்திட்டங்கள்: மத்திய மாகாணம்
PROJECTS UNDER "THE NEAREST SCHOOL - THE BEST SCHOOL" PROGRAMME: CENTRAL PROVINCE

613/2025

2. ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ළඟම පාසල-හොඳම පාසල ව්‍යාපෘතිය' යටතේ මධ්‍යම පළාතේ රජයේ පාසල්වල ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වන විට වැඩ අවසන් කර ඇති සහ වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) "அருகிலுள்ள பாடசாலை - சிறந்த பாடசாலை" கருத்திட்டத்தின்கீழ், மத்திய மாகாணத்திலுள்ள அரச பாடசாலைகளில் ஆரம்பிக்கப்பட்ட கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்களில் தற்போது பணிகள் நிறைவு செய்யப்பட்டுள்ள மற்றும் நிறைவு செய்யப்படாத கருத்திட்டங்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) பணிகள் நிறைவு செய்யப்படாத கருத்திட்டங் களை விரைவில் நிறைவு செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of projects that were launched in government schools in the Central Province under the project named "The Nearest School - the Best School";

(ii) number of those, out of the aforesaid projects, that have been completed and have not been completed, separately; and

(iii) measures that will be taken to expeditiously complete the projects that have not been completed yet?

(b) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) "ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ රජයේ පාසල්වල ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 1,995කි.

(ii) එම ව්‍යාපෘති අතරින් මේ වන විට,

වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව - 1,962කි.

වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව- 33කි.

(iii) වැඩ අවසන් කර නොමැති පළාත් පාසල් 29 සඳහා 2025 වර්ෂයේ වැඩ අවසන් කිරීමට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත මහා භාණ්ඩාගාරයෙන් සෘජුවම රුපියල් මිලියන 1,000ක මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

එමෙන්ම, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදනය කර ඉතිරිව ඇති වැඩ 4ක් අවසන් කිරීම සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් මිලියන 36.58ක ප්‍රතිපාදන මේ වන විට වෙන් කර දී තිබේ.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද වෙනකොට අවිච්ඡේද වූ පාසල් ව්‍යාපෘති 33ක වැඩ සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 1,456ක් අවශ්‍ය වෙලා තිබෙනවා, ඔබතුමාගේ උත්තරය පරිදි. වසර ගණනාවක් තිස්සේ මේ ගොඩනැඟිලි අබලන් තත්ත්වයට පත්වෙලා තිබෙන හෙයින්, ඒ සඳහා කඩිනමින් මුදල් වෙන් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

අද වන විට මධ්‍යම පළාතේ පාසල් 400කට ආසන්න සංඛ්‍යාවක අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම "ළඟම පාසල - හොඳම පාසල" කියන ව්‍යාපෘතියට ගමේ පාසල් ඇතුළත් වුණා. කාලගුණික තත්ත්වය නිසා එම පාසල්වලින් රාශියක් අවදානම් තත්ත්වයක තිබෙනවා. ඒ අතර මධ්‍යම පළාතේ පාසල් 300කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. රජය මේ සම්බන්ධයෙන් ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය ඇසීම ගැන ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳව අපි විමසීමක් කළා. මේ වන විට එම පාසල් 33 සඳහාම අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ටෙන්ඩර් කටයුතු අවසන් කර තිබෙනවා. 2026 වෙනකොට අපට ඒ කටයුතු අවසන් කරන්න පුළුවන්කම තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමියගේ පළමු අතුරු ප්‍රශ්නයේ දෙවැනි කොටසට අදාළ පිළිතුර මෙයයි. අපි මේ වසරේ මූලික කරගත්ත ප්‍රධාන කාරණාව තමයි පාසල්වල ඉතිරිව ඇති ගොඩනැඟිලි සහ වෙනත් අත්‍යවශ්‍ය ගොඩනැඟිලි සම්පූර්ණ කර ගැනීම සඳහා මුදල් වෙන් කිරීම. ඒ සඳහා මධ්‍යම පළාතට මෙවර දෙගුණයක විතර මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. ඊට අදාළ ටෙන්ඩර් ක්‍රියාවලිය ගැන අපි විමසීමක් කළා. ටෙන්ඩර් ක්‍රියාවලියේ බොහොමයක් දේවල් අවසන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ කටයුතු ඉක්මනින් අවසන් කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

"ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතියේ අතුරු ව්‍යාපෘතියක් වශයෙන් මධ්‍යම පළාතේ ප්‍රාථමික පාසල්වල සුහුරු පන්ති කාමර 300ක් පමණ සංවර්ධනය කරන්නට පුළුවන් වුණා. සුහුරු පන්ති කාමර විශේෂයෙන්ම මේ ප්‍රාථමික පාසල්වලට අත්‍යවශ්‍ය දෙයක්.

[ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය]

රජය විසින් මේ ප්‍රාථමික පාසල්වල සුහුරු පන්ති කාමර වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා මෙන්න මේ වාගේ පිළිතුරක් තමයි අපේ ළඟ තිබෙන්නේ. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී ප්‍රාථමික පාසල් වෙනුවෙන් කරන මූලික කටයුත්තක් තමයි මුලින්ම පාසල හඳුනාගෙන අවශ්‍ය සම්පත් දියුණු කිරීම. කිලෝමීටර 3ක් ඇතුළත තිබෙන, ළඟා විය හැකි ප්‍රාථමික පාසලක් දියුණු කිරීම තමයි මූලික කාරණාව වෙන්නේ. ලබන අවුරුද්දේ සිට ඒක කරනවා, ව්‍යුහාත්මක වෙනස්කම් විධියට. එතැනදී විෂයානුබද්ධ අවශ්‍යතාව අනුව සුහුරු පන්ති කාමර අවශ්‍ය නම් අපි කථා කරලා තිබෙනවා, විෂයානුබද්ධ අවශ්‍යතාව අනුව ක්‍රමානුකූලව ඒ ඒ අදාළ පාසල්වලට අවශ්‍ය සුහුරු පන්ති කාමර ලබා දීම සඳහා. ඒ සම්බන්ධ ක්‍රියාවලිය සිද්ධ වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -633/2025- (1), ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නීතිපතිවරයා විසින් එම තොරතුරු තවම එවා නොමැති බැවින් එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පාලවිය සිට අරුවෙකාඩු දක්වා හුණුගල් ප්‍රවාහනය: දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම
பாலாவியிலிருந்து அறுவைக்காடு வரை சுண்ணாம்புக்கற்களை ஏற்றிச் செல்லல்: புகையிரதத் திணைக்களத்துடனான ஒப்பந்தம்
TRANSPORT OF LIMESTONE FROM PALAVIYA TO ARUWAIKADU: AGREEMENT WITH DEPARTMENT OF RAILWAYS

636/2025

4. **ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම, පාලවිය සිට අරුවෙකාඩු හුණුගල් කොරිය වෙත හුණුගල් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින්, මැදිරි සහ වෙනත් උපාංග බදු පදනම මත ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඉහත උපකරණ බදු පදනම මත ලබා ගන්නා ලද සමාගමේ නම කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම උපකරණ බදු පදනම මත ලබා දීමෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත බදු ගිවිසුම කාලීන අවශ්‍යතා මත සමාලෝචනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமானசேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம், பாலாவியிலிருந்து அறுவைக்காடு சுண்ணாம்புக்கல் ஆலைக்கு சுண்ணாம்புக் கற்களை ஏற்றிச் செல்வதற்கு இலங்கைப் புகையிரதத் திணைக்களத்தின் புகையிரத என்ஜின்கள், பெட்டிகள் மற்றும் துணை உறுப்புகள் குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்குறிப்பிட்ட உபகரணங்களைக் குத்தகை அடிப்படையில் பெற்றுக்கொண்ட நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(iii) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை மேற்படி உபகரணங்களைக் குத்தகை அடிப்படையில் வழங்கியதன் மூலம் இலங்கைப் புகையிரதத் திணைக்களம் ஈட்டிய வருமானம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி குத்தகை ஒப்பந்தத்தை சமகால தேவைப்பாடுகளின் அடிப்படையில் மீண்டும் மீளாய்வு செய்வதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) whether locomotives, coaches and other equipment belonging to Sri Lanka Railways have been leased out for transporting limestone from Palaviya in Puttalam to the Aruwaikadu Limestone Quarry;

(ii) if so, the name of the company to which above-mentioned equipment have been leased out;

(iii) the income that has been earned by Sri Lanka Railways by leasing out the said equipment from the year 2015 up to now, separately in respect of each year; and

(iv) whether action will be taken to review the above-mentioned lease agreement in relation to the current requirements?

(b) If not, why?

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පුත්තලම, පාලවිය සිට අරුවෙකාඩු හුණුගල් කොරිය වෙත හුණුගල් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින්, මැදිරි සහ වෙනත් උපාංග බදු පදනම මත ලබා දී නොමැත.

නමුත්, ප්‍රවාහනය කරන හුණුගල්වල බර මත පදනම්ව ගාස්තු අය කරමින් හුණුගල් ප්‍රවාහනය කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හා පුත්තලම සිමෙන්ති කොම්පැනි ලිමිටඩ් ආයතනය ගිවිසුම්ගතව ඇත. (පුත්තලම සිමෙන්ති කොම්පැනි ලිමිටඩ් 2002.01.25 දින සිට හොල්සිම් ලංකා ලිමිටඩ් ලෙසත්, 2016.09.15 දින සිට සියාම් සිටි සිමෙන්ට් ලංකා ලිමිටඩ් ලෙසත් වෙනස් වී ඇත.)

හුණුගල් ප්‍රවාහනය සඳහා දුම්රිය ඇණියක් එම ආයතනය සතු වන බැවින් දුම්රිය එන්ජින්, මැදිරි හෝ වෙනත් උපාංග බදු පදනමින් හුණුගල් ප්‍රවාහනය සඳහා ලබා දී නොමැත.

එමෙන්ම, එම ආයතනය විසින් අවශ්‍යතාව මත දෛනික කුලී පදනමින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වරින් වර දුම්රිය එන්ජින් ලබා ගැනීම සිදු කරනු ලබයි.

(ii) පැන නොනඟී.

(iii) හුණුගල් ප්‍රවාහනය සඳහා බදු පදනමින් දුම්රිය දෙපාර්තමේන්තුව ආදායම් උපදවා නොමැත.

(iv) පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. හුණුගල් නිධි අපේ රටේ තිබෙන ප්‍රධානම සම්පතක්. මේක විශාල සම්පතක්. අක්කර විශාල ප්‍රමාණයක් තිබෙනවා.

මම හිතන විධියට මේ, අවුරුදු 100කට, 150කට එහා ගන්න පුළුවන් සම්පතක්. හැබැයි, මේ සම්පතෙන් අපි හරි විධියට ප්‍රයෝජන ගන්නේ නැහැ කියන එක තීන්දු කරලා ඉවරයි. එක වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවා. මේකෙන් තව ඔය වාගේ සිමෙන්ති කම්හල් 2ක්, 3ක් දමන්න පුළුවන්. ලංකාවට ආයෙත් කොහෙන්වත් සිමෙන්ති ගන්න බැරි වෙන්නම අපට සිමෙන්ති හදන්න පුළුවන්. හැබැයි, මේක පළමුවෙන්ම දීලා තිබෙන හොල්සිම් ආයතනය වෙනස් වුණා. එහෙම වෙනස් වෙලා ඒ අයට නැවත බදු දුන්නේ කොයි ආකාරයෙන්ද? මේක ඒ ආයතනයෙන් බදු දුන්නාද, රජයෙන් වෙනම බදු දුන්නාද, නැත්නම් සංස්ථාවෙන් වෙනම බදු දුන්නාද? මේ සිද්ධ වෙලා තිබෙන ක්‍රමවේදය මොකක්ද? ඒ වාගේම, මේ හුණුගල් නිධිය දීලා තිබෙන ඒ ප්‍රමාණය, ඒකෙන් අය කරගන්නා රජයේ ගාස්තුව -විශේෂයෙන් හුණුගල් සඳහා රජයේ ගාස්තුව- ගැන ඔබතුමන්ලා සෑහීමට පත් වෙනවාද කියන එක තමයි මම පළමු අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ. මෙතැන පොඩ්ඩක් ගැළපිල්ලක් තිබෙනවා ප්‍රශ්න දෙකතුනක් එකට, ගරු ඇමතිතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නය තුළ තිබෙන්නේ ඇත්තටම රජයට අයත්ව තිබූ පුත්තලම සිමෙන්ති සංස්ථාව වෙනත් පෞද්ගලික සමාගමකට බදු දීම ගැනයි. මේක සෘජුවම මට අදාළ වෙන්නේ නැහැ. නමුත් ඔබතුමාත් දන්නවා, මට මතක හැටියට 1994දී හෝ 1995දී වාගේ තමයි මේ පුත්තලම සිමෙන්ති සංස්ථාව පෞද්ගලීකරණය කළේ. අපි දන්නා තරමින් එහි විශාල දූෂණ, වංචා සිද්ධ වුණා. ඒකට වෙන් වෙච්ච dedicated railtrack එකක් තිබෙනවා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ. ඒක තමයි, ඒ සිමෙන්ති සංස්ථාව එක් එක් companiesවලට යනකොට, -මේකත් ඒ සිමෙන්ති සංස්ථාවට අයත් දේපළක්- ඒගොල්ලන් දුම්රිය දෙපාර්තමේන්තුවට ඒවා බදු දීලා, දුම්රිය දෙපාර්තමේන්තුවෙන් සහන ලබාගන්න පුළුවන් විධියට කටයුතු කර තිබෙනවා. ඒ සම්බන්ධව අවශ්‍ය කරන ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඒ, 1999දී PCCL සමාගම Sri Lanka Railways සමඟ.

ඊට පසුව 2002දී, PCCL Group එක එවා තිබෙනවා, ඒගොල්ලන්ගේ නම වෙනස් වෙනවා කියලා හොල්සිම් ලංකා විධියට. ඒ නිසා, මම හිතන විධියට පෞද්ගලීකරණය කරපු එක අතින් අතට මාරු වෙද්දී, අනෙක් සේවාවනුත් ඔවුන්ට අනුයුක්ත වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේවායෙන් හොඳම ප්‍රයෝජනය ලංකාවට ගන්නේ නැද්ද කියලා ඔබතුමා අහපු ප්‍රශ්නයට කර්මාන්ත අමාත්‍යාංශයෙන් විමසා බලා පිළිතුරක් ලබා ගැනීම තමයි වඩාත් සුදුසු වන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අද මම ඇහුවේ සමස්ත ශ්‍රී ලංකාවටම - විශේෂයෙන්ම වර්තමානයේ රට පත් වෙලා තිබෙන තත්ත්වයෙන් රට ගොඩගන්න පුළුවන් - වාසිසහගත වන වැඩසටහනකට අදාළ වූ ප්‍රශ්නයක්. හුණුගල් කියන්නේ විශාල සම්පතක්. මෙතෙක් පැවති රජයන් මේ පිළිබඳව හරියාකාරව සොයා බැලීමක් සිද්ධ කළාද කියන එක ගැනත් අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. සමහර විට ඔබතුමාට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි වෙයි. හැබැයි, මේක ඉතාම වටිනා දෙයක් නිසා අපි ඉදිරියේදී මේ ගැන දිගින් දිගටම ප්‍රශ්න කරන්න බලාපොරොත්තු වෙනවා. මා ඉදිරිපත් කළ ප්‍රශ්නයෙන් අසා ඇති පරිදි එම බදු දීම්, බදු දීම සම්බන්ධයෙන් වන ගණනය කිරීම් සහ හුණුගල් කොරියේ වටිනාකම හරියට ගණනය කර නැහැ. මොකද, විදේශ රටකින් තමයි මේ ආයෝජනය සිදු කරලා මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඒ අය අපේ රටේ - දේශීය - සම්පත් යොදාගෙන නිෂ්පාදන සිදු කර, ලංකාවටම බඩු ටික විකුණලා ලාභය ඒ රටට ගෙනියනවා, ඩොලර්වලින්. ඒ කියන්නේ අපේම සම්පත් අරගෙන මේ රටේම නිෂ්පාදන කටයුතු සිදු කරලා ඒකෙන් හොයන ඩොලර් ටික තමයි ඒගොල්ලන් ලාභය හැටියට ඒගොල්ලන්ගේ රටට යවන්නේ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඒ නිසා මේකට වෙනම, විධිමත් වැඩසහනක් හදන්න ඕනෑ. මම ප්‍රශ්නයක් සහ යෝජනාවක් විධියට මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සිමෙන්ති සංස්ථාව සහ හුණුගල් කොරිය යනාදී මේ සියලු දේ සම්බන්ධව සමාලෝචනයක් කරලා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න සූදානම් ද? දිස්ත්‍රික්කයක් හැටියටත්, රටක් හැටියටත් එකට වාඩි වෙලා මේකට අවශ්‍ය කරන ශක්තිය හා සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. මේක හදන වැඩ පිළිවෙළ සම්බන්ධ සාකච්ඡාවක් ඉදිරි කාලය තුළ පැවැත්වෙනවා ද කියලා අපි දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කර්මාන්ත ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නයේ, "බදු පදනම" කියන වචනය දාලා තිබෙනවා. හැබැයි, බදු පදනමින් දීපු දෙයක් නැහැ. ඔබතුමා බලාපොරොත්තු වෙන උත්තරය අපිට තේරෙනවා. මට ඕනෑ නම් මේක "අදාළ නොවේ" කියලා කියන්න පුළුවන්. නමුත්, ඔබතුමා පාර්ලිමේන්තුවේ යම් කිසි විනයක් ඇතිව හැසිරෙන මන්ත්‍රීවරයකු කියන ගරුත්වය නිසා ඔබතුමාට අදාළ නොවුණත්, ඔබතුමා හිතලා තිබෙනවා කියන උත්තරය දෙන්න මම හිතුවා.

ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අනුව බදු පදනමෙන් දුම්රිය දෙපාර්තමේන්තුව මොනවාවත් කරලා නැහැ. නමුත්, දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඒ සේවාවන් එම company එක විසින් විවිධ අවස්ථාවලදී හයර් කරනවා. ඒ, බදු පදනම මත නොවෙයි. ඒ අනුව හුණුගල් ප්‍රවාහනය කිරීමේදී දුම්රිය දෙපාර්තමේන්තුවේ වැගන් යොදා ගන්නවා, එන්ජින් ගන්නවා. එහෙම ගන්නේ දෛනිකව තිබෙන market ratesවලට. එහෙම අරගෙන ලබපු ආදායම මම ගරු මන්ත්‍රීතුමාට කියන්නම්. මේවා තවත් අලුත් කරන්න ඕනෑ. අපිට ඒකත් බලන්න පුළුවන්. 2015දී රුපියල් 54,800,000ක ආදායමක් ලබා තිබෙනවා. 2016දී 31,000,000ක ආදායමක් ලබා තිබෙනවා. 2017දී රුපියල් 18,600,000ක ආදායමක් ලබා තිබෙනවා. 2019දී රුපියල් 10,095,000ක ආදායමක් ලබා තිබෙනවා. 2020දී රුපියල් 7,300,000ක ආදායමක් ලබා තිබෙනවා.

2022දී සියල්ලේ එකතුව ගත්තොත්, රුපියල් කෝටි 8ක් විතර වනවා. ඒ අනුව විවිධ සේවාවන් market rate එකට ලබා දීම මඟින් රුපියල් 273,409,766ක ආදායමක් 2015 සිට 2022 දක්වා දුම්රිය දෙපාර්තමේන්තුව ලබාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා අහන්නේ ඒක කියලායි මම හිතුවේ. ගරු කථානායකතුමනි, මට පැහැදිලි කරන්න තිබෙන්නේ එච්චරයි. ගරු මන්ත්‍රීතුමාට පුළුවන් ඔබතුමාගේත් පුළුල් යෝජනා සම්බන්ධයෙන් ගරු කර්මාන්ත ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න.

කුකුළේ ගඟ විදුලි බලාගාරයේ ප්‍රවේශ මාර්ගය: නඩත්තු කිරීම
குக்குலே கங்கை மின் உற்பத்தி நிலைய நுழைவுப் பாதை: பராமரிப்பு
ACCESS ROAD TO KUKULE-GANGA POWER STATION: MAINTENANCE

715/2025

5. ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුකුළේ ගඟ විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ආරම්භ කරන ලද කාලවකවානුව කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම විදුලි බලාගාරයේ ප්‍රවේශ මාර්ගය සම්බන්ධයෙන් දැනුවත් වී තිබේද;

(ii) එම ප්‍රවේශ මාර්ගයේ ආරම්භක ස්ථානය සහ අවසාන ස්ථානය කවරේද;

(iii) ඉහත ප්‍රවේශ මාර්ගයේ මාර්ග අංක 437 දරන බස් රථය ධාවනය වන අතර එම මාර්ගය පොදු ප්‍රවාහන මාර්ගයක් බවට පත් වී ඇති බව දන්නේද;

(iv) එම මාර්ගයේ කුකුළේ ගඟ විදුලි බලාගාරයට අයත් වන කොටසේ දුර කොපමණද;

(v) නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් එම මාර්ග කොටසේ අර්ධයකට ආසන්න ප්‍රමාණයක් අනාරක්ෂිතභාවයට පත් වී ඇති බව දන්නේද;

(vi) එම මාර්ග කොටස නිසි පරිදි නඩත්තු කිරීම සඳහා පියවර ගන්නේද;

(vii) නොඑසේ නම්, එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குக்குலே கங்கை மின் உற்பத்தி நிலைய நிர்மாணிப்புக் கருத்திட்டத்திற்கான காணிகளைக் கையகப்படுத்தும் நடவடிக்கை ஆரம்பிக்கப்பட்ட காலப்பகுதி யாது என்பதையும்;

(ii) அந்தக் கருத்திட்டத்திற்காகக் கையகப்படுத் தப்பட்ட காணியின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் நுழைவுப் பாதை குறித்து அறிவாரா என்பதையும்;

(ii) அந்த நுழைவுப் பாதையின் ஆரம்ப மற்றும் முடிவிடம் யாது என்பதையும்;

(iii) மேற்படி நுழைவுப் பாதையில் வீதி இலக்கம் 437இற்கான பேருந்து சேவையில் உள்ளதுடன், அந்தப் பாதையானது பொதுப் போக்குவரத்துப் பாதையாக மாறியுள்ளதை அறிவாரா என்பதையும்;

(iv) அந்தப் பாதையில் குக்குலே கங்கை மின் உற்பத்தி நிலையத்திற்குச் சொந்தமான பகுதியின் தூரம் யாது என்பதையும்;

(v) முறையாகப் பராமரிக்காததன் காரணமாக, அண்ணளவாக அந்த வீதிப் பகுதியின் சரிபாதியான பகுதி பாதுகாப்பற்றதாக மாறியுள்ளதை அறிவாரா என்பதையும்;

(vi) குறித்த வீதிப் பகுதியை முறையாகப் பராமரிப் பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(vii) இன்றேல், அந்தப் பாதை, வீதி அபிவிருத்தி அதிகாரசபையிடம் ஒப்படைக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) time period when acquiring lands for the Kukuleganga Power Station Construction Project was commenced; and

(ii) extent of land that was acquired for the project concerned?

(b) Will he also inform this House -

(i) whether he is aware of the access road to the power station concerned;

(ii) the points at which the access road concerned starts and ends;

(iii) whether he is aware that the bus bearing route number 437 plies along the access road and the road itself has transformed into a public transport road;

(iv) the length of the part of that road belonging to the Kukuleganga Power Station;

(v) whether he is aware that due to lack of proper maintenance, nearly half of the part concerned of that road is in an unsafe condition;

(vi) whether steps will be taken to maintain that part of the road properly; and

(vii) if not, whether the road concerned will be vested in the Road Development Authority?

(c) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1995 ජනවාරි මස.

(ii) ආසන්න වශයෙන් හෙක්ටෙයාර 340ක්.

(ආ) (i) ඔව්.

(ii) ආරම්භක ස්ථානය, මෝල්කාව අලුත් හන්දිය. අවසාන ස්ථානය, මතුගම-කලවාන මාර්ගයෙහි ව්‍යාපෘති හන්දිය.

(iii) ඔව්.

(iv) කිලෝමීටර 1.25ක් පමණ.

(v) ඔව්. මෙම පොදු මාර්ගයෙහි බස්නාහිර පළාතට අයිති කොටසක් පමණක් එවකට පැවති රජය විසින් ක්‍රියාත්මක කළ කිලෝමීටර ලක්ෂයේ වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාපට් අතුරා මනා ලෙස සංවර්ධනය කරන ලදී. නමුත්, මෙම මාර්ගය දෙපස එළිපෙහෙළි කිරීම කිසිදු ආයතනයක් මඟින් මෙතෙක් සිදු නොකිරීම නිසා අනාරක්ෂිතව පවතී.

(vi) අදාළ මාර්ග කොටස නඩත්තු කිරීමේ හැකියාවක් කුකුළේ ගඟ විදුලි බලාගාරය සතුව නොමැත.

(vii) මෙම පොදු මාර්ගය අදාළ අංශ සඳහා පවරා දීමට මහත් පරිශ්‍රමයක් දැරුවද, මේ වනතෙක් මෙම පොදු මාර්ගය පවරා ගැනීම සම්බන්ධයෙන් අදාළ බලධාරීන් විසින් කිසිදු ඉදිරි පියවරක් ගෙන නොමැත. මේ සම්බන්ධව 2005.07.29වන දින සිට 17 වතාවක් ගන්නා ලද උත්සාහයන්වල විස්තර ඇතුළත් සාරාංශයක් ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, මේ නිශ්චිත ප්‍රශ්නය මේ ආකාරයෙන්ම යොමු කරන්නට හේතුව වුණේ, මේ මාර්ගය පිළිබඳව තිබෙන ගැටලුවයි. ගරු ඇමතිතුමනි, මේ හේතුව නිසාම මෙම මාර්ගය භාවිත කරන්නන් දැඩි අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. අගලවත්ත ආසනයේ කෙළවර සහ බුලත්සිංහල ආසනයේ කෙළවර තමයි මේ මාර්ගය තිබෙන්නේ. මෙම ප්‍රදේශයේ පාහියංගල, මාකෙළි ඇල්ල වැනි සංචාරක ආකර්ෂණීය ස්ථාන පිහිටා තිබෙනවා. මේ භාවිත කරන මාර්ගය ඉතාම හොඳ මාර්ගයක්. එහෙත් ඒ මාර්ගයේ එක මංතීරුවක් -ඔය කියන කිලෝමීටර ප්‍රමාණය- මේ වන විට සම්පූර්ණයෙන්ම කැලයෙන් වැසී ගිහින් තිබෙන්නේ. ඒ නිසා පසුගිය කාලයේ අනතුරු රැසක් සිද්ධ වුණා. SLTB බස් එකකුත් අනතුරකට ලක් වෙලා එක් පුද්ගලයෙකු මිය ගියා. මෙම දුෂ්කරතාව නිසා ඒ ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවකට පත් වෙලා ඉන්නේ. ගරු ඇමතිතුමනි, අප දැනගන්න කැමැතියි, මේ පැවරීම් කටයුත්ත මේ වන විට නතර වෙලා තිබෙන්නේ කුමන තැනකද කියලා.

මේ පැවරීම් කටයුත්තට ලංකා විදුලිබල මණ්ඩලය මඟින් යම් පොලී ගෙවීමක් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ පොලී ගෙවීම නතර වෙන්න හේතුව මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

පොලී ගෙවීමක් ගැන ප්‍රශ්නයක් මතු කරලා නොතිබුණු හින්දා ඒ සම්බන්ධව මා දැනුවත් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේ දෙයක් ප්‍රාදේශීය සංවර්ධන කමිටුව හෝ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා විසඳා ගැනීම තමයි පහසුම මාර්ගය වන්නේ. මම කලින් කිව්වා වාගේ, මාර්ග සංවර්ධන අධිකාරියටත්, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට වාගේම දිස්ත්‍රික් ලේකම් වෙතත් 17 වතාවක් නැවත නැවත මේ සම්බන්ධව මතක් කරලා තිබෙනවා. මොකද, ඒ තැන්වලින් තමයි ඒක කර ගන්න වෙන්නේ. මේ ගනුදෙනු බේරාගන්න වෙන්නේත් එතැනදී තමයි. ඒ ප්‍රශ්නය විසඳා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන කමිටුව හරහා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කිරීම තමයි කළ යුත්තේ.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු ඇමතිතුමනි, අපි ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් කථා කළා. නමුත්, ඒ සඳහා නිශ්චිත පිළිතුරක් අපට ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගත් අවසාන තීන්දුවත් මා ළඟ තිබෙනවා. මූලාරම්භයේ සිට අවසානය දක්වා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ සම්බන්ධව ගත් තීන්දු තීරණ මා ළඟ තිබෙන ලේඛනයේ සඳහන් වෙනවා. මම ඒ ලේඛනය ඔබතුමාට ලබා දෙන්නම්.

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය වසර 15කට ආසන්න කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් අමාත්‍යාංශයට යම් මැදිහත් වීමක් කළ හැකි ද කියන ප්‍රශ්නයත් යොමු කරමින්, ඔබතුමාගේ දැනගැනීමට මා මෙම ලේඛනය ඔබතුමාට ලබා දෙන්නම්.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු මන්ත්‍රීතුමා, මාර්ගයක් නඩත්තු කරන බලතල විදුලිබල මණ්ඩලයට පැවරෙන්නේ නැහැ. අපට මාර්ග සංවර්ධන අධිකාරියෙන් හෝ දිස්ත්‍රික් ලේකම්ගෙන් ඉල්ලන්න පුළුවන්, ඒකට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ලංකා විදුලිබල මණ්ඩලය යම් ගෙවීමක් කරන්න ඕනෑ නම් ඒ සඳහා estimate එකක් ඉදිරිපත් කළොත් අපිට ඒ ගැන සලකා බලන්න පුළුවන්. එහෙම නැතිව, ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීමේ හැකියාව ලංකා විදුලිබල මණ්ඩලයට හෝ අපේ අමාත්‍යාංශයට නොමැති බව තවදුරටත් මම කියනවා. ඇත්තටම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගත්තා කියන තීරණය මීට කලින් මට ඉදිරිපත් කළා නම්, අපේ පැත්තෙන් වගකීමක් ඉටු කරන්න තිබෙනවා නම් මට ඒ අනුව කටයුතු කරන්න පුළුවන්.

'සුව සැරිය' ගිලන් රථ සේවය: වැඩිදියුණු කිරීම
'சுவ செரிய' நோயாளர் காவு வண்டிச் சேவை: மேம்படுத்தல்
"SUWA SERIYA" AMBULANCE SERVICE: IMPROVEMENT

724/2025

6. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'සුව සැරිය' ගිලන් රථ සේවය මඟින් ඉතා විශිෂ්ට සේවයක් සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගිලන් රථ සේවය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ පුළුල් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'சுவ செரிய' நோயாளர் காவு வண்டிச் சேவைமூலம் மிகச் சிறந்ததொரு சேவை இடம்பெறுகின்றதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சேவையை மேலும் வலுவூட்டுவதற்கும், விஸ்தரிப்பதற்கும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he accepts that an excellent service is provided by the "Suwa Seriya" ambulance service; and

(ii) if so, the measures that will be taken to further strengthen and expand the said ambulance service?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ගරු කථානායකතුමනි, ඒක අදියර කීපයකින් වැඩිදියුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

<u>කෙටි කාලීන ක්‍රියාමාර්ග</u>

1. හැකි ඉක්මනින් අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (ප්‍රධාන වශයෙන් හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරින්)

ගරු මන්ත්‍රීතුමියනි, මේකට අනුමත cadre එක 895ක්. දැනට 534දෙනෙක් බඳවා ගෙන තිබෙනවා. හැබැයි, ඇත්තටම කැලණිය විශ්වවිද්‍යාලය ආශ්‍රිතව ඩිප්ලෝමාවට එන ළමයි ප්‍රමාණයට අනුව තමයි බඳවා ගැනීම් කරන්න වෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, පාසල් මට්ටමින් හා තරුණ තරුණියන් අතර යම් දැනුවත් කිරීමක් සිදු කර ඒ තුළින් උනන්දුවක් ඇති කරලා, අයදුම්කරුවන් වැඩිපුර ගෙන්වා ගන්න.

2. පෙර වර්ෂවලදී නොලැබුණු අරමුදල් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන අනුමැතීන් ලබා ගැනීම.

මෙවර අය වැයෙන් අපි රුපියල් මිලියන 5,000ක් මේ වෙනුවෙන් වෙන් කළා. පසුගිය වසරවල සමහර නිරීක්ෂණ අනුව අය වැයෙන් වෙන් කරන ලද මුදල් නොවැම්බර් මාසයේ විතර තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා සමහර උපකරණ මිලදී ගැනීමේදී සහ යටිතල පහසුකම් සංවර්ධනයේදී ගැටලු පැනනැඟිලා තිබෙනවා. නමුත්, ඒක අපිට නිරාකරණය කර ගන්න පුළුවන්, මේ රුපියල් මිලියන 5,000 Treasury එකෙන් ලබා දීමත් එක්ක.

3. 1990 හදිසි ඇමතුම් අංකය පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම හරහා වෙනත් හදිසි ඇමතුම් අංක සමඟ සිදු වන ව්‍යාකූල තත්ත්වයන් මඟ හරවා ගැනීමට කටයුතු කිරීම.

පසුගිය කාලයේ අපි කළ සමීක්ෂණයකින් දැනගන්න ලැබුණා, ගිලන් රථ සේවය ගැන දන්නා ප්‍රමාණයට ඒ අංකය මතක නැති බව. ඒ නිසා අපි දැන් 1990 අංකය ජනතාවගේ මනස තුළ තහවුරු කිරීම තමයි කරන්න ඕනෑ. ඒ සඳහාත් අපි වැඩ පිළිවෙළක් සකස් කරමින් තිබෙනවා.

4. මීට පෙර ආරම්භ කරන ලද "ගිලන් රථයක් භාර ගන්න" - "Adopt an Ambulance" - ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යෑම.

5. ගිලන් රථ අලුත්වැඩියා කිරීමේ කටයුතු අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යෑම.

මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

1. රට පුරා ප්‍රතිචාර දැක්වීමේ කාලය විනාඩි 10ට වඩා අඩුවෙන් පවත්වා ගැනීම සඳහා ගිලන් රථ බල ඇණියට තවත් ගිලන් රථ 150ක් අනුයුක්ත කිරීම හරහා ශක්තිමත් කිරීම.

ඒ සම්බන්ධයෙන් අපි ඉන්දියානු රජයත් එක්ක සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. දැනට ගිලන් රථ 50ක් ලබා දෙන්න එකඟතාවක් තිබෙනවා. නමුත්, 150ක් දක්වා යැමට හැකියාවක් තිබෙන බව නරේන්ද්‍ර මෝදි අගමැතිතුමාගේ සංචාරයේදීත් කියා තිබෙන බව අපට වාර්තා වුණා. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඊට අමතරව ආසියානු සංවර්ධන බැංකුවෙන් කොටසක් ණය පදනමෙනුත්, කොටසක් නොමිලේත් වශයෙන් ගිලන් රථ ප්‍රමාණයක් අපට ලැබෙනවා.

2. හදිසි අණ සහ පාලන මධ්‍යස්ථානය - Emergency Command and Control Centre - තවදුරටත් පුළුල් කිරීම.

3. 1990 සුවසැරිය පදනම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ එහි පුහුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.

දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග

1. එංගලන්තයේ නව බකිංහැම්ෂයර් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මඟින් අපේ තාක්ෂණ නිලධාරින් සඳහා උපාධියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.

2. ජීවිත බේරා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කරගෙන සියලුම ගිලන් රථ වෙත යාන්ත්‍රික CPR උපකරණ හා උසස් තත්ත්වයේ ජීවිත ආරක්ෂක ගිලන් රථ පද්ධතියක් හඳුන්වා දීම.

3. හදිසි අණ සහ පාලන මධ්‍යස්ථානය ජාත්‍යන්තර තත්ත්වයට අනුව උසස් කිරීමට කටයුතු කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මම ඔබතුමාගෙන් අහන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම ගිලන් රථ සේවයක් තිබෙන එකේ වැදගත්කමක් තිබෙනවා. විශේෂයෙන් මම නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන මම කථා කරන්නම්. ලංකාවේ අනෙක් දිස්ත්‍රික්කවලත් ඒ තත්ත්වය ඇති, විශේෂයෙන් දුෂ්කර පළාත්වල. හැම රෝහලකටම ගිලන් රථයක් තිබෙනවා නම් හොඳයි. හැබැයි අපි දකිනවා, සමහර රෝහල්වලට ගිලන් රථයක් නැති බව. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉලුක්කුඹුර කියන රෝහලට ගිලන් රථයක් තිබෙනවා. හැබැයි, ඉලුක්කුඹුර කියන්නේ බොහොම හුදෙකලා වුණු, නකල්ස් රක්ෂිතය තුළ තිබෙන රෝහලක්. ඒ රෝහලට වෛද්‍යවරයෙක් පත් කර සිටිනවා. ඔහු උදේ බස් එකේ ඇවිල්ලා හවස බස් එකේ යන තත්ත්වයක් තමයි තිබෙන්නේ. එතැන වසම් 14ක ජනතාවක් ඉන්නවා. ඒ රෝහලේ ගිලන් රථයක් තිබෙනවා. හැබැයි, ඒ ගිලන් රථය සමහර වෙලාවට අනෙක් රෝහල්වලට ගෙන්වා ගන්නවා. ඒ නිසා මේ වාගේ හුදෙකලා වුණු ප්‍රදේශයක තිබෙන රෝහලකට ගිලන් රථයක් නැතිවීම තුළ ජනතාවගේ ජීවිත බේරා ගැනීම සම්බන්ධයෙන් යම් යම් අවස්ථාවල ප්‍රශ්න ඇති වෙනවා. මම මේ උදාහරණයක් ගත්තේ. මෙහෙම තැන් තවත් ඇති. ඒ වාගේ අවස්ථාවකදී 1990, එහෙම නැත්නම් "සුව සැරිය" කියන system එක බොහොම වටිනවා. ඒ වාගේම හැම පොලීසියක්ම කේන්ද්‍ර කරගෙන "සුව සැරිය" ගිලන් රථයක් තිබුණත්, -තිබෙනවාද කියන එක පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා- පවතින දුරත් එක්ක මිනිත්තු 10ක් තුළ ඒ රථ ධාවනය කිරීම සම්බන්ධවත් ගැටලු ඇති වෙනවා.

ඒ කාලයේ වතු රෝහල්වලට ගිලන් රථ තිබුණා. සමහර වතුවල අදටත් දිරාපත් වෙමින් ගිලන් රථ තිබෙනවා කියලා මම අහලා තිබෙනවා. හැබැයි, වතු රෝහල නැහැ. මෙන්න මේ වාගේ සංකීර්ණ ගැටලු තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමිය උදාහරණයක් වශයෙන් ගත් ඉලුක්කුඹුර රෝහලේ පමණක් නොවෙයි, මේ ප්‍රශ්නය රටේ තැන් තැන්වල තිබෙනවා. ඇත්තටම අපේ රටේ තිබුණු සාමාන්‍ය ගිලන් රථ සේවයට විශාල පහසුවක් වුණා, මේ 1990 ගිලන් රථ සේවය පැමිණීම. අපි බලාපොරොත්තු වෙනවා, මේ ගිලන් රථ ඇණිය 450ක් දක්වා වැඩි කිරීම තුළ මේ ප්‍රශ්නයට යම් සැලකිය යුතු විසඳුමක් ලැබෙයි කියලා. නමුත් ගිලන් රථ 450ක් ධාවනය කරනකොට සාමාන්‍යයෙන් 30ක, 40ක විතර ප්‍රමාණයක් හැම තිස්සේම තාක්ෂණික දෝෂත් එක්ක තමයි පවත්වාගෙන යන්න වෙන්නේ.

අපි දැන් රෝහල් මට්ටමින් ගණනය කිරීමක් කරමින් යනවා, සාමාන්‍ය ගිලන් රථ තවත් කොපමණ ප්‍රමාණයක් අවශ්‍යද සහ ඒවායේ රියදුරන්ගේ ප්‍රශ්න ඇතුළු තාක්ෂණික ප්‍රශ්නවලටත් විසඳුම් සෙවීම සඳහා. අපි ඇත්තටම බලාපොරොත්තු වෙන්නේ අපි යෝජනා කරමින් යන ප්‍රාථමික සහ ද්විතීයික සෞඛ්‍ය සේවාවේ ප්‍රතිසංස්කරණ තුළ ගිලන් රථ සේවය යම් විධිමත්භාවයකට පත් කරලා මේ කටයුතු කරන්නයි.

මේ ගිලන් රථ සම්බන්ධ ප්‍රශ්නය කොයි ආණ්ඩුවලටත් මුහුණ දෙන්න වෙන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ඔබතුමිය සඳහන් කරපු ස්ථාන පිළිබඳව මම අවධානය යොමු කරන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, මම එක උදාහරණයක් විතරයි කිව්වේ. එවැනි ප්‍රශ්න ලංකාව පුරාම ඇති. ඔබතුමා කිව්ව අසීරුතාත් ඒවාට බලපානවා.

එම කාරණයට තව පැහැදිලි කිරීමක් එකතු කළොත්, ලග්ගල රෝහල ශ්‍රේණියෙන් උසස් කරන්න, මූලික රෝහලක් බවට පත් කරන්න කියලා වසර ගණනාවක් ඉල්ලීම් කර තිබුණා. පසුගිය කාලයේ ඒ සඳහා -එය A ශ්‍රේණියේ රෝහලක් බවට පත් කරන්න

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කියලා- යම් අනුමැතියකුත් ලැබුණා. මේ ලග්ගල ආසනය; ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත්, එයට විශාල භූමි ප්‍රමාණයක් අයත් වෙනවා. එහේ ඉඳලා රෝගීන්ට දඹුල්ලට, මහියංගනයට, බදුල්ලට, එහෙම නැත්නම් මාතලේට එන්න සිද්ධ වෙනවා. ඒ සඳහා කිලෝමීටර 100කට එහා දුරක් එන්න ඕනෑ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ලග්ගල රෝහල සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න, ඒ වාගේම එම රෝහලට අවශ්‍ය ගිලන් රථ පහසුකමත් ලබා දෙන්න කියලා.

දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් මම මේ කථා කරන්න යන කාරණාව සම්බන්ධයෙන් ඔබතුමාට මුලින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. මොකද, වසර 9කට අධික කාලයක් තිස්සේ ඩෙංගු කාර්ය සාධක බලකාය නමින් හඳුන්වපු කණ්ඩායමක් හිටියා. ඒ අය ඩෙංගු රෝගය වළක්වා ගන්න,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, අසා තිබෙන මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒකට අදාළව තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය මේ අහන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම පළමුවෙන්ම ස්තුතිය කරන්නයි හිටියේ. නමුත්, ගරු කථානායකතුමා ඔය කාරණය කියයි. මොකද, ඒ තරම් අසීමිත මර්දනයක් සිද්ධ වෙනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. අසීමිත මර්දනයක් නොවෙයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් උත්තර දෙන්න. මට ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ස්ථාවර නියෝග අනුව,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ, මොකක්ද කියන්නේ කියලා. ඇමතිතුමා කැමැති නම් මේකට උත්තර දෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කැමැතිද උත්තර දෙන්න?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔව්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒක නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මතක තියාගන්න,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පොඩ්ඩක් ඉන්න. හැම වෙලේම කොරහේ කිඹුල්ලු දකින්න එපා, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් අහන්න. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, වසර 9ක් තිස්සේ සේවය ස්ථිර කරගන්න බැරිව හිටපු කණ්ඩායමක සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන්. මේත්, වසංගත සමයක්. වැස්සත් එක්ක ආපහු ඩෙංගු රෝගය හිස ඔසවන්න පුළුවන්. කාලයක් තිස්සේ ඒ ඩෙංගු කාර්ය සාධක බලකායේ අය ලොකු, නිහඬ සේවයක් කළා. ඒ අයගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් සමස්ත රටවැසියන් සහ ඒ ඩෙංගු කාර්ය සාධක බලකායේ අය වෙනුවෙන් මම ඔබතුමාට ස්තුතිය පුද කරනවා. ගරු ඇමතිතුමනි, එතැන තවත් ඉන්නවා, 301දෙනෙක්. දැන් ඔය ස්ථිර කළේ අට පාස් අය. එම බලකායේ තව 301දෙනෙක් ඉන්නවා, හයයි, දෙකක් තිබෙන, ඒ කියන්නේ O/L සමත් අය. ඉතින් ඒ අයව ස්ථිර කරන්නත් ඔබතුමා ක්‍රියා කරනවාද, එහෙම නැත්නම් ඔබතුමා ඒ අය සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියන එක ගැන දැනුවත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමිය දෙවැනි අතුරු ප්‍රශ්නයේ පළමුවැනි කොටසින් ඇහුවේ, ලග්ගල රෝහල සම්බන්ධයෙන්. අපි රෝහල් upgrade කරන්නේ 2022දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය පදනම් කරගෙනයි. ඒ අනුව, වර්ගීකරණයට අදාළව දැන් ඒ රෝහල තිබෙන මට්ටමට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙමින් තමයි අප එය BH - Type - A - එකක් දක්වා ගෙන යන්නේ. ගරු මන්ත්‍රීතුමිය, පහසුකම් නොදී Board එකෙන් පමණක් උසස් කළාට තේරුමක් නැහැ. සමහර විට ඒ දේශපාලන අධිකාරියට යම් සතුටක් දැනෙන්න පුළුවන්, තමන් රෝහල උසස් කළා කියලා. නමුත්, BH - Type - A - තත්ත්වයට පත් කරන කොට අවශ්‍ය කරන consultantsලා ප්‍රමාණයකුත්, මානව සම්පත් සහ උපකරණ ප්‍රමාණයකුත් තිබෙනවා. එම නිසා එය දැනට තිබෙන category එකට අවශ්‍ය පහසුකම් සම්පූර්ණ කරමින් උසස් කිරීමට අවධානය යොමු කරන්නම්. කොහොමටත් ඒ පිළිබඳව නිරීක්ෂණය කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශයේ යම් කණ්ඩායමක් අපි එවනවා. ඒ, එතුමියගේ අතුරු ප්‍රශ්නයේ පළමුවැනි කොටසට පිළිතුර.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු ඇමතිතුමනි, එම උසස් කිරීම කරන්න පුළුවන්කමක් තිබෙනවාද? ලග්ගල රෝහල A ශ්‍රේණියේ රෝහලක් කරන්න නම්

තවත් වර්ග පහකට අයත් වෛද්‍යවරුන් පස්දෙනෙකු එන්න ඕනෑ; ළමා වෛද්‍යවරයෙකු ආදී වශයෙන් වෛද්‍යවරු පස්දෙනෙක් එන්න ඕනෑ. ඒ පහසුකම ලබා දෙන්න හැකියාව මේ අවස්ථාවේ තිබෙනවාද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ වාගේ අවශ්‍යතා ගොඩක් තිබෙන නිසා දැනට ඉන්න consultantsලා ප්‍රමාණය අනුව තමයි ඒක තීන්දු කරන්න වෙන්නේ.

ඔබතුමියගේ දෙවන අතුරු ප්‍රශ්නයේ දෙවන කොටසට පිළිතුර මෙසේයි. ක්ෂේත්‍ර මදුරු මර්දන සහායකයන්, එහෙම නැත්නම් සෞඛ්‍ය කාර්ය සහයකයන් හයසිය හතළිස්දෙදෙනෙකු අපි ස්ථිර කළා. ඒ, අවුරුදු අටකට පස්සේ. ඒ අය 1,500දෙනෙක් විතර සේවයට බැඳිලා සේවය කරමින් සිටියා, ස්ථිර නොවී. කොටස කොටස අත් හැර ගිහින් තිබුණා. ඒ අය අතුරින් හයසිය හතළිස්දෙදෙනෙකු තමයි අප විසින් ඔය ස්ථිර කරනු ලැබුවේ. ගරු මන්ත්‍රීතුමියනි, එතැන තවත් 40කට ආසන්න පිරිසක් ඉන්නවා මේ category එකේ තොරතුරු එවීමේ ප්‍රමාදය මත තවම ස්ථිර කර ගන්න බැරිව. අපි ඒ අයත් ඉක්මනින් ස්ථිර කරනවා. ඒ වාගේම, ඔබතුමිය කියපු තුන්සියඑක්දෙනාත් මේත් එක්කම අනිවාර්යයෙන් ස්ථිර කරනවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ඒ ඔක්කොම ස්ථිර කරන්න ඕනෑ. මොකද, අගමැති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පත් කර තිබෙන කමිටුව විසින් සැලකිල්ලට ගත්තා, GCE O/L සමත්, මෙවැනි ආකාරයට බඳවා ගත්තු, තවත් ආයතන ප්‍රමාණයක 6,000ක් පමණ ඉන්නවා කියන කාරණය. මීට අදාළ තීන්දුව එක සැරේ ගත යුතුව තිබෙන නිසා තමයි මෙහි පොඩි ප්‍රමාදයක් තිබෙන්නේ. නමුත්, ඒ අයට එම පත්වීම් ලබා දෙන්න අපි වැඩි කාලයක් ගන්නේ නැහැ. දැනට ඉතිරි වෙලා සිටින 980කට ආසන්න පිරිස -ඒ සියලුදෙනා- ස්ථිර කරනවා. ඇත්තෙන්ම ඒ අය රටට ලොකු සේවයක් කරමින් සිටියා. ඒ අයව ස්ථිර කිරීම ඒගොල්ලන්ගේ පැත්තෙන් වැඩ කටයුතු කරගෙන යන්න ලොකු පහසුවක් සහ ශක්තියක් වෙයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාව දැනුවත් කිරීමක් කරන්න තිබෙනවා. මෙයට උත්තර මොකුත් දෙන්න ඕනෑ නැහැ. අනුරාධපුර රෝහලේ ඊයේ දවසේ බෙහෙත් නැතුව- *[බාධා කිරීමක්]* කැනියුලා එක ගහන්න- *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හවස විවාදයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
විවාදය වැඩක් නැහැ. ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හරි, හරි. සොයා බලමු.

පවතින මාර්ග බලපත්‍ර මත නව බස් රථ යෙදවීම: හිඟ මුදල් අය කිරීම
தற்போதைய வழித்தட அனுமதிகளில் புதிய பேருந்துகளை ஈடுபடுத்துதல்: நிலுவைத் தொகை அறவிடல்
DEPLOYMENT OF NEW BUSES ON EXISTING ROUTE PERMITS: CHARGE OF OUTSTANDING FEE

792/2025

7. ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට වාහන ආනයනය නතර කර තිබූ කාල සීමාව තුළදී, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලපත්‍රලාභී බස්රථ හිමියන්ගේ ධාවනයට නුසුදුසු බස්රථ විකිණීමෙන් පසු, නව බස්රථයක් මිල දී ගැනීමට බස්රථ ආනයනය ආරම්භ කරන තුරු සිටීමට සිදු වූ බවත්;

(ii) ඉහත කාල සීමාවේදී, එම බස්රථ හිමියන් විසින් ධාවන බලපත්‍ර කොමිෂන් සභාවට භාර දී තිබූ බවත්;

(iii) බස්රථ ආනයනය ආරම්භ කිරීමෙන් පසු නව බස්රථ ධාවනයට යෙදවීමේදී, පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 'වාට් ශීට්' නිකුත් කිරීමට ධාවනය නොකළ කාල සීමාව සඳහා ද හිඟ මුදල් අය කරන බවත්;

(iv) බස්රථ ආනයනය නතර කර තිබූ කාලයේදී බස්රථ මිල දී ගැනීමට නොහැකි වීමෙන් නව බස්රථ ධාවනයට යෙදවීමට නොහැකි වූ බවත්;

(v) එබැවින්, බස්රථ සඳහා 'වාට් ශීට්' නිකුත් කිරීමේදී ධාවනය නොකළ කාල සීමාව සඳහා හිඟ මුදල් අය කිරීම අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கான வாகன இறக்குமதி நிறுத்தப்பட்டிருந்த காலப்பகுதியில், தேசிய போக்குவரத்து ஆணைக்குழுவின் உரிமம் பெற்ற பேருந்து உரிமையாளர்களுக்குச் சொந்தமான, சேவையில் ஈடுபடுத்துவதற்குப் பொருத்தமற்ற பேருந்துகளை விற்பனை செய்ததன் பின்னர், புதிய பேருந்துகளைக் கொள்வனவு செய்யப் பேருந்து இறக்குமதி செய்யப்படும் வரை காத்திருக்க வேண்டிய நிலையேற்பட்டது என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில், அப்பேருந்து உரிமையாளர்கள் வீதி அனுமதிப் பத்திரத்தை ஆணைக்குழுவிடம் ஒப்படைத்திருந்தனர் என்பதையும்;

[ගරු සුජීව දිසානායක මහතා]

(iii) பேருந்து இறக்குமதி ஆரம்பிக்கப்பட்டதன் பின்னர் புதிய பேருந்துகளை சேவையில் ஈடுபடுத்தியபோது, மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபையானது 'ஓட்டப் பதிவுக் குறிப்பு' வழங்குகையில் சேவையில் ஈடுபடுத்தப்படாத காலப்பகுதிக்கும் நிலுவைத் தொகையை அறவிடுகிறது என்பதையும்;

(iv) பேருந்து இறக்குமதி நிறுத்தப்பட்டிருந்த காலப்பகுதியில் பேருந்துகளைக் கொள்வனவு செய்ய முடியாமற்போனதால் புதிய பேருந்துகளை ஓட்டத்தில் ஈடுபடுத்த முடியாமற்போனது என்பதையும்;

(v) ஆகையால், பேருந்துகளுக்கான 'ஓட்டப் பதிவுக் குறிப்பினை' வழங்கும்போது ஓட்டத்தில் ஈடுபடுத்தப்படாத காலப்பகுதிக்கு ஏற்புடையதாக நிலுவைத் தொகையை அறவிடுவது அநீதியானது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) அவ்வாறெனில், இது தொடர்பில் வழங்கப்படும் தீர்வுகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he accept that -

(i) the bus owners holding route permits issued by the National Transport Commission and who sold their unroadworthy buses during the period when import of vehicles into Sri Lanka had been suspended had to wait until the import of buses recommenced in order to purchase a new bus;

(ii) during the above-mentioned period, the bus owners concerned had surrendered their route permits to the said Commission;

(iii) when new buses are put into operation after the import of buses has recommenced, the Provincial Road Passenger Transport Authority charges an outstanding fee for issuing chart sheets even for the period during which the buses were not in operation;

(iv) it was not possible for the bus owners to put new buses into operation, as they were unable to purchase buses during the period when import of buses were suspended; and

(v) it is therefore unfair to charge an outstanding fee for the period during which buses were not operated when issuing 'chart sheets' for the new buses?

(b) If so, will he inform this House of the solution that will be given in this regard?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවට වාහන ආනයනය නතර කර තිබූ කාල සීමාව තුළ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලපත්‍රලාභී බස් රථ හිමියන්ගේ ධාවනයට නුසුදුසු බස් රථ විකිණීමෙන් පසු නව බස් රථයක් මිල දී ගැනීමට බස් රථ ආනයනය ආරම්භ කරන තුරු සිටීමට සිදු වූ බව පිළිගනිමි.

(ii) අදාළ කාල සීමාවේදී ධාවන බලපත්‍ර ජාතික ගමනාගමන කොමිෂන් සභාවට භාර දීමට බොහෝ අවසර පත්‍ර හිමිකරුවන් කටයුතු කර ඇත.

(iii) අවසර පත්‍ර සඳහා නව බස් රථ ආදේශ කරන අවස්ථාවලදී අවසර පත්‍ර පොත හා ලේබලය කාර්යාලයේ රඳවා තිබූ කාල සීමාව තුළ ගෙවීමට නියමිත ලොග් පත්‍ර ගාස්තු නිදහස් කරන ලෙසට අදාළ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි කාර්යාලවලට ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇත. එසේ වුවද, ඇතැම් අවස්ථාවලදී එම ලොග් පත්‍ර ගාස්තු නිදහස් නොකළ බවට අවසර පත්‍ර හිමිකරුවන් විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත දැනුම් දීමට කටයුතු කර තිබේ. එවැනි අවස්ථාවලදී නැවත වරක් අදාළ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීන් දැනුවත් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කර තිබේ.

(iv) බස් රථ ආනයනය නතර කර තිබීම හේතුවෙන් අවසර පත්‍ර සඳහා නව බස් රථ ආදේශ කිරීමට නොහැකිව තිබුණි.

(v) ඔව්. ධාවනය නොකළ කාල සීමාව සඳහා හිඟ මුදල් අය කිරීම අසාධාරණයක් බව පිළිගනිමි. ඒ නිසාම මෙලෙස බස් රථ ධාවනය නොකළ කාල සීමාව තහවුරු කර ගැනීමෙන් පසුව ධාවනය නොවූ කාල සීමාව සඳහා ලොග් පත්‍ර ගාස්තු අය කිරීම සාධාරණ නොවන බැවින්, කලින් පිළිතුරේ සඳහන් කළ පරිදි එම මුදල් අය නොකරන ලෙස මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීන් වෙත දැනුම් දී තිබේ.

(ආ) ඔව්. අදාළ ගාස්තු නිදහස් කරන ලෙසට අවශ්‍යතාව අනුව පළාත් ප්‍රවාහන අධිකාරීන් යළිත් දැනුවත් කිරීමට කටයුතු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සාමාන්‍යයෙන් අලුතින් බස් රථ ධාවනයට යෙදවීමේදී හෝ ධාවනය වන බස් රථ මාරු කර ගැනීමේදී මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීන් හරහා මාර්ග බලපත්‍රයක් - route permit එකක්- ලබා දෙනවා. ඒ route permit එක ලබා ගැනීමේදී අදාළ බස් රථ හිමියන්ට විශාල මුදලක් වැය වෙනවා. එම නිසා අලුතින් බස් රථ ධාවනයට එකතු වන ප්‍රමාණය විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, route permits ලබා දෙන විට සිදු වන අක්‍රමිකතා හෝ අධික මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා හැටියට ඔබතුමා ප්‍රවාහන අමාත්‍යාංශය හරහා මොනයම් හෝ පියවරක් ගන්නවාද කියලා මෙම ගරු සභාවට කියන්න පුළුවන්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගමන් බලපත්‍ර ලබා දීම දූෂිත ක්‍රියාවක්, මාෆියාවක් ලෙස තමයි පසුගිය අවුරුදු 25කට අධික කාලය තිස්සේ මේ රටේ පැවතිලා තිබෙන්නේ. ඒ බව ඉතාම පැහැදිලියි. සම්පූර්ණයෙන්ම තමන්ගේ යාළුවන්ට, ගෝලයන්ට, දේශපාලන හෙංචයියන්ට කිසිදු පදනමකින් තොරව route permits දීපු එක තමයි මේ රටේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි බොහොමයක් වැඩි කාලයක් තිස්සේ කරලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයට තමන්ගේ කට්ටිය ආවාට පස්සේ ඔවුන් කරන්නේ ඒගොල්ලන්ගේ රුස්වීම්වලට බස් රථ දෙන එක. ඒක ඉතාම දූෂිත ආයතනයක්. ගරු කථානායකතුමනි, එම නිසා අපි අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ route permits ලබා දීම පිළිබඳව සම්පූර්ණ audit එකක් කරන ලෙසට කියා තිබෙනවා. දැන් ඒ audit එක පටන් ගෙන තිබෙනවා. තුන්දහස් ගණනක් audit කරන්න තිබෙනවා. තවම ඒ කටයුතු අවසන් කරලා නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, route permit සම්බන්ධයෙන් audit එකක් කරලා ඒවායේ ගැටලුකාරී තත්ත්වයන් සම්පූර්ණයෙන් නිවැරදි කරන්නත්, ඒ කාරණා හෙළිදරව් කරන්නත්.

ඊළඟ කරුණ මෙයයි. ජාතික ජන බලවේගයේ පාලනය ආවාට පස්සේ අපි ටෙන්ඩර් කිරීමෙන් තොරව කිසිදු permit එකක්, කිසිසේත් ලබා දෙන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරු -විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ නොවන මන්ත්‍රීවරු- එක්කෙනෙක්, දෙන්නෙක් ඒ සම්බන්ධයෙන් අපට ලියුම් දීලා තිබෙනවා. අපි එතුමන්ලාටත් කියපු දේ තමයි, අප ඒ පරණ ක්‍රමය අනුගමනය කරන්නේ නැහැ කියන එක.

ඊළඟට මම තවත් කරුණක් කියන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාටම. අපට අලුතින් routes අවශ්‍යයි. එම නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගේ පැත්තෙන්, සම්බන්ධීකරණ කමිටුව හරහා අලුත් මාර්ග බලපත්‍ර අවශ්‍ය කරන routes යෝජනා කරලා එවන්න පුළුවන් නම් හොඳයි, ගරු කථානායකතුමනි. මොකද, හැම දාම යන විධියටම බස් යන්න ඕනෑ නැහැ. නගර අතර අලුත් විධියට බස් ධාවනය කරවන්න පුළුවන්. ඒ නිසා අලුත් මාර්ග පිළිබඳව යෝජනා තිබෙනවා නම් අපට එවන්න. දැන් බස් රථ ආනයනයට ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් අවසර දීලා තිබෙන නිසා අලුත් permits ගන්න පුළුවන්. ඒ නිසා ඒවා ගන්න tender කරලා එන්න කියන ඉල්ලීම අපි කරනවා. ගරු මන්ත්‍රීවරුන් වන ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා අලුත් routes හොයාගෙන ඒවා business එකක් වශයෙන් sustainable නම් ඒවාට permits ඉදිරිපත් කරන්න කියලා.

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සාමාන්‍යයෙන් බස් රථ ධාවනය වීමේදී පළාත් අතර බස් රථ ධාවනය වෙනවා, පළාත් තුළ බස් රථ ධාවනය වෙනවා වාගේම ග්‍රාමීය මාර්ගවලත් බස් රථ ධාවනය වෙනවා. පළාත් තුළ සහ ග්‍රාමීය මාර්ගවල බස් රථ ධාවනය කරවීමේදී එය විශේෂයෙන්ම ඒකාබද්ධ කාලසටහනකට හෝ එවැන්නක් නැතිව ධාවනය කරවනවා. ඒකාබද්ධ කාල සටහනක් නැති ඇතැම් මාර්ගවල බස් රථ ධාවනය කරවන්නේ ඉතා හෙමින්.

එම නිසා මගී ජනතාවට බොහෝ අපහසුතාවට ලක් වෙන්න සිදු වෙලා තිබෙනවා, විශේෂයෙන් කාලය කළමනාකරණයේදී. එක අවස්ථාවක මමත් ඒ අත්දැකීමට මුහුණ දුන්නා. විශේෂයෙන් මාර්ග අංක 17, පානදුර-මහනුවර බස් රථ ධාවනය වීමේදී සෑම bus stand එකකම වාගේ බස් රථ නතර කරමිනුයි යන්නේ. අන්තර් පළාත් ධාවනයේදී හෝ ග්‍රාමීය මාර්ගවල ධාවනයේදී බස් රථ ගමනාගමනයේ යෙදෙන කාලය වැඩි වීම සම්බන්ධයෙන්, එනම් එම බස් රථ ඉතා හෙමින් ගමන් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලාගේ පැත්තෙන් ගන්නා ඉදිරි පියවර කුමක්ද කියලා මම අහනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කරන ප්‍රශ්නය ඉතාම වැදගත් වාගේම අප කවුරුත් දන්නා ප්‍රශ්නයක්. පළමුවෙනි කරුණ වශයෙන්, ප්‍රවාහන අමාත්‍යාංශය ලෙස අපි පිළිගන්නවා, ඒකාබද්ධ කාල සටහන් ක්‍රමය තමයි අප යා යුතු ඉලක්කය, අරමුණ කියලා. දැනට දකුණු පළාත් සභාවේ වසර ගණනාවක් තිස්සේ එය ක්‍රියාත්මක කරනවා. එහි විශේෂ ගැටලුවක් ඇති වෙලා නැහැ. ගරු මන්ත්‍රීතුමා මතු කරන සමහර ගැටලු අවම වෙලා තිබෙනවා, දකුණු පළාත් සභාවේ private සහ ලංගම බස් රථ එකට ධාවනය කිරීම නිසා. අපි දැන් තීන්දුවක් ගෙන තිබෙනවා, පුත්තලම දිස්ත්‍රික්කයේ "පුත්තලම කොරිඩෝ" කියා හඳුන්වන ස්ථානයට අදාළව, බොහෝ දුරට මේ මාසය තුළදී ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය ක්‍රියාත්මක කරන්න.

ගරු කථානායකතුමනි, පොදු ජනතාව මුහුණ දෙන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. උදාහරණයක් ලෙස කොටුව Bus Stand එක ගනිමු. අපිත් ඇති තරම් එහි කට්ට කාලා තිබෙනවා. කොටුව Bus Stand එක ආශ්‍රිතව ලංගම බස් නතර කරන්නේ එක bus stand එකක, private buses නතර කරන්නේ bus stands දෙකක. මේ නිසා බස් එකක් හොයා ගන්න ඕනෑ වුණාම මිනිස්සු බෑග් උස්සාගෙන හැම පැත්තටම යනවා. පසුගිය කාලයේ යාපනයේ හදලා තිබෙනවා, දුර ගමන් බස් රථ සඳහා වෙනම bus stand එකක්. ඇත්තටම ඒක හොඳට හදලා තිබෙනවා. අඩුම ගණනේ, ඒකේ පෙනුම හොඳයි. හැබැයි, ඒ bus stand එක භාවිත වෙන්නේ නැහැ, මේ කියන ඒකාබද්ධ කාල සටහන නැති නිසා. ඒකාබද්ධ කාල සටහනකට යෑම තමයි අපේ ප්‍රතිපත්තිය. අපි බලාපොරොත්තු වෙනවා, යාපනයේත් long-distance buses ධාවනය පටන් ගන්න. නමුත්, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්නය තමයි ලංගම ආයතනය සහමුලින් විනාශ කර තිබීම. සමහර ඒවා හොර රහසේත්, විවෘතවත් පෞද්ගලික බස් රථ මුදලාලිලාට විකුණා තිබෙන නිසා ලංගම ඒකාබද්ධ කිරීම හරහා ලංගම දැනට තිබෙන තත්ත්වයෙන් පවා පවත්වාගෙන යෑම දුෂ්කර වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ලංගම ක්‍රමානුකූලව ගොඩ ගන්නා ප්‍රමාණයට සාපේක්ෂව තමයි, ඒකාබද්ධ කාල සටහන්වලට යන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් ලංගම සේවකයන්ගේ ඉල්ලීමකුත් තිබෙනවා. අපේ අරමුණ ඒකාබද්ධ කාල සටහනකට යන එක. අපි එතැනට යනවා. නමුත්, යම්කිසි ප්‍රමාණයකට මේ දෙකම බේරාගෙන යන්න ඕනෑ. නැත්නම්, බස් රථවලට සම්පූර්ණයෙන් පෞද්ගලික අංශයේ ඒකාධිකාරයක් හැදුණොත්, ඒක අනෙක් ඒකාධිකාරයන් හැදිලා තිබෙනවා වාගේම අර්බුදයක් වී තියේවි.

අවසාන වශයෙන් ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාව යොදා ගන්නවා පිළිතුරට යම් කාරණයක් එකතු කරන්න, ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරපු කාරණයක් නිසා. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලාත් දන්නවා බොහෝ අවස්ථාවලදී අපේ ග්‍රාමීය ප්‍රදේශවල -ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ ඒක යම් ප්‍රමාණයකට තිබුණා- සමහර වෙලාවට බස් රථ නැහැ, නැත්නම් ඒ බස් රථ දුවන්න බැහැ, පාඩුයි. සති අන්තයේ බස් රථ නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා ලබන වසරේ අය වැය යටතේ අපි බලාපොරොත්තු වෙනවා, හොඳට study කරලා යම්කිසි subsidy එකක් දෙන්න. යම්කිසි ග්‍රාමීය මාර්ගයක ලංගමයෙන් බස් රථයක් ධාවනය කරනවා නම් -විශේෂයෙන්ම ඒ ඩිපෝ පාඩු ලැබුවා වුණත්- ඒ ග්‍රාමීය මාර්ගයට ලංගමයෙන් බස් රථයක් යොදනවා නම්, අන්න ඒකට වැය වන අමතර මුදල,

[ගරු බිමල් රත්නායක මහතා]

ඒගොල්ලන්ට දරන්න වෙන මුදල රජයෙන් ලබා දෙන්න. දැනට මේ ක්‍රමය යම් මට්ටමකින් තිබෙනවා, National Transport Commission එක යටතේ "ගැමි සැරිය" කියලා. ඒක තව පුළුල් කරන්නත් පුළුවන්. ඒ නිසා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අපි ඉල්ලා සිටිනවා හරියට study කරලා, ඇත්තටම බස් යන්නෙත් නැති, බස් ගියත් ලාභ ගන්න බැරි, සාධාරණ ලාභයක් ගන්න බැරි routes තිබෙනවා නම් ඒවා ගැන ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා කරන්න කියලා, අපි ඊළඟ අය වැයේදී එහෙම ක්‍රමයක් හඳුන්වා දෙන නිසා.

මිනුවන්ගොඩ නව වෙළඳ සංකීර්ණය: වෙළඳ කුටි බදු දීම

மினுவங்கொடை நவீன வர்த்தகக் கட்டிடத்தொகுதி: விற்பனைக்கூடங்களைக் குத்தகைக்கு விடுதல்

NEW SHOPPING COMPLEX, MINUWANGODA: LEASE OF TRADE STALLS

848/2025

8. ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මිනුවන්ගොඩ නගර සභාවට අයත්, 'නව වෙළඳ සංකීර්ණය' නමින් හඳුන්වන වෙළඳ සංකීර්ණයක් මිනුවන්ගොඩ නගරයේ තිබෙන බව දන්නේද;

(ii) එහි ඇති වෙළඳ කුටි (කඩ කාමර) සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් වෙළඳ කුටිය බදු පදනම මත ලබා ගෙන ඇති පුද්ගලයාගේ නම, ලිපිනය සහ අය කරනු ලබන මාසික හෝ වාර්ෂික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සංකීර්ණයේ වෙළඳ කුටි බදු පදනම මත ලබා ගත් පුද්ගලයන්ට එම වෙළඳ කුටි වෙනත් පුද්ගලයකුට විකිණීමට, බදු දීමට හෝ අයිතිය පැවරීමට නීතිමය අවසරයක් තිබේද;

(ii) මෙම වෙළඳ කුටිවල මේ වනවිට ව්‍යාපාර කටයුතු කරනු ලබන්නේ මිනුවන්ගොඩ නගර සභාව සමඟ ගිවිසුම්ගත වෙමින් එම වෙළඳ කුටි ලබා ගත් පුද්ගලයන්මද;

(iii) නොඑසේ නම්, මේ වනවිට එම වෙළඳ කුටිවල ව්‍යාපාර කටයුතු කරනු ලබන පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

(iv) එම පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மினுவங்கொடை நகர சபைக்குச் சொந்தமான 'நவீன வர்த்தகக் கட்டிடத் தொகுதி' என்ற பெயரில் அழைக்கப்படும் வர்த்தகக் கட்டிடத் தொகுதியொன்று மினுவங்கொடை நகரில் உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அங்குள்ள விற்பனைக் கூடங்களின் (கடை அறைகள்) எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அந்த விற்பனைக் கூடங்கள் ஒவ்வொன்றையும் குத்தகை அடிப்படையில் பெற்றுக்கொண்டுள்ள நபர்களின் பெயர், முகவரி மற்றும் அறவிடப்படும் மாதாந்த அல்லது வருடாந்த வாடகை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கட்டிடத் தொகுதியில் உள்ள விற்பனைக் கூடங்களை குத்தகை அடிப்படையில் பெற்றுக்கொண்ட நபர்களுக்கு, அந்த விற்பனைக் கூடங்களை வேறொருவருக்கு விற்பனை செய்வதற்கு, குத்தகைக்கு விடுவதற்கு அல்லது உரிமை மாற்றம் செய்வதற்கு சட்டபூர்வ அனுமதி உள்ளதா என்பதையும்;

(ii) தற்போது இந்த விற்பனைக் கூடங்களில் வியாபார நடவடிக்கைகளை மேற்கொள்பவர்கள், மினுவாங்கொடை நகர சபையுடன் ஒப்பந்தங்களைச் செய்து, அந்த விற்பனைக் கூடங்களைப் பெற்றுக்கொண்ட அதே நபர்களா என்பதையும்;

(ii) இன்றேல், தற்போது அந்த விற்பனைக் கூடங்களில் வியாபார நடவடிக்கைகளில் ஈடுபட்டு வரும் நபர்களின் பெயர்ப் பட்டியலை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) அந்த நபர்களுக்கு எதிராக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a shopping complex known as the New Shopping Complex belonging to the Minuwangoda Urban Council situated in Minuwangoda Town;

(ii) the number of trade stalls (shops) available in the said shopping complex; and

(iii) separately, the name and address of each person who has obtained the said stalls on lease basis and the monthly or annual rent charged on each of the stalls concerned?

(b) Will he also inform this House -

(i) whether the persons who have obtained the stalls in the above-mentioned shopping complex on lease basis have the legal right to sell, sub-lease, or transfer the ownership of the said stalls to another person;

(ii) whether the original lessees who have obtained the said stalls by entering into lease agreements with the Minuwangoda Urban Council are the ones currently conducting business in the stalls;

(iii) if not, whether he will submit a list of names of the persons who are currently conducting business activities in the said stalls; and

(iv) whether legal action has been taken against those persons?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 93කි.

(iii) වෙළඳ කුටි 93 සම්බන්ධව සවිස්තර සටහන ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම සභාගත* කරමි.

(ආ) (i) නැත.

(ii) වෙළඳ කුටි 32ක ව්‍යාපාර කටයුතු කරනු ලබන්නේ වෙනත් පුද්ගලයන් විසිනි.

(iii) මේ සම්බන්ධ සවිස්තර සටහන ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කරමි.

ඇමුණුම 02

මිනුවන්ගොඩ නගර සභාව

වෙළඳකුටියේ ව්‍යාපාර කටයුතු කරන සභාව සමඟ ගිවිසුම්ගත නොවූ පුද්ගලයන් සම්බන්ධ තොරතුරු

කාමර ගණන : 32

අනු අංකය	කඩ කාමර අංකය	අභාවිත අංකය	බදු පදනම මත වෙළඳ කුටි ලබා ගත් පුද්ගලයාගේ නම	බදු පදනම මත වෙළඳ කුටි ලබා ගත් පුද්ගලයාට එම කුටිය වෙනත් පුද්ගයන්ට විකිණීමට, බදු දීමට හෝ අයිතිය පැවරීමට නීතිමය අවසරයක් පවතීද යන්න	මේ වන විට මෙම වෙළඳකුටියේ ව්‍යාපාර කටයුතු කරන්නේ සභාව සමඟ ගිවිසුම්ගත වූ පුද්ගලයාමද යන්න	නොඑසේ නම් එසේ ව්‍යාපාර කටයුතු කරන පුද්ගලයාගේ නම	එම පුද්ගලයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න
1	GF04	B07	කම්මැල්ලවීර අශෝක පුෂ්ප කුමාර බාලචන්ද්‍ර සිල්වා	නැත	නැත	ආර්.ඒ.චමිඳු එරංග	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
[illegible]	GF05	C06	හෙනරත් ආරච්චිගේ දොන් සුමිත් ජයලත් සෙනවිරත්න	නැත	නැත	නුවන් මාලිංග	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
3	GF06	C16	සේතුංග මුදලිගේ ස්වර්ණලතා සේතුංග	නැත	නැත	එම්.ඩී.නුවන් මාලිංග	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
4	GF07	C05	උස්හෙට්ටිගේ දෝන යමුනා හේම කුමාරි	නැත	නැත	ඩී.එස්.ඩබ්.වික්‍රමසිංහ	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
5	GF14	C03	මොහොමඩ් කස්සාලි හම්සතුල් ලාෂිර්	නැත	නැත	එම්.කේ.එච්.ලාහිර් (පියා මිය ගොස් ඇත) එච්.එල්.එම්.සිප්රාන්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
6	GF15	C04	ලොකු එඩුප්පුරිලාගේ පාලිත චන්ද්‍රසිරි	නැත	නැත	එච්.එල්.එම්.සිප්රාන්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
7	GF18	C19	ජයසිංහ ආරච්චිගේ දොන් භාග්‍යා කුමාරි ජයසිංහ	නැත	නැත	එම්.ජේ.එම්.ජප්නීර්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
8	GF19	C01	හෙනරත් හෙට්ටිආරච්චිගේ රනු ඉඳුවර හෙනරත්	නැත	නැත	ඊ.සුමිත්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
9	GF20	C18	කාරියවසම් රණතුංගගේ වසන්ති	නැත	නැත	එම්.එන්.එම්.ෆස්ලාන්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
10	GF21	B11	ඌරවනාවේ ගමරාළලාගේ උපාලි රුවන් කුමාර	නැත	නැත	එම්.ඩබ්.ධනුක කසුන් කුමාර	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
11	GF22	C09	එම්.ඩබ්.ශ්‍රියානන්ද අනුර කුමාර	නැත	නැත	ගිවිසුම්ගත බදුකරුගේ පුතා වන එම්.ඩබ්.ධනුක කසුන් කුමාර විසින් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබයි	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

12	GF23	C08	වනිගසිංහ වි බද්දේ ලේකම්ලාගේ නිසල් සංදීප	නැත	නැත	එම්.ඩබ්.ධනුක කසුන් කුමාර	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
13	GF26	A14	කේ.පී.නවීන් හසරංග පතිරණ	නැත	නැත	එම්.ආර්.එම්.ෆරුසාන්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
14	GF30	B03	හම්සතුල් ලාෆීර් මුහම්මදු සිෆ්රාන්	නැත	නැත	මොහොමඩ් හලීම් මොහොමඩ් ඉස්තිහාර්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
15	GF33	B08	දරුවෙස් මොහිදීන් මුරුසිද් මොහිදීන්	නැත	නැත	හතීෆා මෙහොමඩ් ඉක්රම්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
16	GF34	A09	පිරාස් මොහිදීන් මොහොමඩ් පිර්නාස්	නැත	නැත	මොහොමඩ් නිතීෆා මොහොමඩ් ඉක්‍රම්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
17	**FF 04**	සිල්ලර වෙළඳසැල	ලොකු ලියන හේමචන්ද්‍රගේ සුනිල් ගාමිණී හේමන්ත	නැත	නැත	ජේ.එම්.එන්.තෙන්නකෝන්	නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගිවිසුම සම්පූර්ණ කර ගැනීමට MUC/R/1/1/ ගිවිසුම්/2025 හා 2025.05.14 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් පතා ඇත.
18	FF 08	B 02	ජයසූරිය ආරච්චිලාගේ සුසන්ත ජයසරිය	නැත	නැත	එන්.ඒ.ඒ.කාවිදු විදූශාන් නිශ්ශංක	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
19	FF 09	D 07	අක්මීමන කංකානම් ගමගේ නේරංජනා ගීතාංජලී සෙනෙවිරත්න	නැත	නැත	කේ. හෙට්ටි ආරච්චි	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
20	FF 12	A 18	එම්. ඒ. එම්. නසාර්දීන්	නැත	නැත	රුවන් සොයිසා	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
21	**FF 13**	**B 09**	මෙහිදින් මවුජුඩ් මෙහොමඩ් මිෆාස්	නැත	නැත	නිසල් මාධව ජයසිංහ	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
22	FF 15	C 21	ඉහළ හේම්ගේ දොන් බුද්ධික නිරෝෂන්	නැත	නැත	ගාල්ල හේවගේ සුරාජ් මධුර ඩිලංජන	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
23	**FF 16**	A 06	අධිකාරී මුදියන්සේලාගේ ඉන්දික සෙනෙවිරත්න	නැත	නැත	එම්.ඒ.අරුණසිරි ජයවික්‍රම	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
24	**FF 19**	D 18	අස්මා උම්මා තුවාන් මොහිදීන්	නැත	නැත	එම්.ජේ.එම්.අන්සෆ්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
25	FF 20	A 17	කනුවන පතිරන්නැහැලගේ කවීන් හසරංග පතිරණ	නැත	නැත	කේ.ඩී.අයි.මධුෂාන් මොහොමඩ් නස්රාක්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
26	FF 23	B 12	එරන්ද කුලරත්න	නැත	නැත	එම්.රිෂාන්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
27	**FF 25**	A 15	පතිරගේ අජිත් ගුණවර්ධන	නැත	නැත	ඩබ් ඩී.වරුණ ලක්මාල්	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
28	FF 26	D 13	එම්.එම්.එරන්ත ජයසූරිය	නැත	නැත	ඒ.ඩී.හසිත චන්ද්‍රකාන්ත	නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගිවිසුම සම්පූර්ණ කර ගැනීමට MUC/R/1/1/ ගිවිසුම්/2025 හා 2025.05.14 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් පතා ඇත.
29	FF 27	A 13	වන්නිආරච්චිලාගේ දොන් ලාල් ප්‍රැට්‍රික් පෙරේරා	නැත	නැත	එස්.වන්නිආරච්චි	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
30	FF 32	C 17	හම්සතුල් ලාෆිරි මොහොමඩ් ඉන්දාස්	නැත	නැත	එස්.ඩී.එම්.නිස්කාර්	නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගිවිසුම සම්පූර්ණ කර ගැනීමට MUC/R/1/1/ ගිවිසුම්/2025 හා 2025.05.14 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් පතා ඇත.
31	FF 35	E 11	එම්.ඒ.හංසක සේනාදීර	නැත	නැත	එම්.ඒ.අරුණ සංජය සේනාධිර	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී
32	**SF - 3**	B 04	සාගරිකා නිල්මිණී ජයසිංහ මිය	නැත	නැත	එම්.අයි.දීපිකා මධුවන්ති	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී

(iv) මෙසේ බදුකරු නොවන නමුත් ව්‍යාපාර කටයුතු කරන පුද්ගලයන්ගේ නීත්‍යානුකූලභාවය සොයා බලා එම අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට මීනුවන්ගොඩ නගර සභාව විසින් කටයුතු සිදු කරමින් පවතී.

(ආ) ඉහතින් තොරතුරු සපයා ඇත.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඇත්තටම මම මේ ප්‍රශ්නය යොමු කරන්න ප්‍රධානම හේතුව මේකයි. මීනුවන්ගොඩ නගරයේ මේ නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට පෙර පරණ මාර්කට් එකක් තිබුණා.

අපි සොයා බැලුවාම, ඒක තව අවුරුදු 40ක් විතර භාවිත කරන්න පුළුවන් මට්ටමක තිබුණා. යම් අලුත්වැඩියාවක් කරලා ඒක භාවිත කරන්න පුළුවන්. නමුත් ඒ ප්‍රදේශයේ හිටපු දේශපාලන අධිකාරියේ අවශ්‍යතාව මත නව වෙළඳ සංකීර්ණය ඉදිකර තිබෙනවා. ඒ අවස්ථාවේ පරණ මාර්කට් එකේ හිටපු අයට පොරොන්දු වෙලා තිබුණා, ඒ අයට අලුත් කඩ කාමර ලබා දෙනවා කියලා. නමුත් නව වෙළඳ සංකීර්ණය ගොඩනැගුවාට පස්සේ ඒක ඒ විධියටම සිද්ධ වෙලා නැහැ. ඒ තුළ විශාල මුදල් ගනුදෙනුවකුත් සිද්ධවෙලා කියලාත් යම් කථාවකුත් පවතිනවා. ඒ සමහර අහිංසක පුද්ගලයන්ට කඩ කාමර ලබා නොදී ඒ නව වෙළෙඳ සංකීර්ණය පවත්වා ගෙන යනවා.

මේ නව වෙළඳ සංකීර්ණයේ කටයුතුත් නියමිත පරිදි සිදු කර නැහැ. ඒකේ වැසිකිළි පද්ධතිය ගත්තත්, ගැටලු තත්ත්වයක තිබෙන්නේ. ඒ සමහර ඒවා උතුරා යන මට්ටමේ තිබෙන්නේ. එහි භූගත වතුර ටැංකිය තිබෙන අසලම මස්කඩ ඉදිකර තිබෙනවා. එවැනි තත්ත්වයක් තමයි ඒ වෙළඳ සංකීර්ණය තුළ පවතින්නේ. ගරු ඇමතිතුමනි, එහි තිබෙන කඩ කාමර සංඛ්‍යාව 93යි. එයින් 32ක් වසා දමා තිබෙනවා. ඒකෙන් ලක්ෂ 50ක විතර පාඩුවක් සිදු වෙලා තිබෙනවා. ඒ කඩකාමර 31ක් භාවිත කරන්නේ ඊට අදාළව ගිවිසුම්ගත වුණු පුද්ගලයන් නොවෙයි. අපට ලැබී තිබෙන ආරංචි අනුව එම නගර සභාවේ හිටපු නගරාධිපතිගේ නෑදෑයන්ට, හිතවතුන්ට, නගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරුන්ගේ නෑදෑයන්ට, සහෝදර සහෝදරියන්ට තමයි ඒ කඩ කාමර දීලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම අහන්නේ මේකයි. මිනුවන්ගොඩ වෙළඳ සංකීර්ණය තුළ සිදු වුණු එම නීති විරෝධී ක්‍රියා සිදුවීමට ඉඩ හරිමින් - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න. *[බාධා කිරීම්]*

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
මම අහන්නේ එම නීති විරෝධී ක්‍රියාව සිදුවීමට - *[බාධා කිරීම්]* ඔබතුමන්ලා කලබල වෙන්න එපා. කලබල වෙන්න එපා. පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා, මම ප්‍රශ්නය අහනවා. පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. ගරු මන්ත්‍රීවරුනි, නිශ්ශබ්ද වෙන්න. දැන් විනාඩි දෙකක් ගියා. *[බාධා කිරීම්]*

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* රිදෙනවා තමයි විපක්ෂයේ එතුමන්ලාට. *[බාධා කිරීම්]* රිදෙනවා තමයි. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉවසන්න. *[බාධා කිරීම්]* ගරු අමාත්‍යතුමනි, මම අහන්නේ මේකයි. එම නීති විරෝධී ක්‍රියාව එලෙසම සිදු වෙන්න ඉඩ හරිමින් කාලයක් තිස්සේ කටයුතු කළ බලධාරින් කවුද? ඒ වාගේම ඒ අය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඔබතුමා කටයුතු කරනවාද? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, සාමාන්‍යයෙන් මම විනාඩි 2ක් බලනවා. අර මන්ත්‍රීතුමියත් ගොඩක් වෙලා ප්‍රශ්නය ඇහුවා. විනාඩි 2ක් ගත්තාට පසුව තමයි මම - *[බාධා කිරීම්]*

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නයට මම මේ විධියට පිළිතුර ලබා දෙන්න කැමැතියි. එතුමා සඳහන් කරපු ආකාරයටම මේ නව වෙළෙඳ සංකීර්ණයේ වෙළඳ කුටි 93ක් තිබෙනවා. හැබැයි, පැරණි වෙළඳ සංකීර්ණය භාවිත කළ හැකිව තිබියදී තමයි මේ නව වෙළඳ සංකීර්ණය ඉදිකර තිබෙන්නේ. මේවා ගැන කියනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ටිකක් කෑ ගහන්නත් හිතෙනවා ඇති. ඒක සාධාරණයි. මේ වෙළඳ කුටි බදු දීමේදී බරපතළ ප්‍රශ්න මතු වී තිබෙන බව නිරීක්ෂණය වෙනවා.

විශේෂයෙන්ම වෙළඳ කුටි 32ක් කලින් බදු දුන් බදුකරුවන් නොමැතිව වෙනත් අයට භාවිත කරන්න අවසර දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපට ප්‍රශ්නයක් තිබෙනවා වෙනත් පුද්ගලයන්ට මේවා භාවිත කරන්න දුන්නේ කොහොමද, ඊට අදාළ මුදල් අය කර ගත්තේ කොහොමද සහ අපට නොපෙනෙන මුදල් අය කර ගැනීම් තිබුණා ද කියන එක ගැන. ඒ නිසා මන්ත්‍රීතුමා මතු කරපු ආකාරයට මේ පිළිබඳව අමාත්‍යාංශය මඟින් විධිමත් විමර්ශනයක් පවත්වලා, අයථා ලෙස මේ කඩ කාමර වෙනත් පුද්ගලයන්ට පරිහරණය කරන්න දීමත්, ඒ සඳහා ක්‍රියා කරපු අයට එරෙහිවත් අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තවත් කඩ කාමර 31ක් තවමත් කාටවත් දීලා නැහැ. පසුගිය කාලයේදී ඒ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ආයතන මට්ටමින් අරගෙන නැහැ. මේ සමහර ක්‍රියාකාරකම්වල දී, විශේෂයෙන් නව පළාත් පාලන ආයතන ස්ථාපිත කිරීමේදී සමහර කණ්ඩායම් විශේෂ උනන්දුවක් දක්වන්නේ ඇයි ද කියන කාරණයත් මේ වාගේ ප්‍රශ්න ඇතුළේ තිබෙනවා ද කියලා අපට හිතනවා. ඒ නිසා මේ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් විධිමත් විමර්ශනයක් කරලා යම් අයථා ක්‍රියාවක් සිදු වී ඇත්නම් ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපි කටයුතු කරනවා.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය පරිපාලනය විසින් සහ හිටපු නගරාධිපතිවරු, හිටපු නාගරික මන්ත්‍රීවරු ඇති කරලා තිබෙන, දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදර්ශනය කරලා තිබෙන මේ නීති විරෝධී වැඩකටයුතු සහ ආකාර්යක්ෂමතාව මැඩ පැවැත්වීම සඳහා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාව තිබේද?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, අකාර්යක්ෂමතාව පමණක් නොව, විනිවිදභාවයෙන් තොරව කටයුතු කිරීමත් මේ ක්‍රියාවලිය ඇතුළේ අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා කලින් පිළිතුරේදී සඳහන් කළ ආකාරයටම අපි අමාත්‍යාංශ මට්ටමින් විධිමත් විමර්ශනයක් කරලා ඒ අයථා කටයුතුවලට සම්බන්ධ පුද්ගලයන්ට නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

ලියාපදිංචි තේ කර්මාන්තශාලා: විස්තර
பதிவுசெய்யப்பட்ட தேயிலைத் தொழிற்சாலைகள்: விபரம்
REGISTERED TEA FACTORIES: DETAILS

864/2025

9. ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) අමු තේ දළු, නිමි තේ ලෙස නිෂ්පාදනය කිරීමේදී, වැදගත් කාර්යයක් තේ කර්මාන්තශාලා තුළ දී ඉටු කරනු ලබන බව පිළිගන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති ලියාපදිංචි තේ කර්මාන්තශාලා සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කර්මාන්තශාලා, අදාළ භූමිය තුළ භෞතිකව සත්‍ය වශයෙන්ම පිහිටා ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ බව ස්ථානීය පරීක්ෂණයක් මඟින් තහවුරු කර ගෙන තිබේද,

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) කවර හෝ හේතුවක් මත, ඉහත තේ කර්මාන්තශාලා/කර්මාන්තශාලාවක් මේ වනවිට නිමි තේ නිෂ්පාදනයෙන් බැහැර වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மொத்தத் தேயிலை உற்பத்தியில் சிறு தேயிலைத் தோட்ட உரிமையாளர்களின் பங்களிப்பு எத்தனை சதவீதம் என்பதையும்;

(ii) தேயிலைக் கொழுந்தை முடிவுத் தேயிலையாக உற்பத்தி செய்வதில், தேயிலைத் தொழிற் சாலைகளில் முக்கிய பணி மேற்கொள்ளப் படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) இலங்கையில் பதிவுசெய்யப்பட்ட தேயிலைத் தொழிற்சாலைகளின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்திற்கும் அமைய வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி தொழிற்சாலைகள் சம்பந்தப்பட்ட பிரதேசத்தினுள் பௌதிக ரீதியாக உண்மையாகவே அமைந்துள்ளதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(v) அவ்வாறெனில், அது கள சோதனையின்மூலம் உறுதிப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(vi) இன்றேல், அதற்குரிய காரணங்கள் யாவை என்பதையும்;

(vii) மேற்படி தேயிலைத் தொழிற்சாலைகள்/ தொழிற்சாலை ஏதேனுமொரு காரணத்தின் அடிப்படையில், தற்போது முடிவுத் தேயிலை உற்பத்தியிலிருந்து விலகியுள்ளனவா/ விலகியுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the tea smallholders' contribution to the total tea production in Sri Lanka as a percentage;

(ii) whether he accepts that the tea factories perform an important role during the production process from raw tea leaves to the finished good;

(iii) the number of registered tea factories in Sri Lanka located in each district, separately;

(iv) whether he accepts that the above-mentioned factories are actually located physically on the respective lands;

(v) if so, whether the aforesaid fact has been ascertained through an on-site inspection;

(vi) if not, the reasons for it; and

(vii) whether any of the above-mentioned tea factories/ any factory has departed from producing finished tea for any reason?

(b) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සමස්ත තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය සියයට 75ක් පමණ වේ.

(ii) ඔව්.

(iii)

	දිස්ත්‍රික්කය	ලියාපදිංචි තේ කර්මාන්තශාලා සංඛ්‍යාව	වර්තමානය වන විට තේ නිෂ්පාදනය සිදු කරන කර්මාන්තශාලා සංඛ්‍යාව (2015)
01.	බදුල්ල	62	57
02.	කොළඹ	02	01
03.	ගාල්ල	116	101
04.	හම්බන්තොට	01	01
05.	කළුතර	34	29
06.	මහනුවර	88	73
07.	කෑගල්ල	24	18
08.	මාතලේ	06	06
09.	මාතර	96	79
10.	මොනරාගල	00	00
11.	නුවරඑළිය	129	116
12.	රත්නපුර	104	86
	මුළු එකතුව	662	567

(iv) ඔව්.

(v) ඔව්. නව තේ කර්මාන්තශාලා ලියාපදිංචිය, අක්‍රිය තේ කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීමේදී හා තේ කර්මාන්තශාලා ලියාපදිංචිය අලුත් කිරීමේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ස්ථානීය

පරීක්ෂණයක් සිදු කර ලියාපදිංචිය ලබා දීම හෝ අලුත් කිරීම සිදු කරයි. තවද, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරින් විසින් සෑම තේ කර්මාන්තශාලාවක්ම මාසිකව පරීක්ෂා කර තේ කර්මාන්තශාලාවල තේ නිෂ්පාදනය, නිෂ්පාදන ක්‍රමවේද සහ සාධාරණ මිල සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කිරීම සිදු කරයි.

(vi) අදාළ නොවේ.

(vii) ඔව්. සක්‍රියව පවතින තේ කර්මාන්තශාලා පහත සඳහන් අවස්ථාවලදී තේ නිෂ්පාදනයෙන් බැහැරවීම හඳුනාගෙන ඇත.

(1) දුර්වල කළමනාකාරීත්වය හේතුවෙන් කර්මාන්තශාලා කෙටි කාලීනව නිෂ්පාදනයෙන් බැහැරවීම හඳුනාගෙන ඇත.

(2) ප්‍රමාණවත් දලු ලබා ගැනීමට නොහැකි වීම හා කළමනාකරණ තීරණ මත කර්මාන්තශාලා වසා දැමීම.

(3) අයිතිය සම්බන්ධ ගැටලු මත තේ නිෂ්පාදනයෙන් බැහැර වීම.

(4) ස්වාභාවික ආපදා හා පාරිසරික ගැටලු හේතුවෙන් තේ නිෂ්පාදනයෙන් බැහැර වීම.

(5) තේ පාලන පනත උල්ලංඝනය වන ආකාරයෙන්ම ක්‍රියා කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් කර්මාන්තශාලාවන්හි තේ නිෂ්පාදනය නිශ්චිත කාලයකට යටත්ව අත්හිටුවීම.

ඉහත හේතූන් මත වසා දැමෙන කම්හල් නැවත වරක් විවෘත කිරීම සිදුවන අතර, සමහර අවස්ථාවන්හිදී එම කම්හල් ස්ථිර වශයෙන්ම තේ නිෂ්පාදනයෙන් බැහැර වේ.

(ආ) අදාළ නොවේ.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම මේ ප්‍රශ්නය යොමු කරන අවස්ථාව වන විට මෙවැනි කථා බහක් රටේ ඇති වෙලා තිබුණේ නැහැ. තේ ක්ෂේත්‍රයට වගකියන එක්තරා ප්‍රධාන ආයතනයක ප්‍රධාන නිලධාරියෙකු විසින් ප්‍රකාශයට පත් කළා, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ විශාල කර්මාන්තශාලා තොගයක් වැසුණා කියලා මතයක්. ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනකොට එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. ඇත්තටම ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ඔබතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ඇති වෙච්ච මොකක් හරි විශේෂ තත්ත්වයක් නිසා තේ කර්මාන්තශාලා වැසී ගිය බවට හඳුනාගෙන තිබෙනවාද?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, මෙය පසුගිය දවසක අපේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් කරපු ප්‍රකාශයක්. එතුමා විසින් අතපසුවීමකින් කියපු කොටසක් සමහර මාධ්‍ය උපුටා දක්වමින් "නව රජය කාලය තුළ තේ කර්මාන්තශාලා දෙසිය ගණනක් වැසී ගියා" කියලා ප්‍රවෘත්තියක් පළ කළා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයි. පසුව සභාපතිවරයා ඇතුළු අපේ නිලධාරි මණ්ඩලය විසින් ඒක නිවැරදි කරනු ලැබුවා. නමුත් ඒකට පළමුවැනි ප්‍රවෘත්තියට තරම් ප්‍රමාණවත් කාලයක් සමහර මාධ්‍යවලින් ලබා දුන්නේ නැහැ.

ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයට අදාළව කිව්වොත්, මේ වෙනකොට තේ කර්මාන්තශාලා 213ක් වැසී ගිහින් තිබෙනවා. ඒ වැසී ගිය ඒවා 1986 සිට මේ දක්වා අදාළයි. මම ඔබතුමාට ඒ කිහිපයක් පිළිබඳව පැහැදිලි කරන්නම්. 2018 වසරේ 13ක් වැසී ගිහින් තිබෙනවා; 2019 වසරේ 17ක් වැසී ගිහින් තිබෙනවා; 2020 වසරේ 13ක් වැසී ගිහින් තිබෙනවා; 2022 වර්ෂයේ 14ක් වැසී ගිහින් තිබෙනවා; 2023 වසරේ 19ක් වැසී ගිහින් තිබෙනවා. මේ විධියට 2025 දක්වාම කර්මාන්තශාලා වැසී ගිහින් තිබෙනවා. 2025 වසරේ මේ වෙනකොට කර්මාන්තශාලා හයක් වැසී ගිහින් තිබෙනවා. මේවා වැසී යන්නේ මාසයෙන් දෙකෙන් ඇති වෙන තත්ත්වයන් තුළ නොවෙයි. 2025දී වැසී ගිය ඒවාට බලපෑ හේතු වුණත් මේ මාස දෙකක, තුනක කාලයට අදාළ ඒවා නොවෙයි. සමහර කර්මාන්තශාලා පවත්වා ගෙන යන්න එම ව්‍යාපාරිකයන්, කර්මාන්තශාලා හිමියන් දීර්ඝ කාලයක් සැහෙන්න මහන්සි ගන්න බව අපි දන්නවා. බැරිම මොහොතේ තමයි අත්හරින්නේ. මම ඉස්සෙල්ලා කියපු හේතූන් මත - ඒ කට්ටියගේ තිබෙන කළමනාකරණයේ දෝෂ මත, නැත්නම් දලු ප්‍රමාණවත් නොවීම මත- මේවා වසා දමනවා. මේ වාගේ දීර්ඝ කාලයක් අපේ රටේ පැවතුණු හේතු මත - අකාර්යක්ෂමතා සහ පැවතුණු රජයන්වල යම් යම් බලපෑම්, දුර්වලකම් මත - 1986 සිට මේ දක්වා කර්මාන්තශාලා 213ක් වැසී ගොස් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ "Ceylon Tea" නාමය ඉතාම ප්‍රචලිත එකක්; ලෝකයේ තවමත් පිළිගන්නා එකක්. ඒක නිසා ලෝකයේ සම්ප්‍රදායික තේ නිෂ්පාදකයා හැටියට අපට තවමත් ලොකු වගකීමක්, පිළිගැනීමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඇමතිතුමාට ඊළඟට යොමු කරන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන අනුව පසුගිය කාලයේ කර්මාන්තශාලා වැසී යාමට හේතු පාදක වෙච්ච කාරණයක් වෙනවා, මේකත්. ඉතාම අවිධිමත්, ඒ වාගේම අවිද්‍යාත්මකව පිහිටුවපු කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා. වාණිජ අරමුණක් ප්‍රමුඛ කොට පමණක් එහෙම බිහි කරපු කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් මේ රටේ තිබෙනවා. සමහර විට ඒවා වැසී යමින් පවතිනවා. සමහර ඒවා තවමත් මේ කර්මාන්තයට හානි කරමින් පවත්වාගෙන යනවා.

ඒ අතරේ, ඉතා හොඳින් විද්‍යාත්මකව රටේ අභියෝගයන්ට මුහුණ දෙන්නට පුළුවන් ආකාරයට තනියම නැඟී සිටීමේ වුවමනාවක් සහිත කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා, අපි දකිනවා. ඒවායේ හිමිකරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මම ඔබතුමාගෙන් අහන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. හඳුනාගෙන තිබෙන සංඛ්‍යාලේඛන සියල්ල එක්ක, එවැනි රටට වැදගත්, විද්‍යාත්මකව පිහිටවපු, ඇත්තටම එකම අරමුණ වාණිජ අරමුණක් කර නොගත්, අපේ රටේ තේ කර්මාන්තයේ උන්නතියට බර අදින්න ලෑහැස්ති එවැනි කර්මාන්තශාලා හඳුනාගෙන ඒ සඳහා වෙච්ච විශේෂ වැඩ පිළිවෙළක් ඔබතුමා අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ සකසා තිබෙනවාද? ඒ සඳහා දැක්මක් තිබෙනවාද කියන අදහසත් දැන ගන්න කැමැතියි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔබතුමා ඇහුවා වාගේ, අපේ රටේ සමහර තේ කර්මාන්තශාලා පිහිටුවා තිබෙන්නේ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් නොවෙයි.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

සමහර දේශපාලන වුවමනාවන් මත සහ සමහර ෆැක්ටරි හිමියන්ගේ වුවමනා මත යම් යම් විධියට පිහිටවපු ඒවා නිසා, ඒ ආසන්නයේ තිබෙන තවත් කර්මාන්තශාලාවලටත් එයින් බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. අපි නව රජය හැටියට තීන්දු අරගෙන තිබෙනවා, නව තේ කර්මාන්තශාලාවකට අනුමැතියක් දෙනවා නම් නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව තමයි ඒ කර්මාන්තශාලාවලට අනුමැතිය ලබා දෙන්නේ කියලා. මම මුලින් පැහැදිලි කළා වාගේම අපේ රටේ තේ කර්මාන්තශාලා හිමියන් මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි දැනට සමහර කර්මාන්ත පවත්වාගෙන ගියත් උපරිම ධාරිතාවයෙන් ඒවා පවත්වාගෙන යන්නේ නැති එක. ඒවාට අවශ්‍ය දලු ප්‍රමාණය නැහැ. ඔවුන්ට අවශ්‍ය ආදායම් ප්‍රමාණයකුත් උත්පාදනය කරගන්න අපහසුයි. ඔබතුමා කිව්වා වාගේ ලෝකයේ සමහර රටවල් ලංකාව හඳුනා ගත්තේ, "Ceylon Tea" කියන නාමය තුළයි. ලංකාවේ තේ කර්මාන්තය ඉතාම අර්බුදකාරී තත්ත්වයකට වැටිලා තිබෙනවා. අපේ තේ කර්මාන්තය ඒ තත්ත්වයෙන් ගලවා ගන්න, ඒ තත්ත්වය නිවැරදි කරන්න අදාළ උපාය මාර්ගික සැලැස්මක් අමාත්‍යාංශය හැටියට අපි සකස් කරලා තිබෙනවා. ගිය අවුරුද්ද වෙන කොටත් අපේ රටේ නිමි තේ නිෂ්පාදනය තිබුණේ, කිලෝග්‍රෑම් මිලියන 262යි.

අපි සැලසුම් කරලා තිබෙනවා, 2030 අවුරුද්ද වන විට නිමි තේ කොළ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 400 දක්වා ගෙනියන්න. ඒ ප්‍රමාණය නිෂ්පාදනය කරන්න නම් දලු ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑ. ඒ දලු ප්‍රමාණය වැඩි වෙනකොට, කර්මාන්තශාලාවලට අවශ්‍ය දලු ටික ලැබෙනකොට, ඒ කර්මාන්තශාලාවල ධාරිතාව ඉහළ යනවා. එතකොට ඔවුන්ට ලාභ ලැබීමේ හැකියාව ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව ඔබතුමා අහපු ආකාරයට වැසී ගිය කර්මාන්තශාලා යම් ප්‍රමාණයක් ආපහු විවෘත කර ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒකට අපි සූදානම් වෙනවා.

ගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදීත් කිව්වා, ඌන උපයෝජිත ඉඩම් සහ යම් රාජ්‍ය දේපළ ඌන උපයෝජිතව තිබෙනවා නම්, පෞද්ගලික අංශයත් එක්ක සම්බන්ධ කරලා ඒවා ඵලදායී මට්ටමට ගෙන එන්න අපි සූදානම් කියලා. ඒ අනුව අපේ අමාත්‍යාංශය දැන් සූදානම් වෙලා තිබෙනවා, වැසී ගිය කර්මාන්තශාලා හා ඌන උපයෝජිත තේ වතු නැවත වගා කිරීමේ වැඩ පිළිවෙළක් හදන්න. ඒ අතර වැසී ගිය කර්මාන්තශාලා යම් යම් ආයෝජකයන්ට විනිවිදභාවයකින් යුතුව ඉදිරියේදී ලබා දෙන්නත් අපි සූදානමින් ඉන්නවා. වගාව වැඩිදියුණු වෙනකොට, කර්මාන්තශාලා හිමි වෙනකොට, ලෝක වෙළෙඳ පොළේ යම් ප්‍රමාණයක් අපි අත් පත් කර ගන්නා විට, ඔබතුමා අහපු ප්‍රශ්නය අනුව ඒ කර්මාන්තශාලා හිමියන්ට යම් සාධාරණයක්, විසඳුමක් ලැබෙයි කියලා මම හිතනවා. කොහොම නමුත් ඒ කර්මාන්තශාලා හිමියන් මුහුණ දෙන ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මම මේ වන විට තව සතියකින් වාගේ දිනයක් යොදාගෙන තිබෙනවා. අදාළ කර්මාන්තශාලා හිමියනුත් ගෙන්වා අපි ඔවුන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කරනවා. ඒ අනුව ඔවුන් මුහුණ දෙන ප්‍රශ්නවලට අමාත්‍යාංශයක් හැටියට අපට ලබා දිය හැකි සහන, පිළිතුරු ලබා දෙන්න අපි සූදානමින් ඉන්න බව මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

සමාජ මාධ්‍ය තුළ පළවන ජාතිවාදී, ආගම්වාදී සහ ද්වේශ සහගත ප්‍රකාශ: වැළැක්වීමේ ක්‍රියාමාර්ග
சமூக ஊடகங்களில் பதிவிடப்படும் இனவாத, மதவாத மற்றும் வெறுப்புணர்வுக் கூற்றுகள்: தடுப்பதற்கான நடவடிக்கை
RACIST, RELIGIOUS AND HATEFUL STATEMENTS MADE ON SOCIAL MEDIA: PREVENTIVE MEASURES

515/2025

1. ගරු අජිත් අගලකඩ මහතා (ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் அகலகட - மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க சார்பாக)
(The Hon. Ajith Agalakada on behalf of the Hon. (Dr.) Najith Indika)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මියගිය ජනතාව සිහිකිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජාලා තුළ රජය අපකීර්තියට පත්වන ආකාරයේ ප්‍රචාර සිදු කරන ලද බව දන්නේද;

(ii) සමාජ මාධ්‍ය තුළ සංවිධානාත්මක ආකාරයෙන් ජාතිවාදය, ආගම්වාදය සහ ද්වේශ සහගත ප්‍රකාශ සිදු කිරීමට එරෙහිව මේ වන විට බලපැවැත්වෙන නීතිමය ප්‍රතිපාදන කවරේද;

(iii) ඒ අතරින් පසුගිය කාලයේදී වැඩි වශයෙන් යොදා ගෙන ඇති පනත් කවරේද;

(iv) මාධ්‍ය මඟින් අසත්‍ය කරුණු ප්‍රචාරය වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිවැරදි සත්‍ය තත්ත්වය පිළිබඳව රජය විසින් කරනු ලබන පැහැදිලි කිරීම කඩිනමින් ප්‍රචාරය නොවීම හේතුවෙන් ඇති වන අපකීර්තිය වැළැක්වීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබේද;

(v) මෙම තත්ත්වය නිවැරදි කිරීමට සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් නැවත ඇති නොවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் வடக்கு மாகாணத்தில் இடம்பெறும் இறந்தவர்களை நினைவுகூரும் நினைவேந்தல் நிகழ்வுகள் தொடர்பில் சமூக ஊடகங்களில் அரசாங்கத்திற்கு அவப்பெயரை ஏற்படுத்தும் வகையில் பிரசாரங்கள் மேற்கொள்ளப்படுவதை அறிவாரா;

(ii) சமூக ஊடகங்களில் ஒழுங்கமைக்கப்பட்ட விதத்தில் இனவாத, மதவாத மற்றும் வெறுப்புணர்வுக் கூற்றுகள் பதிவிடப்படுவதற்கு எதிராகத் தற்போது நடைமுறையிலுள்ள சட்ட ஏற்பாடுகள் யாவை;

(iii) இச்சட்டங்களில் கடந்த காலத்தில் அதிகமான சந்தர்ப்பங்களில் பயன்படுத்தப்பட்ட சட்டங்கள் யாவை;

(iv) ஊடகங்களில் உண்மைக்குப் புறம்பான விடயங்கள் பிரசாரம் செய்யப்பட்ட பின்னர் இவற்றின் உண்மை நிலை தொடர்பாக

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

அரசாங்கத்தினால் முன்வைக்கப்படும் விளக்கங்கள் விரைவாகப் பிரசாரம் செய்யப்படாமையினால் ஏற்படக்கூடிய இழுக்கினைத் தடுத்து நிறுத்துவதற்கு ஏதேனும் வேலைத் திட்டம் தயாரிக்கப்பட்டுள்ளதா;

(v) இந்நிலையை நிவர்த்தி செய்வதற்கும் எதிர்காலத்தில் இவ்வாறான நிலைமைகள் மீண்டும் ஏற்படாமலிருப்பதற்கும் மேற்கொள்ளக் கூடிய நடவடிக்கைககள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House-

(i) whether he is aware that propaganda in the nature of defaming the Government has been carried out on social media regarding the commemoration of the dead persons of the Northern Province of Sri Lanka;

(ii) the legal provisions currently in force against the making of organized racist, religious and hateful statements on social media;

(iii) the Acts most frequently used in the past, out of those referred to above;

(iv) whether a course of action has been developed to prevent the defamation caused to the Government by the failure to promptly give the correct factual explanation of the Government after misinformation has been disseminated by the media; and

(v) the measures that will be taken to rectify this situation and to avoid any recurrences of such in the future?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

- 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත
- 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය - අයි.සී.සී.පී.ආර් - පනත
- දණ්ඩ නීති සංග්‍රහය
- පොලිස් ආඥාපනත
- 1958 අංක 41 දරන මිථ්‍යා දෘෂ්ටික ප්‍රකාශන පිළිබඳ ආඥාපනත
- 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික පනත

(iii) මේ සම්බන්ධව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සතුව දත්ත නොමැති අතර, පවතින නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව අදාළ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා පොලීසිය විසින් ගනු ලැබේ.

(iv) මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතී.

(v) ඔව්.

මෙම තත්ත්වය සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී ඇති අතර, මාධ්‍ය මඟින් අසත්‍ය කරුණු ප්‍රචාරය වැළැක්වීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක අවශ්‍යතාව හඳුනාගෙන ඊට අදාළව සැලසුම් සකස් කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19(2)(ඇ) යටතේ මම යෝජනාවක් ඉදිරිපත් කරනවා. ස්ථාවර නියෝග යටතේ ඒක මගේ අයිතිය. ගරු මන්ත්‍රීවරුන් විසිදෙනෙකුට වැඩි පිරිසක් අනුමැතිය ලබා දීලා තිබෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කරන්න.

[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසිදෙනෙක් සිය අසුන්වලින් නැඟී සිටියහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்களில் இருபது பேர் தமது ஆசனங்களிலிருந்து எழுந்து நின்றனர்.]
[At this stage, twenty Hon. Members of the Opposition rose from their seats.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඉදිරිපත් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විශේෂයෙන්ම මේ අවස්ථාව වන විට ඊශ්‍රායල-ඉරාන යුද්ධය කේන්ද්‍ර කරගෙන බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රටේ ශ්‍රමිකයින් 10,000ත් 20,000ත් අතර පිරිසක් ඊශ්‍රායලයේ රැකියා කරනවා.

ඒ අයගේ ජීවිත ආරක්ෂාව පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම අපේ රටේ තේ අපනයන ගමනාන්තයක් හැටියට ප්‍රධාන තැනක් ගන්නවා, ඉරානය. විශේෂයෙන්ම මේ යුදමය තත්ත්වය තුළ තේ කර්මාන්තයට, ඒ වාගේම අපේ අපනයනවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන බරපතළ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම අත්‍යවශ්‍යයි. ඒ වාගේම මේ යුදමය තත්ත්වය නිසා තෙල් මිල හරහා විශේෂයෙන්ම අපේ රටේ ආර්ථික වර්ධනයට, නිෂ්පාදන ධාරිතාවට, කර්මාන්ත පද්ධතියට, සේවා පද්ධතියට, කෘෂිකර්මික පද්ධතියට ඇති විය හැකි බලපෑම පිළිබඳව, ග්‍රාමීය, නාගරික, වතු කියන සමස්ත ජන පරපුරටම සිදු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වන අගතිගාමී තත්ත්වය පිළිබඳව විධිමත් සාකච්ඡාවකට අපි ප්‍රවේශ වෙන්න ඕනෑ. ඒ වාගේම Strait of Hormuz වසා දැමීම පිළිබඳ තර්ජනයකුත් අද මතු වෙලා තිබෙනවා. ඒ වාගේම සීමාසහිත වූ න්‍යෂ්ටික අවි යුද්ධයක - limited theatre nuclear war එකක - බලපෑමත් අද නිර්මාණය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා හදිසි තත්ත්වයක් මත අපේ සමස්ත ආර්ථිකයට සිදු වන බලපෑම, ඒ වාගේම කලාපීය ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව රජයේ වැඩ පිළිවෙළ මොකක්ද, රජයේ ස්ථාවරය මොකක්ද, රජයේ මැදිහත් වීම මොකක්ද, ඒ ප්‍රශ්නවලට රජය ලබා දෙන උත්තර මොනවාද කියලා දැන ගැනීම සඳහා අදාළ ස්ථාවර නියෝග අත්හිටුවා අද දිනයේ, එසේ නොමැති නම් හෙට දිනයේ අපට විවාදයක් අවශ්‍යයි. මොකද, ඒ පිළිබඳව අපට විධිමත් උත්තරයක් ලැබුණේ නැහැ. තනි තනිව එක් එක් ඇමතිවරයා ඇවිල්ලා මේ සම්බන්ධව කරන ප්‍රකාශවලින් අපට සෑහීමකට පත් වන්නට බැහැ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගෙන් අපි උත්තරයක් බලාපොරොත්තු වෙනවා. මේ ගැටලු පිළිබඳව විපක්ෂයත්, රාජ්‍ය පාර්ශ්වයත් සම්බන්ධ කර ගත් විධිමත් විවාදයක් අද දිනයේ හෝ හෙට දිනයේ අපට අවශ්‍යයි. දැනටමත් එය පරක්කුයි. ඒ නිසා ඒ අවස්ථාව හැකි නම් අද දිනයේ, අද අපහසු නම් හෙට දිනයේ සෑහෙන වෙලාවක් වෙන් කරලා අපට ලබා දෙන්න. මේ විවාදය අත්‍යවශ්‍යයි. ඒ පිළිබඳව පසුව නොවෙයි, මේ මොහොතේ ඔබතුමාගෙන් අපි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මේ කාරණය ගැනමද කථා කරන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ මගේ නමින්. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මේක ඉතාම වැදගත් කාරණයක්; ජාතික වශයෙන් වැදගත් කාරණයක්. ස්ථාවර නියෝග 19(3) අනුව අද දින පස්වරු 3.30ට මේ විවාදය ගන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා දැන් කාරණය ඉදිරිපත් කරලා නේ තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම නේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඕක තමයි ඔබතුමාගේ ප්‍රශ්නය. ස්ථාවර නියෝග 19(3) අනුව අද දින සවස 3.30ට මේ විවාදය ගන්න පුළුවන්. මේක ජාතික වශයෙන් වැදගත් කාරණයක්. රජයට මොනවා හෝ විශේෂ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අද දින මේ විවාදය ගන්න බැරි නම් ඒක ගැන කථා කරන්න අපි ලැහැස්තියි. මගේ නමින් යෝජනාව ඉදිරිපත් කරලා තිබියදී මේ විධියට ඔබතුමා මගේ mike එක off කරලා හරියනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාවම තමයි විපක්ෂ නායකතුමාත් ඉදිරිපත් කළේ. ගරු සභානායකතුමනි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ නමින් ඇති, ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ එකඟතාව මොකක්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19(1) යටතේ විපක්ෂ නායකතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. එම ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, මන්ත්‍රීවරුන් 20දෙනෙකු නැඟිටලා ඉල්ලුවාම කථානායකතුමාට ඒ සම්බන්ධව තීරණයක් ගන්න පුළුවන් කියලා. ගරු කථානායකතුමනි, ඒ වාගේම ස්ථාවර නියෝග 19(3)හි පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "යෝජනාවට එසේ අනුග්‍රහය ලැබේ නම් නැතහොත් පාර්ලිමේන්තුව විසින් අවසර දෙනු ලබන්නේ නම්, එම යෝජනාව පිළිබඳව අ.භා. 3.30ට පාර්ලිමේන්තුව විසින් ක්‍රියා කරනු ලැබිය යුත්තේ ය."

ඒ අනුව ආණ්ඩු පක්ෂයේ සහයෝගය අවශ්‍ය වෙනවා, මේ යෝජනාව ඉදිරියට විවාද කරන්න. අපි ස්ථාවර නියෝග අනුව මේ ප්‍රශ්නය පිළිබඳව සලකා බලන්න කැමැතියි. ඔබතුමා දන්නවා, අද සවස 3.30ට තමයි මේ විවාදය ගන්න පුළුවන් වන්නේ කියලා. ඒ වාගේම අද ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන ලද අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරන්න නියමිතයි. හැබැයි, කල් තැබීමේ විවාද දෙකක් ගන්න බැහැ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]* ඇහුම්කන් දෙන්න. ඒ නිසා අපි කියන්න කැමැතියි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ සභාව කල් තැබීමේ යෝජනාව වෙනුවට මේ විවාදය අද සවස 3.30 සිට 5.30 වෙනකම් ගන්න කැමැති නම් අපි ඒකට අනුමැතිය දෙන්න එකඟ බව. ඒ වාගේම මේ යෝජනාව ඔබතුමන්ලා ඉදිරිපත් කරද්දීම මම කියන්න ඕනෑ, මේ විවාදය ඊයේ පැවැත්වුණු බවත්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ. එහෙම,- *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ කාරණය අහගන්න. ගරු විපක්ෂ නායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අවුල තිබෙන තැන තමයි ඔබතුමාගේ පක්ෂයේ නායකයෝ වැඩි වීම. ඔබතුමා විපක්ෂ නායක. ඔබතුමා දෙයක් කිව්වාට පස්සේ ඒක උස්සාගෙන යන්න මේ සභාවේ තව ගෝලයෝ ගොඩක් හදන්න එපා. ඔබතුමා ස්ථාවර නියෝග 19(1) යටතේ යෝජනාවක් ඉදිරිපත් කළා. අපි දන්නවා, ඒ යටතේ තමයි මේ ඔක්කෝම තිබෙන්නේ කියලා. ගරු කථානායකතුමනි, හැම වෙලාවේම පණ්ඩිතයෝ දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා, ඒ පණ්ඩිතයන්ට අවශ්‍යයි, - *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමනි, ඒ නිසා අපි ඔබතුමාට කියන්න කැමැතියි, පණ්ඩිතයන් එක්ක යන්න ගිහිල්ලා ඔබතුමා අමාරුවේ වැටෙන බව. ගරු කථානායකතුමනි, ඊයේ අපේ ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය මේ ගැන සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. *[බාධා කිරීමක්]* ඇහුම්කන් දෙන්න, පොඩ්ඩක්. ඔය යෝජනාව සම්මත වෙන්න තිබෙනවා. මොකද, මේ ප්‍රශ්නය අපි සාකච්ඡා කරලා ඉවරයි. මේ ප්‍රශ්නය ඊයේ ගීතා හේරත් මැතිනිය ඉදිරිපත් කළා, විදේශ කටයුතු ඇමතිතුමා ඉතා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා, ඉරාන තානාපති

කාර්යාලය ඇතුළු ඒ සියලු විස්තර ගැන; මේ ගැන රජයේ ස්ථාවරය, රජය අරගෙන තිබෙන ක්‍රියාමාර්ග ගැන ඔක්කෝම විස්තර කිව්වා. ඒ නිසා මේ විවාදය කරපු විවාදයක්. අද වුණත් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන්න තිබුණු කාරණයක්. ඒ වාගේම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ සභාව කල් තැබීමේ යෝජනාව වෙනුවට දාන්න තිබුණු දෙයක්. *[බාධා කිරීමක්]* ඇහුම්කන් දෙන්න. ගරු කථානායකතුමනි, මම ඒකයි කිව්වේ. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයෙක් ඉන්නවා, විපක්ෂ නායකතුමාත් ඉන්නවා. අපි එහෙම නේ කරන්නේ. අපි 159දෙනාම කථා කරන්නේ නැහැ නේ. ඒ නිසා කරුණාකරලා පාර්ලිමේන්තුවේ මේ අවුල හැදෙන තැන බලන්න. විපක්ෂ නායකතුමා කථා කරනවා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කරනවා. හැබැයි, තව දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා, ඒ අයටත් හැම දෙයක්ම කියන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉස්සර අනුර කුමාර මහත්තයාත් එහෙමයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අනුර කුමාර මහත්තයා විතරයි. *[බාධා කිරීමක්]* විජිත හේරත් සහෝදරයාවත්, හරිනි සහෝදරියවත් කථා කරන්න ගියේ නැහැ. පක්ෂයක් කරන්න ඉගෙන ගන්න; පක්ෂයක් කරන්න ඉගෙන ගන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, - *[බාධා කිරීමක්]* ඉතාම පැහැදිලියි, - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, ඒ නිසා අපි කියන්න කැමැතියි, අප පාර්ලිමේන්තුවේ,- *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද පස් වරු 3.30 ඉඳලා 5.30 වෙනකල් මේ විවාදය කරන්න පුළුවන්. අපි ඒකට එකඟතාව ලබා දෙනවා. නමුත්, අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි, මේ විවාදය අද උදේත් කරන්න තිබුණා කියන එක. ස්ථාවර නියෝග 27(2) යටතේ අද උදේත් එය ඉදිරිපත් කරන්න තිබුණා. ඒ නිසා විපක්ෂයක් වශයෙන් ඔබතුමන්ලාගෙන් අපි මීට වඩා වගකීම්සහගත හැසිරීමක් බලාපොරොත්තු වෙනවා. අපට දැනුත් පුළුවන්, ඔබතුමන්ලාගේ මේ යෝජනාව,- *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තුවේ අනුමත වෙන්න ඕනෑ, මේ යෝජනාව. මන්ත්‍රීවරු 20ක් නැඟිට්ටත් මදි. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(ඌ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය;"

ගරු සභානායකතුමා දැන් කියනවා, අපේ පක්ෂයේ නායකයෝ වැඩියි කියලා. අපේ පක්ෂය, ඔබතුමන්ලාගේ එක පක්ෂයක් වාගේ නොවෙයි. පක්ෂ 12ක් මෙතැන ඉන්නවා. නායකයෝ 12කට වැඩිය ඉන්නවා. ඒ නිසා ඒක තීරණය කරන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, මේක තනි දේශපාලන පක්ෂයක් නොවෙයි; දෙදෙනෙකුගේ, තුන්දෙනෙකුගේ පක්ෂයක් නොවෙයි. ගරු කථානායකතුමනි, ඊයේ නිකම් ප්‍රශ්නයක් අහලා ප්‍රශ්න 5කට උත්තර දුන්නා. විවාදයක් කළේ නැහැ. අපි කියන්නේ,- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, අද හවස 3.30ට මේ යෝජනාව,- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point එක මොකක්ද? කරුණාකර අනෙක් මන්ත්‍රීවරු අසුන් ගන්න. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපි ඉල්ලීමක් කරනවා,- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, දැන් ආණ්ඩු පක්ෂයෙන්,- *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපි ඉල්ලීමක් කරනවා. [බාධා කිරීම්] අපි ස්තුතිවන්ත වනවා, මේ විවාදය ලබා දෙන්නට කටයුතු කිරීම පිළිබඳව. මේ අවස්ථාවේදී අපි ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මේ බරපතළ ප්‍රශ්නය පිළිබඳව කථා කරන්නට පැය දෙකක කාල සීමාවක් ප්‍රමාණවත් නැහැ, ගරු සභානායකතුමනි. අපි සාධාරණ වෙන්න කැමැතියි. මේ පිළිබඳව අද සවස හෝ හෙට දවසේ,- [බාධා කිරීමක්] මේ කටයුතුවලට බාධා කරන්න අපි උත්සාහ කරන්නේ නැහැ. මේ විවාදය සඳහා වැඩි වෙලාවක් අපට අවශ්‍යයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, "අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා" කියන එක. පණ්ඩිතයෝ තමයි අපි ඇසුරු කරන්නේ. ක්‍රියාවෙන් බාල අය නොවෙයි. ඒ නිසා මම සතුටු වෙනවා, පණ්ඩිතයෝ කණ්ඩායමක් එක්ක කටයුතු කරන්න ලැබීම ගැන. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඉල්ලා සිටින විවාදය අද දින සවස 3.30 සිට 5.30 දක්වා පැවැත්වෙනවා.

ප්‍රධාන වැඩ කටයුතු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉන්න, ඉන්න. අපට වෙලාව කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින සවස 3.30 සිට 5.30 දක්වා එම විවාදය පැවැත්වෙනවා. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, සවස 5.30 වෙනකල් මේ සියලුදෙනාටම සභාවේ රැඳී සිටින්න කියා නියෝගයක් දෙන්න කියලා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු අධිකරණ අමාත්‍යතුමා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඉඳගන්න.

Hon. Minister, you have 16 minutes.

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත: නියම
வெளிநாட்டு தீர்ப்புகளைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவு செய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டம்: கட்டளைகள்
RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS ACT: ORDERS

[පූ.භා. 10.49]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 28 දිනැති අංක 2429/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියමයන් අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, මම ඉස්සෙල්ලාම සමාව ඉල්ලන්න ඕනෑ, ගැලරියේ ඉන්න පාසල් ළමයින්ගෙන්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැසිරිය යුත්තේ මේ විධියට නොවෙයි. හැබැයි, මේක හැම දාම වනවා. නමුත්, ඔයගොල්ලන් විපක්ෂයේ ඉන්න අන්කල්ලා දිහා බලලා තේරුම් ගන්න ඕනෑ, වැඩිහිටියෝ වුණාම කවදාවත් මේ විධියට නම් කටයුතු කරන්නේ නැහැ කියලා. මෙහෙම වුණොත් ලොකු අපරාධයක්.

ගරු කථානායකතුමනි, අද දින අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වන නියමයන් පිළිබඳව පැහැදිලි කිරීමට පෙර මා එහි පසුබිම පිළිබඳව පැහැදිලි කරන්න කැමැතියි. අපේ රටේ නීතියක් තිබුණේ නැහැ, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධව. එම නිසා 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත පාර්ලිමේන්තුවේ සම්මත වුණා. එහෙත් එම සම්මත වූ පනත නිසි ලෙස ක්‍රියාවට නැඟුණේ නැහැ. මක්නිසාද, කුමන රටවල, කුමන අධිකරණවලින් ලබා දෙන නඩු තීන්දු ද මේ රටේ අන්‍යෝන්‍යාව පිළිගත යුත්තේ, ලියාපදිංචි කළ යුත්තේ කියන කරුණු ගැසට් පත්‍රයේ පළ කරන්නට ඕනෑ.

අද පනත ගැන විවාදයක් නැතත්, මෙම ගැසට් පත්‍රයේ අඩංගු කරුණු අවබෝධ කර ගැනීම සඳහා මම ඉතා සංක්ෂිප්තව මේ කාරණය සඳහන් කරන්න කැමතියි. ඒ අනුව යම් විදේශ රටක දුන් අවසානාත්මක නඩු තීන්දුවක් අපේ රටේ අධිකරණ හරහා බලාත්මක කරන්න මෙම පනත අදාළ වනවා. හැබැයි, පැහැදිලිවම මොන ආකාරයේ නඩුද, විදේශයන්හි දුන් මොන ආකාරයේ නියෝගයන්ද මෙම රටේ ලියාපදිංචි කරලා බලාත්මක කරන්න පුළුවන් කියන කාරණාව සඳහන් වෙන්නේ මෙම පනතේ 2වන සහ 3වන වගන්තිවලයි. 3වන වගන්තිය යටතේ උපවගන්ති රාශියක් තිබෙනවා. ඒ සියල්ලම සමස්තයක් වශයෙන් ගත් කළ පෙනෙනවා, ණයගැතියන් සහ ණය හිමියන් අතර විදේශ රටකදී ඇති වුණු ආරාවුලකදී ඒ දීපු නඩු තීන්දුව අනුව අදාළ කොන්දේසි සපිරෙනවා නම් ඒවා ලංකාවේ අධිකරණයක බලාත්මක කරන්න පුළුවන් කියන කාරණාව.

අනෙක් කාරණය මේකයි. අපට මේක වඩාත්ම පහසු වෙන්නේ විදේශ රටක දෙන දික්කසාද නියෝගයක් - divorce order එකක් - සම්බන්ධයෙන් මෙය බලාත්මක වීමේදීයි. අපේ නීතිඥ මහත්වරු සහ මහත්මීන් අපට නිතරම කියපු කාරණාවක් තමයි, ඒක එම පාර්ශ්වයන්ට පහසුවක් බව. එම වර්ගයේ නඩු දෙකටම විදේශ රටකදී යම් අවසානාත්මක තීන්දුවක් ලබා දීලා තිබෙනවා නම් ඒක මේ රටේ බලාත්මක කරන්න පුළුවන්. ඒක එම පාර්ශ්වයන්ටත් පහසුවක් වාගේම වියදම් අඩු වීමකුත් වනවා, නැවත ලංකාවේ නඩු අහන්න අවශ්‍ය වෙන්නේ නැති නිසා. නමුත්, ඒ වෙනුවෙන් සපුරන්න ඕනෑ කොන්දේසි රාශියක් පනත යටතේ තිබෙනවා. මම ඒවා සියල්ලම කියන්නේ නැහැ. නමුත්, ඒක තමයි මූලික හරය වුණේ.

ඒ වාගේම කිහිපදෙනෙක් අපෙන් ප්‍රශ්න කළා, වෙනත් රටවල දෙන දණ්ඩන නියම ගැන. ඒවා මේකට අදාළ වෙන්නේ නැහැ.

මොකද, අපි බැලුවොත්, පනතේ 3(2) උපවගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

> "විදේශීය රටක අධිකරණයක නඩු තීන්දුවක් යටතේ ගෙවිය යුතු යම් බදු, අය කිරීම්, දඩ මුදල් හෝ වෙනත් දණ්ඩන සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය."

ඒ කියන්නේ, දණ්ඩන, අපරාධ නඩු, වෙනත් බදු සම්බන්ධයෙන් වූ නඩු මෙයට අදාළ වෙන්නේ නැහැ. පැහැදිලිව මෙය ණයගැතියන් සහ ණයහිමියන් අතර ආරාවුල් සහ දික්කසාද නඩුවලට සීමා වෙලා තිබෙනවා. ඒ වාගේම පනතේ අනෙක් වගන්තිවලින් කියා තිබෙනවා, ඒ නඩු තීන්දු ලංකාවේ බලාත්මක කරන්නේ කොහොමද කියලා. නමුත් ගැටලුව වුණේ, ඒ රටවල් ටික මොනවාද කියා නම් කරලා, ඊට අදාළ ගැසට් පත්‍රයක් පළ වුණේ නැතිකමයි. ඒ නිසා මේ පනත ක්‍රියාවට නැඟුණේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ අනුව මේක බලාත්මක කර ගන්න අමාත්‍යවරයා වශයෙන් මට ඇති බලතල අනුව මම ගැසට් පත්‍රයක් publish කළා. ඒ publish කළ ගැසට් පත්‍රය අද නියමයන් වශයෙන් අනුමත කර ගැනීම සඳහා තමයි මෙම විවාදය පවත්වන්නේ. එතකොට, මෙයින් සැහෙන ප්‍රශ්න ප්‍රමාණයක් ඒ විෂයය සම්බන්ධයෙන් වෙනස් කර ගන්නට පුළුවන් වනවා. එය පැහැදිලිව කියනවා නම්, "2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2වන වගන්තියේ (1)වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය, හර්ෂණ නානායක්කාර වන මා විසින්, එකී පනතේ I වන කොටසේ විධිවිධාන මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති විදේශීය රටවල අධිකරණ නඩු තීන්දු සම්බන්ධයෙන් අදාළ විය යුතු යයි මේ නියමය මඟින් ප්‍රකාශ කර සිටිමි" කියලා ගැසට් පත්‍රයේ සඳහන් වනවා. මෙම ගැසට් පත්‍රයේ උපලේඛනය යටතේ රටවල් 53ක් ගැසට් කරලා තිබෙනවා. අපේ නීති පද්ධතිය අන්‍යෝන්‍යව පිළිගන්නා වූ නීති පද්ධති ඇති රටවල් 53කින් මේක සමන්විතයි. අපි විදේශ කටයුතු, විදේශ රැකියා අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරලා, එම රටවල් 53 මොනවාද කියා ගැසට් පත්‍රයේ ඇතුළත් කර තිබෙනවා. එම රටවල් මොනවා ද කියලා මම දැන් කියන්න යන්නේ නැහැ. නමුත්, මෙම ගැසට් පත්‍රයෙන් පැවැති ප්‍රශ්නය විසඳීම සිද්ධ වනවා. මා විශ්වාස කරනවා, ගැටලුවකින් තොරව අද දිනයේදී මෙම නියමයන් සම්මත කර ගන්න හැකි වෙයි කියලා.

ගරු කථානායකතුමනි, අද දින විෂය පථයෙන් බැහැරව මම පොඩ්ඩක් වෙනත් කාරණයක් පිළිබඳව කථා කරන්නට කැමතියි. අපි, අපේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්නට කොච්චර උත්සාහ කළත් තවම ඒ සංස්කෘතිය යම් යම් තැන්වල හිර වෙලා වෙනස් වෙනවා. මාධ්‍යවලත් වැඩි වෙනසක් නැහැ. අපි භාෂණයේ නිදහසට, මාධ්‍ය නිදහසට ගරු කරනවා. සමහරු අසත්‍ය ප්‍රවෘත්ති මවනවා. තව සමහරු නිවැරදි ප්‍රවෘත්ති ලබා ගන්නවා. නිවැරදි තොරතුරු ලබාගෙන වැරදි ඉදිරිපත් කිරීම් නිසා ජනතාව නොමඟ යවනසුලු ආකාරයේ දේවල් වෙනවා.

Let me continue in English, Hon. Speaker. Last Sunday, there was an article in a reputed Sunday newspaper. As you are aware, we, on a policy basis, did say that we will take steps to abolish the pension of Parliamentarians who had served just five years and also that we will attend to the Presidents Entitlements Act to take away the privileges which we thought was immoral for an ex-President to have. For that purpose, we have been working on the subject for a while. And, last Monday, I presented a Cabinet Paper for those two Acts - the Presidents Entitlements Act and the Parliamentary Pensions Act - to be repealed with repeal Acts and that proposal was accepted by the Cabinet. So, accordingly, I am in the process of taking the next steps to bring in those two laws to repeal the Presidents Entitlements Act and the Parliamentary Pensions Act in the near future after the due course of procedure has been followed. But, what happened, Sir, is that a particular newspaper, after an RTI request, has obtained information of the Action Plan of the Ministry of Justice and National Integration and made a headline news that the Government has reversed its policy, but not in the words "Presidents Entitlements Act". So, that was a front-page news continued half way through. That particular news in that Sunday newspaper is partly true and partly, does not process the information they have. It is pointless being a journalist, if you are unable to process the information you have. Sir, this is what happened. There was an Action Plan. At the beginning of this year, the Presidential Secretariat informed us of 58 activities in the policy document and to prepare the subjects. Accordingly, we did prepare them, but there were certain subjects which were not within the purview of the Line Ministry. A couple of them were Subjects 17 and 18. Subject 17 in that Action Plan was to do with amending the parliamentary electoral system and Subject 18 was about abolishing the pensions and special privileges given to retired Presidents. Those two particular subjects were not within our Line Ministry. So, accordingly, we informed the Presidential Secretariat that those be deleted from our Action Plan because they technically belong elsewhere. That is, with the President. Then, a few days later, we got a reply from the Presidential Secretariat deleting those two proposals. Writing about the deletion of proposals from a Ministry’s Action Plan equating it as a reversal of policy by a government is done either by someone who does not know how to process an information or someone who is trying to mislead the public. And, the public was misled because we spoke to many of our supporters and citizens, explaining this is what happened. So, what I am saying to those authors is this. Sir, I will fall short of calling it fake news; I will not call it fake news, but they were either unable to process the information they had to come out with the right news because they did not know the procedure or they had some other ulterior motives. But, either way, that is what happened. According to Article 44 of the Constitution, the President can assign any subject under him to any Minister. So, the fact that those subjects had not been in the programme does not mean that we were reversing them. But, that was the message the newspaper was giving either deliberatly or by accident, I do not know. If it was by accident, it is a serious problem because unlike social media and other YouTube platforms, traditional journalism must be more careful with the information they give out to the public, especially when the newspaper has a reputation.

Anyway, I will not find fault with that newspaper, but want to just remind them that getting the information is not enough; they must process their information properly and come out with the correct news, which, I believe, they failed to do. And, the fact that we have now passed it in the Cabinet should put that speculation to rest. So, Sir,

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

I thought that I should explain it. Further, the same newspaper is carrying another news with regard to an assault on a particular political party, which I will not talk about. They have already named the party and the Member, but I am still looking for more information.

Sir, it is very important to state at this juncture that local government authorities including the Colombo Municipal Council have been clearly and decisively being won by the National People's Power, the Government. Again, people have given the Government a chance to carry out their mandate and that step is being taken now.

Sir, we need an Opposition. Why? To criticize the wrong decisions of the Government and to give a good input as an Opposition. We fully welcome that, but quite unfortunately, what do we see in this Parliament? This Opposition is not being responsible except for a few Members on very rare occasions. We have a shouting match, a deliberately prepared shouting match for a morning session. Thereafter, none of them are in Parliament. Now, only a few are here and I can count them; it is only a few. But, at the start in the morning, it was full with the Opposition MPs. Their intention in the morning is to come and make sensational remarks, which are baseless, and get a voice clip out on their YouTube channels and Facebook pages. This is not how a responsible Opposition should act. I respect those few Opposition Members who are still seated here participating in this Debate; others are not here. Sir, I can count them. Out of the 59, there are only seven Opposition Members now. This is how they act. -*[Interruption]* No, we have more than that. Hon. Member, you are in the House. So, I am not attacking you in anyway. Therefore, Sir, my request is that this House should be a place for proper Debate, extending courtesies.

ගරු කථානායකතුමනි, එම කරුණු එසේ සඳහන් කරමින්, විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් මේ සඳහා මා සහාය ඉල්ලා සිටිනවා. මේවා ඉතා හොඳ රෙගුලාසි. මේ හරහා අන්‍යෝන්‍ය තීන්දු බලාත්මක කිරීම නිසා මේ රටේ ගැටලු රාශියක් ඒ ක්ෂේත්‍රයට අදාළව විසඳා ගැනීමට හැකි වනවා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු අමාත්‍යතුමනි, මේ වෙනකොටත් බන්ධනාගාරය ඇතුළේ කුවේට් සහ මාලදිවයිනේ convict වෙච්ච prisonersලා ඉන්නවා; ඒ රටේ convict වෙලා ඔය exchange කිරීම හරහා ලංකාවට ආපු අය. ඒ අයගේ prison period එක, ඒ කියන්නේ conviction period එක පිළිබඳව confusion එකක් තිබෙනවා. නැත්නම්, ඒ අයට නීතිමය සහන ලබා ගැනීමේ ක්‍රමවේදයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ඒ රටේ ඒ අයත් එක්ක හිරේ හිටපු සමහර අයගේ කාලය ඉවර වෙලා නිදහස් වෙලා ගිහිල්ලා. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඒ අය ලංකාවට ආවාට පස්සේ, රජය පැත්තෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කිරීම සඳහා පමණයි මම මේ කියන්නේ. මොකද, ඒ අය අපට ඒ පිළිබඳව සඳහන් කෙරුවා. ඒක පසුගිය කාල සීමාවේ වුණේ නැහැ. ඔබතුමාට පුළුවන් නම් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලනවා. මොකද, මේ Regulation එකේ ඒක නැහැ.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. එය ඉතා වැදගත් යෝජනාවක්. මට වෙලාව තිබෙනවා, මම එයට කෙටියෙන් උත්තර දෙන්නම්.

ගරු මන්ත්‍රීතුමා කියන එක හරි. මෙතැන සිද්ධ වෙන්නේ මේකයි. ගරු මන්ත්‍රීතුමනි, අපි හිතමු කුවේට් හෝ මාලදිවයිනේ අවුරුදු 10කට රිමාන්ඩ්ගත කළා කියලා; බන්ධනාගාරගත කළා කියලා. එතකොට ඒ committal paper එකේ තිබෙන්නේ අවුරුදු 10යි. සාමාන්‍යයෙන් අපේ රටේ අවුරුදු 10යි කියලා දුන්නොත්, අපේ රටේ තිබෙන නීති රීති රෙගුලාසි යටතේ ඒ අඩුවීම් - remissions - කරන්න පුළුවන්. නමුත් විදේශ රටකින් convict වෙලා ආපුවාම අපි ඒකට බැඳෙනවා. මොකද, විදේශ රටත් එක්ක අපේ තිබෙනවා, අන්‍යෝන්‍ය ගිවිසුමක්. මොකක්ද? ඒ පුද්ගලයා ඒ රටේ නීතිය යටතේ තමයි වැරදිකාරයා වෙන්නේ. නමුත් ඒ සිර කාලය ගත කිරීම සඳහා අපේ රටට එව්වාට පස්සේ, අපේ රටේ ඒ අවුරුදු 10 ඉන්න ඕනෑ කියලා තිබෙනවා. එතකොට ගරු මන්ත්‍රීතුමනි, ඒ රටේම හිටියා නම්, ඒ අවුරුදු 10 අරගෙන, එහෙම නම් ඒ රටේ නීතිය අනුව sentence එක අඩුවීම - remission - වෙනවා. නමුත් වෙන රටකින් දීපු sentence එකක් සම්බන්ධයෙන් අපේ prison authoritiesට බැහැ, remission වෙන විධිය දාන්න. අන්න ඒ හේතුව නිසා ගරු මන්ත්‍රීතුමා කියූ පරිදිම ගැටලුවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have another two minutes.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I will finish off. It is a very important matter that you raised, Hon. Namal Rajapaksa. I thank you very much. Actually, there is such a problem. ඇත්ත, ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකක්ද? සමහර මිනිස්සු ඒ රටවල අවුරුදු 15 sentence එක දුන්නාට පස්සේ අවුරුදු 5ක් එහේ ඉඳලා අපේ රටට එනවා. එතකොට හිතන්නේ අවුරුදු 10න් කරන්න පුළුවන් කියලා. නමුත් ඊට පසුව මෙහෙත් අර අවුරුදු 15ම දුවනවා. මේකට හේතුව තමයි එහෙන් එන documentationවල මේ ගැන සඳහන් වෙන්නේ නැති එක. නමුත් සමහර රටවල් තිබෙනවා, දැන් එංගලන්තය වාගේ රටක් ගත්තොත්, ඒගොල්ලෝ කියනවා, අවුරුදු 10ක් දුන්නොත්, මෙන්න මේක මේ මේ හේතු මත අවුරුදු 5න් ගෙවෙන්නත් පුළුවන් කියලා; ඒ රටවල්වල. අන්න ඒක මෙහේ ක්‍රියාත්මක කරන්න පුළුවන්. නමුත් ගරු මන්ත්‍රීතුමා, මේක පුරවැසියාගේ ප්‍රශ්නයක් නොවෙයි, ඔබතුමා කියූ පරිදි ආණ්ඩුවේ

ප්‍රශ්නයක්. ඒ මිනිස්සු ඇවිල්ලා අපට කියන්නෙත් ඔබතුමාට කිව්වා වාගේමයි. "අයියෝ බලන්නකෝ ඇමතිතුමා, මෙහෙම මෙහෙම වුණා" කියනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට විදේශ කටයුතු අමාත්‍යාංශයත්, අපේ අධිකරණ අමාත්‍යාංශයත්, Department of Prisons ද ඇතුළත් කමිටුවක් මම කැඳවලා තිබෙනවා. මෙතැන අපි හදන්න හදන්නේ ක්‍රමයක්. එහෙන් මෙහෙට එවන්න කලින් අපේ විදේශ තානාපති කාර්යාල හරහා අවශ්‍ය සියලු තොරතුරු එතැනට ගත්තා නම්, මෙහේට ඒ පුද්ගලයෝ එනකොට ඒ තොරතුරු ටිකත් මෙහේ තිබෙනවා. නමුත් දැන් මෙතැන වෙලා තිබෙන ප්‍රශ්නය තමයි ගරු කථානායකතුමනි, ඒ තොරතුරු එන්නේ නැති එක. කවුරු හරි පුරවැසියෙක් ඇවිල්ලා ඒගොල්ලන්ගේ දුක්ගැනවිල්ල අපට කියනකම් අපි දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Okay, Sir.

අන්න ඒ හේතුව නිසා අපි ඒකටත් පියවර ගන්නවා. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමනි, ඒ වැදගත් ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධව නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Mujibur Rahman. You have 14 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.07]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අධිකරණ ඇමතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඊයේ පාර්ලිමේන්තු විවාදය අතරතුරදීත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කොළඹ මහ නගර සභාවේ ප්‍රශ්නය ගැන කථා කළා මම දැක්කා. කොළඹ මහ නගර සභාව විතරක් නොවෙයි, අද වනකොට ලංකාවේ පළාත් පාලන ආයතන අතර එකදු පක්ෂයකටවත් බහුතර බලයක් නොමැති ආයතන රාශියක ඡන්ද විමසීම් සිදු වෙමින් පවතිනවා.

ඒ ඡන්ද පවත්වන ආකාරය ගත්තාම, බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමියගේ හැසිරීමයි, මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමියගේ හැසිරීමයි දෙවිධියක් බව අපට පෙනුණා. විශේෂයෙන්ම රහස් ඡන්දයක් ද, එහෙම නැත්නම් විවෘත ඡන්දයක් ද ඕනෑ කියන එක මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය තීන්දු කළේ විවෘත ඡන්දයකින්. නමුත්, කොළඹ මහ නගර සභාවේ පෙරේදා ඇති වුණු සිදුවීමේදී අපි දැක්කා, විශේෂයෙන්ම එම කොමසාරිස්තුමිය පූර්ණ නිගමනයකට ඇවිල්ලා, සභාව කැඳවපු වෙලාවේ ඉඳන් රහස් ඡන්දය ගැනම කථා කරනවා. එතකොට අපේ කණ්ඩායම -විපක්ෂයේ කණ්ඩායම- යෝජනා කළා, විවෘත ඡන්දයක් ලබා දෙන්න කියලා. ආණ්ඩුව පැත්තෙන් යෝජනාවක් ආවා, "නැහැ, අපි රහස් ඡන්දයකට යන්න ඕනෑ" කියලා. ඒ විධියට යෝජනා දෙකක් සභාවට ආවා. සභාවට යෝජනා දෙකක් ආවාම, එතුමිය ඒ සභාව හමුවේ තිබෙන යෝජනා දෙකම සැලකිල්ලට ගන්න ඕනෑ. නමුත්, එතුමිය ඒ යෝජනා දෙක සැලකිල්ලට ගන්නේ නැතුව දිගින් දිගටම කථා කළේ, රහස් ඡන්දයකට යන්න ඕනෑ කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 48 වගන්තියේ 66ඇ. (6) වන උප වගන්තියේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ නම් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, තෝරා පත් කර ගැනීමේ ක්‍රමය, පැමිණ සිටින සාමාජිකයන් විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන විවෘත හෝ රහස්‍ය ඡන්දයක් මගින් විය යුතු ය...."

ඒක හරි. ඒ කියන්නේ ඇවිල්ලා ඉන්න සභිකයන් තීන්දු කරන්න ඕනෑ, පැවැත්විය යුත්තේ රහස් ඡන්දයක් ද, විවෘත ඡන්දයක් ද කියන එක. ඒක කොහොමද තීරණය කරන්නේ කියන එක මේ පනතේ නැහැ. රහස් ඡන්දයක් ද, විවෘත ඡන්දයක් ද පවත්වන්නේ කියන එක තීරණය කරන ක්‍රමවේදය මේ පනතේ කියලා නැහැ. ඒ සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා වන එස්. ආලෝක බණ්ඩාර මහතා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයක් දැන් මා ළඟ තිබෙනවා. මේ මාර්ගෝපදේශය තමයි පෙරේදා බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය පිළිපැදිය යුතුව තිබුණේ. මේ මාර්ගෝපදේශවල පැහැදිලිව මෙසේ කියනවා:

> "4.1 - නගරාධිපති, සභාපති සඳහා ඡන්ද විමසීම.
>
> පැහැදිලි බහුතරයක් නොමැති විට ඡන්ද ක්‍රියාවලිය - අපේක්ෂකයින් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක දී නම් සභාපති හෝ නගරාධිපති සඳහා යෝජනා කර ස්ථිර කර ඇත්නම් කොමසාරිස්වරයා විසින් සභාවේ සභිකයින් අතර ඡන්ද විමසීමක් පවත්වා නගරාධිපති, සභාපති තෝරා පත් කරගත යුතුය. මේ තරගය සඳහා ආඥාපනතේ පියවරෙන් පියවර ක්‍රියාවලියක් දක්වා ඇත."
>
> "මුලින්ම සභාවේ සභිකයින් විසින් ඡන්ද විමසීමේ ක්‍රමය තීරණය කරනු ලැබේ. එනම් තේරීම විවෘත ඡන්ද විමසීමක් කළ යුතු ද රහස් ඡන්ද විමසීමක් කළ යුතු ද යන්නයි. එහි ඇත්තේ අපේක්ෂකයින් කීප දෙනෙක් තරග වදින ඡන්ද විමසීමක දී තෝරා පත් කරගනු ලබන ක්‍රමය පිළිබඳව සභිකයින් අතර මතභේදයක් ඇතිවුවහොත් ඒ සඳහා එක් එක් සභිකයාගේ නම් අඬගසා ඡන්ද විමසීමක් කර බහුතරයේ එකඟතාවය මත ඡන්ද විමසීමේ ක්‍රමය තීරණය කළ යුතුය."

ඉතින් මේක තමයි මේ මාර්ගෝපදේශවල - guidelinesවල - කියන්නේ. පැහැදිලිව කියනවා, එක් එක් සභිකයන්ගේ නම් අඬගසා ඡන්ද විමසීමක් කළ යුතුයි කියලා. ඒ කියන්නේ, එක් එක් සභිකයාගේ නම කියලා අහන්න ඕනෑ, "ඔබතුමා විවෘත ඡන්දයකට කැමතිද, රහස් ඡන්දයකට කැමතිද?" කියලා. නමුත්, කොළඹ මහ නගර සභා ඡන්ද විමසීමේදී කොමසාරිස්තුමිය එහෙම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කළේ නැහැ. ඒ කොමසාරිස්තුමිය නිතර කිව්වේ මොකක්ද? එතුමිය කිව්වා, "මම පනත අනුව කටයුතු කරනවා" කියලා. අඩුම ගණනේ එතුමිය එම පනතේ අදාළ Section එකවත් කියෙව්වාද? මොන පරිච්ඡේදයේ ද මේක තිබෙන්නේ කියලා කිව්වාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩුම ගණනේ එතුමිය ඒකවත් කිව්වේ නැහැ. එතුමිය පුන පුනා කිව්වේ, "මම පනත අනුව කටයුතු කරනවා" කියලායි.

එම පනතට අදාළව තමන් ඡන්ද විමසීම ක්‍රියාත්මක කරන්න යන, තමන්ට බලය ලැබිලා තිබෙනවාය කියන Section එකේ - ඒ පරිච්ඡේදයේ - අංකයවත් එතුමිය කිව්වේ නැහැ. ඒ අංකයවත් නොදන්නා කෙනෙකු තමයි පෙරේදා ඇවිල්ලා කොළඹ මහ නගර සභාවේ ඡන්ද විමසීම මෙහෙයවූයේ. අඩුම ගානේ මා අතේ තිබෙන මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතවත් එතුමිය අරගෙන ආවේ නැහැ. ඇයි, මේක ගෙනාවේ නැත්තේ? අපේ සභිකයන් කිව්වා, ඔබතුමිය මේ ඡන්ද විමසීම කරන්නේ මේකේ මොන Section එක යටතේ ද කියලා කියන ලෙස. නමුත් එතුමිය ඒ Section එක මොකක්ද කියලා කිව්වේ නැහැ. "පනත අනුව, පනත අනුව" කියලා තමයි එතුමිය කිව්වේ. එහෙම නැත්නම් එතුමියට තව දෙයකට අනුව ඒ කටයුත්ත කරන්න තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි, නගර සභා ආඥාපනත. අඩුම ගානේ එතුමියට නගර සභා ආඥාපනත අනුව යන්න තිබුණා. එම ආඥාපනතේ **272(1)(f)** වගන්තියේ තිබෙනවා, නගර සභාවේ ඡන්දය තියන්නේ කොහොමද කියලා. ඒක අනුව යන්න තිබුණා. නමුත්, එතුමිය ඒ guidelines follow කළේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන් පැහැදිලිවම පෙනෙන දෙය තමයි, කොහොම හරි රහස් ඡන්දයක් තියනවා කියලා එතුමිය කලින් තීන්දුවක් අරගෙන ආවා කියන එක. එතුමිය බලහත්කාරකමින් ඒ ඡන්දය පැවැත්වූවා. බලහත්කාරකමින්! එතැනදී සියලුදෙනාම විරුද්ධ වුණා. නමුත්, එතුමිය ඒක ගානකට ගත්තේ නැහැ. ඕනෑ නම් එතැන හිටපු සභිකයන්ට රණ්ඩුවක් ඇති කර ගන්න තිබුණා. එතකොට හැසිරීමේ ප්‍රශ්නයක් එතැනදී මතු වෙනවා. ඒ ඡන්දය නවත්වන්න හිතුවා නම්, එතැන හිටපු විරුද්ධ පක්ෂයේ අයට ආණ්ඩු පක්ෂයත් එක්ක රණ්ඩුවක් ඇති කරගෙන ඒක කඩාකප්පල් කරන්න තිබුණා. නමුත්, එහෙම කරන්න ගියේ නැහැ. මොකද, එහෙම කරන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. අපි එහෙම හැසිරුණා නම් ඒකටත් තමුන්නාන්සේලා ඇවිල්ලා වෙන වෙන කථා කියයි, මේක කඩාකප්පල් කළා කියමින්. නමුත්, මතක තබා ගන්න පෙරේදා එතුමියගේ ඒ හැසිරීම තුළ රාජ්‍ය සේවකයන්ට තිබුණු ආත්ම ගරුත්වයයි එතුමිය නැති කළේ කියන එක. එතුමිය රාජ්‍ය සේවකයන්ට තිබුණු ආත්ම ගරුත්වය නැති කළා. ඒ විතරක් නොවෙයි, අඩුම ගානේ පනතේ වගන්තියක්වත් කිව්වේ නැහැ. අඩුම ගානේ ඒක ගැනවත් එතුමිය දැනගෙන හිටියේත් නැහැ. මොන වගන්තිය ද කියලාවත්, අඩුම ගානේ Section 66 කියලාවත් කියන්න එතුමිය දන්නේ නැහැ. ඒකවත් එතුමිය කිව්වේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත්, මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය ඒ කටයුත්ත විනිවිදභාවයකින් කළා; කඩුගන්නාවේ පළාත් පාලන ආයතනයට අදාළවත් ඒ කටයුත්ත විනිවිදභාවයෙන් කළා; අනෙකුත් ප්‍රාදේශීය සභාවලත් විනිවිදභාවයකින් කළා. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරියට ක්‍රියාත්මක වෙන්න එක නීතියකුත්, බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්වරියට තව නීතියකුත් වශයෙන් නීති දෙකක් තිබෙන්න බැහැ. එක නීතියයි තිබෙන්න ඕනෑ. නමුත්, අවාසනාවට බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය එදා ආණ්ඩුවේ දේශපාලන වුවමනාව මත වැඩ කළා කියන එක මුළු ලෝකයටම පෙන්නුවා. අපි විතරක් නොවෙයි, live telecast එකෙන් මුළු ලෝකයම - සියලුදෙනාම - දැක්කා, රහස් ඡන්දයක් තියන්න ඕනෑ කියන තීරණයට එතුමිය ආවේ කොයි විධියේ දරදඬු ආකාරයකටද කියලා. ගරු කොමසාරිස්තුමියට මම එකක් කියනවා. කොමසාරිස්තුමිය, මේක මතක තබා ගන්න ඕනෑ. ඔබතුමිය රාජ්‍ය සේවයේ Code of Conduct, ඒ කියන්නේ විනය කඩ කරලා තිබෙනවා. මේ තිබෙන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම ඔබතුමිය පැහැර හැර තිබෙනවා. ඒ පැහැර හැරීම තුළ ඔබතුමිය රාජ්‍ය සේවකයන්ට අදාළව තිබෙන විනය කඩ කරපු කොමසාරිස්වරියක හැටියට පෙරේදා ඉතිහාසගත වෙලා තිබෙනවා.

ගරු කොමසාරිස්තුමිය මතක තබා ගන්න, පාලකයෝ එනවා යනවා කියන එක. මේ ආණ්ඩුව නියෝජනය කරන තමුන්නාන්සේලා තව අවුරුදු 5ක්, 10ක් බලයේ ඉන්න පුළුවන්. කවදා හරි මේ ආණ්ඩුව වෙනස් වෙනවා. මොකද, අපි දන්නවා, මේ රටේ පවුල් පාලනයක් ඇවිල්ලා වෙච්ච දේ. අන්තිම පුරුක දක්වා බලයේ ඉන්නවා කියාගෙන තමයි ඒ අය බලයට ආවේ. අන්තිමට මොකද වුණේ? දෙවැනි පුරුකෙන් යන්න වුණා. ජනතා මතය කියන්නේ, ගලේ කොටපු දෙයක් නොවෙයි. ජන මතය වෙනස් වෙනවා. මේ මාස හයේදී තමුන්නාන්සේලාගේ ඡන්ද ලක්ෂ 23ක් අඩු වුණා. තව මාස හයක් යනකොට අපි දන්නේ නැහැ, තවත් කීයක් අඩු වෙයිද කියලා. ඒ හින්දා ඒ කොමසාරිස්තුමියට අපි කියනවා, මොන ආණ්ඩු තිබුණත් දේශපාලන නායකයන්ට, රටේ පාලකයන්ට එහෙම කඩේ යන වැඩේ කරන්න ගිහිල්ලා මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයත් එක්ක සෙල්ලම් කරන්න එපා කියලා. එහෙම සෙල්ලම් කරපු ලේකම්වරු අද කොහේද ඉන්නේ? අද කෙහෙළිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ Director General, තවත් හිටපු අමාත්‍යාංශ ලේකම්වරු කිහිප දෙනෙක් හිර ගෙදර ඉන්නවා. ඇයි ඒ? දේශපාලන නායකයන්ගේ අතකොළුවක් බවට පත් වෙන්න ගිහිල්ලායි. තමන්ගේ කීර්ති නාමයත් නැති කරගෙන ඒ අයට අන්තිමට හිරේ ලගින්න වුණා.

ඒ නිසා මතක තබාගන්න, ආණ්ඩු එනවා යනවා. ආණ්ඩු හැම දාම තිබෙන්නේ නැහැ. ඒ නිසා එතුමියට අපි කියනවා, එතුමිය මේ කරපු ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩේට කවදාහරි අපි එතුමිය නීතිය ඉදිරියට ගෙනෙනවා කියලා. කවදාහරි දවසක. මේ අවුරුදු පහේ නොවෙන්න පුළුවන්. ඊළඟ අවුරුදු පහේ නොවෙන්න පුළුවන්. නමුත්, කවදාහරි දවසක එතුමිය මේ රාජ්‍ය සේවයට කරපු අගෞරවයට විතරක් නොවෙයි, රටේ ප්‍රජාතන්ත්‍රවාදයට කරපු අගෞරවයට අපි එතුමිය නීතිය ඉදිරියට ගෙනෙනවා. ඒක මේ රටේ ඔප්පු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා, එදා කඩේ ගිය සමහර රාජ්‍ය ලේකම්වරුන්ට විරුද්ධව අද ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරනවා. ඒක හොඳයි. ඒක කරන්න ඕනෑ. අපි ඉන්නෙත් ඒ පැත්තේ තමයි. නමුත්, ඒ රාජ්‍ය නිලධාරින්ට ස්වාධීනව වැඩ කරන්න ඉඩකඩ ලබා දෙන්න ඕනෑ කියලා තමයි ඔබතුමන්ලා ඡන්දය ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ උදවිය රහස් ඡන්දයට විරුද්ධව සිටියේ. මේ පාර්ලිමේන්තුවේ අපේ ජනාධිපතිතුමා මේවා හොඳට කියලා තිබෙනවා. රහස් ඡන්දය තුළ ජනතාවගේ අදහස පිළිබිඹු වෙන්නේ නැහැ. රහස් ඡන්දය තුළ තමයි deal යන්නේ. රහස් ඡන්දය තුළ තමයි ගනුදෙනු වෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ හැම දාම දරපු මතය තමයි, රහස් ඡන්දය දූෂිතයි කියන එක. ඒ දූෂිත ඡන්ද ක්‍රමය නවත්වන්න ඕනෑ කියලා තමයි එතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට හඬ නඟලා කිව්වේ. නමුත්, අද ආණ්ඩු පක්ෂයට ගියාම ඒ අදහස වෙනස් වෙලා තිබෙනවා. මම ඒ ගැන පුදුම

වෙන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා විරුද්ධ පක්ෂයේ සිටියදී කියපු හැම දෙයක්ම ආණ්ඩු පක්ෂයට ගියාම වෙනස් කරගෙන තිබෙනවා. ඒ නිසා මේ ගැන මම පුදුම වෙන්නෙත් නැහැ. මොකද, ඔබතුමන්ලා එදා කියපු දේ නොවෙයි අද කියන්නේ. මේ පැත්තේ ඉඳිද්දී කියපු දේ නොවෙයි ඔය පැත්තට ගියාම කියන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන අපි පුදුම වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් හැම එක්කෙනාම කථා කරනවා මේ නයි-මුගටි හවුල ගැන. ආචාර්යවරු, මහාචාර්යවරු, මාධ්‍යවේදීන්, මේ ආණ්ඩුව පිහිටුවන්න උදවු කරපු උදවිය Facebook එකේ කියනවා මේක නයි-මුගටි හවුලක් කියලා. මොකක්ද මේ කියන්නේ? ඒකාබද්ධ විපක්ෂය එකතු වෙලා වැඩ කිරීම නිසා කියනවා, නයි-මුගටි හවුල කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පැත්තේ ඉන්න සියලු දේශපාලන පක්ෂ ධනේශ්වර ක්‍රමය නියෝජනය කරන දේශපාලන පක්ෂ. තමුන්නාන්සේලා මාක්ස්වාදය, ලෙනින්වාදය, සමාජවාදය විශ්වාස කරන දේශපාලන පක්ෂ. ඒක තමයි ජනතා විමුක්ති පෙරමුණේ මූලික අරමුණ. ඒ නිසා ධනවාදයයි, සමාජවාදයයි එකතු වෙන්න බැහැ. මොකද, ඒ දෙකත් නයයි මුගටියයි වාගෙයි. තමුන්නාන්සේලා 2004දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියත් එක්ක ආණ්ඩු හදන්න එකතුවෙලා ඡන්දය ඉල්ලුවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය කියන්නේ මේ රටේ ධනේශ්වර ක්‍රමය ඉස්සරහට ගෙනයන්න ක්‍රියා කළ නායිකාවක්. අනුර කුමාර දිසානායක මැතිතුමා කියන්නේ සමාජවාදය වෙනුවෙන් පෙනී සිටින නායකයෙක්. ඒ දෙන්නා 2004 ආණ්ඩු හදන්න එකට හිටියේ නැද්ද? එතකොට නයයි මුගටියයි නොවෙයිද ඒ එකට හිටියේ? ඒක අපට පැහැදිලි කරන්නකෝ. ඒ වේදිකාවේ එකට සිටියේ නයි-නයි ද, මුගටි-මුගටි ද? එතකොට ඒ නයයි, මුගටියයි නොවෙයිද? මොකද, මාක්ස්වාදයයි, ධනේශ්වර නායිකාවයි. සමාජවාදය පිළිගන්නා උදවිය, ධනපති පන්තියේ මේ ක්‍රමය ඉස්සරහට ගෙන යන නායිකාවත් එක්ක 2004දී එකතු වුණා. ඊළඟට, 2005දී තමුන්නාන්සේලා ගිහිල්ලා මැදමුලන වළව්වේ මහින්ද රාජපක්ෂ මහත්මයා කර ගහගෙන මහින්ද චින්තනයත් ලිව්වා. මහින්ද චින්තනයත් තමුන්නාන්සේලා ලියාගෙන ආවා. අපට කියන්නකෝ, ඒකෙදි කවුද නයා, කවුද මුගටියා? අපට කියන්නකෝ ඒක. නයා කවුද, මුගටියා කවුද? ඔයගොල්ලන් මහින්දලාත් එක්ක එකතු වුණේ, ඔයගොල්ලන් එහෙනම් නයි-නයි ද, මුගටි-මුගටි ද? නයා කවුද, මුගටියා කවුද? ඔයගොල්ලන්ගේ තේරුම අනුව මහින්ද රාජපක්ෂ කියන්නේ මේ රටේ කොම්ප්‍රදෝරු, දේශීය ධනපති පන්තිය නියෝජනය කරන නායකයෙක්. එතුමා පෙනී සිටින්නේ ධනේශ්වර ක්‍රමය වෙනුවෙන්. තමුන්නාන්සේලාගේ අනුර කුමාර දිසානායක ඇතුළු ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටින්නේ, මාක්ස්වාදය, ලෙනින්වාදය, සමාජවාදය වෙනුවෙන්. ඒ දෙක කොහොමද පැහුණේ? ඒ දෙක කොහොමද එකතු වුණේ? ඒ දෙක එකතු වෙන්න පුළුවන්ද? එහෙම එකතු වෙන්න බැහැ. නමුත්, ඒ දෙක එකතු වෙනවා.

ඒ කියන්නේ නයයි, මුගටියයි වාගේ ඉන්න ඔයගොල්ලොත් එකතු වෙනවා.

ඊළඟට, 2015දී අපේ රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති වශයෙන් හිටපු කාලය බලන්න. එතුමාට කිව්වේ "යැංකි ඩිකී" කියලා. එතුමාට ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ නියෝජිතයා කියලා කිව්වේ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ අනුර කුමාර දිසානායක මහත්තයා වැඩි හරියක් හිටියේ අගමැතිතුමාගේ කාර්යාලයේ. කවුද නයා? කවුද මුගටියා? අපට කියන්නකෝ. නයි-නයිද? මුගටි-මුගටිද? ඒක නයයි-මුගටියයි නොවෙයි. ඒක නයි-නයි. නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මෙතුමන්ලා හොඳ වැඩක් කළා. "ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට විරුද්ධයි. ඇමෙරිකාව මුළු ලෝකයම හූරාගෙන කනවා. ඒ හින්දා අපි ඇමෙරිකාවට විරුද්ධයි" කිව්වා. අන්තිමට මොකද වුණේ? අන්තිමට ජුලී චන්ග් එනවා, පැලවත්තට කෝපි බොන්න. ඒ කොහොමද? ඔයගොල්ලන්ගේ තේරුම අනුව ඇමෙරිකාව කියන්නේ නයා, ඔයගොල්ලෝ මුගටියා. එක්කෝ ඔයගොල්ලෝ නයා, ඇමෙරිකාව මුගටියා. ජුලී චන්ග් මුගටියා වෙන්න එපා යැ. ජුලී චන්ග් එක්ක අර පැලවත්ත කාර්යාලයේ හැම දාම හිටියා. එහෙම කොහොමද පැහුණේ? ඒක කොහොමද පැහුණේ කියලා විස්තර කරන්න. ඒක නයි-නයිද, මුගටි-මුගටිද?

ඊළඟට, ඊයේ රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ සාමාජිකයෙක් අරගෙන කුරුණෑගල උපනගරාධිපතිකම දීලා බලය හැදුවා. ඒ කොහොමද? රිසාඩ් බදියුදීන්ට ඔයගොල්ලන්ගේ විදේශ නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා, පොලිතින් බෑග් එක අරගෙන කොළඹ ආවේ කියලා. ඔයගොල්ලන්ට රිසාඩ් බදියුදීන් කියන්නේ නයෙක්. ඔයගොල්ලන් මුගටියා. ඊයේ කොහොමද නයයි, මුගටියයි එකතු වුණේ, කුරුණෑගලදී? කියන්නකෝ, මට. අනුරාධපුරයේදී එකතු වුණා, නයයි, මුගටියයි. හල්දුම්මුල්ලේදී එකතු වුණා, නයයි, මුගටියයි. හපුතලේදී එකතු වුණා, නයයි, මුගටියයි තොණ්ඩමන් එක්ක. තොණ්ඩමන් පතුරු ගැහුවා. තොණ්ඩමන්ගේ සීයාටත් හොරා කියලා කිව්වා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පිල්ලෙයාන් -

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ආ! පිල්ලෙයාන්. අන්න, ෂාණක්කියන්. පිල්ලෙයාන් ත්‍රස්තවාදියා. මහින්ද ළඟ ඉන්නකොට ත්‍රස්තවාදියා. ඔයගොල්ලන් කිව්වා, මහින්ද පිල්ලෙයාන් හොඳ මිනිහෙක් කරලා ත්‍රස්තවාදියෙක් නොවෙයි කියලා පිළිගත්තා කියලා. දැන් ඔයගොල්ලන් එයාව හිරේ දැම්මා. හිරේ දමලා මඩකලපුවට ගිහිල්ලා ඒ සභා හදන්න -අර නයාත් එක්ක මුගටියා- සෙට් වෙනවා. ඒ, කොහොමද? එහෙම කරන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම කථාවක් තිබෙනවා. හෙලුවෙන් ඉන්න මිනිහා අමුඩයෙන් ඉන්නා මිනිහාට හූ තියනවා ලු. හෙලුවෙන් ඉන්නා එක්කෙනා අමුඩයෙන් ඉන්නා එක්කෙනාට හූ තියනවා වාගේ වැඩක් තමයි තමුන්නාන්සේලා කරන්නේ. තමුන්නාන්සේලා නයි, මුගටි එක්ක ඉතිහාසය පුරාම ඉඳලා, ඩීල් දමලා දැන් ඔය පැත්තේ ඉඳගෙන අපට කියනවා, අපි නයි, මුගටි එක්ක එකතු වෙලා කියලා. මතක තබා ගන්න, අපි නයි, මුගටි එක්ක එකතු වෙලා නැහැ. අපි කා එක්කවත් දේශපාලන ඩීල් දමලා නැහැ. අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේත් තමුන්නාන්සේලා ගෙනෙන හොඳ පනත්වලට ඡන්දය දෙනවා. එදා තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුත් විපක්ෂයේ ඉන්නකොටත් ආණ්ඩුව හොඳ දේවල් කරනකොට ඡන්දය දීලා තිබෙනවා. මේ සභා පිහිටුවීමේදී අපි සමහර පක්ෂවල උදවු ගන්නවා; ඡන්දය ගන්නවා. එහෙම නැතුව ඒවා දේශපාලන ඩීල් නොවෙයි. ඒවා දේශපාලන එකගතා නොවෙයි. ඒවාට උත්තර දී ගන්න බැරුව තමුන්නාසේලාගේ ඉන්න -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahman, you have exhausted your additional four minutes also.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
I will finish up, Sir.

ඒක balance කරගන්න, තමුන්නාන්සේලා නැවත වතාවක් සාමාජිකයන් අන්දගන්න අපට කියනවා, නයයි, මුගටියයි කියලා. ඒ නිසා තමුන්නාන්සේලාගේ දේශපාලන බංකොලොත්කම, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති දේශපාලනය මොකක්ද කියන එක මේ මාස 6 තුළ ජනතාවට හෙළිදරව් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ system එක change කරන්න, මේ ගරා වැටුණු system එක වෙනස් කරන්න විශාල ඡන්ද ප්‍රමාණයක් ගත්තා. ඒවා මේ රටේ බුද්ධිමත් ජනතාවගේ ඡන්ද. නමුත් ඒ ඡන්දවලට ගෞරවය තියන්නේ නැතුව අද ඩීල් දේශපාලනයට ගිහිල්ලා ඒ ඡන්ද දායකයන්ට තමුන්නාන්සේලා අගෞරව කර තිබෙනවා කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 10 minutes.

[පූ.භා. 11.27]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුජිබුර් රහුමාන් මැතිතුමාට මිනිත්තු 4ක් නොවෙයි, තව මිනිත්තු 10ක් විතර දුන්නත් මම නම් කැමැතියි. මොකද, අද හිතේ අමාරුවෙන්නේ ඉන්නේ. ඒ නිසා වැඩිපුර දුක කිව්වාට කමක් නැහැ. *[බාධා කිරීම්]* අපි ඒවා ඉවසා ගෙන ඉන්නම්, කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම දාම කොළ පාට වෙලා තිබුණු කොළඹ මහ නගර සභාව මොහොතකට කලින් රතු පාට වුණා; ව්‍රායි කැලී බල්තසාර් නගරාධිපතිනිය විධියට දිවුරුම් දුන්නා. ඒ වාගේම මට දැන් මොහොතකට කලින් ආරංචි වුණා, කොලොන්නාව සභාවත් අපි ජයග්‍රහණය කළා කියලා.

අද ඇත්තටම කථා කරන්න තිබෙන්නේ වැදගත් නියමයන් කිහිපයක් ගැන. නමුත්, විපක්ෂයේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දුක කියපු නිසා මටත් හිතුණා, පොඩ්ඩක් ප්‍රතිචාර දක්වන්න. මොකද, එතුමා නීතිඥවරයෙකුත් නොවන නිසා මෙන්න මේ දේ ගැනත් මම කියන්න ඕනෑ. මේ පනතේ යම් ප්‍රතිපාදන ටිකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනතක් සහ මාර්ගෝපදේශයක් කියන්නේ නීතිමය පැත්තෙන් ගත්තාම දෙකක්. ඒක හරියට ජාත්‍යන්තර නීතියේ නම් convention එකක් සහ declaration එකක් වාගේ එකක්. ඒ දෙකේ වෙනසක් තිබෙනවා. මොකද, convention එකක් යම් බැඳීමක් ඇති කරනවා; declaration එකකට බැඳීමක් නැහැ. ඒ වාගේම තමයි, නීතිය අනුව පනතක් සහ මාර්ගෝපදේශයක් අතර පැහැදිලි වෙනසක් තිබෙනවා. පනතක් කියන්නේ නීතිමය බැඳීමක් තිබෙන දෙයක්. ඕනෑම කෙනෙක් බැඳෙන්නේ ඒ පනතින්. හැබැයි, මාර්ගෝපදේශයක් කියන්නේ යම් පැහැදිලි කිරීමේ guideline එකක් පමණයි. ඒ පැහැදිලි කිරීම ඇතුළේ නීතිමය බැඳීමක් නැහැ. මෙතුමන්ලා දිගින් දිගටම මෙන්න මේ මාර්ගෝපදේශයක් ගැන දිනයකුත් නැතිව කියනවා. දිනයක් නැති මාර්ගෝපදේශයක් ගැන කියන්නේ. හැබැයි, එතුමන්ලා නොකියන දෙයක් තිබෙනවා. 2025 ජුනි 14වැනි දා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා නිකුත් කරනවා, මෙන්න මේ විධියේ ලියුමක්. මේක, මේ කියන දින නොමැති මාර්ගෝපදේශයට පස්සේ ආපු එකක් කියලා මම විශ්වාස කරනවා. මොකද, මේක නිකුත් කර තිබෙන්නේ ජුනි 14වැනි දා නිසා. එහි සඳහන්ව තිබෙනවා, "ඔබ වෙත එවා ඇති මාර්ගෝපදේශ සංග්‍රහය පළාත් පාලන කොමසාරිස් ලෙස 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතින් ඔබ වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යභාරය පහසු කරලීම සඳහා වන උපදෙස් මාලාවක් පමණක් වන අතර, ඔබ වෙත පැවරී ඇති ව්‍යවස්ථාදායක කාර්යභාරය යථෝක්ත පනතේ විධිවිධාන පරිදි ඉටු කළ යුතුව ඇත" කියලා. මේ කියන්නේ පනත ගැන. එහි තවදුරටත් සඳහන් වෙනවා, "ඒ අනුව කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල සහ වගකීම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධව තීරණ ගැනීමේ වගකීම ද එකී නීතිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉටු කළ යුතුය" කියලා.

ඒ නිසා බොරුවට තර්ජනය කරන්න එපා. කොමසාරිස්තුමිය, පනතට අනුව එතුමියට ලැබී ඇති නිසි බලතල අනුව කටයුතු කර තිබෙනවා. තමන් ස්වාධීනව පනත අනුව කටයුතු කරනවා කියලා එතුමිය කොන්ද පණ ඇතිව ප්‍රකාශ කළා. ඒ වාගේම, ඡන්දයට කලින් රහස් ඡන්දයක් ඉල්ලපු උදවිය පස්සේ රහස් ඡන්දයකට විරුද්ධ වුණා. ඒක කළේ ඇයි කියලා අපි දන්නවා. හේතුව, තමන්ගේ පක්ෂයේ අයවත් තමන්ට ෂුවර් නැහැ. එච්චරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂ නායකතුමා අද උදේ කිව්වා නේ, "අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා" කියලා. එතුමාටත් මට කියන්න තිබෙන්නේ ඒකයි. තමන්ගේ පක්ෂයේ සිටින දුර්වල සංවිධායකවරු ටිකක් නිසා තමන්ට බිමේ තිබෙන බලයත් නැති කරගෙන ඉන්නවා. හෙට දිනයේදී එතුමා සම්බන්ධයෙන් රහස් ඡන්දයකට ගියොත්, එතුමාගේ පක්ෂයේ අය එතුමාව කැමැත්තෙන් බාර ගනීවිද කියලාවත් අපි දන්නේ නැහැ. ඒ නිසා මම කියන්නේ මේකයි. ඔබතුමන්ලා තර්ජනය කළාට වැඩක් නැහැ. මොකද, ඔබතුමන්ලා නැවත බලයට එන්නේත් නැහැ. හැබැයි, කොන්ද කෙළින් තියාගෙන නීතිය ප්‍රකාරව වැඩ කරන රාජ්‍ය සේවකයන්ට විරුද්ධව තර්ජනය කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් අද දවසේ අපේ මාතෘකාවට එන්නම්. අද කථා කරන්න තිබෙන්නේ අපට වැදගත් ගැසට් නිවේදනයක් ගැන. 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ සිදු කරනු ලබන නියමයන් ගැන තමයි අද දින අපි කථා කරන්නේ. ඇත්තම කිව්වොත්, මේ පනත සම්මතවීමට කලින් ක්‍රියාත්මක වුණේ Reciprocal Enforcement of Judgments Ordinance කියන එකයි. ඒක අනුව එංගලන්ත නීතිය යටතේ ලබා දුන් judgment එකක් විතරයි ලංකාවේ බලාත්මක කරගන්න හැකියාව තිබුණේ. හැබැයි, මේක ඇත්තටම විශාල අඩු පාඩුවක් සපුරමින් ගෙනාපු පනතක්. මේ පනත එන්න කලින්, "ලියනගේ චම්පික හරේන්ද්‍ර සිල්වා එරෙහි වීරසේකර සහ තවත් අය" කියලා ඓතිහාසික නඩු තීන්දුවක් තිබුණා. මේ නඩුවේදී කියනවා, විදේශයකදී පිළිගත්ත දික්කසාද නඩුවක් ලංකාවේ පිළිගත යුතුයි කියලා. හැබැයි එහෙම තිබුණාට, නීතියකුත් ගෙනාවාට මේක ක්‍රියාත්මක වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැනට අපි රටවල් 53ක් මේ ගැසට් නිවේදනයෙන් ඉදිරිපත් කර තිබෙනවා. මේක නිකම් නීතියක් හැටියට තිබුණා. මේක ඉතාම වැදගත් දෙයක් හැටියට අපේ රජය තීරණය කළා. මම නීතිඥවරියක් ලෙස කටයුතු කරද්දී දැක තිබෙනවා, විශේෂයෙන්ම විදේශගත වෙලා සිටින ගොඩක් අයට මේක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණු ආකාරය. විශේෂයෙන්ම දික්කසාද සහ ඒ සම්බන්ධ නඩුවලදී ඔවුන්ට මේක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඉන්දියාව,

නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, මලයාසියාව, සිංගප්පූරුව, එක්සත් රාජධානිය ඇතුළු රටවල් 53ක් මේ ලේඛනයට ඇතුළත් වෙනවා.

ඩයස්පෝරාවේ අතිවිශාල ප්‍රමාණයක් මේ රටවල ඉන්නවා. විදේශයකදී දික්කසාදයක් හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් නඩු තීන්දුවක් අරගෙන තිබුණත්, ඒගොල්ලන් ලංකාවට ආවාම නැවත මුල ඉඳන් ඒ නඩුව අහලා ඒගොල්ලන්ගේ කාලයත්, අධිකරණයේ කාලයත්, අනෙක් හැම දෙනාගේම කාලයත් නාස්ති කරලා එම තීන්දුව ලංකාවේ බලාත්මක කරගන්න අවශ්‍ය වෙන්නේ නැහැ, මෙම නියමයන් සම්මත වුණාට පස්සේ. මෙතැන රටවල් 53ක් තිබෙනවා. අපට පෙනෙන විධියට මෙතැන පොදු රාජ්‍ය මණ්ඩලීය නීති ක්‍රමය ක්‍රියාත්මක වෙන රටවල් තමයි ගොඩක් තිබෙන්නේ. එක පැත්තකින්, විදේශගතව ජීවත් වෙන තැනැත්තන්ට විශාල පහසුවක් වෙනවා, මුදල් සහ දික්කසාද - සිවිල් - නඩුකර ලංකාවේ පිළිගැනීම හේතුවෙන්.

අපි දන්නවා, මේ වෙනකොට අධිකරණවල ලක්ෂ 11කට වඩා නඩු ගොඩ ගැහිලා තිබෙන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ නඩු තීන්දු පිළිගැනීම හේතුවෙන් අධිකරණයේ ගොඩ ගැහිලා තිබෙන නඩු චක්‍රාකාරයෙන් යම් ප්‍රමාණයකට අවම වෙනවා. හැබැයි, අධිකරණය සම්බන්ධයෙන් ඊට එහා ගිය බරපතළ කාරණා ගොඩක් තිබෙනවා. ඒ කියන්නේ අධිකරණ කාර්ය මණ්ඩල හිඟකම, සම්පත් හිඟකම, ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් හිඟකම වාගේ අඩු පාඩු රාශියක් අධිකරණවල දැන් තිබෙනවා. අපි දැනට අධිකරණවලට කාර්ය මණ්ඩල බඳවා ගනිමින් ඉන්නවා. විශේෂයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල හිඟකමත් මේ නඩු ගොඩ ගැසීමට බලපා තිබෙනවා. අධිකරණවල ගොඩ ගැහිලා තිබෙන නඩු සංඛ්‍යාව අඩු කරන්න තව ගොඩක් දේවල් අපට කරන්න තිබෙනවා. ඒ වෙනුවෙන් අපි දැන් යම් යම් දේවල් කරමින් ඉන්නවා. ඊයේ දිනයේ පැවැත්වුණු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදිත් මොන වාගේ උපක්‍රමද අපි මේ වෙනුවෙන් පාවිච්චි කරන්න ඕනෑ කියලා කථා වුණා. ඒ කාරණයත් මම මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමතියි. අපේ කාලය, මුදල් වාගේම අධිකරණයේ ගොඩ ගැහිලා තිබෙන නඩු කටයුතු අවම වීමත් යම් ආකාරයකට මේ නියමයන් තුළින් සිදු වෙයි කියලා අපි විශ්වාස කරනවා.

මට ලැබී තිබෙන කාලය සීමිත නිසා මගේ කථාව අවසන් කරන්නම්. මොකද, විපක්ෂ නායකතුමා විසින් අද පස්වරු 3.30ට විශේෂ විවාදයක් ඉල්ලා තිබෙනවා. අපි ඒ ගැන ඇත්තටම සතුටු වෙනවා. අද උදේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගොඩක් ඇවිත් හිටියා. ඒ ආපු මන්ත්‍රීවරුන් - කථා කරන මන්ත්‍රීවරුන් දෙතුන්දෙනාගෙන් එහාට ගිහිල්ලා - අද පස්වරු 3.30ටත් එතුමන්ලා හරි උනන්දුවෙන් පාර්ලිමේන්තු එයි කියලා අපි විශ්වාස කරනවා. අයාලෙ යන විපක්ෂය හරි මඟට ගන්නට මේ තරම්න් හෝ අපට දායක වෙන්න ලැබීම ගැන අපි ඇත්තටම සතුටු වෙනවා. අපි හොඳ, constructive සංවාද කරමු. සවස් වරුවට විපක්ෂයේ ආසන හිස් වෙලා තිබෙනවා. මේ සංවාදවලට; විවාදවලට සහභාගි වෙමින්, මේ පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, දේශපාලන සංස්කෘතියෙත් අපි ඇති කරපු වෙනස ඇති කරන්න එකතු වෙන්න කියලා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. අපේ ආණ්ඩුවෙන් ආදර්ශයක් අරගෙන හෝ විපක්ෂය නිවැරදි මඟට එන එක ගැන මම හරියට සතුටු වෙනවා. ඒ කාරණයත් කියමින්, මගේ කාලය අවසාන නිසා මම නතර වෙනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. M. Nizam Kariapper. You have nine minutes.

[පූ.භා. 11.36]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියගේ කථාවෙන් පසුව මට කථා කරන්නට අවස්ථාව ලැබීම එක අතකින් වරප්‍රසාදයක්. එතුමිය මේ පාර්ලිමේන්තුවේ විවාදවලට මන්ත්‍රීවරුන් නොපැමිණීම ගැන සඳහන් කළා. එහෙම කියනකොට එතුමියට සිද්ධ වෙනවා, තමන්ගේ පැත්තත් පොඩ්ඩක් බලන්න. සමහරවිට Committee meetings ඇති. අනෙක් අයට ඇඟිල්ල දිගු කරන්න ඉස්සෙල්ලා බලන්න, ඔබතුමියගේ ඉදිරිපිටත් හතර දෙනායි හිටියේ. ඒකට කමක් නැහැ. ඉන්නෙත් එච්චරයි. කමක් නැහැ. ඒක ඉතින් එහෙම තමයි. ඒකට වැඩිය වැදගත් දෙයක් එතුමියගේ කථාව ගැන මට කියන්න තිබෙනවා. එතුමිය නීති උපාධියක් සහ ආචාර්ය උපාධියක් තිබෙන මන්ත්‍රීවරියක්.

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 48 වගන්තියේ, "පළාත් පාලන ආයතනයක පළමු රැස්වීමේදී හෝ වෙනත් යම් රැස්වීමකදී නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය" යටතේ 66ඇ. (6) හි අදාළ ප්‍රතිපාදන සඳහන් වෙනවා. මම ඒ අදාළ කොටස ඉංග්‍රීසියෙන් කියවන්නම්.

> "Where two or more names of members are proposed and seconded for election as Mayor,...."

This is, what had happened in the Colombo Municipal Council.

> " ... the mode of election shall be by open voting,....."

I shall repeat it, "shall be by open voting".

එහි, "shall" කියන වචනය තමයි පාවිච්චි කරලා තිබෙන්නේ. ඒ කියන්නේ විවෘත ඡන්දය තිබීම තමයි, the general principle. It is a shall; අනිවාර්යයෙන්ම විවෘත ඡන්දයක් තිබිය යුතුමයි. ඒ පනතේ පොඩි පරස්පරතාවක් මතු වුණා. ඒ පනතේ 48වන වගන්තියේ 66ඇ.(7)හි එය සඳහන් වෙනවා. මම ඒ අදාළ කොටස ඉංග්‍රීසියෙන් කියවන්නම්.

> "Where it is determined under subsection (6) that the election of the Mayor shall be by open voting, the presiding officer..."

48වන වගන්තියේ 66ඇ.(8)හි මෙසේ කියනවා:

> "Where it is determined under subsection (6) that the election of a Mayor shall be by secret voting,..."

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය බලන්න, 66ඇ.(6). ඔබතුමියට පුළුවන් නම් හෝ කවුරු හරි නීති විශාරදයෙක් මෙතැන ඉන්නවා නම් ඔබතුමන්ලාගේ කථාවක් කරන අවස්ථාවකදී හෝ මම වැරදියි නම් හරි ගස්සන්න. 48වන වගන්තියේ 66ඇ.(6)හි එක තැනකවත් රහස් ඡන්ද - secret voting - ගැන සඳහන් කරලාම නැහැ. ඉතින්, කොහොමද එහෙම කළේ? යම්කිසි හේතුවක් නිසා, "Where it is determined ... by secret voting" කියන වචන ආවා, 48 වගන්තියේ 66ඇ.(8)ට.

ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne?

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මගේ වෙලාව ගන්නේ නැතුව එතුමියට අවස්ථාව දෙන්න, not out of my time.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
තත්පර 30කින් මම පිළිතුරක් දෙන්නම්. ඔබතුමාගේ කාලය ගන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඔබතුමා කියන කාරණය හරි. පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, විපක්ෂයේ රෝයි බෝගහවත්ත කියන මන්ත්‍රීතුමා secret voting එකකට යන්න කැමැති වුණු සන්දර්භයක් ගැන කථා කළා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
වැරදියි. ඔබතුමිය නැවතත් මෙම සභාව නොමඟ යවන්න හදන්නේ. First, let me thank you for saying, මම කියපු එක හරි කියලා. So, it states "Where it is determined". එක මන්ත්‍රීවරයෙකුට නැඟිටලා ඒක determine කරන්න බැහැ. එක මන්ත්‍රීවරයෙක් නැඟිටලා, "මට රහස් ඡන්දයක් ඕනෑ" කිව්ව පළියට දෙන්න බැහැ. It should be determined by the presiding officer on the reasons. What are the reasons? අන්න එතකොට තමයි මාර්ගෝපදේශය අදාළ වෙන්නේ. 16වැනි දා කොළඹ මහ නගර සභාවේ ඡන්දය එනවා කියලා කඩිමුඩියේ 14වැනි දා ඒක වෙනස් කරන්න උත්සාහ කළාට, ඒක එහෙම වෙන්නේ නැහැ. අපි බලමු, යම්කිසි අධිකරණයකදී, the *mala fide* intention of the Government would be very clearly shown, the haste at which they were trying to change it. But, it did not change; it was actually confirmed.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 66ඇ.(8) යටතේ යම්කිසි විධියකින් එය රහස් ඡන්දයක් ලෙස තීරණය කළහොත් කුමක්ද කරන්නේ? කවුද එය තීරණය කරන්නේ? ඒකත් තීරණය කරන්න ඕනෑ සභාව. ඒ සභාව තීරණය කරන්න ඕනෑ, that the general procedure of voting is by open voting. Open voting එකක් නොවෙනවා නම්, ඒක රහස් ඡන්දයක් නම් ඒකත් බහුතර මන්ත්‍රීවරුන් කියන්න ඕනෑ. මෙතුමිය මෙහෙම කිව්වාට, අදාළ presiding officer ලියලා තිබෙනවාද, ඒකට හේතුව? නැහැ. හේතුව ආණ්ඩුවත් දන්නවා, ඔක්කෝම දන්නවා. Let us talk about it on another day. But, all I want to do is to correct the misleading information given to this House.

Now, let me come to the Orders that are being discussed today. The Hon. Minister is there. I would like to bring up a few important matters. I have been watching the Hon. Minister's speech on TV; though I went out to the washroom, I was watching his speech on TV. There are a few serious issues.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකේ කියලා තිබෙනවා නේ, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා ඇමතිතුමාට පුළුවන්, යම් යම් රටවල තිබෙන විදේශීය නඩු තීන්දු මෙහේ බලාත්මක කරන්න. එතකොටත් එතුමිය කිව්වා, I was surprised, ලංකාවේ දික්කසාදය පිළිබඳව ප්‍රශ්න තිබුණා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය ලියනගේ නඩුව ගැන වෙන්න ඕනෑ කියන්නේ. අභියාචනාධිකරණය දැනටමත් තීරණය කරලා තිබෙනවා, පනත් විධිවිධාන නොමැතිව විදේශීය දික්කසාද නඩු තීන්දු භාරගන්න, provided that ඒ රටේ ක්‍රියාත්මක වූ නීති පද්ධතිය අපේ නීති පද්ධතිය සමඟ සැසඳෙනවා නම්. දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. මේක අදාළ වෙනවා, to two categories of judgments and decrees. එකක්, දික්කසාද. අනෙක් එක තමයි, ණය ලබා දීම සහ ගැනීම. මෙතුමන්ලා හිතනවා ඇති, ගැසට් එකක් නිකුත් කරපු ගමන් මහා ලොකු වැඩක් කළා කියලා. ඒක එහෙම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙහිදී කාරණා තුනක් පිළිබඳව සැලකීමකට පත් වෙන්න ඕනෑ.

පළමුවැනි එක තමයි, අදාළ රටත්, අපත් අතර යම් කිසි අන්‍යෝන්‍ය ගිවිසුමක් තිබිය යුතු වීම. එසේ තිබෙනවාද? අද අපේ ගරු ඇමතිතුමා ඒ පිළිබඳව විස්තර දුන්නේ නැහැ. ගැසට් පත්‍රයේත් කියලා නැහැ, as to how he decided these 53 countries. ඒ කියන්නේ, "A", "B", "C", "D", "E", "F" කියලා නිකම් ලියන්න බැහැ නේ. What is the discretion? There are three conditions that have to be fulfilled. පළමුවැනි එක, නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ රට අපේ රටත් එක්ක අන්‍යෝන්‍ය ගිවිසුමක් ඇති කර ගන්න ඕනෑ. ඒවා සපුරා තිබිය යුතුයි. දෙවැන්න, ඒ රටේ නීති පද්ධතියත්, අපේ රටේ නීති පද්ධතියත් සැසඳෙන්න ඕනෑ. තුන්වැනි එක - ඒක නම් විකල්පයක්, an option - මේ පිළිබඳව විදේශ කටයුතු ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ උපදෙස් ලබා ගන්න ඕනෑ. That is the most important point I would like to bring to the Hon. Minister's attention. මෙතැන තිබෙන්නේ අපට ලොකු වාසියක් නොවෙයි; මෙතැන ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

අපි ගත්තොත්, ඇන්ටිගුවා, එහෙම නැත්නම් New Zealandවල හෝ United Kingdomවල අපට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් ගත්තාම, ඒ රටෙන් අපට summons එවනවා. එහෙම නැත්නම් අපේ රටේ පුරවැසියෙකුට සිතාසියක් එවනවා. ඒ සිතාසියට අනුව ඒ මනුෂ්‍යයා එහේ ගිහිල්ලා ඒ නඩුවට පෙනී ඉන්න ඕනෑ. ස්ටර්ලින් පවුම් දහස් ගණන් ඒවාට වියදම් කරන්න ඕනෑ. ශ්‍රී ලාංකික පුරවැසියෙකුට විරුද්ධව ඒ ඒ රටවල නඩුවක් පවතිනකොට, අදාළ රටේ මහ කොමසාරිස් කාර්යාලයෙන් ඔහු වෙනුවෙන් පෙනී සිටීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඒ අවශ්‍ය කටයුතු සකස් කරලා තිබෙනවාද? Please answer that question. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? They will take an *ex parte* judgment because, මට පුළුවන්ද, එංගලන්තයට ගිහිල්ලා solicitor කෙනෙක්ව, එහෙම නැත්නම් counsel කෙනෙක්ව retain කරලා, ඒ නඩුව defend කරන්න? ඒක හරි අමාරුයි; it is a very costly thing. ඊට පස්සේ ඒ නඩු තීන්දුව ලංකාවට ගෙනැල්ලා, "Right, we had a fair hearing. A county court in the UK has made this decision" කියලා ඒක implement කළාම, අනාථයි. මහා ලොකුවට මේවා කරන්න කලින් මෙතැන විසඳන්න ගොඩක් ප්‍රශ්න තිබෙනවා. මෙහි හොඳ දේවල් තිබෙනවා. Middle Eastවල ප්‍රශ්නයක් නැහැ; ඉන්දියාවේ ප්‍රශ්නයක් නැහැ. අපටත් කර ගන්න පුළුවන්.

ඊළඟට තිබෙන ප්‍රශ්නය තමයි, ඒ රටවල් අපේ නඩු තීන්දු භාර ගන්නවාද කියන එක. ඒ පිළිබඳව වාර්තාවක් ලබා ගත්තාද? Have all these 53 countries accepted our judgments reciprocally? අන්‍යෝන්‍ය වශයෙන් පිළිගෙන තිබෙනවාද? මේ කාරණා සියල්ල පිළිබඳව පැහැදිලි කිරීමක්, ගරු අධිකරණ ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Nizam Kariapper, you have exhausted your time.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Give me just half a minute, Sir.

එතුමාට විශේෂයෙන්ම නැවත නැවත මම එය කියා සිටිනවා, මේ රටවල් පනස් තුනේම ලංකාවේ විදේශීය තානාපති කාර්යාලවල, we have to have a separate section to defend our citizens and to facilitate the necessary services for that. Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Bhagya Sri Herath. You have 11 minutes.

[පූ.භා. 11.46]

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි කරන්නේ, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ගරු අමාත්‍යවරයාට තිබෙන බලතල ප්‍රකාරව රටවල් නම් කොට, ඒ රටවල ලංකාවේ ඉන්න පාර්ශ්වකරුවන්ට අදාළව ලබා දෙන නඩු තීන්දු ලංකාවේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, ලංකාව තුළ බලාත්මකභාවයක් ලබා දීම සම්බන්ධයෙන් වන නියමයන් අනුමත කිරීම. ගරු අමාත්‍යතුමා මාතෘකාවට අදාළ ගැසට් පත්‍රයේ සඳහන් නියමයන් ඉදිරිපත් කළා. ඉන් අනතුරුව තිබෙන්නේ, ඒ නියමයන් මේ ගරු සභාව ඇතුළේ සම්මත කර ගැනීම. ඒ අනුව ඊළඟට සාකච්ඡා වෙන්න ඕනෑ, එක්කෝ මේ ගැසට් පත්‍රයේ සඳහන් නියමයන්, පනත පිළිබඳව සහ මේ ආශ්‍රිතව අපේ රටේ ගොඩනැඟෙන්න ඕනෑ නීති මොනවාද, එහෙම නැත්නම් අපේ රටේ හැදෙන්න ඕනෑ ප්‍රතිපත්ති මොනවාද කියන කාරණායි. ඒ සාකච්ඡාව තමයි මේ සභාව ඇතුළේ සිද්ධ වෙන්න ඕනෑ. අපි ඒ සාකච්ඡාවට පිටින් ගියොත්, ඒ සාකච්ඡාව අද අපෙන් මඟහැරෙන්න ඉඩ තිබෙනවා.

2024 වර්ෂයේ සම්මත වුණු පනතක් තිබෙනවා. ඒ පනත ප්‍රකාරව අද ගරු ඇමතිතුමා විසින් රටවල් පිළිබඳව යම් ඉදිරිපත් කිරීමක් කළා. ඒ වාගේම අවසාන වශයෙන් කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුත් මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කළා. ඒ සම්බන්ධයෙන් යම් ප්‍රමාණයකට මා සතුටු වෙනවා. නමුත්, එතුමා විසින් ඉදිරිපත් කළ එක් කාරණයක් ගැන පමණක් මම සඳහන් කරනවා. ඒ තමයි, අනිවාර්යයෙන් විදේශ කටයුතු ඇමතිතුමාගෙන් සහ නීතිපතිතුමාගෙන් අහන්න ඕනෑය කියන කාරණය. නමුත්, පනතේ තිබෙන්නේ "අදහස් විමසිය හැකිය" කියලා. අවශ්‍ය නම් අදහස් විමසන්න පුළුවන්. ඒ විධියට තමයි පනතේ තිබෙන්නේ.

කොහොම හරි කමක් නැහැ, සාකච්ඡාව හැදෙන්න ඕනෑ එතැනට. නමුත්, අපි කාලයක් තිස්සේ බලාගෙන ඉන්නවා, එළියේ උත්තර දී ගන්න බැරි ප්‍රශ්නවලට, එළියේ උත්තර දී ගන්න සභාවක් නැති ප්‍රශ්නවලට මේ සභාව තුළ විකෘති ලෙස අදහස් ප්‍රකාශ කරමින් ඉදිරියට යනවා. ගරු ඇමතිතුමා අදහස් ප්‍රකාශ කළා. ඊළඟට, විපක්ෂය නැඟිටලා පරාජය වහගන්න කියවනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි, කොළඹ මහ නගර සභාවේ නගරාධිපති තෝරන ඡන්දය පැරදුණු එක. ඒ ඡන්දය පැරදුණේ ඇයි කියන එක මම කියන්න ඕනෑ. පැරදුණේ ඡන්දය නැති නිසා. ඒ හිටපු සභිකයන් ඡන්දය දුන්නේ නැති නිසා පැරදුණා. එතකොට එහෙනම් කියන්න ඕනෑ, "පැරදුණා, අපි ඊළඟ වතාවේ දිනන්න මෙහෙම වැඩක් කරමු" කියලා නේ; එහෙම නේ කථාව හැදෙන්න ඕනෑ. නමුත්, ඒ වෙනුවට පැරදුණේ මේ නිසා කියලා වෙන කථාවක් කියනවා. සමාජයටත්, ඇත්තටම විපක්ෂයේ පාක්ෂිකයෝ ටිකටත් දැන් කථාව මාරු වෙලා තිබෙන්නේ; චැනල් මාරු වෙලා තිබෙන්නේ. දැන් සාකච්ඡාව යන්නේ රහස් ඡන්දය පැවැත්වූ නිසා තමයි ප්‍රශ්නය, රහස් ඡන්දයක් පැවැත්වූ එක නීති විරෝධීයි කියායි. ඒකටත් මාර්ගෝපදේශයක් අල්ලාගෙන ඉන්නවා. පනත අදාළ කර ගන්නේ නැහැ. පනතේ තිබෙන සඳහන් කිරීම් සම්බන්ධයෙන් එතරම් ප්‍රබල විධියට අර්ථ කථනය දෙන්නේ නැහැ. ඒ වෙනුවට කියනවා, "පැරදියි, ඒකට හේතුව මේකයි" කියලා. දැන් මෙහෙම බලන්න ඕනෑ. රහස් ඡන්දයක් පවත්වන්නේ නැතුව විවෘත - open - ඡන්දයක් පැවැත්වූවා නම් දිනනවාද? විවෘත ඡන්දයක් පැවැත්වූවා නම් දිනනවා නම්, රහස් ඡන්දයක් පැවැත්වූවාමත් දිනනවා නේ. මොකක්ද ප්‍රශ්නය? ඒ සාකච්ඡාව දැන් නැහැ, ඉවරයි. පැරදීමට හේතු වාගේම පැරදුණු එක ගැන සාකච්ඡාවක් නැහැ. ඒ වෙනුවට සාකච්ඡාව වෙන පැත්තකට යනවා. ඒ මොහොතේදී අපි දැක්කා, ඒ රාජ්‍ය නිලධාරිනිය ඉතාම පැහැදිලිව පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනවා. නමුත්, එයට අභියෝග කරමින් මේ මොහොතේදී පාර්ලිමේන්තුවේ කෑ ගැහුවාට වැඩක් නැහැ. එහෙම නම් අධිකරණයට යන්න ඕනෑ. අධිකරණයට ගිහිල්ලා බලන්න. එතකොට නිවැරදි මොකක්ද කියන කාරණය එළියට ගන්න පුළුවන්. නමුත්, එහෙම අධිකරණයට යන්නේත් නැහැ. ඕක ඔතැනින් ඉවර වෙනවා. නමුත්, මේ මොහොතේ සාකච්ඡාවක් හදාගෙන මේ විධියට දඟලනවා. නමුත් මේකේ තිබෙන අවාසනාවන්ත තත්ත්වය තමයි, එළියේ උත්තර දී ගන්න බැරි ප්‍රශ්නවලට මේ සභාවේ කාලය කා දැමීම.

ලෝකයේ නීති ක්‍රම ඉක්මනින් දියුණු වෙමින් ඉස්සරහට යනවා. ඒ වාගේම විවිධ සාකච්ඡා මතු වෙනවා. සමාජය දියුණු කිරීමත්, සමාජයේ මිනිසුන් මුහුණ දෙමින් ඉන්න ප්‍රශ්න සම්බන්ධවත් සාකච්ඡා වෙනවා. නමුත්, අපේ රටේ පාර්ලිමේන්තුවේ අපි ඒක දකින්නේ නැහැ. පාර්ලිමේන්තුවේ දකින්නේම ගාල ගෝට්ටිය. විපක්ෂයේ පළමුවැනි කාර්යභාරය වෙන්න ඕනෑ, ආණ්ඩුව විසින් ගත්ත මොකක් හෝ ක්‍රියාමාර්ගයක් නැත්නම් ගෙනෙන ලද පනත් කෙටුම්පතක්, එහෙම නැත්නම් ගැසට් පත්‍රයක් සම්බන්ධයෙන්, අවශ්‍ය නම් ඊට එහා ප්‍රතිසංස්කරණ වෙනුවෙන් සාකච්ඡා කිරීමයි. පළමුවැනි රාජකාරිය වෙන්න ඕනෑ ඒකයි. දෙවැනි කාර්යභාරය විය යුත්තේ මොකක්ද? ආණ්ඩුව කරන්නේ නැති මොනවා හෝ ප්‍රතිසංස්කරණ නීතිය තුළ තිබෙනවා නම් ඒ වෙනුවෙන් ආණ්ඩුවට බල කිරීම. ඒ වෙනුවට, මොන පනතක් ආවත් ආණ්ඩුව වට්ටන්න පුළුවන් කියලා හිතාගෙන වෙන විකාර කියවනවා; දූක වහගන්න මෙතැන අඬනවා. එම නිසා ඒ ගැන අපට තිබෙන්නේ ඇත්තටම කනගාටුවක්.

මම නැවතත් සම්මත කිරීම සඳහා අද දිනයේ ඉදිරිපත් කරපු නියමයන් පිළිබඳව අවධානය යොමු කරන්න කැමතියි. පැහැදිලිවම මේ සම්බධයෙන් ඇතැම් නඩු තීන්දු තිබෙනවා තමයි. නමුත් මේ සඳහා නිශ්චිත නීතියක් අවශ්‍යයි. පනතක් තිබුණා, පනත ප්‍රකාරව යම් රටවල් ප්‍රමාණයක් ගැසට් පත්‍රයේ පළ කරලා, ඒ ඒ රටවල් ණය සම්බන්ධ, එහෙම නැත්නම් දික්කසාද - divorce - නඩු වැනි සිවිල් නඩුවලට අදාළව ලබා දෙන තීන්දු අපේ රටේ

[ගරු නිතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා]

බලාත්මක කරවා ගැනීම සම්බන්ධයෙන් සඳහන් කිරීමක් තමයි කරලා තිබෙන්නේ. ඇත්තටම මේ වෙනකොට පනත සම්මත වෙලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා වෙලා තිබෙනවා. ඊට පසුව තමයි ගැසට් පත්‍රය මඟින් මේ නියම ඉදිරිපත් වෙන්නේ. කෙසේ හෝ, රටවල් 53ක සංඛ්‍යාවක් ගැසට් පත්‍රයේ පළ කරලා තිබෙනවා. අපි දකිනවා, වෘත්තීය ජීවිතය වෙනුවෙන් ලංකාවෙන් පිට රටවලට ගිහිල්ලා ජීවත් වන අපේ ශ්‍රී ලාංකික පුරවැසියන් මුහුණ දෙන ඇතැම් තත්ත්වයන් පිළිබඳව. ඔවුන් අපිත් එක්ක සාකච්ඡා කරනකොට අපට තේරෙනවා, ඉතා ඉක්මනින් දියුණු වුණු, සංවර්ධනය වුණු නීතිය ලෝකයේ රටවල් පාවිච්චි කරනවා කියලා. ඒ වෙනුවට අපි ඉතාම පැරණි සමහර ක්‍රමවේද වාගේම procedures පාවිච්චි කරමින් තවම එක තැනක හිර වෙලා ඉන්නවා. ඒ පුරවැසියන්ට එක පැත්තකින් අපේ රටේ දික්කසාදයක් ගන්න, නැත්නම් වෙනත් නඩු තීන්දුවක් ක්‍රියාත්මක කරවා ගන්න අපහසු පැත්තක් තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් සලකා බලා මේ රටවල් 53 ගැසට් කිරීම සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊයේ දිනයේදී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්වුණා. අපි මේ සම්බන්ධයෙන් කථා කරද්දී මේ පනත සම්බන්ධයෙන් හෝ ගැසට් පත්‍රය සම්බන්ධයෙන් හෝ මෙවැනි ආකාරයේ කිසිදු විරුද්ධ මතයක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මතු වුණේ නැහැ.

එවැනි මතයක් ඉදිරිපත් කළා නම් ඊට වඩා දීර්ඝ සාකච්ඡාවකට යන්න තිබුණා. කෙසේ හෝ, ඒ කාරක සභාවේදී අපේ අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් බොහෝ සාකච්ඡා සිදු වුණා. ඒ වාගේම ඉදිරියේදී ඉටු කිරීමට නියමිත සහ ගොඩනැඟීමට නියමිත ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙනුත් එහිදී සාකච්ඡා වුණා. විශේෂයෙන් අපි ගරු ඇමතිතුමාගෙන් විමසීමක් කළා, අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය -digitalize- කිරීම සම්බන්ධයෙන්. ඇත්තටම මේ වනකොට ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වාගේම පනතක්, එහෙම නැත්නම් ගැසට් පත්‍රයක් පළ වූ පමණින් එයින් බලාපොරොත්තු වන අවශ්‍යතාව ඉෂ්ට වෙන්නේ නැති බව අපි දන්නවා. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරියක් සඳහන් කළා වාගේම ඒකට බොහෝ කරුණු fulfil වෙන්න ඕනෑ, සම්පූර්ණ වෙන්න ඕනෑ. යටිතල පහසුකම්වල ඉඳලා, සමහර විට ඉන්න සුළු සේවකයාගේ ඉඳලා ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ. කාලයක් තිස්සේ අධිකරණ ක්ෂේත්‍රයේ වැඩ කරන නිසා අපිට හිතෙනවා, සුළු වෙනස්කමක්වත් කර ගන්න බැරි ඇයි, මේ සුළු වෙනස්කමක්වත් කරගෙන නැත්තේ ඇයි කියලා. අධිකරණ පද්ධතිය තුළ නඩු ලක්ෂ 10කට වැඩිය හිරවෙලා තිබෙනවා. අපට පේනවා, නඩු හිර වෙමින් අධිකරණ ක්‍රියාවලිය ඉක්මනින් ඉතාම අකාර්යක්ෂම වෙමින් යන බව. කාලයක් තිස්සේ එවැනි තත්ත්වයක් ගොඩනැඟෙමින් තිබෙනවා. ඒ නිසා අපි කල්පනා කළා, මේ පාලකයන්ට මේකට උත්තර හොයන්න බැරි වුණේ ඇයි කියන එක. දැන් කථාව පැහැදිලියි. ඊට උත්තර හොයනවා වෙනුවට, මේ ගරු සභාව තුළ ඒ සඳහා සාකච්ඡා ගොඩනඟනවා වෙනුවට අපි උදේ දැක්කා වාගේ විවිධ නාටක ඉදිරිපත් කරනවා. නාටක විතරයි තිබෙන්නේ. නාටක ඉදිරිපත් කරමින් මේ ගරු සභාවේ කාලය කා දමනවා. කාලය වටිනාම ලෙස පාවිච්චි වෙන්නේ ලංකාවේ කොහේද කියලා ඇහුවොත් ඒකට පිළිතුර තමයි, මේ ගරු සභාව කියන එක. මේ ගරු සභාව තුළ සිදු වන සාකච්ඡා, සංවාද මත තමයි අපේ රට තව අවුරුදු 100කට පස්සේ කොහේද තිබෙන්නේ කියන එක තීරණය වෙන්නේ. තව අවුරුදු 100කට පස්සේ අපේ රට කොහේද තිබෙන්නේ කියන සාකච්ඡාව හැදෙන්නේ මේ ගරු සභාව තුළිනුයි. තව අවුරුදු 100කට පස්සේ අපේ අනාගත පරපුරේ දරුවෙක් මේ ගරු සභාවේ සිදු වන සාකච්ඡා ඇතුළත් හැන්සාඩ් වාර්තාව කියෙව්වොත් ඒ අයට හම්බ වෙන්නේ මොනවාද? ඒ අයට හම්බ වෙන්නේ සතියකින් විසඳෙන්න ඕනෑ ඉතාම සුළු ප්‍රශ්නයක්, වැස්සක් නිසා ඇති වුණු තත්ත්වයක් වාගේ සාකච්ඡාවට බඳුන් නොකළ යුතු ඉතාම කුඩා මාතෘකාවක් පිළිබඳව දවස් ගණන්, පැය ගණන් අරගෙන මේ සභාවේ සාකච්ඡා කරලා තිබෙනවාය කියන එකයි. අවුරුදු 100කට පසුව බැලුවොත් ඒ සාකච්ඡාව කිසිදු එලක් නැති සාකච්ඡාවක් වනවා.

පසුගිය දවස්වල අපි දැක්කා, ලුණු ප්‍රශ්නය වාගේම වෙනත් ප්‍රශ්න ගැනත් මේ ගරු සභාව තුළ සාකච්ඡා වනවා. අද මේ කරන්න යන සාකච්ඡාවත් එහෙම තමයි. ඒ නිසා විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට හිතෙන්න ඕනෑ, අද කෙරෙන සාකච්ඡාවට අදාළ හැන්සාඩ් වාර්තාව තව අවුරුදු 100කට පසුව අරගෙන කියවන දරුවෙකුට "අවුරුදු 100කට පෙර කරලා තිබෙන සාකච්ඡාව අදටත් අපේ ජීවිතවලට බලපානවා" කියන එක. නමුත්, අපට අහන්න ලැබෙන්නේ නැහැ, එවැනි සාකච්ඡා. අද ආණ්ඩු පක්ෂය පැත්තෙන් විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ නියමයන් ඉදිරිපත් කළා. නමුත් විපක්ෂය පැත්තෙන් වෙන සාකච්ඡාවක් හැදුණා. දැන් මේ සාකච්ඡාව ඒ පැත්තට ගලාගෙන යනවා. ඇත්තටම කරන්න තිබුණේත්, කාලයක් තිස්සේ අපි නොකළේත් අදාළ point එකට කථා කරලා, ඒ අදාළ සාකච්ඡාව ගොඩනඟන එකයි. අපි ගෙනෙන පනත් කෙටුම්පතේ හෝ ගැසට් පත්‍රයේ හෝ තිබෙන ඉතා කුඩා අඩුපාඩු බරපතළ විධියට අරගෙන අවුරුදු 100කින් පස්සේ එය බලපාන විධිය ගැන සාකච්ඡා කරන්න දවස් ගණනක් ගත්තත් කමක් නැහැ. නමුත් මම හිතනවා, මේ විධියට කාලය අරගෙන අපි කරන්නේ අවුරුදු 100කින් පස්සේ අපේ රටේ ඉපදෙන දරුවන්ට අසාධාරණයක් කියලා. ඒ නිසා මේ සාකච්ඡාව point එකට අනුව කරගෙන යමු කියන ඉල්ලීම මම කරනවා.

මම ආපසු අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කථා කරන්න කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, අධිකරණ ක්ෂේත්‍රයට මේ නියමයන් ප්‍රමාණවත් නැහැ, මේ ගැසට් පත්‍රය ප්‍රමාණවත් නැහැ කියලා. ඊයේ දිනයේ අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ ඉදිරියේදී අධිකරණ ක්ෂේත්‍රයේ ක්‍රියාවලිය තවත් ශක්තිමත් කිරීම සඳහා වැඩ කිරීමට පොරොන්දු වෙමින්, අපේ ගරු ඇමතිතුමාට ඒ වැඩකටයුතු කිරීම සඳහා ශක්තිය ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda. You have seven minutes.

[පූ.භා. 11.57]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කර ඇති නියමයන් පිළිබඳව මේ ගරු සභාවේ කථා කරන මේ මොහොතේ මීට පෙර කථා කළ කවීක මහත්මයා කොළඹ මහ නගර සභාවේ ඡන්ද විමසීම පිළිබඳව සිහිපත් කළා. මම ඒ ගැන කියන්න දීර්ඝ

වේලාවක් ගන්නේ නැහැ. හැබැයි, ඔබ දන්නේ නැති වුණාට අද ඔබට වග කියන, රටට වග කියන අපේ ආදරණීය ජනාධිපතිතුමා එදා විපක්ෂයේ ඉන්නකොට රහස් ඡන්දය දැක්කේ දූෂිත ඡන්දයක් විධියටයි කියන එක මම කියන්න ඕනෑ.

එතුමා එදා මේ විපක්ෂය තුළ කටයුතු කරනකොට රහස් ඡන්ද හැඳින්වූයේ දූෂිත ඡන්ද විධියට. තමන් ඡන්දය දීපු තමන්ගේ මන්ත්‍රීවරයා නගර සභාවට ගියාම තමන්ගේ මතය, තමන් ප්‍රකාශ කළ ඡන්දයේ වටිනාකම විවෘතව ප්‍රකාශ කිරීම දැකීමට ජනතාව කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මා විශ්වාස කරන විධියට දියුණු ක්‍රමය බවට පත් වෙන්න ඕනෑ විවෘත ඡන්දයයි. මේ කාරණය මම විවාදයක් බවට පත් කරගන්නේ නැහැ. රහස්‍යභාවය තුළ තිබෙන්නේ, දූෂණය, වංචාව කියන කාරණය පමණක්ම බව මේ මොහොතේ මා සිහිපත් කරනවා.

විශේෂයෙන්ම වත්මන් ජනාධිපතිවරයා ජනාධිපති අපේක්ෂකවරයා විධියට 2024 වසරේ කිරිබත්ගොඩදී පැවැති රැළියකදී කිව්වා, මේ රටට දැවැන්ත වංචාවක් කරපු අර්ජුන් ඇලෝසියස් කියන පුද්ගලයා මේ රටට ගෙන ඒම තමන්ගේ ප්‍රමුඛ කාර්යයක් කියලා. හැබැයි, එතුමාට ඒ ප්‍රමුඛ කාර්යය තවම ඉෂ්ට කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ ප්‍රමුඛ කාර්යය ඉෂ්ට කරගන්න බැරි වෙච්ච මොහොතේ අපි සතුටු වෙනවා, වත්මන් ආණ්ඩුව මේ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ නියම අනුමත කිරීමට ගෙන ඒම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පනතට ඉතාම කැමැතියි. ඒ වාගේම අපි මේ පනතේ තිබෙන යම් යම් අඩුපාඩුකම් පෙන්වා දෙන්න මේක අවස්ථාවක් කරගන්නවා. මේ පනත තුළ වාණිජ හා සිවිල් නඩු ගැන පමණක් සඳහන් වෙලා තිබෙනවා. අපරාධ නඩු ගැන මේ පනතෙහි සඳහන් වෙලා නැහැ. අපරාධ නඩු පිළිබඳවත් මේ පනත තුළ සඳහන් වුණා නම් වටිනවා කියන කාරණය මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම රටවල් 50කට අධික සංඛ්‍යාවක් එකඟතාව පළ කරපු රටවල් විධියට මේ පනත තුළ සලකා තිබෙනවා. හැබැයි ඒ රටවල් අතර අපි දැක්කේ නැහැ, අපිත් සමඟ ඉතාම ළඟින් ගනුදෙනු කරන විශේෂයෙන්ම අපේ රටේ වැඩි පිරිසක් සම්බන්ධතා ගොඩ නඟා ගත්තු චීනය, රුසියාව, ජපානය, සෞදි අරාබිය කියන රටවල් මේ පනතට ඇතුළු කර තිබෙනවා කියන කාරණය. ඒ වෙනුවට අපි දැක්කේ, අපි සක්‍රියව සම්බන්ධතා නැති වනාටුව, ටුවාලු රාජ්‍යය, නාඋරු රාජ්‍යය, සියෙරා ලියෝන් වැනි රාජ්‍යයන් මෙයට එකතු කර තිබෙන බවයි. ඒ නිසා චීනය, රුසියාව, ජපානය, සෞදි අරාබිය කියන රටවලුත් මේකට එකතු වුණා නම් හොඳයි කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරනවා.

ඒ වාගේම අභියාචනා කිරීමට ඇති ක්ෂේත්‍රය, කාල සීමාව මේ පනත තුළ ඉතාම සීමාසහිත කර තිබෙනවා. ඒ නිසා ඒ සඳහා යම් කාලයක් ලබා දෙනවා නම්, ඒ සඳහා යම්කිසි කාලයක් එකතු කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ මතක් කරනවා. ඒ වාගේම මේ පනතේ, "පනත අදාළ වීම" කියන කොටසේ (ආ) වගන්තියේ සඳහන් වෙනවා, ව්‍යාජනය කිරීම "අමාත්‍යවරයා විසින් සෑහීමකට පත් වන අවස්ථාවකදී" කියලා. මා විශ්වාස කරනවා, රටවල් දෙකක් අතර සිදු වන අන්‍යෝන්‍ය සම්බන්ධතා, අධිකරණමය කටයුත්තකදී "අමාත්‍යවරයා විසින් සෑහීමකට පත් වන" වැනි නිශ්චිත නොවන ප්‍රකාශ සිදු කර තිබීම කිසිසේත්ම සුදුසු නැහැ කියලා. එය මේ සභාව හමුවේ සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම ඒ පිළිබඳව කථා කරනකොට විශේෂයෙන්ම අමාත්‍යවරයා කොපමණ සෑහීමකට පත් වෙනවාද, එහෙම නැත්නම් කුමන කරුණු නිසා සෑහීමකට පත් වෙනවාද, එහෙම නැත්නම් සෑහීමකට පත් වෙන රාමුව කුමක්ද, එහි සීමාව මොකක්ද කියන කාරණා පිළිබඳව නිශ්චිතව මෙහි දැක්වෙන්නේ නැහැ. නීතිපතිවරයාගෙන් විමසිය හැකිය යන්න සඳහන් කර තිබුණත්, එය සිදු වන්නේ අමාත්‍යවරයාගේ අභිමතය පරිදි. ඒ පිළිබඳවත් අපි මේ මොහොතේ සිහිපත් කරනවා. ඒ කාරණය පිළිබඳව මේ පනත තුළ නිශ්චිතභාවයක් නැහැ කියන කාරණයත් මේ මොහොතේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ පනත අපේ රටට, විශේෂයෙන් වර්තමාන ආණ්ඩුව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළට එකතු කරගෙන, ඔවුන් ලබා දීපු පොරොන්දු මේ රටට ඉෂ්ට කරන්න කටයුතු කරනවා නම්, ඒ වාගේම මේ තුළින් මේ රටේ ජනතාවට -ඔවුන්ගේ නඩු කටයුතුවලදී- යම්කිසි සහනයක් සැලසෙනවා නම් විශේෂයෙන්ම වටිනවා කියන කාරණයත් කියමින්, මේ මොහොතේ රට තුළ පවතින ගැටලුවක් පිළිබඳවත් මතක් කරනවා. අපේ හිටපු කථානායක රන්වල මැතිතුමා මේ අවස්ථාවට සම්බන්ධ වෙලා ඉන්න නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ තිබෙන ගැටලුවක් මම මේ මොහොතේ ඉදිරිපත් කරන්න කැමැතියි.

වත්මන් ආණ්ඩුව එදා විපක්ෂයේ ඉන්නකොට ඔවුන් සේවක අයිතීන් වෙනුවෙන් අරගළ කළ ආකාරය අපි දැක්කා. ඔවුන් එදා විපක්ෂයේ කාර්යභාරය ඉටු කරමින්, අරගළ කරමින් ජනතා නායකයන් විධියට සේවක අයිතීන් වෙනුවෙන් පෙනී සිටියා. ඒ පෙනී සිටි කණ්ඩායම අද ආණ්ඩු පක්ෂයේ, මේ සභාවේ ඉදිරි පෙළේ කටයුතු කරනවා. එම නිසා විශේෂයෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අද පවතින ගැටලුව ඔබතුමන්ලාට සිහිපත් කරන්න ඕනෑ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පැය අටක තිබුණු සේවා මුරය අද පැය නවය දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ අතිකාල සේවා පැය ගණන පැය හතරේ සිට පැය තුන දක්වා අඩු කරලා තිබෙනවා. විශේෂයෙන් ඔබතුමන්ලාට මතක ඇති, කම්කරුවන් ගැන කථා කරමින් කටයුතු කළ ආකාරය; කම්කරු දිනයේ තේමාව වුණේ කුමක්ද කියන එක. එදා වැඩි පැය ගණනක් සේවය කරන්න කියා ඉල්ලා සිටි වෙලාවේ ඊට විරුද්ධව කම්කරුවා එළියට බැස්සා. වත්මන් ආණ්ඩුවේ අය එදා කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියා. එදා කම්කරු ජනතාව වෙනුවෙන් පෙනී සිටි වෘත්තීය සමිති නායකයන් වැඩි සංඛ්‍යාවක් අද මේ ආණ්ඩුවේ ඇමතිකම් දරනවා. එවැනි ආණ්ඩුවකින් ඒ කම්කරු නීතිවලට පටහැනි දේවල් සිදු නොවනවා නම් හොඳයි කියන කාරණය මා සිහිපත් කරනවා.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවක මහතුන්ගේ පැය අටේ සේවා මුරය පැය නවය දක්වා වැඩි කිරීම තුළින් අද ඔවුන් දැඩි අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ පැය හතරේ අතිකාල සේවය පැය තුන දක්වා අඩු කිරීම තුළිනුත් ඔවුන් ඉතාම අසරණතාවකට පත් වෙලා තිබෙනවා. එම නිසා ඔවුන්ගේ දෛනික කටයුතු, සමහර වෙලාවට ඔවුන් සැලසුම් කරපු දේවල් අද ඔවුන්ට සිදු කර ගන්න නොහැකි වෙලා තිබෙනවා. අපේ ගරු අශෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෘත්තීය සමිති නායකයෙක් විධියට කටයුතු කළා. අද දවසේ එතුමාට, ආණ්ඩුවට යම්කිසි හැකියාවක් තිබෙනවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කරන -ආරක්ෂක අංශයේ කටයුතු කරන- ඒ සේවක මහතුන්ගේ ගැටලුවට මේ මොහොතේ මැදිහත් වෙන්න. ඊට මැදිහත් වෙලා ආණ්ඩුව විධියට පිළිතුරක් දෙන්න පුළුවන්නම් වටිනවාය කියන කාරණයත් මා සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ගෙනෙන නියමයන් සම්මත කර ගැනීම

[ගරු වාසනක මාදුගොඩ මහතා]

සඳහා අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒවා සම්මත කර ගනිමින් ඒ සියලු කටයුතු සාර්ථක කර ගැනීමට ආණ්ඩුවට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Hon. Ruwanthilaka Jayakody. You have eleven minutes.

[අ.භා. 12.05]

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විවාදයට ගැනෙන මාතෘකාව නඩු තීන්දු සම්බන්ධ කාරණයක් වුණත්, මට හිතුණා විපක්ෂයෙන් දැන් කථා කළ කාරණාත් එක්ක යම් අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. අපි දන්නවා, කොළඹ මහ නගර සභාවේ පරාජය සම්බන්ධයෙන් විපක්ෂයේ අයට කනගාටුවක් තිබෙන බව. ඒක සාධාරණයි. එහි බලය පිහිටුවන්න එතුමන්ලා සෑහෙන්න උත්සාහ කළා. මට නීතිමය කාරණා සම්බන්ධයෙන් විශේෂ ප්‍රාගුණ්‍යයක් නොතිබුණත්, ඉස්සෙල්ලා මතු වුණු මාතෘකාවත් එක්ක මම කැමැතියි, සාමාන්‍ය පුරවැසියෙක් විධියට යම් අදහසක් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න.

කොළඹ මහ නගර සභාවේ කාරණය සම්බන්ධයෙන් ඉතා කනගාටුවෙන් සිටින විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට අපි පළමුවෙන්ම යෝජනා කරනවා, ඊයේ කොළඹ මහ නගර සභාව තුළ පැවැති ඒ ඡන්දය සම්බන්ධයෙන් වන වීඩියෝව සම්පූර්ණයෙන් බලන්න කියලා. ඒ වීඩියෝව සම්පූර්ණයෙන් බලන්න. ඒක බලද්දී ඔබතුමන්ලාට පැහැදිලිව පෙනේවි, අවසානයේදී විපක්ෂයේ මන්ත්‍රීවරයකු විසින්ම රහස් ඡන්දයක් පවත්වන්න ඕනෑය කියන යෝජනාව ඉදිරිපත් කරන ආකාරය. ඒක සභාවේ සියලුදෙනාම ඒකමතිකව ස්ථිර කළා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධයෙන් විරෝධතාවක් තිබුණා නම් සභාවෙන් නැගිටලා යන්න තිබුණා. ඊයේ මේ ගරු සභාවේත් පොඩි කාරණයක් නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු නැගිටලා ගියා. එහෙම නම් කොළඹ මහ නගර සභාවේ ඔබතුමන්ලාගේ ඒ මන්ත්‍රීවරුන්ටත් තිබුණා ඒ වෙලාවේ ඒක වැරදියි කියලා, එය පිළිගන්නේ නැතිව පිට වෙලා යන්න. හැබැයි, එහෙම දෙයක් කළෙත් නැහැ. මොකද, එතුමන්ලා දන්නවා සියලුදෙනාම එකඟ වෙලා, නීතියට අනුව තමයි රහස්‍ය ඡන්දයක් පැවැත්වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. අපි දන්නවා, පළාත් පාලන මැතිවරණයේදී ජනතාව ඡන්දය දුන්නේ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම් අනුව බව. ජාතික ජන බලවේගයට ඡන්දය දුන්නේ මේ රටේ පැහැදිලි වෙනසක් බලාපොරොත්තුවෙන්. "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය නිවැරදිව ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන අදහසත් එක්ක තමයි ජාතික ජන බලවේගයට ජනතාව ඡන්දය දුන්නේ. ඒ වාගේම තමයි විපක්ෂයේ අනිකුත් දේශපාලන පක්ෂ නොයෙකුත් බොරු අවලාද කියද්දිත් එම පක්ෂවලට ඡන්දය දුන්නේ ඒගොල්ලෝ දරන මතයත් එක්කයි. ජාතික ජන බලවේගයට වැඩි මන්ත්‍රීවරු සංඛ්‍යාවක් පත් වෙලා තිබුණු නිසා සමහර පක්ෂවල මන්ත්‍රීවරු හිතන්න ඇති, හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දෙන්න ඕනෑ කියලා. ඒ අදහස එක්ක තමයි පැහැදිලිවම කොළඹ මහ නගර සභාවේදී ඡන්දය ඒ විධියට පාවිච්චි කළේ.

රහස් ඡන්දයක් තිබුණේ. ඒ රහස් ඡන්දයේදී විපක්ෂයේ මතය පිළිගත්තා නම් ඒගොල්ලන්ට විපක්ෂයේ මතය ජයග්‍රහණය කරවන්න අනිවාර්යයෙන් ඡන්දය දෙන්න තිබුණා. නමුත්, එහෙම නොවෙයි සිදු වුණේ. මම හිතනවා, ප්‍රජාතන්ත්‍රවාදීව විය යුතු හොඳම දේ, රහස් ඡන්දය තියලා තමතමන්ගේ හෘදය සාක්ෂිය අනුව ඒ වෙලාවේ ඡන්දය භාවිත කරන්න අවස්ථාව ලබා දීමයි කියලා. මට ඒ සම්බන්ධව වැඩිදුර කථා කරන්න අවශ්‍ය නැහැ. මට අවශ්‍ය වුණේ ඒ සම්බන්ධයෙන් යම් අදහසක් දෙන්න පමණයි.

දැන් මම අද දවසේ අපේ මාතෘකාවට එන්නම්. අද අප සාකච්ඡා කරන්නේ, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ගෙනෙන නියමයන් පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ අධිකරණවල සහ යම් විදේශීය රටක අධිකරණවල නඩු තීන්දු යම් අවබෝධයක් සහිතව අන්‍යෝන්‍යව පිළිගැනීම මෙම පනතෙහි ඉතාම වැදගත් කාරණයක්. මේ මඟින් අපි ලෝකයේ තවත් රටවල අධිකරණ පද්ධති සමඟ යම් ආකාරයකින් සම්බන්ධ වෙනවා. ඒ අනුව, රටක් විධියට අපි විවිධ රටවල අධිකරණ නඩු තීන්දු පිළිගන්නවා වාගේම, ඒ රටවල් ද අපේ අධිකරණ නඩු තීන්දු පිළිගන්නා තැනට එනවා. ඒ මඟින් අපේ ජාත්‍යන්තර සබඳතා තවදුරටත් පුළුල් වෙනවා කියන අදහස ඉදිරිපත් කරන්න පුළුවන්. රටක් විධියට ඉදිරියට යෑමට නම්, අපට මේ වාගේ ජාත්‍යන්තර සම්බන්ධතා අවශ්‍යයි. අපි ඒ සම්බන්ධතා ඉතළින්ම ගොඩ නඟමින් ඉන්නවා.

පසුගිය කාලයේදී විපක්ෂය මොකක්ද කිව්වේ? ඔබතුමන්ලාත් එය දන්නවා. හිටපු ජනාධිපතිවරයා පවා කිව්වේ මොකක්ද? අප වාගේ දේශපාලන පක්ෂයක් ආවාම ජාත්‍යන්තර සබඳතා නැති වෙනවා කිව්වා. ජාත්‍යන්තර සබඳතා තිබෙන්නේ ඒගොල්ලන්ට විතරයි කිව්වා, ඉංග්‍රීසියෙන් කථා කරලා ණය ගන්න පුළුවන් ඒගොල්ලන්ට විතරයි කිව්වා. එහෙම තමයි ඒගොල්ලන් හිතුවේ. ජාත්‍යන්තර සබඳතා කියන්නේ ණය ගන්න එක කියලා තමයි ඒගොල්ලෝ හිතුවේ. එහෙම තත්ත්වයක් තිබුණේ. හැබැයි ඔබතුමන්ලා දකිනවා, විපක්ෂයේ හිටපු සමහර නායකයන් ගිහිල්ලා ජාත්‍යන්තරය කෙසේ ජය ගත්තා ද කියලා. "Channel 4" නාළිකාවෙන් හොඳටම ඇණ ගත්තේත් ඒගොල්ලන්ම තමයි.

ජාත්‍යන්තර සබඳතා පවත්වන්න යනවා කියලා ඒගොල්ලෝ ඒ රටවලට ගියේ කොහොමද? ඔබතුමන්ලා දකින්න ඇති, සාටකය දමාගත් අය ද ඇතුළුව හිටපු ජනාධිපතිවරුන් ජාත්‍යන්තර රැස්වීම්වලට ගියේ කොහොමද කියලා. විශාල පිරිසක් එකතු කරගෙනයි ගියේ; ඒගොල්ලන් තමන්ගේ පවුල්වල ඉන්න විශාල පිරිසකුත් එකතු කරගෙන තමයි ජාත්‍යන්තර සබඳතා සඳහා වෙන වෙන රටවල සාකච්ඡාවලට ගියේ. ඒගොල්ලෝ ඒක විනෝදයක් කර ගත්තා, ඒගොල්ලෝ ඒක trip එකක් කර ගත්තා. ඒගොල්ලන් ණය ගන්න කොට, නැත්නම් වෙන වෙන ව්‍යාපෘති ගේන කොට තමන්ට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය කොච්චරද, තමන්ට ලැබෙන කොමිස් ප්‍රමාණය කොච්චරද කියන ඒවා තීරණය කරන සම්බන්ධතා තමයි ඒගොල්ලන් ගොඩනඟා ගත්තේ. ඒ අරමුණු තමයි ඒගොල්ලන් ජාත්‍යන්තර සබඳතාවලින් ඉෂ්ට කරගෙන තිබුණේ. නමුත් අපි පැහැදිලිවම දන්නවා, විදේශ ඇමති ගරු විජිත හේරත් මැතිතුමා, ඒ වාගේම අදාළ අමාත්‍යාංශය මේ කටයුතු සම්බන්ධීකරණය කරමින් ජාත්‍යන්තර සබඳතා ඉතාම හොඳ මට්ටමින් ගොඩ නඟා ගනිමින් යනවා කියලා. පසුගිය කාලයේදී ඔබතුමන්ලා දකින්න ඇති, අපේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඇතුළු ටීම් එක ඉන්දියාවට, චීනයට, වියට්නාමයට වාගේම ජර්මනියටත් ගිහිල්ලා හොඳ ජාත්‍යන්තර පිළිගැනීමකුත් එක්ක සාකච්ඡා කළ ආකාරය. විදේශ සම්බන්ධතා ශක්තිමත් කරගෙන මේ රටට අවශ්‍ය වාසිසහගත තත්ත්වයක් තමයි එතුමන්ලා සාකච්ඡා කරලා නිර්මාණය කළේ. ඒ සම්බන්ධතා ඉදිරියටත් ඒ විධියටම පවත්වාගෙන යනවා; ඒ විධියටම ගොඩ නඟාගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පනතට අදාළ වන නඩු තීන්දු ගත්තොත්, ණය ගනුදෙනු සම්බන්ධ නඩු තීන්දු වාගේම විවාහය, දික්කසාදය පිළිබඳ නඩු තීන්දු ද අදාළ වෙනවා. සාමාන්‍යයෙන් මෙවන් නඩු කටයුතුවලදී පාර්ශ්ව දෙක රටවල් දෙකක වාසය කරන විට නඩුව විභාග කර දඬුවම් නියම කිරීම, ඒ වාගේම නියම කරන දඬුවම ක්‍රියාත්මක කිරීම සමහර විට ප්‍රායෝගිකව ගැටලුසහගත වෙනවා. එවන් අවස්ථාවකදී මේ පනතින් සපයා ඇති ප්‍රතිපාදන මඟින් එකී ප්‍රායෝගික ගැටලු සම්පූර්ණයෙන් නොවුණත්, අවම කර ගැනීමට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ අනුව අධිකරණමය කටයුතු පහසු වෙනවා. ඒ විතරක් නොවෙයි, මේ මඟින් ඒ නඩුවට අදාළ පාර්ශ්වයන්ට අනවශ්‍ය මානසික පීඩා ඇති වීම ද වළකිනවා. ඒ වාගේම නඩුවට අදාළ පාර්ශ්ව රටවල් දෙකක ජීවත් වුණත්, නීතිය ක්‍රියාත්මක කිරීමට එය බාධාවක් වන්නේ නැහැ.

දික්කසාදය හෝ විවාහය අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම වැනි නඩු කටයුත්තකදී වැදගත්ම දේ තමයි, පැමිණිලි පාර්ශ්වය ඉල්ලා සිටින තීන්දුව ලැබුණු අවස්ථාවක ඔවුන් දෙරටක වාසය කිරීම බාධාවක් කර නොගනිමින් අදාළ තීන්දුව ක්‍රියාත්මක කිරීමට හැකි වීම. එය පැමිණිලිකාර පාර්ශ්වයේ මානසික සහනයට හේතුවක් වනවා. ඒ වාගේම අධිකරණ ක්‍රියාදාමයකින් තමන් ලද තීන්දුව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට හැකි වීමත් ඔවුන්ගේ සතුටට කාරණයක් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනතේ විධිවිධාන තවදුරටත් පුළුල් විය යුතු බව මගේ අදහසයි. විශේෂයෙන් අපරාධ නඩු සම්බන්ධයෙන් ද මේ පනත බලාත්මක කළ යුතු බව මගේ හැඟීමයි. මොකද, අපි දන්නවා, සමහර අපරාධකරුවන් අපරාධ සිදු කරලා මේ රටින් පලා ගොස් විදේශ රටවල ආරක්ෂිතව, සුව පහසුව ජීවත් වන බව. පසුගිය කාලයේ පැවැති දේශපාලන අධිකාරිය දේශපාලන බල පුළුවන්කාරකම උපයෝගි කර ගනිමින් ඒ අයට ආරක්ෂාව සලසා ගැනීමට හැකි වන පරිදි ඒ අය විදේශ රටවලට යැව්වා. ඒ විධියට තමයි කටයුතු සිද්ධ වුණේ. ඔබතුමන්ලා දන්නවා, හිටපු ජනාධිපතිතුමාගේ හොඳම යාළුවෙකු වූ අර්ජුන මහේන්ද්‍රන්ට මොකක්ද කළේ කියලා. ඉතාම දරුණු විධියට ආර්ථික අර්බුදයක් කරා මේ රට ගෙන යන්න පදනම් වෙච්ච කාරණාත් එක්ක චෝදනාවට ලක් වුණු අර්ජුන මහේන්ද්‍රන් මංගල උත්සවයකට සහභාගි වෙන්න කියලා හොර රහසේ විදේශගත කළා. ඒ වාගේ දේවල් තමයි හිටපු පාලකයන් සිදු කර තිබුණේ.

ඒ වාගේම වැරැදිකරුවන් අත්අඩංගුවට අරගෙන නඩු විභාගයට ගැනීම පිළිබඳ ඉතා අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. විදේශ රටවල ලබා දී තිබෙන අපට වැදගත් වන නඩු තීන්දු සම්බන්ධයෙන් ඉදිරියේදී තවත් වටයකදී පනත් කෙටුම්පත් ආදිය ඉදිරිපත් කරලා මේ පිළිබඳව පුළුල් සාකච්ඡාවක් සිදු කිරීමේ හැකියාවක් තිබෙනවා නම් ඒක ඉතාම වැදගත් කියලා මම විශ්වාස කරනවා.

ඔබතුමන්ලා දන්නවා, නීතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවුණු කාලයක් තිබුණු බව. අපරාධකරුවෝ පාර්ලිමේන්තුවටත් ආවා. ඒ කාලයේ ඔබතුමන්ලා දකින්න ඇති, මිනීමරුවන්ට ජනාධිපති සමාව ලැබුණා. තමන්ගේ පෙම්වතිය ඝාතනය කරලා මරණ දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වූ කෙනා ජනාධිපති සමාව යටතේ නිදහස් කරලා වෙනත් රටකට පලා යැමට සැලැස්වීමට පැවැති ක්‍රමවේදය උපයෝගි වෙලා තිබෙනවා. ඒ වාගේම, මනුෂ්‍ය ජීවිතත් එක්ක සෙල්ලම් කරලා මුදල් හම්බ කිරීම පමණක් ජීවිතය කරගත් අපේ සමහර ඇමතිවරුන්ට මේ පාර්ලිමේන්තුවේදී විශ්වාසය පළ කළ අවස්ථා ද තිබුණා. හැබැයි, අපි බලයට ඇවිල්ලා ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කර තිබෙනවා. අපි අපරාධකාරයින්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා. ඔබතුමන්ලා දකින්න ඇති, ඔවුන්ට විරුද්ධව පසුගිය කාලයේ නඩු පැවරීම් කළා; අධිකරණය මඟින් දඬුවම් ලබා දුන්නා. ඒ වාගේම, ඉදිරියේදී තවත් පෝලිමක් ඉන්නවා කියන එක තමයි අපට ඔබතුමන්ලාට කියන්න තිබෙන්නේ.

අප මේ රට පාලනය කරද්දී මේ සියලු කාරණා සැලකිල්ලට ගන්න ඕනෑ. මේ රටේ මහ ජනතාව විසින් තෝරාගත් අපි මහ ජනතාවට සේවය කරන්න සූදානම් වෙලා තමයි මේ ඇවිල්ලා ඉන්නේ. මේ තාවකාලික කාලය සඳහා පාර්ලිමේන්තුවට පැමිණෙන මන්ත්‍රීවරුන් දූෂිත ක්‍රියාවල නියැළෙනවා නම්, ජනතාවගේ මුදල් මංකොල්ල කාලා වෙනස් වූ ක්‍රියාදාමවලට යොමු වනවා නම් ඒක ඉතාම වැරැදි සහගතයි. ඒවා වළක්වන්න තමයි නීතිය නිවැරැදි විධියට හදා ගන්න අවශ්‍ය වන්නේ.

නීතිගරුක, යුක්තිගරුක දේශයක් ගොඩ නැඟීම සඳහා මේ දූපතට පමණක් සීමා නොවී සමස්තය සමඟ එකතු වෙන්න අපට අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීති සම්පාදනය කරන ලෙස ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Asitha Niroshana Egoda Vithana. You have 11 minutes.

[අ.භා. 12.16]

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා ඉදිරිපත් කරන ලද 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වන නියමයන් සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ, විපක්ෂයට නඩු ගොඩක් පැටලිලා තිබෙන වෙලාවක කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ආණ්ඩු පක්ෂය විධියට අද අපට සතුටුදායක දිනයක්. ඊට හේතු වන පළමුවෙනි කාරණය තමයි, කොළඹ මහ නගර සභාව විශිෂ්ට ජයග්‍රහණයක් ලබා අද අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම දිවුරුම් දීලා වැඩ භාර ගන්නා දවස වීම. ඒ විතරක් නොවෙයි, සජබයට දිනන්න පුළුවන් කියලා පාරම් බාපු කොලොන්නාව නගර සභාවත් අප විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර තිබෙන දවසක්, අද දවස. ඒ විතරක් ද නොවෙයි, සජබය ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ හදවත බඳු නුවරඑළිය මහ නගර සභාවේත් අප බලය පිහිටවපු වෙලාවක්, මේක.

ඒ විතරක් නොවෙයි, මේ වන විට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේත් ජාතික ජන බලවේගය විසින් බලය පිහිටුවා තිබෙනවා. ඒ නිසා මේක අපට සතුටුදායක අවස්ථාවක්. කොලොන්නාව මහ නගර සභාවේ ජාතික ජන බලවේගයට මන්ත්‍රී ධුර 9යි, විපක්ෂයට 10යි. සමගි ජන බලවේගයේ වැඩිම ඡන්ද ප්‍රතිශතය ගත්ත සුසිල් කුමාර මන්ත්‍රීතුමා ජාතික ජන බලවේගයට සහයෝගය දෙනවා, හෘදය සාක්ෂියට එකඟව. වැරදි පාරේ යන, නිවැරදි නොවන, අසංවිධිත, සමගියක් නැති විපක්ෂය අත හැර, ආණ්ඩු පක්ෂයට එකතු වෙලා අද රට වෙනුවෙන් ගමනක් යන්න එතුමා තීන්දු කරලා තිබෙනවා. ඒ නිසා අද අපට ඉතාම සතුටුදායක දවසක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ඔබතුමා දන්නවා ඇති, අර නවසීලන්ත රග්බි කණ්ඩායම match එකට කලින් "හකා" කියලා නැටුමක් නටනවා. ඒ වාගේම ඡන්දයට කලින් අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමන්ලා ඇතුළු මේ විපක්ෂයේ උන්දැලාත් හකා නැටුවා, ලොකු සද්දයක් දාලා; බෙර ගහලා, සද්දේ දාලා හකා නැටුවා. අන්තිමට මොකක්ද ප්‍රතිඵලය? එක්සත් ජාතික පක්ෂය පිහිටවපු දවසේ ඉඳලා බලය තිබුණු තැන තමයි කොළඹ මහ නගර සභාව. ඉතිහාසයේ පළමු වතාවට කොළඹ ජනතාව අද ඔවුන් පලවා හැර තිබෙනවා. හරි නම්, මුජිබුර් රහුමාන් මහත්මයලා දේශපාලනයෙනුත් ඉල්ලා අස්වෙන්න ඕනෑ. 2023 මාර්තු මාසයේ 09වැනි දා පවත්වන්න තිබුණු, නමුත් කල් දමපු පළාත් පාලන ඡන්දයේදී, අනේ හත්ඉළව්වේ! එතුමා මේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයත් අතහැර ගියා නේ, කොළඹ මහ නගර සභාවේ නගරාධිපති වෙන්න. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයත් අතහැරලා ගියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද සිද්ධ වුණේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා, ඡන්දත් නැහැ, ඡන්ද තියන්න සල්ලිත් නැහැ, මොකුත් නැහැ කියලා. අන්තිමට මුජිබුර් මන්ත්‍රීතුමාට මොකක්ද වුණේ? පාර්ලිමේන්තු මන්ත්‍රීකමත් නැහැ, නගරාධිපතිකමත් නැහැ, ගෙදරට වෙලා විරවාපට්ටන් ගහගෙන බලාගෙන හිටියා. ආයෙත් පාර්ලිමේන්තුවට ආවා. ඇවිල්ලා ගත්තා කරට කොළඹ මහ නගර සභාවේ බලය අත්පත් කරගන්න වැඩේ. සජබයට මන්ත්‍රී ධුර කීයද? සජබයට මන්ත්‍රී ධුර 29යි. ලජ්ජා වෙන්න ඕනෑ මුජිබුර් රහුමාන් මහත්මයලා. එතුමන්ලා බෙර ගහලා "හකා" නැටුවේ. ඒත් සද්දේ වාගේ වැඩ නැහැ. පාර්ලිමේන්තුව දෙක කරනවා උදේ පාන්දර ඇවිල්ලා. පිළිවෙළකට යන ආණ්ඩුවේ කටයුතුවලට බාධා කරනවා. මේ පාසල් ශිෂ්‍යයන් මෙතැනට ඇවිල්ලා ඉන්නේ අත්දැකීම් ලබා ගන්නයි. විනයගරුක, ශිෂ්ට සම්පන්න පාර්ලිමේන්තුවක්, ශිෂ්ට සම්පන්න රටක්, මේ දරුවන් වෙනුවෙන් ගොඩනහන්න ඕනෑ. විනයක් ඇතිව මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යද්දී ඒක මුළුමනින් කඩාකප්පල් කරලා, පාර්ලිමේන්තුවේ පළමු පැය කිහිපයම විනාශ කරන්න කටයුතු කරනවා, ඉස්සරහට වෙලා ඉඳගෙන ඉන්න ඔය කට්ටිය. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් එහෙම කෙනෙක්. එහෙම සද්දේ දාගෙන හිටපු මහත්වරුන්ට ලජ්ජා නැහැ. අද කොළඹ මහ නගර සභාව එතුමන්ලා මුළුමනින් පරාජයට පත් වෙලා තිබෙනවා. නම නම් සමගි ජන බලවේගය. මරික්කාර් මන්ත්‍රීතුමා මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වුවොත්, මුජිබුර්ට බණිනවා. මුජිබුර් මන්ත්‍රීතුමා press conference එකක් පැවැත්වුවොත්, මරික්කාර්ට බණිනවා. ඉතින්, සමගිය කොහේද තිබෙන්නේ? අසමගි පක්ෂයක්, අසමගි විපක්ෂයක්. කොළඹ මහ නගර සභාව වාගේ තීරණාත්මක දේශපාලන ආයතනයක බලයට පත් වෙන්න පක්ෂයක සමගිය වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, 2018දී කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රී ධුර 119න් එක්සත් ජාතික පක්ෂයට තිබුණා, මන්ත්‍රී ධුර 60ක්. ජනතා විමුක්ති පෙරමුණට තිබුණේ මන්ත්‍රී ධුර 6යි. 2025 පළාත් පාලන මැතිවරණයේදී -මේ මැතිවරණයේදී- මොකක්ද වුණේ? SJB එකට මන්ත්‍රී ධුර 29යි. UNP එකට මන්ත්‍රී ධුර 13යි. ඒ දෙකම එකතු කළත් මන්ත්‍රී ධුර 42යි. අපි -NPP එක- මන්ත්‍රී ධුර 6 ඉඳලා 48 දක්වා වැඩි කරගන්න සමත් වුණා, මෙවර මැතිවරණයේදී. මුජිබුර් මන්ත්‍රීතුමන්ලා, මරික්කාර් මන්ත්‍රීතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. නැඟෙනහිර කොළඹ කොට්ඨාස 7යි, කොට්ඨාස 7න් 7ම අපි දිනුම්. බොරැල්ල ආසනයේ කොට්ඨාස 7යි, 7න් 7ම අපි දිනුම්. බටහිර කොළඹ කොට්ඨාස 5යි, 5න් 5ම දිනුම් ජාතික ජන බලවේගය. උතුරු කොළඹ කොට්ඨාස 9යි, 9න් 6ක් අපි දිනුම්. මැද කොළඹ කොට්ඨාස 19යි, 19න් 19ම අපි දිනුම්. කොළඹ මහ නගර සභාවේ කොට්ඨාස 3ක් හැර අනෙක් සියලු කොට්ඨාස අපි ජයග්‍රහණය කර තිබෙනවා, ඉතිහාසයේ පළමු වතාවට. ඒවා එක්සත් ජාතික පක්ෂයේ සහ සජබයේ බලය තිබුණු තැන්. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු නගරාධිපති අපේක්ෂකයා ඉල්ලපු ගමත් පරාදයි. තව මොන කථාද? ඉල්ලපු ගමත්, දකුණු කොළඹ කොට්ඨාසයත් පරාදයි. ඒ අසමගි විපක්ෂයක ප්‍රතිඵල. ඒ අසමගිය දැන් මේ පාර්ලිමේන්තුවෙත් පෙනෙන්න පටන් අරගෙන තිබෙනවා. සඳුදා ඡන්දය තිබුණා, කොළඹ මහ නගර සභාවේ බලය ජාතික ජන බලවේගයට ගියා; අඟහරුවාදා පාර්ලිමේන්තුවට ආවෙත් නැහැ. අර point of Order විපක්ෂයේ ඉන්න අපේ දයාසිරි මන්ත්‍රීතුමන්ලා, ඒ හැමෝම මේ පාර්ලිමේන්තුවේ කාලය විනාශ කරලා ඒ අයගේ පරාජිත දේශපාලනය වහගන්න අසාර්ථක උත්සාහයක් දරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා අපට කියන්න තිබෙන්නේ මේකයි. ආණ්ඩුවට මුහුණ දෙන්න නම්, ඉස්සෙල්ලාම තමුන්නාන්සේලා සමගි වෙලා එන්න. ඔබතුමන්ලා දන්නවා මේ ඡන්දය පවත්වපු විදිය කොහොමද කියලා. ඊයේ ඉඳලා මේ ගැන කතන්දර ගොඩක් කිව්වා. රෝයි බෝගහවත්ත කියන්නේ දශක ගණනාවක් කොළඹ මහ නගර සභාවේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයා; වර්තමානයේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයා. ඒ වීඩියෝ එක හරියට බලන්න. බාගෙට බලන්න එපා; තක්කඩි විදියට බලන්න එපා; වාසියට විතරක් බලන්න එපා. ඇප නැති වෙලා, ඇඩ්‍රස් නැතිවෙලා දේශපාලන වශයෙන් නන්නත්තාර වුණාට පස්සේ press conference එකකට ගිහිල්ලා, mediaවලට ගිහිල්ලා දෙන voice-cut එකක කෑල්ලක් විතරක් බලන්න එපා. තමන්ගේ ලජ්ජාව වහගන්න, දේශපාලන නිරුවත වහගන්න ඒකේ කෑලි විතරක් බලන්න එපා. ඒ සමස්ත වීඩියෝ එක බලන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්ත වීඩියෝ එකේ අවසානයේ මොකක්ද තිබෙන්නේ? සමස්ත වීඩියෝ එකේ අන්තිමට තිබෙන්නේ මොකක්ද? දශක ගණනාවක් කොළඹ මහ නගර සභාව නියෝජනය කරපු රෝයි බෝගහවත්ත මන්ත්‍රීවරයා අවසානයට කියනවා, "අපට දැන් ඡන්ද දෙකක් ඕනෑ නැහැ. අපි කැමැතියි රහසිගත ඡන්දයකට. ඒකමතිකයි; අපි යමු." කියලා. අනේ! හත්වලාමේ, එහෙම නම් අපි ඒකට එකඟ නැහැ කියලා සීතාවකදී කළා වාගේ බහින්න එපායැ එළියට. විපක්ෂය එළියට බැස්සා ද? කොළඹ මහ නගර සභාවේ ඡන්ද විමසීමට විරුද්ධයි කියලා විපක්ෂය එළියට බැස්සා ද? බහින්න එපායැ එළියට. පුළුවන් නම් ගණ පූරණය නැති කරන්න එපායැ සීතාවක පළාත් පාලන ආයතනයේදී කළා වාගේ. මොකක්ද කළේ? ඒ එකඟතාවෙන් තමයි කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ පුරපති තෝරන ඡන්දයේදී පළමුව මත දෙකක් ආවා ඒ ඡන්දය විමසන්නේ රහසිගතව ද, විවෘතව ද කියලා. ඒ මත දෙකෙන් අවසානයේදී එකඟතාවකට ඇවිල්ලා, සමගි ජන බලවේගයේ රෝයි බෝගහවත්ත මන්ත්‍රීවරයා ඒකට සම්පූර්ණයෙන්ම එකඟවෙලා ඒකමතිකව තමයි රහසිගත ඡන්දයකට ගියේ. තව මොනවා ද කථා? නැත්නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එළියට බහින්න තිබුණා නේ. එළියට බැස්සා ද? එළියට බැස්සේ නැහැ. ඒ අය හිතුවා මොකක් හරි ගේමක් ගහන්න පුළුවන් කියලා. අන්තිමට ඉවරයි. පැරදුණාට පස්සේ අනේ ඇවිල්ලා හොටු හූරනවා. පච්! ලේන්සුවක් නොවෙයි, ඒකට towel එකක් ළඟ තියා ගන්න ඕනෑ. ඊට පස්සේ අපේ දිලිත් ජයවීර මහත්මයාත් ඒකට අඩ තියන්න ගියා. අනේ, එතුමාත් කලින් දවසේ කිව්වා, ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයාට විරුද්ධව අපේ දෙන්නාත් ඡන්දය දෙනවා කියලා. ඒ දෙන්නාම ඡන්දය දුන්නා. නමුත් මොකක්ද වුණේ? අරුණෙන් ගහනවා; දෙරණෙන් ගහනවා; ආණ්ඩුවේ වැඩ කටයුතු ව්‍යාකූල කරන්න උත්සාහ කරනවා. මේ පත්තර පඩංගු, ටීවී පඩංගුවලින් මඩ, අවලාද පතුරුවනවා. අන්තිමට ඒ දෙන්නාත් ඡන්දය දුන්නා. ඒ දෙන්නා ඡන්දය දීලාත් පරාදයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේ කොළඹ මහ නගර සභාවේ ඡන්ද

විමසීමෙන් මුළු විපක්ෂයම කුඩුපට්ටම් වෙලා ගියා. එම නිසා අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න විපක්ෂය දුර්වල, අසාර්ථක, නායකත්වයක් නැති, අසංවිධිත, සමගියක් නැති, අසමගි, එකාට එකෙක් නැති විපක්ෂයක් බවට පත් වෙලා තිබෙනවා. ඉවරයි; තමුන්නාන්සේලාගේ ඓතිහාසික කාර්යභාරය ඉවරයි. අඩුම තරමින් තමුන්නාන්සේලාට විපක්ෂයේ part එකවත් අද කර ගන්න බැරි මට්ටමට ඇද වැටී තිබෙනවා. මේ තමයි තමුන්නාන්සේලාගේ ඉරණම. ඒ නිසා අපි කියා සිටිනවා, දයාසිරි මහත්තයෝ, කරුණාකර උදේ පාන්දර මේ පාර්ලිමේන්තුවේ වටිනා කාලය කන්න එපා කියලා. ඒකාබද්ධ විපක්ෂය විධියට ඇවිල්ලා උදේ පාන්දර මේ පාර්ලිමේන්තුවේ කාලය පැයක්, දෙකක් කන්න එපා. ඒක රටට වැදගත් කාලයක්. ගරු කථානායකතුමා පිළිවෙළකට, න්‍යාය පත්‍රයකට අනුව මේ සභාව මෙහෙයවනවා. තමුන්නාන්සේලා ඒක ව්‍යාකූල කරන්න උත්සාහ කරන්න එපා. තමුන්නාන්සේලාට අද ඉතිරි වෙලා තිබෙන්නේ ඒ පැය කිහිපය විතරයි.

අද වන විට තමුන්නාන්සේලාගේ බිමේ දේශපාලනය මුළුමනින්ම ඉවර වෙලා තිබෙනවා. මේ සමස්ත වගකීම දුර්වල විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයාත් බාර ගන්න ඕනෑ. මේ තමයි විපක්ෂයේ ඉරණම. ඒ වාගේම තමයි, කොළඹට නායකත්වය දුන්නු මුජිබුර් රහුමාන්, මරික්කාර් ඇතුළු පිරිසත් මේ පරාජයේ වගකීම බාර ගන්න ඕනෑ. ඒකට ආණ්ඩු පක්ෂයට දෙස්දෙවොල් තියලා වැඩක් නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා වටිනා කාලය කාලා වැඩක් නැහැ. මේ රටට වැදගත් කාලය තමයි අපි මේ පාර්ලිමේන්තුවේ ගත කරන්නේ. පිළිවෙළකට, න්‍යාය පත්‍රයකට අනුව මේ පාර්ලිමේන්තුව දැන් ක්‍රියාත්මක වෙනවා. පාසල් දරුවන්ට ඇවිල්ලා බලන්න පුළුවන් පාර්ලිමේන්තුවක් අපි ගොඩ නඟා තිබෙනවා. මීට පෙර තිබුණු පාර්ලිමේන්තුවල ස්වභාවය අපි දැකලා තිබෙනවා නේ. බෝතල්වලින් ගහ ගත්ත, මිරිස් කුඩු ගහපු, පිහි ඇදපු, කුණුහරුප කියපු, මයික් කඩපු පාර්ලිමේන්තුවක් නේ තිබුණේ. නමුත් විනයක් ඇතිව මේ පාර්ලිමේන්තුව අද පවත්වාගෙන යනවා. ඒ නිසා ඒකට බාධා කරන්න ලෑස්ති වෙන්න එපා. රටේ ජනතාව එක පෙළට මේ ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට ගමට යන්න බැරි නිසා පාර්ලිමේන්තුව ඇතුළට ඇවිල්ලා මේ කාලය විනාශ කරන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ මහ නගර සභාවේ ජයග්‍රහණය තුළින් සමස්ත විපක්ෂයේ පරාජය අද තහවුරු වෙලා තිබෙනවා. ජාතික ජන බලවේග ආණ්ඩුවේ ජනාධිපතිවරයාත්, පාර්ලිමේන්තුවත්, පළාත් පාලන ආයතන 267 විතරක් නොවෙයි, - අපි හිතුවේ අපට බලය පිහිටුවන්න පුළුවන් වන්නේ පළාත් පාලන ආයතන 267ක කියලා- පළාත් පාලන ආයතන 267 ඉක්මවන බලයක් දැන් බිමේ නිර්මාණය වෙනවා. ඒ සියලු බලයත් එක්ක මේ රට ගොඩ නඟන කර්තව්‍යයට අපි පියවර තියනවා. ඒකට අඩ තියන්න, බාධා කරන්න කිසිදු බලවේගයක් නැහැ කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ අධිකරණ අමාත්‍යාංශය යටතට ගැනෙන මේ විවාදයට එක් වන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කර ඇති නියම ගැන සාකච්ඡා කරන මේ මොහොතේ මම කියන්න කැමැතියි, විදේශ නඩු තීන්දු භාර ගන්නවා වාගේම ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳව අප තුළ තිබෙන ගෞරවයත් කවදාවත් කෙලෙසිලා නැති බව.

විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉඳලා පහළට සිටින විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳව වාගේම ඒ අයට සිදුවන අසාධාරණකම් පිළිබඳවත් දිගින් දිගටම මා මේ පාර්ලිමේන්තුව තුළ කථා කර තිබෙනවා. මෙවැනි ප්‍රශ්න ගණනාවක් පසුගිය ආණ්ඩු පැවති කාලයේ සිද්ධ වුණා. තමන්ට පක්ෂව තීරණ තීන්දු දෙන අය, තමන්ට කැමැති අය කැමැති තැන්වලට තල්ලු කළා. සමහර වෙලාවට ඇතැම් ජනාධිපතිවරුන් තමන්ගේ නඩු තිබෙනකොට විනිශ්චයකාරවරුන් කැඳවා කථා කරපු ඒවා, නීතිපතිවරුන් ගෙනැල්ලා කථා කරපු ඒවා, නඩු අහන්නේ කොහොමද කියලා කියපුවා ගැන අපි මේ පාර්ලිමේන්තුවේ ඇති වෙන්න කථා කරලා තිබෙනවා. අපි හිතුවා, මේ ආණ්ඩුවවත් අඩුම තරමින් එතැනින් ගැලවෙයි කියලා. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව විශාල කථා බහක් පසුගිය කාලයේ සිද්ධ වුණා. හැබැයි, අද වෙනකොට මේ ආණ්ඩුවත් ඒ සෙල්ලම ම ක්‍රමානුකූලව පටන් ගනිමින් ඉන්න තත්ත්වයක් තමයි අපි අත්දකිමින් ඉන්නේ.

මේ ආණ්ඩුව ආපු ගමන් මොකක්ද කළේ? ඉස්සෙල්ලාම කිව්වා, බන්දුල කරුණාරත්න විනිශ්චයකාරතුමා ගැන. එතුමා අභියාචනාධිකරණයේ සභාපතිතුමා විධියට කටයුතු කළා. මට මතකයි, වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු පිරිස දිගටම කිව්වා, මේ විනිශ්චයකාරවරයාට විරුද්ධව අවශ්‍ය තීන්දු ගන්න අපි 114දෙනෙක් යෝජනාවක් අත්සන් කර තිබෙනවා, අපි ඒක පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අවශ්‍ය කටයුතු ටික කරනවා කියලා. හැබැයි, මොකක්ද වුණේ? ඒක පැත්තකින් තියලා එතුමාට විශ්‍රාම පූර්ව නිවාඩු ගන්න ඉඩ දුන්නා. අපි දන්නේ නැහැ, ඒක ඩීල් එකක්ද, මොකක්ද කියලා. එහෙම ගන්න දීලා මොකක්ද කළේ? එතුමා ඊයේ තමයි විශ්‍රාම යන්නේ. එතුමා ඊයේ විශ්‍රාම යනකම් අභියාචනාධිකරණයේ සභාපති තනතුරට වැඩ බලන කෙනෙක්ව දැම්මා. ඒක මීට කලින් කවදාවත් සිද්ධ නොවුණු කාරණයක්. හිටපු සභාපතිතුමාව විශ්‍රාම පූර්ව නිවාඩු යවා, එතුමාට කකුලක් පිට කකුලක් දමාගෙන විශ්‍රාම සුවයෙන් ඉන්න දීලා අභියාචනාධිකරණයේ සභාපති විධියට acting කෙනෙක් පත් කළා; රඟපාන්න කෙනෙක්ව පත් කළා. මොහොමඩ් ලෆාර් මැතිතුමා තමයි ඒ කටයුත්තට පත් කළේ. එතුමාට අවස්ථා ගණනාවක් ආවා, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. හැබැයි, ඒකට අවශ්‍ය ඉඩකඩ ලබා දුන්නේ නැහැ.

2024 දෙසැම්බර් 15වන දා විතර වෙනකොට පුරප්පාඩු 4ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණා. එතැනට ඉස්සෙල්ලාම යන්න තිබුණේ බන්දුල කරුණාරත්න මැතිතුමාට. නමුත් එතුමා විශ්‍රාම

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

පූර්ව නිවාඩු යවා තිබුණා. ඒ නිසා සෝභිත රාජකරුණා විනිසුරුතුමාව තමයි ඊළඟට යවන්නේ. ඊළඟට, මේනකා විජේසුන්දර විනිශ්චයකාරතුමිය එතැනට යවන්න තිබුණා. හතරවැනියාට හිටියේ මොහොමඩ් ලෆාර් මැතිතුමා. ඊළඟට එතුමාව යවන්න තිබුණා. ඊළඟට සම්පත් විජේරත්න විනිසුරුතුමා සහ සම්පත් අබේකෝන් විනිසුරුතුමා වාගේ අය ජ්‍යෙෂ්ඨත්වය අනුව හිටියා. නමුත් මොකක්ද කළේ? මොහොමඩ් ලෆාර් මැතිතුමාව පැත්තකට දමලා සම්පත් විජේරත්න විනිසුරුතුමා එතැනට ගෙනාවා. එතුමා ඊට වඩා ජ්‍යෙෂ්ඨයි කියලා යම් තර්කයක් තිබෙන්න පුළුවන්, දිසා අධිකරණයේ ඇති වුණු තත්ත්වයන් එක්ක. නමුත් ලෆාර් මැතිතුමාව ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන එක දිගින් දිගටම ප්‍රතික්ෂේප කරනවා. මොකක්ද ඒකට හේතුව? අපට පෙනෙන විධියට ඒකට එක හේතුවක් තමයි, Council of Legal Education එකට විරුද්ධව එතුමා දුන් තීන්දුව. විශේෂයෙන්ම Law College admissions සම්බන්ධව එතුමා තීන්දුවක් දෙනවා, විනිශ්චයකාරවරයෙකු විධියට. අග්‍ර විනිශ්චයකාරතුමා ඒ ගැන යම් කිසි විධියක අසතුටකින් හිටියාය කියන කාරණය අපි දන්නවා. ඒ නිසා මොකද වුණේ? ඒ ක්‍රියාදාමය තුළ ලෆාර් මැතිතුමාගේ නම යෝජනා කෙරෙන්නේ නැහැ. එතුමා තියාගෙන ඉන්නවා. අපි හිතුවා, මේ ආණ්ඩුව ආ පසුව මේක වෙයි කියලා. ජනාධිපතිතුමාට වුණත් පුළුවන්, මේ සම්බන්ධව සලකා බලා ඕනෑ නම් කෙළින්ම එතුමාව නිර්දේශ කරන්න. නමුත් එතුමා ඒ නිර්දේශය කළේත් නැහැ.

ඊළඟට මොකක්ද වුණේ? අද ලෆාර් මැතිතුමා අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු විධියටම ඉඳලා ගෙදර යනවා; විශ්‍රාම යනවා. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු විධියට එතුමාට විශ්‍රාම යන්න තිබිච්ච අවස්ථාව අද අහිමි කරලා තිබෙනවා. ඒක ඉතාම වැරදි සහගත ක්‍රියාවලියක්. ඒ වාගේම අමරසේකර මැතිතුමාත් විශ්‍රාම ගියා, 17වෙනි දා. ඇත්තටම එතුමා වෙනුවට ලෆාර් මැතිතුමාව පත් කරන්න තිබුණා. ගිය සිකුරාදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රැස්වීමක් තිබුණා. ඒකට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් 09වෙනි දා ලිපියක් එවනවා, ලෆාර් මැතිතුමාව නිර්දේශ කරලා. එහෙම නැත්නම් එතුමාව පත් කරන්න කියලා. හැබැයි, මොකක්ද කරන්නේ? මේ කමිටුව රැස්වෙලා අපේ සභානායක බිමල් රත්නායක මැතිතුමා මේ යෝජනාව ඉල්ලා අස් කර ගන්නවා. මම අහන්න කැමැතියි, ලෆාර් මැතිතුමා සම්බන්ධව එවූ යෝජනාව ඉල්ලා අස් කර ගත්තේ ඇයි කියලා. ජනාධිපති ලේකම්තුමා එවන්නේ ජනාධිපතිතුමාගේ ලිපියක් වෙන්න ඕනෑ. එතකොට ඒක ඉවත් කර ගත්තේ ඇයි? අද ලෆාර් මැතිතුමා විශ්‍රාම යනවා. බන්දුල කරුණාරත්න මැතිතුමා ගිය 16වෙනි දා විශ්‍රාම ගියා. අමරසේකර මැතිතුමා 17වෙනි දා විශ්‍රාම ගියා. ලෆාර් මැතිතුමා අද -18වෙනි දා- විශ්‍රාම යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 16වෙනි දා ලිපියක් එවනවා, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මැතිතුමාව අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු කරලා. ඒ සම්බන්ධයෙන් අපට ගැටලුවක් නැහැ. එතුමා නීතිඥවරයෙකු විධියට දක්ෂ ලෙස වැඩ කරපු කෙනෙක්. හැබැයි හෙට ඉඳලා ලෆාර් මැතිතුමාට සිද්ධ වෙනවා, අධිකරණයේ පෙනී සිටින Bar එකේ සාමාන්‍ය නීතිඥයෙකු විධියට කටයුතු කරන්න. මේකේ අවසානයේ මොකක්ද සිද්ධ වෙන්නේ? ඇත්තවශයෙන්ම මේ ක්‍රියාවලිය තුළ මේ රටේ හිටපු හොඳ විනිශ්චයකාරවරයෙකුට විශාල හානියක් සිදු වෙනවා. මේක මා දකින්නේ සාහසික ක්‍රියාවක් විධියටයි. ඊයේ රැස් වුණා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. ඉතින් ඊයේ හෝ මේ යෝජනාව ගේන්න තිබුණා. මොකද, විශ්‍රාම යන්න කලින් එක දවසක් හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු විධියට කටයුතු කරලා යන්න ලෆාර් මැතිතුමාට අවස්ථාව තිබුණා. අද ඒ අවස්ථාව අහෝසි කරලා තිබෙන්නේ. මම කියන්න කැමැතියි, ගන්න තිබෙන වැඩ ටික අරගෙන ඊට පස්සේ අර කොණ්ඩම් වාගේ ඉවත් කරන තැනකට මේ අයව පත් කරන්න එපා කියලා. මොකද, මේක ඉතාම වැරදි සහගත ක්‍රියාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ ආණ්ඩුව යටතේ අද මේ රටේ මුස්ලිම් ප්‍රජාවට විශාල අසාධාරණයක් සිද්ධ කරලා තිබෙනවා. ඉතිහාසයේ ඉඳලා බැලුවාම මුස්ලිම් ජාතික කිසිම ඇමතිවරයෙකු නැති කැබිනට් මණ්ඩලය මේ කැබිනට් මණ්ඩලය විතරයි. අද ලෆාර් මැතිතුමාටත් මේ හැන්දෙන්ම බෙදලා තිබෙනවා. කොළඹ මහ නගර සභාවේ අවුරුදු ගාණක් මුස්ලිම් නගරාධිපතිවරුන් හිටියා. අද මුස්ලිම් ජාතිකයෙකු නගරාධිපති විධියටත් නැහැ, උප නගරාධිපති විධියටත් නැහැ. මුස්ලිම් ජනතාවගේ සහාය, ශක්තිය ලබා ගත් ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුව මුස්ලිම් ජනතාවට කරන මේ අසාධාරණය පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මුස්ලිම් ද, සිංහල ද, ද්‍රවිඩ ද කියලා අපට අදාළ නැහැ. නමුත් මේ ක්‍රියාදාමය තුළ ලෆාර් මැතිතුමාට විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපේ බන්ධනාගාර 28 දිහාම බැලුවොත් පෙනෙනවා, ඒවායේ ඉන්නේ CID එකේ නිලධාරින් බව. CID එකේ නිලධාරින් බන්ධනාගාරවලට එනවා, උදේ ඉඳන් රෑ වෙනතුරු ඒවායේ ඉන්න ප්‍රධානීන්ගෙන් කටඋත්තර ගන්නවා. මොකක්ද, මේකට හේතුව? මේකට හේතු වුණේ වෙන මොකුත් නොවෙයි, මේ තිබෙන චක්‍රලේඛ පටලවා ගැනීමයි. මේ, චක්‍රලේඛයක් නිවැරදිව නිකුත් කර ගන්න බැරි ආණ්ඩුවක්. අවසානයේ මොකක්ද වුණේ? චක්‍රලේඛයක් එවනවා 2025.05.01වෙනි දා, "වෙසක් පුර පසළොස්වක පොහොය දිනය නිමිත්තෙන් සිරකරුවන්ට පිරිනැමෙන යෝජිත විශේෂ රාජ්‍ය සමාව" කියලා සඳහන් කරලා. ඒ චක්‍රලේඛයේ ගහලා එවනවා, කරුණු හතරක්. ඒ වාගේම මේ ක්‍රියාවලිය පිළිබඳව 06වෙනි දා වෙනකොට ලැයිස්තුවක් එවන්න කියනවා. එහෙම ලැයිස්තුවක් එවීම සම්බන්ධයෙන් කරුණු ගණනාවක් සඳහන් කරනවා. විශේෂයෙන්ම ඉන් කොටසකට දින 7ක සමාව, දඩ මුදල් නොගෙවීම, ඊළඟට සිර දඬුවමෙන් හරි අඩක් හෝ ඊට වැඩි කාලයක් ගෙවා අවසන් කර ඇති වයස අවුරුදු 65ට වැඩි සිරකරුවන් ආදී වශයෙන්. හැබැයි, දැන් මොකක්ද වෙන්නේ? මෙතැනදී එළියට යනවා, අතුල තිලකරත්න කියලා පුද්ගලයෙක්. ඔහුට නඩු ගණනාවක් තිබෙනවා, අනුරාධපුර උසාවියේ. ඔහුට ඒ උසාවියේ නඩුවෙන් රුපියල් ලක්ෂ 20ක වන්දියක් ගෙවන්න නියම කරනවා. ඔහු රුපියල් ලක්ෂ 20ක වන්දිය ගෙවන්න බැහැයි කියනවා. එතකොට මොකද කරන්නේ? ඔහුව රුපියල් 20,000ක දඩයකට යටත් කරනවා. ඒ අධිකරණයෙන් එවපු note එකේ තිබෙන්නේ, "රුපියල් ලක්ෂ 20ක වන්දියක් නියම කරමි, එම මුදල දඩයක් ලෙස අය කර ගැනීමටත්, එම දඩ මුදල නොගෙවීම මත මාස හයක සිර දඬුවමක් නියම කරමි" යනුවෙන්. මේ, දණ්ඩ නීති සංග්‍රහයේ 386 යටතේ සාපරාධී විශ්වාසය කඩ කිරීම.

1800 ගණන්වල - සුද්දාගේ කාලයේ - ඉඳලා මේ රටේ තිබෙන නීතියක් තමයි, පොදු සමාව කියන්නේ. අපිත් අවුරුදු ගණනක් වැඩ කරලා තිබෙනවා, අධිකරණ අමාත්‍යාංශයේ. අපි දන්නවා, ඒ කාලයේ ඉඳලා ජනාධිපතිවරයාගේ සමාව හැර පොදු සමාව කියලා වෙනම එකක් තිබෙන බව. ඒක අවබෝධ කරගන්න බැරි එකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මොකද, සාමාන්‍යයෙන් මම ඉහතින් කියපු කරුණු ඉවර වෙනකොට යම් පුද්ගලයෙකු නිදහස් කරන්න පුළුවන්. ඔය කියන දවසේ දෙදෙනෙක් නිදහස් කරන්නේ නැහැ. අතුල තිලකරත්න කියන පුද්ගලයා අධිකරණයට ඉදිරිපත් කරනවා. සාමාන්‍යයෙන් එවැනි පුද්ගලයෙකුට සිරකරු අංකයක් ලබා දෙනවා. සිරකරු අංකයක් ලබා දීලා, මේ වාගේ තත්ත්වයක් ඇති වුණාම, ඔහුට සැක අංකයකුත් ලබා දෙනවා. ඒ අනුව එම

සැක අංකය යටතේ ඔහුව නැවත අනුරාධපුර උසාවියට අරගෙන යනවා. අනුරාධපුර උසාවියෙන් වෙනත් කරුණකට ඇප දීලා ඔහු එළියට එනවා. හැබැයි, අර කරුණ යටතේ ඔහුව නිදහස් වෙනවා. ඇයි, එහෙම වෙන්නේ?

මේ වාගේම තත්ත්වයක් තව තිබෙනවා. ගල්ගමුවේ සහ කැකිරාවේ නඩු දෙකකට අදාළ කෙනෙකු වාරියපොල උසාවියට transfer කරනවා. ඒකත් මේ සිද්ධිය වාගේමයි. අද මොකද වෙලා තිබෙන්නේ? මෙච්චර කාලයක් මේ රටේ හරමානිස්ලා, අමාරිස්ලා වාගේ අහිංසක මිනිසුන්ට තිබුණු පොදු සමාවත්, ජනාධිපති සමාව යටතේ අහෝසි කරලා තිබෙනවා. මීට පස්සේ පොදු සමාව නැහැ. මීට පස්සේ තිබෙන්නේ ජනාධිපති සමාව විතරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

1800 ගණන්වල තිබුණු පොදු සමාව අද ආණ්ඩුව ජනාධිපති සමාවත් එක්ක පටලවාගෙනයි තිබෙන්නේ. ඒ කියන්නේ, මීට පස්සේ මෙන්න මේ තැනැත්තාට සමාව දෙන්න ඕනෑ කියලා ජනාධිපතිතුමාට හිතුණොත් මිසක මේ රටේ තිබුණු පොදු සමාව, යම්කිසි දඩ මුදලක් නොගෙවීම නිසා ලැබෙන සමාව කියන මේ සියල්ල අහෝසි කරන තැනට ගෙනැත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අද වෙනකොට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ ඉඳලා සියලුදෙනාම සිර භාරයට ගන්න තැනට පත් වෙලා තිබෙනවා. මම කියනවා කරුණාකරලා මේ විනාශය කරන්න එපා කියලා. අද මේ රටේ කිසිම නිලධාරියෙක් වැඩ කරන්නේ නැති තත්ත්වයකට තල්ලු වෙලා තිබෙනවා. මේ අය උත්සාහ කරන්නේ සිර භාරයට ගන්න, අත්අඩංගුවට ගන්න, CID එකට ගන්න වැඩ පිළිවෙළ සකස් කරන්නයි. මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ අනුෂ්කා දර්ශනී තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.12]

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඇත්තටම මේ කථාව පටන් ගන්න කලින් මම මතක් කරගත යුතු දෙයක් තිබෙනවා. අද උදේ ඉඳලා මේ සභාවේ ලොකු ගෝරනාඩුවක් තිබුණා, කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිනිය පත්වීම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බලය කියන්නේ බලයට, power is power; it is nothing else. Power is people; power is democracy; power is harmony and power is everything. බලය කියන වචනය සම්පූර්ණ අර්ථයෙන් ගත්තාම මිනිස්සු දේශපාලනික බලය පැවරුවේ තමන් බලාපොරොත්තු වන එකමුතුකම, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස සහ අල්ලසින්, දූෂණයෙන්, වංචාවෙන් තොර රටක් නිර්මාණය කිරීම උදෙසායි. ඒ නිසා පසුගිය කාලය පුරාවට විපක්ෂය සමීකරණයක් හැදුවා, ජයග්‍රහණය කරපු ජාතික ජන බලවේගය නොවෙයි දිනලා ඉන්නේ, ඊට පිටිපස්සෙන් හිටපු කණ්ඩායම් ගත්ත ඡන්ද ඔක්කොම එකතු කරලා සහ මැතිවරණ ක්‍රමයේ තිබෙන යම් යම් විධි හීනතා උපයෝගී කරගෙන අපි තමයි ජයග්‍රහණය කළේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒක පැහැදිලි කරනවා නම් එය හරියට පසුගිය දිනවල පැවති ලෝක රූ රැජින තේරීමේ තරගය වාගේයි. ඒ අනුව කාට හෝ තර්කයක් හදන්න පුළුවන්ද, පළමුවැනියාට ජයග්‍රහණය කරපු කෙනාට වඩා, දෙවැනියායි, තුන්වැනියායි එකතු කළාම ඒ දෙදෙනා තමයි ලස්සනම, ඒ නිසා කිරුළ පළමුවැනියාගෙන් ගලවලා දෙවැනියාටයි, තුන්වැනියාටයි දෙනවා කියලා? මේක තමයි විපක්ෂයේ සමීකරණය. පන්තියේ පළමුවැනියා වෙන්නේ වැඩිම ලකුණු ගන්න කෙනා. නැහැ, ඒ ළමයා නොවෙයි පළමුවැනියා කියලා, දෙවැනියා, තුන්වැනියා ඉඳලා පන්තියේ ඉන්න සියලු ළමයින්ගේ ලකුණු එකතු කරලා ඒගොල්ලන්ට දෙනවා, පන්තියේ පළමුවැනි ස්ථානය. ඔන්න, විපක්ෂයේ සමීකරණය. බලය කියන්නේ ඔය එකක්වත් නොවෙයි. බලය කියන්නේ ඕකට නොවෙයි කියන එක හොඳට තේරුම් ගන්න ඕනෑ.

මේ රටේ මිනිස්සු ජාතික ජන බලවේගයට බලය භුවමාරු කරන්නේ අවුරුදු 76ක් තිස්සේ මිනිසුන්ට අහිමි වෙච්ච, මම ඉස්සෙල්ලා සඳහන් කරපු නිදහස, සමානාත්මතාව සහ අල්ලසින්, දූෂණයෙන් හා වංචාවෙන් තොර රටක් හදන්නයි.

කොළඹ මහ නගර සභාව කියන්නේ, 24 වතාවක් නගරාධිපතිවරු බිහි කරපු, ඒ 24 වතාවෙන්, 22 වතාවක් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළ නගර සභාවක්. එක්සත් ජාතික පක්ෂයට ඉහළින් කුරුල්ලෙකුටවත් යන්න බැහැයි කියපු කොළඹ මහ නගර සභාව ඉතිහාසයේ පළමුවන වතාවට මෙවර රතු පාටට පරිවර්තනය වෙනවා. ඉතිහාසයේ පළමුවන වතාවට ජාතික ජන බලවේගයේ අපේ ආදරණීය ව්‍රායි කැලී බල්තසාර් සහෝදරිය එහි නගරාධිපතිනිය ලෙස තේරී පත් වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් ලෙසත්, මේ රටේ මහජන නියෝජිතවරියක් විධියටත්, බලය නිසියාකාරව ක්‍රියාත්මක කරන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් ලෙසත්, ඒ ඔක්කෝටම වඩා ගැහැනියක් ලෙසත් මම ඇයට සුබ පතනවා. එවැනි කොළඹක් තමයි අපි වෙනස් කළේ. කොළඹ මිනිසුන්ට අහිමි වෙච්ච ජීවිතය ගැන කථා කරන්න කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රී සහෝදර-සහෝදරියන් ගොඩාක් ඉන්නවා. නමුත් මම මතක් කරනවා, කුණු ගඳ ගහන ඇළවල්, දිරාපත් වෙච්ච වහලවල් සහිත මුඩුක්කු නිවාස තුළ ජීවිත ගත කරන මිනිස්සු, ජීවිතය අහිමි වෙච්ච දරුවෝ, අධ්‍යාපනය අහිමි වෙච්ච දරුවෝ තමයි කොළඹ ගොඩාක් ජීවත් වෙන්නේ කියන එක. නමුත් කොළඹ මහ නගර සභාව කියන්නේ කෝටි, ප්‍රකෝටි ගණන් සල්ලි තිබුණු මහ නගර සභාවක්. හැබැයි, මිනිසුන්ගේ සුබසාධනය වෙනුවෙන් කටයුතු නොකරපු ඒ ඉතිහාසය වෙනස් කරන්න, කොළඹ අහස රතු පාටින් ලකුණු කරන්න තමයි මිනිස්සු ජාතික ජන බලවේගයට බලය ලබා දුන්නේ. එම නිසා ඒ බලය පිළිබඳව අභියෝග කරන්න විපක්ෂයේ කිසිම කෙනෙකුට අයිතියක් නැහැ. ඒ වාගේම ජාතික ජන බලවේගය වැඩිම මන්ත්‍රී ධුර සංඛ්‍යාව හිමි කර ගන්නේත් ලෙහෙසි පහසු සටනකින් නොවෙයි. අපට මීට කලින් ස්ථාපිත වෙච්ච බලයක් නැහැ. වංචාවෙන්, දූෂණයෙන් එකතු කර ගත්ත මහා ධනස්කන්ධයක් අපිට නැහැ. එහෙම එකක් අපට නැහැ. මිනිසුන්ට

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

කන්න බොන්න දෙන්න, අරක්කු බෙදන්න, වෙන දේවල් දෙන්න, වරදාන-වරප්‍රසාද දෙන්න අපට දේවල් තිබුණේ නැහැ. ඒ සියල්ලට ඉහළින් අපි, අපේ අවංකභාවය, එඩිතරභාවය සහ නායකත්වයේ ලක්ෂණ තමයි මිනිස්සු ඉස්සරහ සපථ කළේ. ඒ නිසා තමයි මිනිස්සු විසින් අපි ජයග්‍රහණය කෙරෙව්වේ. එම නිසා මම විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා, අපට අභියෝග කරන්න ඔබතුමන්ලාට කිසිම අයිතියක් නැති බව. ව්‍යායි කැලී බල්තසාර් නොවෙයි මේ ජයග්‍රහණය කළේ, ජාතික ජන බලවේගය විශ්වාස කරපු මිනිසුන්ගේ ඡන්දයයි කියන එක හොඳට මතක තියා ගන්න කියලා මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක් කරනවා.

ඒ වාගේම තව දෙයක් මම කියන්න ඕනෑ. මම නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය මහ නගර සභාවේ බලය මේ වනකොට ජාතික ජන බලවේගය එහි නගරාධිපති ධුරය අත්පත් කරගනිමින් පිහිටුවා තිබෙනවා. මේවා හරියට මුදා නොගත් කලාප වාගේ තිබුණේ. නුවරඑළියේ මිනිසුන්ට මුදා නොගත් කලාප වාගේ තිබුණු දේවල් මේ. ඒ ජයග්‍රහණයත් අද ඉතිහාසගත වෙනවා. ඒ නිසා මම නුවරඑළිය මහ නගර සභාවේ ජයග්‍රහණය වෙනුවෙන් උර දුන් ජාතික ජන බලවේගයේ සියලුම මන්ත්‍රී සහෝදර- සහෝදරියන්ට සහ ජනතාවට මගේ හෘදයංගම ප්‍රණාමයත් මේ අවස්ථාවේදී පළ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම අද කථා කරන්නේ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වූ නියමයන් සම්බන්ධයෙනුයි. පාර්ලිමේන්තුවට අලුතින් තේරී පත්වෙලා එනකොට මම හිතුවා, අත්දැකීම් තිබෙනවා කියපු, අපට දේවල් උගන්වනවා කියපු අය අපට යමක් උගන්වයි කියලා. හැමදාම උදේට ස්ථාවර නියෝග නම් අපට කියලා දෙනවා. අපි අකුරු කියවන්න දන්නේ නැහැ වාගේ අපට ස්ථාවර නියෝග ගැන කියලා දෙනවා. ස්ථාවර නියෝගවලින් තොර ලෝකයක් නැහැ. හැබැයි, ඒ නීතිය ඇතුළේ කටයුතු කරන බවක් එතුමන්ලා කවදාවත් පෙන්නුවේ නැහැ.

මහා පුදුමාකාර විධියට ජාතික සමගිය ගැන කථා කළා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, මුස්ලිම් ජනතාවට අපි අසාධාරණයක් කරනවා කියලා. හැබැයි, මේ කාරණය මම මතක් කරන්න ඕනෑ. මේ රටේ මිනිස්සු සේලයින් බට ගහගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉස්සරහට ගිහිල්ලා ජනාධිපති අරමුදලින් තමන්ට කීයක් හෝ සල්ලි ගන්න පෝලිම්වල හිටගෙන ඉන්නවා. පිළිකාවෙන් පෙළෙන තමන්ගේ අම්මා, තාත්තාට සල්ලි කීයක් හෝ ගන්න දුප්පත්, අහිංසක මිනිස්සු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉස්සරහ වැඳ වැටෙනවා. කර ගන්න දෙයක් නැතුව ඉතිහාසයේත් ඒ ගැන කථා කරපු මිනිස්සු හිටියා. ඒවායේ මුදල් අවභාවිත කරපු මිනිස්සු අපට ජාතික සමගිය ගැන කියලා දෙන්න එනවා. ජාතික සමගිය විතරක් නොවෙයි, මේ රටේ එකමුතුභාවය ඇති කරන එකම ආණ්ඩු පක්ෂය වාගේම නැවත කිසිදා වෙනස් නොවන ආණ්ඩු පක්ෂය ජාතික ජන බලවේගය කියන එකත් මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේදී මතක් කරනවා.

එතුමන්ලා ඒවා කියද්දී ලජ්ජා සහගත වෙන්න ඕනෑ. ජාතික සමගිය ගැන කියලා, වෙනත් ජාතිවාදී කාරණා අවුස්සලා, මේ ආණ්ඩුව අස්ථාවර කරන්න පුළුවන් තරම් උත්සාහ කළා. නමුත්, අපි පසුගිය කාලය පුරාවටම නීති ප්‍රතිසංස්කරණ බොහොමයක් ඇති කළා. නීති ප්‍රතිසංස්කරණ බොහොමයක් ඇති කරලා, අධිකරණවල ගොඩ ගැසී තිබෙන නඩු ඉක්මනින් විසඳන්න, කාර්යක්ෂමව විසඳන්න අදාළ නීති ප්‍රතිපාදන සම්පාදනය කරමින්, අදාළ නීති සංශෝධනය කරමින් අපි විශාල කාර්යභාරයක් මේ වෙලාවේත් කරමින් ඉන්නවා.

දැන් තවත් පොඩ්ඩක් රිදෙන්න පටන් ගෙන තිබෙනවා. හේතුව මම කියන්නම්. හිටපු ජනාධිපතිවරුන්ට හිමි වන විශේෂ වරප්‍රසාද යටතේ ජීවිතයේ කිසිම දවසක පාර්ලිමේන්තුවට ඇවිල්ලා නැති, ජීවිතයේ කිසිම දවසක මේ රටේ පොදු මහත් ජනතාව වෙනුවෙන් කථා කරපු නැති, හිටපු ජනාධිපතිවරුන්ගේ නෝනලා මහත්වරු -කලත්‍රයෝ- මේ රටේ මිනිස්සුන්ගේ බදු මුදල්වලින් ලජ්ජා සහගත විධියට ජීවත් වුණා. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා බන්ධනාගාරගත වෙලා ඉන්න ගමේ හරමානිස්ලා ගැන කථා කළා. නමුත්, ජනාධිපති වරප්‍රසාද පාවිච්චි කරමින්, ජනාධිපති බලතල පාවිච්චි කරමින්, හිටපු ජනාධිපතිවරුන්ගේ නෝනලා, මහත්වරු මේ රටේ මිනිස්සුන්ගේ සල්ලි වියදම් කරපු විධිය කිසිම කෙනෙක් කථා කළේ නැහැ. හැබැයි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනතාවට පොරොන්දුවක් වුණා, ජනතාවට හිමි නොවන කිසිම වරප්‍රසාදයක් අපිට එපා කියලා. ඒකට අපි අවුරුද්දක් යන්න කලින්ම අත තිබ්බා. ජනතාවට හිමි නොවන කිසිම දෙයක් මේ ධනපතියන්ට, මේ රට විනාශ කරපු කිසිම කෙනෙකුට අපි අයිති කරලා දෙන්නේ නැහැ. අපි ජනාධිපති විශේෂ වරප්‍රසාද අහෝසි කරමින් කැබිනට් තීරණයක් අරගෙන තිබෙනවා. කලත්‍රයන් සහ වෙනත් කාර්යාල සේවකයන් නඩත්තු කිරීම අපි මීට පස්සේ කරන්නේ නැහැ, බලාපොරොත්තු වෙන්නත් එපා.

අද දින විවාදයට ගන්නා විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ නියමයන් පිළිබඳව ගරු අධිකරණ අමාත්‍යතුමා සඳහන් කළා. ඒ පනත යටතේ ක්‍රියාත්මක කර ගන්න බැරි වුණු, ඒ පනත මඟින් බලාත්මක කළ හැකි රටවල් 53ක් සම්බන්ධයෙන් තමයි, මේ අදාළ ගැසට් පත්‍රයේ සඳහන් කරලා තිබෙන්නේ. මේ රටවල් බොහොමයක් පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල්. ඒ නිසා අපි ඉදිරියේදී මීට වඩා තව බොහෝ ප්‍රමාණයක් රටවල් මෙයට ඇතුළත් කර ගනිමින්, ඒ රටවල් සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කර ගනිමින්, හැකි ඉක්මනින් සමහර නඩු තීන්දු -මුදල් ආරවුල් සහ දික්කසාද ආරවුල් සම්බන්ධයෙන් වන නඩු තීන්දු- අපේ රටේ අධිකරණවල කාර්යක්ෂමව ක්‍රියාත්මක කර ගනිමින්, ලියාපදිංචි කරමින්, බලාත්මක කරමින් ඉදිරියට කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කථා කරන්න තව ගොඩක් දේවල් තිබෙනවා. අපි ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ මේ වෙනකොට ලංකාවේ පළාත් පාලන ආයතනවලට මන්ත්‍රී සහෝදර සහෝදරියන් හාරදහස් ගණනකට ආසන්න පිරිසක් බිහි කරලා තිබෙනවා. මේ කිසි කෙනෙක් නිකම් ඉන්න නොවෙයි, අපි පත් කරලා තිබෙන්නේ. අපි පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ගත්තේ, බොහොම දුක් මහන්සි වෙලා. උතුරේ සිට දකුණ දක්වා පළාත් පාලන ආයතනවල හාරදහස් ගණනකට ආසන්න මන්ත්‍රී සහෝදර සහෝදරියන් පිරිසක් ඉතා නුදුරු දිනයකදී මේ රට සංවර්ධනයේ මාවත කරා ගෙන යෑමට වැඩ කරනවා. ඒ වැඩ කළාට පස්සේ රාජපක්ෂලා ගෙදර යැව්වා වාගේ අපි ගෙදර යවන්න පුළුවන් වෙයි කියලා කවුරු හරි හිතනවා නම්, අපි මිනිස්සුන්ගේ බලයට හැර වෙන කිසිවකට හිස නමන්නේ නැහැ. ඒ පළාත් පාලන ආයතනවල මන්ත්‍රී සහෝදර සහෝදරියන් සහ පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනා එකතු වෙලා, මේ රටේ සමාජ පරිවර්තනයක් උදෙසා අපිට කරන්න පුළුවන් හැම කැප කිරීමක්ම කරනවා කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.24]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද දිනයේ සාකච්ඡා කරන්නේ, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වන නියමයන් සම්බන්ධයෙනුයි. අපි විදේශ නඩු පිළිගන්න, එහෙම නැත්නම් භාර ගන්න සූදානම් වෙනකොට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ තානාපති කාර්යාල සම්බන්ධීකරණය කරමින්, ඒ රටවල සිද්ධ වන සමහර නඩු තීන්දු ගැන යම් ආකාරයක වැඩ පිළිවෙළකුත් මේ සමඟ අපට ලබා දිය යුතුයි, කොහොමද මේක කරන්නේ කියන එක සම්බන්ධයෙන්.

එහෙම නැත්නම් අපේ තානාපති කාර්යාල හරහා යම්කිසි නීති අංශ නිර්මාණය වෙනවාද, මේ සඳහා? උදාහරණයක් හැටියට ගත්තොත්, ඉන්දියාවේ ඕනෑ තරම් තිබෙනවා, අපේ ධීවරයන් සම්බන්ධ නඩු. අපේ බෝට්ටු අහු වෙච්ච ඒවා වෙන්න පුළුවන්, ඒ වාගේ ප්‍රශ්නවලට අදාළ නඩු තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? මොකද අපි දන්නවා, ඉතාම අමාරුවෙන් තමයි ඒ නඩුවලට සම්බන්ධ වෙන්නේ අපේ අය. ඒ අයට කිසිම සහයෝගයක් නැහැ. මිල ඉතාම අධිකයි. නීතිඥ මහත්වරුන්ට ගෙවන්න වන මිල ඉතාම අධිකයි. ඒ ආයතනවලට ගෙවන්න වන මිල ඉතාම අධිකයි. ඒ අයට ගිහිල්ලා එහේ නතර වෙලා ඒ කටයුතු ටික කරන්න පහසුකම් නැහැ.

ඒ වාගේම අපි දන්නවා, සමහර රටවල අපේ තානාපති කාර්යාල නැහැ. එහෙම සම්බන්ධීකරණයකුත් නැහැ. ඒ නිසා මේ සියලු රටවල් ටික එකට එකතු වෙලා එකඟත්වය පළ කරනවා වාගේම ඒවාට විසඳුම් සකස් විය යුත්තේ කොයි ආකාරයෙන්ද කියාත් බලන්න ඕනෑ. ඒ ඕනෑම නඩු තීන්දුවක් අපි භාර ගන්නකොට ඒ නඩු තීන්දුව සම්බන්ධව අපේ පාර්ශ්වයට මැදිහත් වෙන්න අවස්ථාව හරි විධියට ලැබුණාද, ඒක නිවැරදි ආකාරයෙන් සිද්ධ වුණාද, ඒකට පහසුකම් ලැබුණාද, නීති අංශ කොයි ආකාරයෙන්ද ක්‍රියාත්මක කළේ යනාදිය සම්බන්ධවත් වැඩ පිළිවෙළකුත් සකස් කළ යුතුයි. ඒ නිසා මේවා භාර ගන්නවා වාගේම ශ්‍රී ලංකාව සහ ඒ රටවල් අතර මේ සඳහා වෙනත් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයි කියලාත් පළමුවෙන්ම යෝජනා කරනවා. මොකද අපට ඉදිරිපත් වෙලා තිබෙන කාරණාවල ඒ තොරතුරු මොනවත් නැහැ. ඒ තොරතුරු නැති නිසා අපට බලවත් ප්‍රශ්නයක් තිබෙනවා, මේක කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා; කොයි ආකාරයේ නඩුද කියලා.

ඒ වාගේම සමහර වෙලාවට විදේශ කණ්ඩායම්වලට විරුද්ධව අපේ රටේ විභාග වන නඩුවලදී ඒ අයට ක්‍රියාත්මක වෙන්න හැකියාව තිබෙනවා. මොකද, සමහර වෙලාවට ඒ අයට අපේ රටේ වියදම් අඩු වෙන්න පුළුවන්; නීති සහයෝගය වෙනස් වෙන්න පුළුවන්. නමුත් මේ දීලා තිබෙන රටවල විභාග වන නඩුවලදී, මම නැවත නැවතත් කියන්නේ අපේ ශ්‍රී ලාංකිකයන්ට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා කියන එකයි. ඒ නිසා ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා, මේ යෝජනාව ඉදිරිපත් කරනවා හා සමානවම කොයි ආකාරයෙන්ද ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සපයන්නේ කියන එක සම්බන්ධයෙනුත් අපට විස්තර සපයන්න කියලා.

නුවරඑළිය පළාත් පාලන ආයතනයේ බලය ගැනීම ගැන කියද්දී, අර අපේ මන්ත්‍රීතුමිය කිව්වා මුදා ගත්තේ නැති ප්‍රදේශ මුදා ගන්නවා කියලා. දැන් පළාත් පාලන ආයතනයේ බලය අරගෙන තිබෙන්නේ. දැන් මුදා ගන්නේ කාගෙන්ද? නුවරඑළිය පළාත් පාලන ආයතනය මුදා ගන්නේ කාගෙන්ද? තොන්ඩමන් මැතිතුමන්ලාගෙන්ද? තොන්ඩමන් මැතිතුමන්ලාගෙන් මුදා ගන්න නම්, තොන්ඩමන් මැතිතුමන්ලා එක්කම බලය පිහිටුවනවාද? ඒ නිසා මතක තියා ගන්න, ඔබතුමන්ලා බලය පිහිටුවන්නේ කා එක්කද කියලා ඉස්සර වෙලා හිතලා බලලා ඒ වැඩ කටයුතු කරන්න.

දැන් මම එන්නම්, වැදගත් point එකකට. කල්පිටිය ප්‍රාදේශීය සභාවේ -පළාත් පාලන ආයතනයේ- සභාපති, උප සභාපති තෝරන ඡන්දය පැවැත්වුවා. ඒ දිනට පෙර දිනයේ රාත්‍රියේ අපේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙක් -අපේ පක්ෂයට අදාළ නැති වුණත් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරයෙක්- පොලීසිය අත්අඩංගුවට ගත්තා. හැබැයි කලින් දවසේ රාත්‍රියේ අත්අඩංගුවට ගන්න හේතු වුණු කාරණාව, ඊට සතියකට දෙකකට පෙර පොලීසියකින් කරුණු විමසලා, කටඋත්තර දීලා තිබුණු කාරණාවක්මයි. එහෙම තිබියදී ඒකට තවත් පොඩි කෑල්ලක් ඈඳලා තමයි අත්අඩංගුවට ගත්තේ. අත්අඩංගුවට ගත්තා විතරක් නොවෙයි. මේක පුංචි ප්‍රශ්නයක්; අධිකරණයෙන් ඇප අරගෙන පහුවදා පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීමට එන්න අවස්ථාව ලබා දෙන්න තිබුණා, පොලීසියට. පොලිස්පතිතුමා ප්‍රමුඛ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු සියලුදෙනාටම මේ සම්බන්ධයෙන් කථා කළා. මේක පුංචි කාරණාවක්; ඒත් රඳවාගෙන හිටියා. රඳවාගෙන හිටියා විතරක් නොවෙයි. අධිකරණයට පහුවදා ගෙනිච්චාට පස්සේ උදේ පාන්දරම මුලින්ම ගිහිල්ලා විනිසුරුතුමාට ඉදිරිපත් කරලා අවස්ථාව ලබා ගන්න තිබුණා. ඇප ලබා දෙන්න තිබුණා, ඒ වෙලාවේදී. හැබැයි ඇප ලබා දීම කළේ නැහැ. ඇප ලබා දීම කරන්නේ නැතුව පහු කරලා පහු කරලා අවසානයේ ඇප ලබා දුන්නාට පසුව තමයි අධිකරණයේ ඉඳලා ඔහු ආවේ, කල්පිටිය පළාත් පාලන ආයතනයට. ආවාම මොකද වුණේ? එතුමා ආයතනයට ඇවිල්ලා ඇතුළු වුණා; සභාපති තෝරන ඡන්දය යනවා.

හැබැයි, ඡන්දය දාන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ, ඔහුට. ඒවා සැලසුම්සහගත වැඩ. ඒවා සැලසුම්සහගතවයි ක්‍රියාත්මක කළේ. ඔහු අත්අඩංගුවට ගෙන තිබුණු කාරණාව එදාම අත්අඩංගුවට ගන්න ඕනෑ කාරණාවක් නොවෙයි. එය, ඊට පෙර සාකච්ඡා කළ කාරණාවක්. ඒ විතරක් නොවෙයි, මතක තබාගත යුතු ඊළඟ කාරණාව මේකයි. අඩු ගානේ ඔහු පහුවෙනි දා පොලීසියේ තියාගෙන වුණත් කමක් නැහැ, ඔහුට සාධාරණ විධියට ඡන්දය දාන්න සලස්වා අරගෙන යන්න පොලීසියට තිබුණා. පොලිස් ආරක්ෂාව ඇතුව ඡන්දය දාන්න ඔහුව අරගෙන යන්න තිබුණා. මම එහෙම කියන්න හේතුවක් තිබෙනවා. අද කොළොන්නාව පළාත් පාලන ආයතනයේ සභාපති, උප සභාපති තෝරන ඡන්ද විමසීමේදී අපේ එක්කෙනෙකු ගිහිල්ලා ඡන්දය දුන්නාම පොලිස් ආරක්ෂාවක් දීලා, පොලිස් බයික් එකක් එක්ක තමයි ඔහු පිටත් කර යවා තිබෙන්නේ. ඔහුට එවැනි පොලිස් ආරක්ෂාවක් දෙන්න පුළුවන් නම්, ඉහත කී මන්ත්‍රීවරයාට මොකද එහෙම නොකළේ?

මතක තියා ගන්න, ඔබතුමන්ලා ආවේ radical වෙනසකට. දැන් radical වෙනුවට classical වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා කා එක්ක ගිහිල්ලා ද සභා ටික පිහිටුවන්නේ? ඔබතුමන්ලා ඇඟිල්ල දිගු කරපු විධියට, ඒ කියපු පට්ට හොරුත් එක්ක තමයි ඔබතුමන්ලා ඒ සභා පිහිටුවන්නේ.

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති තෝරන ක්‍රියාවලිය කොමසාරිස්වරිය කටයුතු කළේ කොහොමද? කොමසාරිස්වරියට 19දෙනෙකුගෙන් යුත් විපක්ෂයේ මන්ත්‍රීවරු උදේම ලියවිල්ලක් දෙනවා, "අපි මේකට විවෘත ඡන්දයක් ලබා දෙන්න කියලා ඉල්ලනවා" කියලා. වැඩි බහුතරයක් ලියුමක්

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

දෙනවා විවෘත ඡන්දයක් ලබා දෙන්න කියලා. "මේක මට වැඩක් නැහැ" කියලා එතුමිය ඒක පැත්තකින් තියනවා. පැත්තකින් තැබුවාම ඒ සියලුදෙනා නැඟිටලා අත උස්සලා පැය භාගයක් විතර ඉල්ලනවා "අපිට විවෘත ඡන්දයක් දෙන්න" කියලා. සභාපති තෝරන වැඩසටහනේදී අවශ්‍යා කරන්නේ විවෘත ඡන්දයක් ද, රහස් ඡන්දයක් ද කියලා විමසද්දී කොට්ඨාස දෙකේ දෙකක් යෝජනා කළ නිසා බහුතරය නැඟිටලා විවෘත ඡන්දයක් ඉල්ලුවා. බහුතරය විවෘත ඡන්දයක් ඉල්ලද්දීත් කොමසාරිස්වරිය කියනවා, "එහෙම කරන්න බැහැ, මට පුළුවන් රහස්‍ය ඡන්දයක් දෙන්න විතරයි" කියලා. ඇයි? කොමසාරිස්වරිය දන්නවා රහස්‍ය ඡන්දයක් තිබ්බොත් එතැන නැඟිටලා ඉන්න 19දෙනාගෙන් මාලිමාවට විරුද්ධව ඡන්දය දෙන්නේ නැති කණ්ඩායමක් ඉන්නවා කියලා. එහෙම නම් මතක තියා ගන්න, මේ deal එකේ එක කොටසක් එතැන බව. මේ deal එකේ කොටසට ඒ රාජ්‍ය නිලධාරිනිය සම්බන්ධ කළේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කට්ටිය, පළාත් පාලන ආයතනයේ ආණ්ඩුවේ කට්ටිය තමයි ඒක කළේ. එහෙම නැත්නම් ඒක වෙන්නේ නැහැ. ඒක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් පුළුස්සා දාපු, විනාශ කරපු ක්‍රියාවක්. ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. හැබැයි එතැනදී අත උස්සලා පැහැදිලිව විවෘත ඡන්දයක් ඉල්ලද්දීත් ඒ අත උස්සලා කරන ඉල්ලීම පිළිගන්නේ නැතිව රහස් ඡන්දයක් තියන්න නම් කොමසාරිස්වරිය දැනගන්න ඕනෑ, මේ අත උස්සාගෙන ඉන්න අයගේ ඡන්ද ප්‍රමාණය රහස් ඡන්දයක් තිබ්බොත් වෙනස් වෙනවා කියලා. එහෙම නම් කොමසාරිස්වරිය දන්නවා එතැන තිබෙන ඡන්ද ප්‍රමාණය කොච්චරක්ද කියලා. කී දෙනෙක් deal දාලා ද කියලා එතුමිය දැනගන්න ඕනෑ; දැනගත්තාම තමයි ඒ වැඩේ කරන්නේ. එහෙම නම්, එතුමියව මෙහෙයවන්නේ කවුද? එතුමියව මෙහෙයවන්නේ පැහැදිලිවම ආණ්ඩුවයි. මෙහෙම කොහොමද ඡන්ද කරන්නේ? ඒ නිසා මතක තියා ගන්න, එතැන සම්පූර්ණ දූෂිත ඡන්ද ක්‍රමයක් තිබුණේ කියන එක. ප්‍රජාතන්ත්‍රවාදී විධියට රටේ ජනතාවට තිබෙන අයිතියක් මන්ත්‍රීවරුන් හැටියට පත් වෙලා ඇවිල්ලා අත උස්සලා විවෘත ඡන්දයක් ඉල්ලන එක. දැන් හෘදය සාක්ෂිය ගැන කථා කරනවා. මරු වැඩක් නේ, අත උස්සලා ඡන්දය දෙද්දී හෘදය සාක්ෂිය නොවෙයි ලු. එය රහසේ කරද්දී තමයි ලු, හෘදය සාක්ෂිය තිබෙන්නේ. දැන් මෙතුමන්ලාට ඡන්දය රහසේ කරද්දී හෘදය සාක්ෂිය, අත උස්සලා කරද්දී වෙනත් සාක්ෂියක්. ඒක හෘදයෙන් නොවෙයි එන්නේ, වෙන තැනකින්.

ඔබතුමන්ලා කොළඹ මහ නගර සභාවේ කළේත් එහෙමයි. ඒ වැඩ කටයුත්තත් ඒ හා සමානයි. ඔබතුමන්ලාට මන්ත්‍රී ධුර කීය ද තිබුණේ, හතළිස්ගාණයි තිබුණේ. ඡන්ද 60ක් ආවේ කාගෙන්ද? අනෙක් අයගෙන් නොවෙයිද? කාගේද ඒවා? ඔබතුමන්ලා වෙනම මචලා දැම්මා ද? නැහැ නේ? කල්පිටියේ 19දෙනෙකු ලිඛිතව විවෘත ඡන්දයක් ඉල්ලලා අන්තිමට අත උස්සලාත් ඉල්ලුවා. ඊට පසුව රහස් ඡන්දය තියන කොට විපක්ෂයේ කණ්ඩායමට ඡන්ද 15යි අවේ, ආණ්ඩුවේ කණ්ඩායමට 16ක් ගියා. ඡන්ද එකෙන් වෙනස් වුණේ. එහෙම නම්, මතක තියා ගන්න පැහැදිලිවම කොමසාරිස්තුමිය ප්‍රමුඛ කණ්ඩායම දන්නවා මෙතැනදී රහස් ඡන්දයක් තිබ්බොත් අනිවාර්යයෙන්ම මේ අත උස්සාගෙන ඉන්න කණ්ඩායම වෙනත් විධියකට ආණ්ඩුවට ඡන්දයක් දෙනවා කියන එක. එහෙම නම් එතැන මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? හෘදය සාක්ෂිය තිබෙනවාද එතැන, කාගේ හරි? රාජ්‍ය නිලධාරීන්ගේ ආත්ම ගරුත්වය, එහෙම නැත්නම් ඒ අයගේ රැකියාවේ ගෞරවය තමුන්නාන්සේලා ආරක්ෂා කළා ද?

තමුන්නාන්සේලා දැන් රැඩිකල් වෙනස කරන්නේ එහෙමද? එහි තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 10දෙනායි හිටියේ. 16ක් වෙන්න තව මන්ත්‍රීවරු 6දෙනෙක් ගන්න කොට රැඩිකල් විධියට ද ඒ අය ගත්තේ? ඒ, රැඩිකල් වෙනසකින් නොවෙයි, දූෂිත විධියටයි ගත්තේ. ඒ නිසා ඒක වැරැදියි. අපි යනවා, අධිකරණයට. ගරු අධිකරණ අමාත්‍යතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අපි ගිහිල්ලා මේ රටේ උත්තරීතර අධිකරණයෙන් විමසනවා, කෝකද හරි, කෝකද වැරැදි කියලා. අර ඉහතින් කියපු, පොලිසියෙන් අත්අඩංගුවට ගත්තු කෙනාගේ ප්‍රශ්නයේ ඉඳලා, ඒ පළාත් පාලන ආයතනය ඇතුළේ සිද්ධ වෙච්ච ඡන්ද විමසීමට අදාළ කාරණාවේ ඉඳලා සියලු දේ සම්බන්ධව අධිකරණයේ විනිශ්චයට භාජන කරන වැඩ කටයුත්තේදී අපි සාධාරණය බලාපොරොත්තු වෙනවා. මේ රටේ සාධාරණය වෙනුවෙන් තමුන්නාන්සේලා සියලුදෙනා පෙනී ඉන්නවා නම්, මේ කාරණයේදීත් තමුන්නාන්සේලා සාධාරණය වෙනුවෙන් පෙනී ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 9ක කාලයක් ලැබිලා තිබෙනවා, විපක්ෂයෙන්.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
තව විනාඩි 9ක් දුන්නාද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? ස්තුතියි.

මේක කියන්නේ වෙන කාරණාවක් නිසා නොවෙයි, දිගින් දිගටම තමුන්නාන්සේලා මේ වාගේ දේවල් කරන නිසායි. මා කලිනුත් කිව්වා වාගේ කොළොන්නාව නගර සභාවේ ඡන්දය පැවැත්වූවාම ඒ මන්ත්‍රීවරයා ඩීල් එකකට, හොරෙන් තමුන්නාන්සේලාට ඡන්දය දුන්නාම එයාට පොලිස් ආරක්ෂාව - පොලිස් ජීප් එකයි, පොලිස් බයිසිකලයකුයි- දීලා ගෙදරට යවනවා. එතකොට කල්පිටියේ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරයාව පොලිසියට අරගෙන ගිහිල්ලා, රෑ එළිවන කල් තියාගෙන, ඊට පහුවෙනිදා උදේ අධිකරණයට ඉදිරිපත් කරලා ඇප ලැබුණාට පස්සේ ඒ මන්ත්‍රීවරයා තනියම කිලෝමීටර හතළිස් ගණනක් කල්පිටිය ප්‍රාදේශීය සභාව දක්වා එනවා, ඡන්දය දෙන්න. හැබැයි, තමුන්නාන්සේලා එච්චර අසාධාරණ විධියට එතුමාව හිර කරගෙන ඉඳලා ඇතුළට ගෙනාවත්, එතුමාට ඡන්දේ දාන්න දෙන්නේ නැහැ. ඔහු එනවා පෙනී පෙනී ඡන්ද විමසීම නතර කරනවා. මතක තියාගන්න, ඒක ඩීල් එකේ එක කොටසක් කියලා. එක්කෙනෙක්ව අත්අඩංගුවට ගන්නවා. රහස් ඡන්දය තියනවා. මේ දෙක අතර ලොකු සම්බන්ධතාවක් තිබෙනවා. ඒ නිසා මතක තියාගන්න, රටේ මේවා සම්පූර්ණයෙන් වෙනස් වෙන්න ඕනෑ කියලා.

මේ ඡන්ද ක්‍රමය ගත්තාම, එක පැත්තකින් මේක සම්පූර්ණයෙන්ම රටේ හැම කෙනෙක් එක්කම ප්‍රශ්න ඇති කරගෙන පවත්වන ඡන්ද ක්‍රමයක්. ඒ ඡන්ද ක්‍රමයට පරිබාහිරව ඒ හා සමානවම අද එම පළාත් පාලන ආයතනවල සභාපති, උප සභාපති තෝරාගන්නා වැඩසටහනේදී මේ වනකොට හැම තැනකම මේ රටේ තිබෙන නීතිය, හෘදය සාක්ෂිය කියන එක, විශ්වාසය කියන එක, ජනතාවගේ පරමාධිපත්‍ය අයිතිය ඇතුළු සියල්ල විනාශ වෙන විධියට කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, නැවත වතාවක් හදනවා, ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදයක්; ඩීල් දේශපාලන ක්‍රමවේදයක්. තමුන්නාන්සේලා තමයි ඒක හදන එකට මූලික වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කියනවා, රට වෙනස් කරනවා, අර විධියට කරනවා, අරයාව අත්අඩංගුවට ගන්නවා, මේ දේවල් කරනවා, සුද්ද කරනවා කියලා. හැබැයි සුද්ධ කරනවා කියලා තමුන්නාන්සේලාම ගිහිල්ලා ඒකෙම පහරලා කියනවා, දැන් මේක සම්පූර්ණයෙන්ම සුද්ධ කරලායි තිබෙන්නේ කියලා. හැබැයි තමුන්නාන්සේලා වෙනම පහරලා තිබෙනවා, විනාශ කරලා තිබෙනවා. ඒ නිසා කරුණාකර ඉදිරි කාලයේදීවත් මේ වැඩ

කටයුතු කරද්දී තමුන්නාන්සේලා මේ කියන කාරණා හොඳට මතක තබාගත යුතුයි.

හැම තැනකදීම වාගේ එහෙම වුණා. කුරුණෑගල නගර සභා ඡන්දයේදිත් ඒක සිද්ධ වුණා අපි දැක්කා. නුවරඑළිය නගර සභාවේ කථාව කියද්දි ලජ්ජා නැතුව ඒ ගැන කියන්න එපා. ඔබතුමන්ලා කවුරු හරි අරගෙන සභාවක් පිහිටුවනවා නම් ලජ්ජා නැතුව ඒ ගැන කථා කරන්න යන්නත් එපා. ඔබතුමන්ලාට ලජ්ජාවක්, ඒක. මොකද, ඔබතුමන්ලා ඉස්සෙල්ලාම එතැන දිනලා නැහැ. එතකොට ගන්නේ කාවද? ඔබතුමන්ලා ගන්න කෙනා ගැන කියනවා ද, "අපි හොඳ ශුද්ධවන්තයෙක් ගත්තේ, හොඳ වැඩකාරයෙක් ගත්තේ, පිරිසිදු මිනිහෙක් ගත්තේ, පිරිසිදු කාන්තාවක් ගත්තේ, මේ සියලු දේ හරි" කියලා? අනෙක් අතට, ඒ තෝරා ගන්නා රහස් ඡන්ද ක්‍රමය සකස් කරන්නේ කොහොමද? ඒ වැඩ පිළිවෙළ කොහොමද කරන්නේ කියන එක කියලා දෙන්නකෝ, හැම කෙනෙකුටම. මතක තබාගන්න තමුන්නාන්සේලා මේ වනකොට විශාල වශයෙන් කැළැලක් ඇති කරගෙන ඉවරයි කියන එක.

ගරු අධිකරණ ඇමතිතුමනි, මේ වැරදි විධියට කර තිබෙන හැම ඡන්දයක් ගැනම වැඩ පිළිවෙළක් අපට අවශ්‍යයි. ඒවා පවත්වන නිවැරදි නීති ක්‍රමවේදය සම්බන්ධව විතරක් නොවෙයි, ඒවා පවත්වපු ආකාරය සම්බන්ධවත් නැවත විමර්ශනය කරන වැඩසටහනක් ඉදිරි කාලයේදී මේ පාර්ලිමේන්තුව තුළිනුත් අපට අවශ්‍යයි. ඒ ගැන පාර්ලිමේන්තුවෙන් විමසන්න අපට අවශ්‍යයි. පාර්ලිමේන්තුවේත් යම්කිසි කමිටුවක් දාලා විමසන්න අපට අවශ්‍යයි, මේ ක්‍රමවේදය හරිද, වැරදිද කියලා. මොකද, පළාත් පාලන රෙගුලාසි, එහෙම නැත්නම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව තිබිච්ච පනත්, නීති, රෙගුලාසි වාගේම ඒ වෙලාවේ ඉදිරිපත් කරලා තිබෙන මාර්ගෝපදේශ ආදිය එක් එක් එක්කෙනාට ඕනෑ විධියට සලකා කටයුතු කරන්න බැහැ. අපි දැක්කා, කඩුගන්නාව නගර සභාවේ ඡන්දය ඉතාම විනිවිදභාවයෙන් යුතුව පැවැත්වුණු ආකාරය. අන්න, හෘදය සාක්ෂිය ගැන කථා කරනවා නම්, උදාහරණයක්.

මොකද, එහිදී එක් එක් මන්ත්‍රීවරයාගේ නමින් නමට ඇහුවා, "විවෘත ඡන්දයක් ද, රහස් ඡන්දයක් ද ඕනෑ?" කියලා. ඒක තමයි ක්‍රමය. නමුත් මෙහේ ක්‍රමය මොකක්ද? කඩුගන්නාවේ එක නීතියක්; කොළඹ තවත් නීතියක්; කල්පිටියේ තවත් නීතියක්; තවත් තැනක තවත් නීතියක්. මේ රටේ නීති 10ක් විතර තිබෙනවා ද, ඡන්දවලට විතරක්? මතක තියා ගන්න, මේ දූෂිත ක්‍රමවේදය තමුන්නාන්සේලා නැති කළේ නැත්නම් තමුන්නාන්සේලාගේ ජයග්‍රහණයෙන් වැඩක් නැහැ. තමුන්නාන්සේලා බලය අරගෙන මොනවාද කරන්න හදන්නේ? තමුන්නාන්සේලා කරන වැඩ කටයුතු සම්බන්ධව, තමුන්නාන්සේලා කරන්න යන වැඩ පිළිවෙළ සම්බන්ධව මහා උජාරුවෙන් කෑ ගැහුවාම හරි කියලා හිතනවා නම්, එහෙම හිතුවාට ඒ වැඩ කරන්න බැහැ. ඒ වැඩ කරන ක්‍රමවේදයත් පෙන්වන්න.

ඒ වාගේම මා තමුන්නාන්සේලාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, රාජ්‍ය සේවය සම්බන්ධව. තමුන්නාන්සේලා හැම තැනකදීම, බොහෝ වෙලාවට රාජ්‍ය සේවකයා දිහාට බරපතළ විධියට ඇඟිල්ල දිගු කරලා කථා කරනවා අපි දකිනවා. එහෙම ඇඟිල්ල දිගු කරලා කථා කරන හැම තැනකදීම වෙන්නේ අවැඩක් බව මතක තියා ගන්න. මොකද, මේ රටේ හොඳ රාජ්‍ය සේවකයෝ ඉන්නවා. මේ රට හදපු, අදටත් හදන, බොහෝ වෙලාවට ආයතන ඉස්සරහට ගෙන යන, රටේ නීති පිළිපදින, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන අය ඉන්න ඉතා කීර්තිමත් රාජ්‍ය සේවයක් අපට තිබෙනවා. එවැනි අවංක රාජ්‍ය සේවකයන් අතර තමයි අර වාගේ කළු පැල්ලම් තිබෙන, ඩීල්වලට සම්බන්ධ වන අය ඉන්නේ. මා ඉහතින් කී කාරණය සම්බන්ධයෙන් ද කර තිබෙන්නේ බරපතළ වරදක්. තමුන්නාන්සේලා හැම දාම කියනවා නේ, ජනාධිපතිතුමා හැම දාම නම් කරලා කියනවා නේ රාජ්‍ය සේවයේ මෙන්න මේ මේ ආයතනවල මෙන්න මේ මේ දූෂිත වැඩ කරන අය ඉන්නවා, ඒ අය හිරේ දැම්මා කියලා. එහෙම නම්, ඉහතින් කී කාරණය සම්බන්ධයෙනුත් තීන්දු තීරණ ගන්න ඕනෑ. මොකද, රාජ්‍ය සේවයේ ඉතාම කීර්තිමත් විධියට වැඩ කරන රාජ්‍ය සේවකයාට ඒක විශාල කැලැලක්. ඒ කැලැල තිබෙන්න හොඳ නැහැ, මේ රටේ රාජ්‍ය සේවයේ. මේ රට නිවැරදි කරනවා නම්, රැඩිකල් වෙනසක් කරනවා නම්, මේ රටේ හැම දේම සාධාරණව කරන්න සූදානම් වෙනවා නම් ඒ වැඩසටහන ඉතාම නිවැරදිව කරන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අවසාන වශයෙන් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මැද පෙරදිග ජීවත් වන, මැද පෙරදිග ගිහිල්ලා රැකියා කරන අපේ අහිංසක කාන්තාවෝ ඉන්නවා. ඒ අය, අම්මලා, නංගිලා, අක්කලා වෙන්න පුළුවන්. ඒ අයට තිබෙනවා, බරපතළ ප්‍රශ්න. වැටුප් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා, හිරිහැර වීම් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා, දීමනා සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා, පහසුකම් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තමුන්ගේ ආගමික ක්‍රමය, සමාජීය ක්‍රමය සම්බන්ධ ප්‍රශ්නත් තිබෙනවා. එහෙම නම්, අපි ඉල්ලා සිටිනවා මේ නීති හදන කොට, විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධ වැඩ පිළිවෙළ සකස් කරන කොට තානාපති කාර්යාල සම්බන්ධ කරගෙන, ඒ ඒ රටවල් ද සම්බන්ධීකරණය කරමින් යම්කිසි වැඩසටහනක් හදන්න කියලා. විශේෂයෙන්ම ගෘහ සේවයේ යෙදෙන අපේ අහිංසක කාන්තාවන්ට තම වැටුප නිවැරදිව අරගන්න, අවුරුදු දෙකක් ගියාට පසුව නිවැරදි ආකාරයෙන් නිවාඩු ලබා ගන්න, ආපසු මෙරටට එන ගුවන් ප්‍රවේශ පත්‍රය හරියාකාරව ලබා ගන්න පුළුවන් වන විධියේ වැඩසටහනක් හදන්න. ඒ විතරක් නොවෙයි, වැටුප් නොදී ඉන්න අයට දඬුවම් දෙන වැඩසටහනක් හදන නීතිමය පියවරයන් ද ඒකට එකතු කරන්න කියලාත් මා ඉල්ලනවා. මොකද, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගන්නවා හා සමානවම අපේ අය ගිහිල්ලා විදේශ රටවල ජීවත් වෙනකොට ඒ රටවලදී සිද්ධ වන වැරදි සම්බන්ධව ක්‍රියා කරන්න අවශ්‍ය තීන්දු තීරණත් ගන්න. ඒ වෙනුවෙන් වන අලුත් යෝජනා ටිකක් සමඟින් වැදගත් වැඩ පිළිවෙළක්, තමුන්නාන්සේලාගේ රැඩිකල් වෙනසත් එක්ක එකතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.43]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று விவாதிக்கப்பட்டுக்கொண்டிருக்கும் 2024ஆம் ஆண்டின் 49ஆம் இலக்க வெளிநாட்டுத் தீர்ப்புகளைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமானது ஏனைய நாடுகளின் நீதிமன்றங்களின் தீர்ப்புகளை இலங்கையில் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்தும் நோக்கத்திற்காகவேண்டி உருவாக்கப் பட்டது. கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உண்மையில் இந்தக் கட்டளைகள் அமுலுக்கு வரும்போது, இன்னொரு நாட்டில் ஒரு விவாகரத்துத் தீர்ப்புக் கொடுக்கப்படுமாயின், அந்த விவாகரத்துத் தீர்ப்பை எமது நாட்டிலும் ஏற்றுக்கொண்டு, மீண்டும் வழக்கு விசாரணையின்றி, அதை அமுலாக்குவதற்கு உதவும். அதேபோன்று கொடுக்கல் வாங்கல் நடக்கும்போது அதில் ஏற்படுகின்ற குளறுபடிகள், பிரச்சினைகளைத் தீர்ப் பதற்குமாகச் சில அங்கீகரிக்கப்பட்ட நாடுகளின் தீர்ப்புகளை இந்த நாட்டிலும் ஏற்றுக்கொண்டு அங்கீகரிக்கப்படும் நிலை உருவாகும். எனவே, எமது நாட்டின் நீதித்துறைக்கு ஓர் உதவியாகவும் எமது மக்களுக்கு ஒரு சேவையாகவும் இதனை நாம் காணலாம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මීට කලින් කථා කරපු ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මුස්ලිම් ජනතාවගේ යම් යම් ප්‍රශ්න ගැන, එහෙම නැත්නම් ඔවුන් යම් අසාධාරණයට ලක් වුණා කියන අදහසින් යම් ප්‍රකාශයක් කළා. එතුමා කනගාටු වෙන්න ඕනෑ. මොකද, මාස 6ක්, 7ක් තිස්සේ අපි මේ පාර්ලිමේන්තුවේ උත්සාහ කරන්නේ, මුස්ලිම්, දමිළ, සිංහල වශයෙන් භේද නොවී එකා වාගේ එකට ප්‍රශ්නවලට මුහුණ දෙමු කියන ආකල්පය ඇති කරන්නයි. ඒ නිසා දයාසිරි ජයසේකර ගරු මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළ ප්‍රකාශයත්, අදහසත් පිළිගන්න බැහැ. එතුමාගේ ඉතිහාසය බලනකොට මුළු හෙට්ටිපොළම ගිනි තියන්න මූලික වුණේ ඒ මන්ත්‍රීතුමා තමයි. හෙට්ටිපොළ නගරයේ ජීවත් වෙන කිසිම මුස්ලිම් මනුස්සයෙක් දයාසිරි ජයසේකර පිළිගන්නේ නැහැ. දයාසිරි ජයසේකර ගරු මන්ත්‍රීතුමාගේ දේශපාලනයට අවුරුදු ගණනාවක් උදවු කරපු බුහාරි කියලා කෙනෙක් හෙට්ටිපොළ කොටඹපිටියේ ජීවත් වුණා. පසුගිය සතියේ ඒ බුහාරි කියන මහත්මයා නැති වුණා. මමත් ඒ අවමඟුල් උත්සවයට සහභාගි වුණා. මට මතක හැටියට, එදා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ උපන්දින උත්සවය හරි මොකක් හරි තිබුණා. නමුත් එතුමා වෙනුවෙන් පෙනී හිටපු, අවුරුදු 10ක්, 15ක් තිස්සේ එතුමාගේ දේශපාලනයට උදවු කරපු අල්ලපු ගමේ ඉන්න ඒ සහෝදරයාගේ අවමඟුල් උත්සවයටවත් සම්බන්ධ වෙන්න හිතක් නැති මනුස්සයෙක් තමයි, ඔය අද මුස්ලිම් ජනතාව වෙනුවෙන් කථා කළේ. හෙට්ටිපොළ නගරයම ගිනි තියලා සම්පූර්ණයෙන්ම විනාශ කළා. හෙට්ටිපොළ කොටඹපිටිය ප්‍රදේශයේ මුස්ලිම් ගම්මාන 3ක්, 4ක් විනාශ කරන්න මූලික වෙච්ච කෙනා තමයි ඒ මන්ත්‍රීතුමා. මෙතැන ඇවිල්ලා කථා කරන්නේ එදා සිද්ධ වෙච්ච දේ අමතක කරලාද? ඒ තමයි, එතුමන්ලාගේ දේශපාලන භාවිතය. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මුස්ලිම් සමාජයෙන් ප්‍රතික්ෂේප කරපු පුද්ගලයෙක් කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මේ විවාදය දිහා බලනකොට, මේ විවාදයේ සම්පූර්ණ අන්තර්ගතය තිබුණේ රහස් ඡන්දයක් ගැන. රහස් ඡන්දය හා විවෘත ඡන්දය. මොකක්ද මේ? ජනාධිපති ධුරය, පාර්ලිමේන්තුව අපට තියෙනකොට,- *[බාධා කිරීමක්]* අපි 150ට වැඩියෙන් අරගෙන බලය පිහිටුවලාත් ඉවරයි. අපි ලොකු ජයග්‍රහණයක් ලබා තිබෙද්දී, රහස් ඡන්දයක් ගැන කථා කරනවා. රහස් ඡන්දයෙන් හරි මොන ඡන්දයකින් හරි තමන් විශ්වාස කරන පුද්ගලයන් තමන්ට ඡන්ද දෙන්න ඕනෑ නේ. හැබැයි, ඡන්දේ දෙන්නේ නැහැ. කොළඹ මහ නගර සභාව ගැන කථා කරනකොට මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කලින් දරපු මතය වුණේ, "අපි මේ රහස් ඡන්දයෙන් දිනනවා" කියන එක. ඒ පුරපති අපේක්ෂකයාත් ඔන්න ඔය කථාව කිව්වා. හැබැයි, ඡන්දෙන් පැරදුණාට පස්සේ, අන්න නීතිය ගැන කථා කරනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

එතුමාගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එතුමා මගේ නම කියලා වැරදි ප්‍රකාශයක් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

හොඳයි, කියන්න ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 91. (ඉ) කෙරෙහි මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය."

එතුමා ඉතාම දරුණු ප්‍රකාශයක් කළේ. මම හෙට්ටිපොළ ගිනි තිබ්බා කිව්වා. හෙට්ටිපොළ නගරයේ මුස්ලිම් ජනතාව බේරාගත්තේ මම. එතුමා දන්නේ නැතුවයි ඒ කථාව කියන්නේ. මම කවදාවත් ජාතිවාදියෙක් නොවෙයි. මම හිටියේ නැත්නම් එදා දවසේ,-

ඒකට විරුද්ධව නඩු දාලා තිබෙනවා. මම අවශ්‍ය කටයුතු ටික කරලා තිබෙනවා. තමුන්නාන්සේ ගිහිල්ලා හෙට්ටිපොළ නගරයේ මුස්ලිම් ජනතාවගෙන් අහන්න, ඒ නගරය බේරාගත්තේ දයාසිරි ජයසේකරද නැද්ද කියලා. මොකද, මම කැමති නැහැ මෙහෙම කියනවාට. මම ජාතිවාදීව හැසිරෙන කෙනෙක් නොවෙයි. ඒ නිසා කරුණාකර මේ වචන ටික ඉවත් කරගන්න -ඉල්ලා අස්කරගන්න- කියලා මම යෝජනා කරනවා.

මොකද හේතුව, එවැනි කිසිම වරදකට මම වරදකාරයෙක් වෙලා නැහැ. නැති චෝදනාවක් ආරෝපිත කිරීම සම්පූර්ණයෙන්

වැරදියි. ගරු මන්ත්‍රීතුමා, ඒ නිසා කරුණාකරලා එම ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න. ඔබතුමා වැරදි ප්‍රකාශයක් කළේ. ඔබතුමා දන්නේ නැතිව නේ මේ කථා කරන්නේ. දන්නේ නැතිව ඒ කථාව කියන්න එපා. මම ඔබතුමන්ලාගේ ජනතාවට සිද්ධ වෙච්ච වරදක් ගැන කථා කළේ.

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම පිට පළාතක මනුස්සයෙක් නොවෙයි. කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක්. මේ සිද්ධිය එකින් එක මම දන්නවා. එතුමාගේ භාවිතයත් දන්නවා. එතුමා එදා කොහොමද, අද කොහොමද කියලා කියන්න මම විස්තරාත්මකව දන්නවා. මම කළ ප්‍රකාශය කිසිසේත් ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මම සහතික ලෙස කියනවා, හෙට්ටිපොළ ජීවත් වෙන හැම මුස්ලිම් මනුස්සයෙක්ම දන්නවා කියලා ගරු මන්ත්‍රීතුමාගේ හැසිරීම ගැන. එතුමා වෙනුවෙන් පෙනී හිටපු බුහාරි මහත්මයාගේ මළ ගෙදර එන්න එදා එතුමාට හිතක් තිබුණාට එන්න බැහැ. මොකද, ඒ මුස්ලිම් ජනයා අතරට එන්න බැහැ. ඒකයි ඇත්ත කථාව. මෙතැනට ඇවිල්ලා රඟපාන්න ඕනෑ නැහැ. අපිට ඕනෑ නැහැ,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පෞද්ගලිකව අභූත චෝදනා කරන්න එපා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ කළ ප්‍රකාශය ඉවත් කරන්න.

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
අද පුරපති අපේක්ෂකකම ඉල්ලනවා, - *[බාධා කිරීමක්]* අද මොකද වෙන්නේ? රහස් ඡන්දය ද, විවෘත ඡන්දය ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, -

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
කරුණාකරලා මගේ කාලය, -

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බුහාරි මැතිතුමා කියන්නේ මමත් එක්ක ඉතා ළඟින් වැඩ කරපු යාළුවෙක්. එතුමාගේ අවමංගල්‍යය දවසේ මම ඇත්තටම හිටියේ කොළඹ. එදා හවස් වෙනකොට බුහාරි මැතිතුමාගේ අවසන් කටයුතු සිදු කළා. මම හවස් වෙනකොට ගෙදර ගියා. මෙතුමා දන්නේ නැති ඒවා නොකියා ඉන්න කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අස්ලම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. මාතෘකාවට අදාළව කථා කරන්න.

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මළ ගෙයක් වුණා නම් ඒ වෙලාවේ යන්න පුළුවන්, පස්සේ යන්නත් පුළුවන්. හැබැයි, මැදිහත් වීම තමයි ප්‍රශ්නය. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියන්නේ මම ගරු කරන මන්ත්‍රීවරයෙක්. නමුත්, එතුමා මේ පුරපති සටනේදී රටම පිළිකුල් කරන විධියට හැසිරුණු ආකාරයෙන් ජනතාව එතුමාව තේරුම් ගත්තා. මොකද, එදා අපේක්ෂකයා සම්බන්ධයෙන් එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමායි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමායි අතර සටනක් තිබුණා, තමන්ගේ පක්ෂය තුළ. ඇයි, මෙහෙම වෙන්නේ? එතකොට විවෘත ඡන්දය, රහස් ඡන්දය නොවෙයි. තමන් විශ්වාස කරන පුද්ගලයෝ ඡන්දය දෙන්න ඕනෑ. හරි, විවෘත ඡන්දයෙන් දිනුවා කියමු. කාත් එක්ක එකතු වෙලා ද මේ රට හදන්න යන්නේ? දැන් මේ රට හැදුවාද? අර පොහොට්ටුව, සජබය, යූඑන්පී කියමින් කෑ ගහපු මිනිස්සු එක්ක, no deal! ගරු විපක්ෂ නායකතුමා කිව්වේ කොහොමද? "මට ඇමෙරිකාවේ ජනාධිපතිකම දුන්නත් මම deal එකකට යන්නේ නැහැ" කිව්වා. එතුමාට ඇමෙරිකාවේ ජනාධිපතිකම දෙන්න! එංගලන්තයේ දෙනවා ලු! ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මොකක්ද මේකේ තේරුම? අපි මේ රට හදන්නේ කොහොමද? නීති රීති හදන්න පුළුවන්. හැබැයි, ආකල්ප වෙනස් කරන්නේ කොහොමද? අපි මේ තිබෙන තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. නගර සභාව, ප්‍රාදේශීය සභාව කියන්නේ මුළු රටේම ආර්ථිකය හසුරුවන තැන් නොවෙයි. රටේ සම්පූර්ණ ජයග්‍රහණය නොවෙයි. ප්‍රාදේශීය වශයෙන් යම් කාර්යයන් සිදු කරනු ලබන සභාවන්. එහෙම නම්, මේ වෙලාවේ පවතින ආණ්ඩුව නොවෙයිද ඒ සභාවන් මෙහෙයවන්න ඕනෑ? අපි කොහොමද සජබය, පොහොට්ටුව තවත් විශ්වාස කරන්නේ? හොඳයි, එකතුවෙලා හදන්නකෝ. රුපියල් ලක්ෂ 10ක ව්‍යාපෘතියක් කරනවා නම්, එයින් රුපියල් ලක්ෂ 5ක තරම් සේවයක් ජනතාවට සිදු වෙන්නේ නැහැ. ඉතින්, අපි තවත් දෙන්න ඕනෑද?

මෙතැනදී කථා කරනවා, පොහොට්ටුවත් එක්ක කිසිම deal එකක් නැහැ කියලා. කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ හය දෙනෙක් ඉන්නවා, පොහොට්ටුවේ. අන්න, සභාපතිකම දුන්නා. සජබයෙන් දුන්නා, සභාපතිකම. උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභාපතිකම දුන්නා. There is no deal. එහෙම නම් අපි තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. අපිට එතුමන්ලාව විශ්වාස කරන්න පුළුවන් තැනක ඉන්නවා නම්, අපි සභාව දෙනවා. අපි ප්‍රතිපාදන දෙන්නම්, ඔබතුමන්ලා ගිහිල්ලා සභාව හදන්න කියලා. අපිට කවදාවත් මේ උදවිය විශ්වාස කරන්න බැහැ. විශ්වාස කරන තැන නොවෙයි එතුමන්ලා ඉන්නේ. අපි අවුරුදු 70 ගණනක් තිස්සේ මේ තත්ත්වයට පත් වුණේ මේ නිසායි. විශේෂයෙන්ම අද මේ ලෝකයේ තත්ත්වයත් එක්ක පොඩි සටහනක් මම ඉදිරිපත් කරන්න කැමැතියි. දමිළ භාෂාවෙන් තිබෙන මේ ලේඛනය මා **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

உலகம் இன்று யுத்த களமாக மாறி வருகின்றது. பிராந்திய யுத்தமாக இன்று காஸாவில் நடைபெறும் யுத்தமானது

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

அதையும் தாண்டி உலக மகா யுத்தமொன்றை நோக்கி நகரும் என்ற அச்சமும் வெளிப்படுத்தப்படுகின்றது. யுத்த பூமியாக மாற்றப்பட்டுள்ள காஸாவை மீளக் கட்டியெழுப்ப அரை நூற்றாண்டுகளாவது செல்லும் எனக் கணிப்பிடப்படுகிறது. அங்கு 60,000க்கும் மேற்பட்ட மனித உயிர்கள் பலியாகியுள்ளன. அநியாயமாக உயிரிழந்த குழந்தைகள், பெண்களின் உயிர்களை மீளப் பெற முடியாது. பெற்றோரை இழந்திருக்கின்ற 17,000க்கும் மேற்பட்ட பிள்ளைகளுக்குத் தாய், தகப்பனைத் திரும்பவும் பெற்றுக் கொடுக்க முடியாது. இவற்றை ஊடகங்கள் வாயிலாகப் பார்க்கும் சிறுவர்கள் மத்தியில் இந்தக் காயங்கள் ஆழமாகப் பதிவாகி வருகின்றது. அதைவிட, தற்போது பல்லாயிரக்கணக்கான மக்கள் பட்டினியால் இறக்கும் அவலம் அங்கு உருவாகியிருக்கின்றது. கர்ப்பிணிப் பெண்களில் மூன்றில் ஒருவர் பிரசவத்தின்போது மரணிக்கக்கூடுமெனச் சுகாதாரத் தரப்புச் சொல்கின்றது. 85 சதவீதமான மருத்துவமனைகள் சேதமடைந்துள்ளன. காயப்பட்டவர்களுக்கும் நோய்வாய்ப்பட்டவர்களுக்கும் சிகிச்சையளிக்க வழியில்லை. இப்படியாக கண்முன்னே மனித இனம் அழிந்து வருகின்றது. மனித அபிவிருத்திக்குப் பயன்படுத்த வேண்டிய கோடிக்கணக்கான பணம், மனித இனத்தை அழிப்பதற்கு வீணாகிறது. ஈரான் - இஸ்ரேல் மோதல் இந்த நிலைமைகளை மேலும் மோசமாக்கும்.

யுத்தத்தின் விளைவுகளை இந்த நாடு அனுபவித்திருக்கின்றது. கடந்த இரண்டு வாரங்களுக்கு முன்பு யாழ்ப்பாணம் library எரிக்கப்பட்ட தினம் அனுஷ்டிக்கப்பட்டது. அந்த இழப்பை இன்னமும் எங்களால் ஈடுசெய்ய முடியவில்லை. யுத்தத்தினால் நாட்டுக்கு ஏற்பட்ட பொருளாதார இழப்பு 200 பில்லியன் டொலர்கள் என மதிப்பிடப்பட்டுள்ளது. நாடு bankrupt ஆகும்போது இருந்த கடன் கிட்டத்தட்ட 52 பில்லியன் டொலர்களாக இருந்தது. யுத்தம் இல்லாதிருந்தால் நாங்கள் இன்று 3 மடங்கு முன்னேறியிருப்போம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

யுத்தத்தின் அவலங்களை நேரடியாக அனுபவித்த நாடு என்ற வகையில், அழிவுக்குக் காரணமாகும் எல்லாவிதமான மோதல்களுக்கும் எதிரானவர்களாவே நாங்கள் இருக்கின்றோம். யுத்தம் ஒருபோதும் நாடுகளை முன்னேற்றப் போவதில்லை. தற்போது முடுக்கிவிடப்பட்டுள்ள யுத்தத்தால் உலகப் பொருளாதாரம் இன்னும் பல மடங்கு வீழ்ச்சியடையப்போகின்றது. எமது நாட்டின் பொருளாதாரமும் நாட்டின் வளர்ச்சியும் பெரிதும் மத்திய கிழக்கு நாடுகளில் தங்கியுள்ளது. வெளிநாடுகளில் பணிபுரிபவர்களிடமிருந்து நாட்டுக்குக் கிடைக்கும் வருமானத்தில் பெரும்பாலானவை மத்திய கிழக்கு நாடுகளில இருந்தே கிடைக்கின்றது. நாங்கள் ஆட்சிக்கு வந்து 2025 ஏப்ரல் வரை இலங்கைக்குக் கிட்டத்தட்ட 646 மில்லியன் டொலர் வெளிநாட்டு வேலைவாய்ப்பு வருமானமாகக் கிடைத்திருக்கின்றது. ஐக்கிய அரபு எமிரேட்ஸிலிருந்து 200 மில்லியன் டொலர்களும் குவைத்திலிருந்து 199 மில்லியன் டொலர்களும் சவூதி அரேபியாவிலிருந்து 167 மில்லியன் டொலர்களும் கத்தாரிலிருந்து 145 மில்லியன் டொலர்களும் கிடைத்துள்ளன. இவை தவிர, ஈரான் வழங்கிய 'உமா ஓயா திட்டம்' போன்ற பல மில்லியன் கணக்கான பெறுமதியான செயற்றிட்டங்களுக்கு மத்திய கிழக்கு நாடுகள் உதவியளித்திருக்கின்றன.

தற்போது நடைபெறும் யுத்தத்தினால் இலங்கைக்கு இதுபோன்ற விடயங்களில் நேரடிப் பாதிப்பு ஏற்பட வாய்ப்பிருக்கின்றது. ஈரான் சொல்வதுபோல ஹோர்மூஸ் நீரிணை மூடப்படுமானால் உலகில் அதிகரிக்கப்போகும் எண்ணெய் விலை நமது நாட்டிலும் பாதிப்பை ஏற்படுத்தும்; பொருட்களின் விலைகள் அதிகரிக்கும். இந்த உலகளாவிய பிரச்சினையின் தாக்கத்தை எதிர்கொள்ள எமது நாட்டு மக்கள் தயாராக வேண்டும். நாட்டின் பொருளாதார நிலை சீரடைந்து வருவதாக அண்மையில் IMF குழுவினரே பாராட்டியிருந்தார்கள். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாங்கள் இணைந்து யுத்தங்களிலிருந்து இந்த உலகை மீட்டெடுக்கப் பாடுபடுவோம் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.58]

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කර ඇති නියම පිළිබඳව අද දින සාකච්ඡා කළත්, මම මුලින්ම කථා කරන්න කැමැතියි, කොළඹ මහ නගර සභාව සම්බන්ධව අප ලැබූ ජයග්‍රහණය ගැන. මීට සුළු මොහොතකට පෙර අපේ ව්‍රායි කැලී බල්තසාර් සහෝදරිය කොළඹ පුරපතිනිය ලෙස දිවුරුම් දෙනු ලැබුවා. එය අපේ පක්ෂය ලැබූ ඓතිහාසික ජයග්‍රහණයක් හැටියට අපි සලකනවා. මොකද, කොළඹ කියන්නේ ඓතිහාසික මහ නගර සභාවක්. විශේෂයෙන්ම මේ වනකොට අපි ජනාධිපතිවරණය, මහ මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණයත් ජයග්‍රහණය කර තිබෙනවා. ඒ අනුව කොළඹ මහ නගර සභාවේත්, නුවරඑළිය මහ නගර සභාවේත් බලය අද දවසේ අපි ලබාගෙන තිබෙනවා. මේ විශේෂ අවස්ථා එකිනෙක සලකා බැලීමේදී කොළඹ මහ නගර සභාවේ ජයග්‍රහණය අපි අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සලකනවා. මෙය අපේ ඓතිහාසික ජයග්‍රහණයක්. ලංකාවේ කාන්තා දේශපාලනය ඇතුළේ මෙතෙක් ආපු ගමන් මගේ ව්‍රායි කැලී බල්තසාර් සහෝදරිය කොළඹ මහ නගර සභාවේ නගරාධිපති ධුරයට තේරී පත්වීම විශේෂ වන කාරණා කිහිපයක් තිබෙනවා.

සාම්ප්‍රදායික පවුල් දේශපාලනයට එහා ගිහිල්ලා, එදා මෙදා තුර මේ රට පාලනය කරමින් ආපු වරප්‍රසාදලාභී සමාජ පන්තියක් නියෝජනය කරපු කාන්තාවන්ගේ යුගය අවසන් කරලා, ඇත්තටම මේ රටේ වැඩ කරන ජනතාවගේ, වැඩ කරන කාන්තාවන්ගේ යුගයයි මේ අවස්ථාවේ ලකුණු වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම කොළඹ නගරයේ ඉහළ මධ්‍යම පන්තිය වාගේම, පහළ මධ්‍යම පන්තිය සහ නාගරිකව වතුවල

ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ කියන සියලු ජනතාවගේ හදවත් එකාවන්ව දිනා ගත් අවස්ථාවක් හැටියටයි අපේ ව්‍රායි කැලී බල්තසාර් සහෝදරියගේ ජයග්‍රහණය අපි සලකන්නේ. මෙවර එතුමියට ලබා දීපු මහජන වරම විශේෂයි. කොළඹ නගරය කියන්නේ බහු සංස්කෘතික, බහු වාර්ගික, බහු ආගමික සහ බහු භාෂිකත්වයට ඉඩ ලබා දෙන, ඒ සියලු විභේදන තිබෙන නගරයක්. කොළඹ මහ නගර සභාවේ ජයග්‍රහණය ඇතුළේ ඒ සියලුදෙනාම එකතු කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ඒ සියලු දෙනාගේම අවධානය දිනාගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ඒ සියලු ජනතාවගේ විශ්වාසය දිනාගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ජාතික ජන බලවේගයට බව මේ ජයග්‍රහණයත් එක්ක තහවුරු වෙනවා. එම ජයග්‍රහණය මුළු රටටම අපි උපමා කරලා බැලුවොත්, ඇත්තටම මෙය ජාතික සමගියේ ආරම්භක අවස්ථාවක්. ඒ වාගේම සිංහල, දෙමළ හා මුස්ලිම් සියලුදෙනාම එකාවන්ව තීන්දු තීරණ ගන්න අවස්ථාවක්.

මේ අවස්ථාව අපි හැමකෙනාම කිසිදු භේදයකින් තොරව කාන්තා දේශපාලනය, කාන්තා නායකත්වය පිළිගනිමින් තිබෙන අවස්ථාවක්. ඒ කාන්තා රැකවරණය සහිත කාන්තා දේශපාලනය පිළිගැනෙන ලංකාවේ තීන්දු තීරණ ගන්නා ස්ථානවල, දේශපාලනික බලය පාවිච්චි වන තැන්වල, ඒ වාගේම තමයි මූල්‍ය හසුරුවන තැන්වල, ආර්ථික ක්‍රියාමාර්ග ගන්න තැන්වල, සමාජ ආරක්ෂණය ගොඩනංවන තැන්වල, කාන්තා බලය වෙනුවෙන් ලැබිච්ච ජන වරම හැල්ලු කරන්න ඉඩ දෙන්න අපට පුළුවන්කමක් නැහැ. එම නිසා මේ ලබා ගත් ජයග්‍රහණය කිසිසේත්ම සුළුකොට තැකිය හැකි ජයග්‍රහණයක් නොවෙයි. එම නිසා අපි හැමකෙනාම මේ අවස්ථාවේදී ඒ ජයග්‍රහණයත් එක්ක ඉතා ආඩම්බර වෙනවා. මේ රටේ දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරනවා කිව්වා. ඒ සඳහා කාන්තා දේශපාලනය සුවිශේෂී තැනකට ඔසවා තැබීමේ ඕනෑකම අපට තිබුණා. ඒ සුවිශේෂී සන්ධිස්ථානය කොළඹ පුරපතිනිය වූ ව්‍රායි කැලී බල්තසාර් සහෝදරිය හරහා අපට ලංකාවේ සටහන් කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. එතුමිය විසින් ඉදිරියේදී ලියනු ලබන මේ නගරාධිපති ධුරයත් එක්ක වසර 4ක ඉදිරි කාලය කොළඹ නගරයේ පෑගෙන, තැළෙන, පොඩි වන මිනිසුන්ගේ අනාගතයේ ඉරණම ලියවෙන වසර 4ක් බවට පත් වෙනවා. ඊට අදාළ තීන්දු තීරණ ගැනීමේදී ඉහළ මධ්‍යම පන්තියේ ජනතාව විතරක් නොවෙයි, පාරිසරික අයිතිය අහිමි වෙලා තිබෙන, ඉතා අඩු සනීපාරක්ෂක පහසුකම් සහිතව ජීවත් වන දරිද්‍රතාවෙන් පෙළෙන පහළ පන්තියේ ජනතාවත්, නාගරිකව වතුවල ජීවත් වන ජනතාවත් අපි අමතක කරන්නේ නැහැ.

අපි ඒ ජනතාවට ලබා දුන් බලාපොරොත්තු ඉෂ්ට කරන්න ඕනෑ. ඒ වාගේම ලබා දෙන්න පොරොන්දු වුණු සහන ඉදිරි අවුරුදු 4ක කාලය තුළ කොළඹ මහ නගර සභාව හරහා ඒ ජනතාව වෙත ලබා දිය යුතුව තිබෙනවා. එතුමියගේ ජීවිතයේ වැඩිම කාලයක් පර්යේෂිකාවක් හැටියටත්, ඒ වාගේම ජනතාවත් එක්ක හරි හරියට, කරට කර, උරෙන් උර ගැටුණු සමාජ ක්‍රියාකාරිනියක් හැටියටත් ගත කරපු කාලය තුළ ලබා ගත් අත්දැකීම් ඒ සඳහා එතුමියට උදව් වෙනවා කියලා අපි දන්නවා.

ගරු අග්‍රාමාත්‍යතුමියගේ පටන් වැඩිම කාන්තා නියෝජනයක් ඇති මේ පාර්ලිමේන්තුවේ ඉඳලා කොළඹ නගරයේ පුරපතිනිය දක්වා එය සටහන් කිරීම, අපේ රටේ දේශපාලන ඉතිහාසයේ කාන්තා දේශපාලනය ජාතික ජන බලවේගය විසින් අලුත්ම තලයකට ගෙනාවාය කියන එක පිළිබඳව අපට නිහතමානී ආඩම්බරයක් සහ සතුටක් තිබෙනවා. ඒ ජයග්‍රහණයත් එක්ක මේ රටේ සෑම ප්‍රදේශයකම ජීවත් වන දරුවන්ගේ ආරක්ෂාව, කාන්තාවන්ගේ රැකවරණය, සවිබලගැන්වීම හා ආර්ථික ක්‍රියාවලියට සක්‍රිය දායකත්වය සැපයීම වෙනුවෙන් අපි මේ සියලු යන්ත්‍රණ පාවිච්චි කරන බව මේ අවස්ථාවේදී මම වගකීමෙන් යුතුව කියන්න ඕනෑ.

අන්න ඒ නිසා එහිම තවත් දිගුවක් හැටියට තමයි අද අපි මේ පාර්ලිමේන්තුවේදී, විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ නියම පිළිබඳව සාකච්ඡා කරන්නේ. එතැනදී අපි අපරානුමත කරන, පිළිගනු ලබන එහි නියම තිබෙනවා. විදෙස් තීන්දු ලංකාව තුළ බලාත්මක කිරීම පිළිගනු ලැබීමේ ක්‍රමවේදයත් එක්ක අපට ලැබෙන විශේෂ වරප්‍රසාද කිහිපයක් තිබෙනවා. අපි දන්නවා, ගනුදෙනුවලදී ණය ගැතියන් සහ ණය හිමියන් අතර වූ නඩු සඳහා ලැබෙන තීන්දු අන්‍යෝන්‍යාව බලාත්මක වීම වාගේම ඒ රටවලදී ගනු ලබන තීන්දු මෙතැනින් එහාට අපේ රටට බලපානවා කියලා.

ඒ වාගේම විවාහය කියන කාරණයේදී, විවාහය ශුන්‍ය කිරීම හා දික්කසාදය කියන අවස්ථාවලදී ගනු ලබන තීන්දුත් අපට මේ රට තුළ තවදුරටත් බලාත්මක වීම, පිළිගැනීම කියන කාරණාව සිදු වෙනවා. අන්න ඒ අතින් ගනිද්දී, අපි මේක විශේෂයෙන්ම ස්ත්‍රී පාර්ශ්වය පැත්තෙන් - කාන්තා කෝණයෙන්; ස්ත්‍රීවාදී දෘෂ්ටි කෝණයෙන් - බැලුවොත් ඇත්තටම දික්කසාදය බලාත්මක වීමේදී අපි විදෙස් නඩු තීන්දු ලංකාව තුළ ක්‍රියාත්මක වීම ඇතුළේ විවාහය කියන කාරණාවේදී, ඒ වාගේම දික්කසාදය කියන කාරණාවේදී, එතැනින් එහාට දේපළ නිදහස් කර ගැනීම කියන කාරණාවේදී මේවායේ තිබෙන ප්‍රයෝජනය අපි සලකා බලා තිබෙනවා. එම නිසා ඊට අදාළ නියම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන මේ මොහොත අපට වැදගත් වෙන්නේ ඒ කාරණා මතයි.

අපි රටක නීතිය කියන එක ගත්තොත්, නීතිය බලාත්මක කිරීමේදී අපට විශේෂ අවස්ථාවක් තිබෙනවා. නීතිය යනු, රාජ්‍ය විසින් ක්‍රියාවට නංවන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියක් කියලා ජෝන් ඔස්ටින් විසින් පවසා තිබෙනවා. නීතිය සාධාරණ විය යුතුයි. එතැනදී ලංකාවේ මේ අවස්ථාවේ අපි කථා කරන මේ පනත පිළිබඳව විතරක් නොවෙයි, මේ නියම පිළිබඳව විතරක් නොවෙයි, අපි හැම විටම නීතිගරුක දේශයක්, ඒ වාගේම යුක්තිගරුක දේශයක් නිර්මාණය කර ගන්න කැපවිය යුතුයි. අපේ දේශපාලන ව්‍යාපාරය ඒ සඳහා අවංකව කැප වන දේශපාලන ව්‍යාපාරයක්. අන්න ඒ නීතිය ක්‍රියාත්මක කිරීමේදී, නීතියේ සාධාරණත්වය කියන එක අපි බලාපොරොත්තු වෙනවා. ස්වාභාවික යුක්තිය ඉෂ්ට කිරීම සඳහා ඌන පූරණයක් වශයෙන් නීතිය දැඩි පාලනයකින් යුතුව ක්‍රියාත්මක වන නෛතික මූලධර්ම තිබෙනවා. අන්න ඒ මූලධර්ම නිසියාකාරව ක්‍රියාත්මක කරවා ගැනීමෙන් රටක ජනතාවට නීතිය පිළිබඳව තිබෙන විශ්වාසය තහවුරු වෙනවා.

අපි පසුගිය කාල පරාසයේ ගනු ලැබූ තීන්දු ගත්තොත්, අපි සම්මත කර ගත් විශේෂ පනත් තිබෙනවා වාගේම හිටපු ජනාධිපතිවරුන්ගේ විශේෂ වරප්‍රසාද සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කිරීම සඳහා වූ යෝජනා ද සම්මත කරගෙන තිබෙනවා. ඒ වාගේම පසුගිය කාල පරාසය තුළ අයථා ලෙස උපයා ගත්, විශේෂයෙන්ම පාතාල ක්‍රියාකාරකම්වලින් සහ මත් ද්‍රව්‍ය ජාවාරම්වලින් උපයා ගත් විශාල දේපළක් තිබෙනවා. අපි ඒවායේ අයිතිය ඉවත් කරලා එම දේපළ රජයට පවරා ගැනීම සඳහා වන කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කරලා තිබෙනවා. ඒ අතින් ගත්තාම, ලංකාව ඇතුළේ අයථා ලෙස උපයාගෙන තිබෙන, විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය ජාවාරමෙන් සහ පාතාල ක්‍රියාකාරකම්වලින් උපයා ගත් අතිවිශාල ධනය නැවත පවරා ගැනීමට අදාළ නීති අපි සම්පාදනය කළා. අපි ඒ තුළින් බලාපොරොත්තු වෙන්නේ යුක්තියේ සාධාරණ හැසිරීම හෝ සැලකුම්, එහෙම නැත්නම් නීතිය සාධාරණ ලෙස ඉටු කිරීම තුළින් රට තුළ ආර්ථික සාධාරණත්වයක් ඇති කිරීමයි.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

නීතිය බලාත්මක කිරීම තුළ නීතියේ සාධාරණත්වය ගත්තාම, විවිධ අංශවල සාධාරණත්වයක් අවශ්‍යයි. සමාජ සාධාරණත්වය ඕනෑ, ආර්ථික සාධාරණත්වය ඕනෑ, ජීවත්වීමේ මානව නිදහස ඕනෑ, අපරාධවලින් තොර සමාජයක් නිර්මාණය කර ගැනීමේ අයිතිය ඕනෑ. ඒ සඳහා තමයි අපි නීති-රීති සම්පාදනය කරන්නේ. අන්න ඒකෙදි අපට පැහැදිලිවම මේ නීති බලාත්මක කිරීම සඳහා තව කාරණා රාශියක් පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කරන්න තිබෙනවා.

අපි මාස 6ක කාල පරාසය තුළ මේ රටේ ඉදිරි ගමනට, ආර්ථික ක්‍රියාවලියට, සමාජ සුරක්ෂිතභාවයට, අපේ රටේ ජනතාවගේ නිදහස් ජීවිතයට බාධා වන විධියේ තීන්දු තීරණ ඉවත් කරන්නත්, වඩාත් යහපත් ජීවන තත්ත්වයක් ඇති කරන්න ගත යුතු තීන්දු තීරණ පිළිබඳවත් නොයෙක් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. එහිදී ආර්ථික ක්‍රියාමාර්ග ගැනීම විතරක් නොවෙයි, නෛතික වෙනස්කම් ඇති කිරීම ද අපි කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි ඒවායේ ව්‍යුහාත්මක වෙනස්කම් ද ඇති කරලා තිබෙනවා. මේ සියල්ල එකට ගත්තාට පස්සේ තමයි රටක ඉදිරිය තීරණය වන්නේ.

ආර්ථික දර්ශක ඉහළ යනවා වාගේම සමාජ දර්ශකත් අපි ගොඩනහන්න ඕනෑ. ඒ සමාජ දර්ශකවල ප්‍රධානම දෙයක් තමයි, රටේ පවතින නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙනවාද කියන එක. ඒ නිසා මේ නීති බලාත්මක කිරීමේදීත්, නීතිය ක්‍රියාත්මක කිරීමේදීත් වන ක්‍රමවේදය තුළ මෙච්චර කල් තිබුණු දේශපාලන අතපෙවීම්වලින් නිදහස් හා සාධාරණ නීති ක්‍රමයක් අපි දැන් රට තුළ නිර්මාණය කරලා තිබෙනවා. ඒ අනුව රටේ නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය, සාධාරණත්වය හා යුක්තිය පිළිබඳ විශ්වාසය තහවුරු වෙද්දි රටේ මිනිසුන්ගේ ජීවන තත්ත්වයෙහි එහෙම නැත්නම් සමාජ දර්ශකවල ප්‍රගතියක් පෙන්නුම් කරනවා. අගතියට පත් වන ඕනෑම පාර්ශ්වයකට යුක්තිය ඉටුවීම පිළිබඳව වන විශ්වාසය ඇතුළේ තමයි ඒ රට කොයිතරම් ප්‍රජාතන්ත්‍රවාදී රටක්ද කියන එක තීරණය වන්නේ. ඒ වාගේම ආගම, ජාතිය, ප්‍රදේශය, ස්ත්‍රී-පුරුෂභාවය, වයස, තරාතිරම ඇතුළු කිසිදු භේදයක් නොසලකා අගතියකට පත් වූ ඕනෑම පුද්ගලයෙකුට ඒ සඳහා යුක්තිය ඉටු කර ගැනීමට තිබෙන විශ්වාසය ඇතුළේ සමාජයක් හැටියට අපි කොයිතරම් ඉහළට එසවෙනවාද? මේ රට ජීවත් වෙන්න උචිත රටක් බවට තහවුරු වීම කියන එක තීරණය වෙන්නේ ඒ මත. ඒ නිසා අපි මෙන්න මේ නීතිය පිළිබඳව වන විශ්වසනීයත්වය රට තුළ ගොඩනැංවූ පළමු දේශපාලන ව්‍යාපාරයයි.

එහෙම නැත්නම් මෑත ඉතිහාසය තුළ රටේ නීතිය ක්‍රියාත්මක වීම හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වීම පිළිබඳව ගත්තොත්, අද වන විට ලංකාවේ ජනතාවට ඒ පූර්ණ විශ්වාසය ලැබිලා තිබෙනවා. අවසාන වශයෙන් මා මේ කාරණයත් කියනවා.

2024ஆம் ஆண்டின் 49ஆம் இலக்க, வெளிநாட்டுத் தீர்ப்புகளைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டத்தின்கீழ் வர்த்தமானியில் பிரசுரிக்கப்பட்ட 2(1)ஆம் மற்றும் 1(2)ஆம் பிரிவுகளின் கீழான கட்டளைகளை அங்கீகரிப்பதற்கான இவ்விவாதத்தில் ஒரு முக்கியமான விடயத்தைக் கூற விரும்புகின்றேன். வெளிநாடுகளில் எடுக்கப்படுகின்ற தீர்ப்புகளை இலங் கையிலும் அங்கீகரித்தல் மற்றும் ஏற்றுக்கொள்ளல், வலுவுறுத்துதல் என்ற விடயங்களை உள்ளடக்கிய சட்டத்தின் விளைவுகளை மேற்படி வர்த்தமானி அறிவித்தல்மூலம் ஏற்று அங்கீகரிப்பதன் காரணம் என்னவென்றால், இலங்கையில் வாழ்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் வெளிநாடுகளில் இருந்தபோது விவாக, விவாகரத்துச் சட்டத்தின் அடிப்படையில் வழங்கப்பட்ட தீர்ப்புகளின் பிரகாரம் இங்கு அவர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் பற்றி எவ்வாறான தீர்மானத்தை எடுப்பது என்பது போன்ற விடயங்கள் கருத்திற்கொள்ளப்பட்டமையாகும்.

அந்த வகையில், தமிழ் சமுதாயம் தங்களுடைய உடைமைகளைப் பற்றி தீர்மானங்கள் எடுப்பதற்கு, வெளிநாடுகளிலே வழங்கப்படுகின்ற தீர்ப்புகள் இலங்கையால் அங்கீகரிக்கப்பட வேண்டும் என்பதை ஒரு முக்கியமான விடயமாக நாங்கள் எண்ணுகின்றோம். ஆகவேதான் இலங்கையில் இவ்வாறான கட்டளைகளை அமுல்படுத் துவதன்மூலம், அதாவது வெளிநாட்டுத் தீர்ப்புகள் இலங்கையிலும் ஏற்றுக்கொள்ளப்படுவதன் காரணத்தினால், அந்த மக்களுக்குத் தங்களுடைய உடைமைகளை யாருக்குக் கையளிப்பது, தன்னுடைய வாழ்வைப் பற்றி தீர்மானிப்பது, மீளத் திருமணம் செய்துகொள்வது போன்ற விடயங்களில் எங்களால் கொண்டுவரப்படுகின்ற இவ்வாறான தீர்மானங்கள் உதவும் என்று நாங்கள் நம்புகின்றோம்.

அதுமட்டுமல்லாமல், இலங்கையில் இந்த விடயம் சம்பந்தமாக மேலதிகமாக எடுக்கவேண்டிய சில தீர்மானங்கள் இருக்கின்றன. வெளிநாடுகளில் வழங்கப்படுகின்ற தீர்ப்புகளை இலங்கையில் எவ்வாறு இவ்வாறான கட்டளைகளை வர்த்தமானியில் பிரசுரித்து ஏற்றுக் கொள்கின்றோமோ, அதுபோலவே இலங்கையில் எடுக்கப் படுகின்ற தீர்மானங்களையும் வெளிநாடுகளில் அங்கீகரிக்கப் படக்கூடிய தன்மையை நாங்கள் ஏற்படுத்த வேண்டும். அவ்வாறான தீர்மானங்களை எடுப்பதன்மூலம் நாங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கான வழிகாட்டல் மற்றும் இலங்கையில் எடுக்கப்படுகின்ற தீர்மானங்களைப் பரஸ்பரம் ஏனைய நாடுகளும் ஏற்றுக்கொள்வதற்கான தன்மையைச் சர்வதேச ரீதியாக ஏற்படுத்திக் கொள்ள வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට තව එක විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

இளைஞர், யுவதிகள் தற்போது இலங்கையில் திருமணம் செய்துகொண்டு வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புகளுக் காகச் செல்வதன் காரணமாக, பல ஆண்டு காலமாகக் கணவன் -மனைவி இருவரும் பிரிந்து வாழ்கின்ற தன்மைகளை நாங்கள் பார்க்கின்றோம். குறிப்பாக, வடக்கு, கிழக்கு மாகாணங்களை எடுத்துக்கொண்டால், கணவன் வெளிநாட்டில் இருக்கின்ற நிலையில், மனைவி - இளம் யுவதி- பிரிந்து வாழ்கின்ற தன்மைகளை நாங்கள் அதிகம் பார்க்கின்றோம். ஆகவேதான், இவ்வாறான பிரச்சினைகளை நிவர்த்தி செய்யக்கூடிய தீர்மானங்களைச் சட்டத்தில் ஏற்படுத்தி, இவர்கள் அனைவரும் திருமணத்திற்குப் பிறகு தம்பதிகள் என்ற வகையில் ஓரிடத்தில் வாழ்வதற்கான வசதிகளைத் துரிதமாக ஏற்படுத்திக் கொடுப்பதற்கான வசதிகளை அரசாங்கம் என்ற வகையில் நாங்கள் மேற்கொள் ளவேண்டிய கட்டாயத்தை அறிந்து கொண்டிருக்கின்றோம்.

ஆகவேதான் நாங்கள் சொல்கின்றோம், வெளிநாட்டில் வாழ்கின்ற ஒருவரைத் திருமணம் செய்துகொள்கின்ற இலங்கைப் பிரஜை அங்கு பிரஜாவுரிமையைப் பெற்றுக் கொள்வதற்கான துரித நடவடிக்கைகளை மேற்கொள்வதற்கு ஏற்ற வகையில் இந்த நாட்டிலுள்ள சட்டத்தில் மாற்றங்களை நாங்கள் மேற்கொள்ள வேண்டுமென்று. அதேபோல, இலங்கையர் ஒருவர் வெளிநாட்டவர் ஒருவரைத் திருமணம் செய்வதாக இருந்தால், அது தொடர்பான சட்ட நடவடிக்கைகளில் உள்ள தாமதங்கள் மற்றும் தடைகளை நீக்கி, அவர்கள் சுதந்திரமாக வாழக்கூடிய சூழலை ஏற்படுத்திக் கொடுக்கவேண்டிய கட்டாயத்தை நாங்கள் வலியுறுத் துகின்றோம். அரசாங்கம் என்ற வகையில், இதற்கான பேச்சுவார்த்தைகள் மற்றும் எடுக்கவேண்டிய தீர்மானங்களை நாங்கள் மேற்கொண்டிருக்கின்றோம்.

இறுதியாக நான் கூற விரும்புவது என்னவென்றால், சட்டம் என்பது மக்களின் வாழ்க்கையை இலகுபடுத்துவதாக அமைக்கப்பட வேண்டும். அதாவது, சட்டமானது பிரஜைகள் என்ற வகையில், மக்களுக்கு ஜனநாயக உரிமைகளைப் பாதுகாத்துக் கொடுக்கும் வகையில், நீதி, நியாயம் ஆகியவற்றில் நம்பிக்கையை ஏற்படுத்திக் கொடுக்கும் வகையில், அந்த நாட்டின் அபிவிருத்திக்கான ஒரு குறியீடாக அமைய வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அதாவது, குறிகாட்டிகள் என்ற அடிப்படையில் பார்க்கும்போது, ஒரு நாட்டில் மக்களின் உரிமைகள் சட்டத்தின்மூலம் பாதுகாக்கப்படுவதாக இருந்தால், அதுவே சனநாயக உரிமை! ஆகவே, நாங்கள் அதற்கு வழி வகுப்போம் என்றுகூறி, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.15]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் எமது சுதேச மருத்துவத் துறை - ஆயுர்வேதம், சித்த, யுனானி - தொடர்பாக நாடளாவிய ரீதியில் இன்று காணப்படுகின்ற நிலைமை பற்றி கதைக்கலாமென்று நான் எண்ணுகின்றேன். அவற்றின் தேவை எமது மக்களின் கலாசார மற்றும் பண்பாட்டுடன் இணைந்த வளர்ச்சியினாலும் சுகாதார சேவைகளுக்கான தேவைகளினாலும் அதிகரித்த வண்ணம் காணப்படுகின்றது. சித்த, ஆயுர்வேத மற்றும் யுனானி மருத்துவங்கள் எமது நாட்டின் கிராமப்புறங்களிலும், பொருளாதார ரீதியாகப் பின்தங்கிக் காணப்படுகின்ற பகுதிகளிலும் வாழ்ந்துவருகின்ற மக்களின் ஆரோக்கியத்தைப் பாதுகாப்பதில் நிலையான மிகப்பெரும் பங்கை வகிக்கின்றன. எனினும், அரச சுதேச வைத்திய அதிகாரிகளின் நியமனங்களின் பற்றாக்குறையானது இவர்களது சேவை தேவைப்படுகின்ற சமூகங்களுக்குச் சேவையினை வழங்க முடியாத நிலையினை ஏற்படுத்தியுள்ளது.

எமது நாட்டில் சுதேச வைத்தியக் கல்வியைப் பூர்த்தி செய்து, வைத்தியர் தகுதியினைப் பெற்றுள்ள பல சுதேச வைத்தியர்கள் வேலைவாய்ப்பின்றிக் காணப்படுகின்றனர். சுதேச மருத்துவத் துறையானது எமது நாட்டின் சுகாதார சேவையில் மிகவும் முக்கியத்துவம் வாய்ந்ததாகக் காணப்படுகின்றபோதிலும், ஐந்து வருட தொழில்சார் சுதேச மருத்துவக் கல்வி மற்றும் அதனைத் தொடர்ந்து ஒரு வருட உள்ளகப் பயிற்சி போன்றவற்றை நிறைவுசெய்தும், நாடளாவிய ரீதியில் தொழில் வெற்றிடங்கள் காணப் பட்டபோதிலும், கடந்தகால அரசாங்கங்கள் அதற்கான நிதி ஒதுக்கீட்டினைச் செய்யாமை மற்றும் நியமனங்களில் அக்கறை செலுத்தாமை போன்ற காரணங்களினால் சுதேச வைத்தியர்களின் தொழில் வாய்ப்புகள் நிறுத்தப்பட்டு, நியமனங்களுக்காகக் காத்திருப்போரின் எண்ணிக்கை அதிகரித்துக்கொண்டு சென்றது.

மேலும், உயர் கல்வி அமைச்சானது இந்த சுதேச வைத்தியக் கற்கைநெறிகளுக்காகப் பல்கலைக்கழகங்களுக்கு உள்ளீர்க்கப்படும் மாணவர்களின் எண்ணிக்கையை அதிகரித்ததன் காரணமாக, கடந்த ஐந்து வருடங்களில் கல்வி கற்று வெளியேறிய மாணவர்களின் எண்ணிக்கை 25 தொடக்கம் 50 வரையானதாக இருந்து, தற்போது 120 தொடக்கம் 200 வரையானதாக உயர்ந்துள்ளது. அதனால் வேலைவாய்ப்பின்றிக் காணப்படும் வைத்தியர்களின் எண்ணிக்கை மேலும் கணிசமான அளவு அதிகரித்துள்ளது. இந்த வேலைவாய்ப்பற்ற சுதேச வைத்தியர்கள் பல தரப்பட்ட இன்னல்களை எதிர்நோக்குகின்றார்கள். அதாவது, தாம் பெற்ற பல வருடக் கல்வி மற்றும் மருத்துவப் பயிற்சிகள் என்பன பயனற்றுப்போதல், தாம் வாழும் சமூகத்துக்கு, குறிப்பாக புறநகர் மற்றும் பின்தங்கிய பகுதிகளுக்குச் சேவை வழங்க இயலாமை, தொழில்சார் தகுதிகள் இருந்தும் வேலையின்மையின் காரணமாக ஏற்படும் உளவியல் ரீதியான பாதிப்புகள், நிதி நிலையற்ற தன்மை மற்றும் சமூகத்தினரால் ஏற்படுத்தப்படும் களங்கங்கள் போன்றவற்றுக்கு முகங்கொடுக் கிறார்கள். தற்போதைய அரசாங்கத்தின் பாதீட்டுப் பரிந்துரையில் 2,720 சுதேச வைத்தியர்களின் நியமனங்கள் பற்றி குறிப்பிடப்பட்டுள்ள போதிலும், அடுத்த ஆண்டு ஜனவரி ஆகும்போது, வேலையற்ற சுதேச வைத்தியர்களின் எண்ணிக்கையான 2,062 உடன், தற்போது உள்ளகப் பயிற்சியில் ஈடுபட்டுள்ள சுதேச வைத்தியர்கள் 360 பேரும்; 2026இல் உள்ளகப் பயிற்சியை மேற்கொள்ளவுள்ள சுதேச வைத்தியர்கள் 363 பேரும் இணையும்போது இத்தொகை மொத்தமாக 2,785 ஆகக் காணப்படும்.

அதேநேரம், எமது நாட்டில் அதிகரித்துவரும் குடிமக்களின் எண்ணிக்கைக்கு அமைவாகச் சுதேச வைத்தியர்களின் நியமனங்களின் எண்ணிக்கையையும் அதிகரிக்க வேண்டிய நிலை காணப்படுகின்றது. அதனடிப்படையில், சுமார் 7,043 புதிய பதவிகளை வழங்கி நாட்டின் சுகாதார சேவையினை மேம்படுத்த உதவுமாறு முன்மொழிகின்றேன். இந்த எண்ணிக்கையை அரசாங்கத்தினால் வெளியிடப்பட்டுள்ள சனத்தொகைக் கணக்கெடுப்பின் அடிப்படையில் நான் முன்வைக்கின்றேன். நாட்டின் சனத்தொகையின் அடிப்படையில் சித்த, ஆயுர்வேத மற்றும் யுனானி மருத்துவ அதிகாரிகளின் பணியிடங்களை அதிகரிக்க அமைச்சரவை அங்கீகாரத்துக்கான வேண்டுகோளாகவே நான் இதனை முன்வைக்கின்றேன்.

2025ஆம் ஆண்டுக்கான சனத்தொகை கணக்கெடுப்பு அறிக்கையின் அடிப்படையில் எமது நாட்டின் மக்கள் தொகை அதிகரித்துள்ளமையை நாம் காண முடியும். இந்த சித்த, ஆயுர்வேத மற்றும் யுனானி ஆகிய சுதேச மருத்துவங்கள் எமது மக்கள் மத்தியில் இலகுவாகவும் எளிதாகவும் கிடைக்கக்கூடிய வகையில் காணப்படுவதால், முழுமையான மற்றும் பண்பாட்டு ரீதியாக ஏற்றுக்கொள்ளக்கூடிய சுகாதார சேவைகளை வழங்குவதில் மிக முக்கிய பங்கு வகிக்கின்றது. எனினும்,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

தற்போது நியமிக்கப்பட்டுள்ள மற்றும் நியமிக்கப்படவுள்ள சுதேச வைத்திய அதிகாரிகளின் எண்ணிக்கையானது நாட்டின் சுதேச சுகாதார தேவைகளை முழுமையாக வழங்குவதற்குப் போதாத நிலையில் காணப்படுகின்றது. சனத்தொகை அதிகரிப்பு மற்றும் சுகாதாரத் தேவைகளைக் கருத்திற் கொண்டு இத்துறையிலுள்ள மருத்துவ அதிகாரிகளின் பணியிடங்களை அதிகரிக்க தங்களது மேலான கவனத்தினை அன்புடன் கோருகின்றேன். இது சிறந்த சுகாதார முறைமையினையும் திறனான சேவையையும் தொடர்ச்சியாக மக்களுக்கு வழங்க உதவும்.

இலங்கையின் 25 மாவட்டங்களிலும் இருக்கும் மக்கள் தொகை இரண்டு கோடியே முப்பத்து நான்கு இலட்சத்துப் பதினோராயிரம் என்று அரச புள்ளிவிபரப்படியான அண்மைய குறிப்பு சொல்கின்றது. எனவே, எதிர்பார்க்கும் சுதேச வைத்திய அதிகாரிகள் எண்ணிக்கை 4,682; எதிர்பார்க்கும் CMO அதிகாரிகளின் எண்ணிக்கை 2,341 என்ற வகையில் மொத்தம் 7,023 பேராகும். இதனடிப்படையில், எமது நாட்டில் இவ்வாறானதொரு பிரச்சினை எதிர்காலத்தில் ஏற்படாதிருக்க நான் பின்வரும் பரிந்துரைகளை முன்வைக்கின்றேன்:

1. நாட்டின் சனத்தொகைக்கேற்ற வகையில் வைத்திய அதிகாரிகளின் பதவி வெற்றிடங்களை அதிரித்தல்.

2. சுதேச வைத்தியக் கற்கைநெறிக்காகப் பல்கலைக் கழகங்களில் உள்ளீர்க்கப்படும் மாணவர்களின் எண்ணிக்கையைக் குறைத்தல் அல்லது மட்டுப்படுத்தல். இதற்குப் பின்வருவன காரணமாகும்:
   - பல்கலைக்கழக பீடங்கள் மற்றும் வைத்தியசாலைகளில் மட்டுப்படுத்தப்பட்ட அளவுக்கே வளங்கள் காணப்படுவதன் காரணமாக அதிகமான மாணவர்கள் கற்பதற்குரிய எந்தவொரு சூழலும் இல்லை.
   - கல்வித்தரம் மற்றும் மருத்துவ அறிவுகளின் தரம் ஆகியன குறைவடைதல்.
   - மட்டுப்படுத்தப்பட்ட வேலைவாய்ப்புகள்.

3. கடந்த 2007 க.பொ.த. உயர்தர ஆண்டு மாணவர்கள் தொடக்கம் தற்போதுவரை கல்விகற்ற 2,400க்கும் மேற்பட்ட வேலையற்ற சுதேச வைத்தியப் பட்டதாரிகள் காணப்படுகின்றார்கள். ஆனால், அண்ணளவாக 700 சுதேச வைத்தியர்களே 2024 தொடக்கம் 2025ஆம் ஆண்டுகளில் நியமனம் பெற்றுள்ளனர். எனவே, இவர்களின் நியமனங்களை அதிகரித்தல்.

4. சுதேச மருத்துவமானது, இயற்கையை மையப் படுத்தியதாகவும் ஆழமான புரிந்துணர்வுடனும் மாத்திரமே கற்கப்பட முடியும். மாறாக, பாரியளவிலான கல்வி மாதிரி மூலமாக இக்கற்கையை மேற்கொள்ள முடியாது. இது பாரம்பரிய வைத்திய அறிவில் பாரிய தாக்கத்தை ஏற்படுத்தும் என்பதைக் கவனத்திற்கொண்டு இக்கல்வியை வழங்குதல்.

5. அந்நியச் செலாவணியை நாட்டுக்குக் கொண்டுவரும் வகையில் சுற்றுலாத்துறை மற்றும் ஏற்றுமதி வியாபாரத்தினை ஊக்குவிக்கும் வகையிலான சுதேச மருத்துவச் செயற்பாடுகளை நடைமுறைப்படுத்தல்.

எனவே, எமது நாட்டின் சுகாதார சேவையில் மிகப் பெரும் பங்கு வகிக்கும் சுதேச மருத்துவச் சேவையினை எதிர்காலத்தில் தங்குதடையின்றி நடாத்துவதற்கும், வேலையற்றுக் காணப்படுகின்ற சுதேச மருத்துவப் பட்டதாரிகளுக்குத் தொழில் நியமனங்களை வழங்குவதற்கும், இனிவரும் காலங்களில் உள்ளகப் பயிற்சிகளை நிறைவுசெய்து வெளியேறும் சுதேச வைத்தியர்களுக்கான பதவி நியமனங்களைத் தாமதிக்காது உடனடியாக வழங்குவதற்கும் நாட்டின் பொருளாதாரத்தினை மேம்படுத்தும் வகையிலான புதிய மற்றும் நவீன பொறிமுறைகளை அமுல்படுத்தவும் தங்களின் மேலான ஆதரவினைக் கோருகின்றேன். நன்றி! வணக்கம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ විවාදයට ගනු ලබන නියමවලට අදාළව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා සෑහෙන පිරිසක් මේ වනකොට අදහස් දක්වා තිබෙනවා. නමුත් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා දැක් වූ අදහස් එක්ක මට වැටහුණු දෙයක් තමයි, මේ විවාදය තිබෙන්නේ කුමන කාරණයක් සම්බන්ධයෙන්ද කියන එකවත් ඇතැම් මන්ත්‍රීතුමන්ලා අවබෝධ කරගෙන නැහැ කියන එක. මොකද, ඇතැම් මන්ත්‍රීතුමන්ලා පනත් කෙටුම්පතක් සම්බන්ධව කරුණු දක්වනවා. මම හිතුවා වචන වැරදීමක් වුණාද දන්නේ නැහැ කියලා. නමුත්, අහලා බලද්දී තුන්හතර වතාවක්ම පනත් කෙටුම්පතක් ගැන කරුණු දක්වනවා.

ඇත්තටම අද දවසේ කථා කරන 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත දැනට සම්මත වෙලා තිබෙන්නේ. මේ පනතේදී කුමන රටවල නඩු තීන්දු ද අපි අදාළ කර ගන්නේ යන්න සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යවරයා විසින් ඒ රටවල් ටික ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. ඊට අදාළව අංක 2429/51 දරන ගැසට් පත්‍රයේ උපලේඛනයේ අපි අදාළ කර ගන්නා රටවල් ටික දක්වා තිබෙනවා. ඒ ගැසට් පත්‍රය සම්බන්ධයෙන් තමයි අද දවසේ විවාද කරනු ලබන්නේ. හැබැයි, ඒ ගැසට් පත්‍රය සහ පනත පැත්තකින් තියෙද්දී අද දවසේ විවාදයේදී නගර සභාවල රහස් ඡන්දය ගැන බොහෝ දුරට කරුණු දැක්වූවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ.

මේ පනත සම්බන්ධයෙන් කරන යෝජනාත් එක්ක මට පැහැදිලි වුණු දෙයක් තමයි, මේ පනත මුල ඉඳන් අගට කියෙව්වා නම් එවැනි යෝජනා කරන්නේ නැහැ කියන කාරණය. මොකද, අපරාධ නඩු සම්බන්ධයෙනුත් ඇතැම් යෝජනා අද දවසේ විවාදයේදී ඉදිරිපත් කෙරෙනවා. පැහැදිලිව කියන්න ඕනෑ, මම මුලින් කිව්වා වාගේ ගැසට් පත්‍රයේ රටවල් 53ක් දක්වා තිබෙනවා. ඒ රටවල් 53හි යම් නඩු තීන්දුවක් අපට මේ රටේ අධිකරණයක් ඉදිරියේදී පිළිගන්න, එහෙම නැත්නම් ලියාපදිංචි කරන්න, බලාත්මක කර ගැනීම සඳහා අවස්ථාව තිබෙනවා. විශේෂයෙන් නීතිඥවරියක් විධියට මමත් අධිකරණවල කටයුතු කරද්දී දැක තිබෙනවා, විදේශගත වෙලා ඉන්න සමහර අය විශේෂයෙන් විවාහ නඩුකරවලදී ප්‍රායෝගික අපහසුතාවන්ට පත් වනවා. මොකද, විදේශගත වෙලා ඉද්දී දික්කසාදය ලබා ගන්න නම් නැවත ඔවුන්ට මේ රටට එන්න වෙනවා. එවැනි අයට මේ පනත තුළින් පහසුවක් සැලසී තිබෙනවා. මේ උපලේඛනයේ දක්වා

තිබෙන රටවල් ගත්තාම, අපේ රටේ බොහෝ අය මේ රටවල්වල දීර්ඝ කාලීනව ඉන්නවා. විවාහ සම්බන්ධ -දික්කසාද, එහෙම නැත්නම් ශුන්‍ය නඩුකර, පාර්ශ්වයන් වෙන් වෙන්න අවශ්‍ය නම්- නඩුකරයකදී විදේශ අධිකරණයකදී නඩු තීන්දුවක් ලබාගෙන එය මේ රටේ බලාත්මක කරවා ගැනීමට හැකියාව තිබෙනවා. ඒක ඒ අයට ලොකු පහසුවක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

එතැනදී මේ නඩු තීන්දු අදාළ වෙන්නේ කුමන ක්ෂේත්‍රවලටද කියන එක පනතේ 3වන වගන්තියේ දක්වා තිබෙනවා. ණය ගැතියන් හා ණය හිමියන්ට අදාළ නඩුවලදී ඒවා අදාළ වනවා. ඒ වාගේම විවාහ නඩුකර. විවාහයක් අවලංගු කර ගැනීම, ශුන්‍ය කිරීම, විවාහක පාර්ශ්ව වෙන් වීමට අදාළ නඩු සම්බන්ධයෙන් පනත අදාළ වනවා. අනෙක් කාරණය තමයි, අපරාධමය තීන්දු සම්බන්ධයෙන් අදාළ නොවීම. විදේශ රටක අධිකරණයක නඩු තීන්දුවක් යටතේ ගෙවිය යුතු යම් බදු, අය කිරීම්, දඩ මුදල් හෝ වෙනත් දණ්ඩන සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ වන්නේ නැහැ කියන කාරණය පනතේ 3වන වගන්තිය යටතේ දක්වා තිබෙනවා. එතකොට අපි තේරුම් ගන්න ඕනෑ, මොන ක්ෂේත්‍රවල නඩු තීන්දු ද බලාත්මක කර ගන්න පුළුවන් කියන කාරණය.

ඒත් එක්කම විදේශ අධිකරණයකින් ලබා ගන්න නඩු තීන්දුවක් ලබාගෙන; ඒ කියන්නේ මුල් අධිකරණයේ ලබාගත්ත ඒ අවසාන නඩු තීන්දුවේ දිනයේ ඉඳලා වසර 10ක කාල සීමාවක් ඇතුළත මෙම අධිකරණයේ ඒ ඉල්ලීම කරන්න ඕනෑ. ඒ කාල සීමාව අවුරුදු 10ක් ලෙස පනතේ දක්වලා තිබෙනවා. ඒ ඉල්ලීම කරන්න ඕනෑ, වසර 10ක් ඇතුළත. ඒත් එක්කම එහෙම කරන ඉල්ලීමකට විරෝධතා දක්වන්න පාර්ශ්වයන්ට හැකියාව තිබෙනවා, මේ පනතේ විධිවිධාන අනුව.

ඒ වාගේම විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, මෙරට ලියාපදිංචි කළ නඩු තීන්දුවක්; ඒ කියන්නේ විදේශයෙන් ලබාගත්ත නඩු තීන්දුවක් මෙරට ලියාපදිංචි කරලා ඕනෑම අවස්ථාවක නිශ්ප්‍රභ කිරීමේ බලය අපේ අධිකරණයට තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, මේ පනතේ විධිවිධාන අනුගමනය කර නැත්නම්, ඒවා උල්ලංඝනය කර තිබෙනවා නම් එවැනි අවස්ථාවක, එහෙම නැත්නම් මුල් අධිකරණයෙන් ගත්ත තීන්දුව වංචනික විධියට ලබාගෙන තිබෙනවා නම් එවැනි අවස්ථාවක, මුල් අධිකරණයෙන් හෝ ඒ මුල් අධිකරණයේ ඉහළ අධිකරණයකින් ඒ තීන්දුව නිශ්ප්‍රභ කර තිබෙන අවස්ථාවක, ඒ නඩු තීන්දුව මේ රටේ ලියාපදිංචි කළා වුණත්, ඕනෑම අවස්ථාවක එය නිශ්ප්‍රභ කිරීමට හැකියාව තිබෙනවා.

ඒ වාගේම, මේ ලියාපදිංචි කරන තීන්දුවකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමටද හැකියාව තිබෙනවා. එතැනදී යම් සීමාවක් පැනවෙනවා. අර කලින් කිව්වා වාගේ විවාහ සම්බන්ධ නඩුකරවලදී විවාහයක් අවලංගු කිරීමක්; ශුන්‍ය කිරීමක්; විවාහක පාර්ශ්ව අතර වෙන්වීමක් පිළිබඳව වන තීන්දුවක් සම්බන්ධයෙන් ලියාපදිංචියක් කළා නම් ඊට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාවත් මේ පනත යටතේ තිබෙනවා. ඇත්තටම පුද්ගල අවශ්‍යතා අනුව, ප්‍රායෝගික අවශ්‍යතා අනුව අලුතෙන් නීති සකස් වෙන්න ඕනෑ.

ඒ විධියට විදේශගත වෙලා ඉන්න අයගේ තිබෙන ප්‍රායෝගික ගැටලුවලට මේ රටේ අධිකරණයක නඩු කටයුත්තක් පවත්වා ගෙන යනවාට වඩා පහසුවක් සැලසී තිබෙනවා, මේ පනත මඟින් සහ මේ නියමයන් මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන හේතුවෙන්. ඉතින් මෙය හොඳ පනතක් බව මා කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒත් එක්කම, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් මේ විවාදය යන අතරතුර කාරණයක් මතු කළා, ආණ්ඩු පක්ෂයෙන් හැම තිස්සේම රාජ්‍ය සේවය හොඳ නැහැ කියන තැනට විවේචන ඉදිරිපත් කරනවා කියලා. ඉතින්, ඒ සම්බන්ධයෙනුත් මා යමක් කියන්න අවශ්‍යයි. කුමන ක්ෂේත්‍රයක් ගත්තත්, හරි විධියට වැඩ කරන පිරිසක් ඉන්නවා. ඒ වාගේම, නරක අතට, එහෙම නැත්නම් නීතිමය රාමුවෙන් පිට වැඩ කරන කණ්ඩායමකුත් ඉන්නවා. ඒ පිරිස නිසා තමයි මේ රටට මේ වාගේ විනාශයක් අත් වෙලා තිබෙන්නේ. කොයි ක්ෂේත්‍රය ගත්තත් ඒ තත්ත්වය තිබෙනවා. රාජ්‍ය සේවය විතරක් නොවෙයි, දේශපාලනය ගත්තත්, කොතැනත් ඒ දේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒත් එක්කම අපි මතක් කරන්න ඕනෑ, අපේ රට විශාල අර්බුදයකට මුහුණ දී තිබුණු අවස්ථාවක මේ දේශපාලන වෙනස සිදු කරමින් මේ රට මේ වනකොට ආර්ථිකමය වශයෙන් යම් ස්ථාවර මට්ටමකට ගෙනැවිත් තිබෙන බව. එතැනදී ඒ ආර්ථික අර්බුදයත් එක්ක, රටේ තිබුණු අර්බුදත් එක්ක ජනතාව මේ දේවල්, මේ පීඩනය දරාගෙන සිටියා. මම ඒ වෙනුවෙන් ජනතාවට ස්තුතිවන්ත වෙනවා. අනෙක් අතට, දේශපාලන අධිකාරියේ සිදු වුණු වෙනසත් එක්කම ජනතාව අපේක්ෂා කළ වෙනස්කම කරන්න අපි ලොකු මහන්සියක් අරගෙන තිබෙනවා. ආණ්ඩුව විධියට ආර්ථිකය යම් ස්ථාවර මට්ටමක රඳවා ගන්න, ඒ වාගේම ඩොලරය ස්ථාවර මට්ටමක තබා ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, බලාපොරොත්තු වුණු විධියට රාජ්‍ය ආදායම් උපයා ගන්නත් අපි මේ වනකොට සමත් වෙලා ඉන්නවා. ඒ වාගේම, විදේශ සංචිත වැඩි කර ගන්නත් අපි සමත් වෙලා ඉන්නවා. ඒ කොහොම නමුත්, අර විපක්ෂයේ මන්ත්‍රීතුමා කලින් මතු කළ කාරණය ගැන කියද්දී අපට නැවතත් කියන්න සිදු වෙනවා, රාජ්‍ය සේවය ගැන අපට සතුටු වෙන්න පුළුවන් මට්ටමක් නැති බව. මොකද, රාජ්‍ය සේවය දැනට තිබෙනවාට වඩා කාර්යක්ෂම වෙන්න ඕනෑ. සමහර සේවාවන් අපට අවශ්‍ය නැති වුණත් රාජ්‍ය සේවයට අදාළව ඒ සේවාවන් වෙනුවෙන් විශාල පිරිවැයක් දරනවා. රාජ්‍ය සේවය වෙනුවෙන් දරන ඒ පිරිවැය අඩු කර ගනිමින්, කාර්යක්ෂමතාව මීට වඩා වැඩි කර ගනිමින්, මීට වඩා හොඳ රාජ්‍ය සේවයක් ගොඩ නැංවීමට ආණ්ඩුව විධියට අපි මහන්සි ගනිමින් ඉන්නවා. රාජ්‍ය සේවයට අප යම් යම් දේවල් කියන බව විපක්ෂය කිව්වත්, රාජ්‍ය සේවයේ ගැටලුකාරී තත්ත්වයන් පවතින බවට හොඳම උදාහරණයක් මා කියන්නම්. අපි ඉතිහාසයේ දැක්කා, රාජ්‍ය සේවයේ ඉහළම පුටු හොබවපු අය කරපු දේවල්. පොලිස්පතිවරයා අත්අඩංගුවට ගන්න පොලීසියෙන් යනවා. පොලීසිය සැහෙන මහන්සියක් ගන්නවා, ඔහුව අත්අඩංගුවට ගන්න. අන්න, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා බන්ධනාගාරගත වෙලා ඉන්නවා. මේ වාගේ දේවල් එක්ක අල්ලස් ගැනීම සම්බන්ධයෙන් ද, දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් ද රාජ්‍ය සේවයට ඇඟිල්ල දිගු වෙනවා. වෙනසක් සිදු කරමින් අප මේ යන ගමනේදී රාජ්‍ය සේවය තුළ අපේක්ෂා කරපු වෙනස සම්පූර්ණයෙන් සිදු වෙලා නැහැ. අපි ඒ දේත් මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. කාර්යක්ෂමතාවෙන් යුතු, අල්ලස සහ දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් ගොඩ නැංවීම සඳහා ආණ්ඩුවක් විධියට අප බොහොම කැපවීමෙන් කටයුතු කරමින් සිටිනවා කියන කාරණයත් මම මතක් කරනවා.

ඊයේ දිනයේ සභාව කල් තබන අවස්ථාවේදී මම මේ ගරු සභාවට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා ඊශ්‍රායල-ඉරාන යුද්ධයට අදාළව. ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න සූදානමින් සිටියදී විපක්ෂය ඝෝෂාකාරී ලෙස හැසිරෙමින් කටයුතු කළා. ඇත්තටම, ප්‍රජාතන්ත්‍රවාදී රටක විපක්ෂයට විශාල කාර්යභාරයක් තිබෙනවා. හැබැයි, අපේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ ඝෝෂාවක් විතරයි

[ගරු නිපුණ ගීතා හේරත් මහත්මිය]

අප දකින්නේ. මේ රටේ ව්‍යසනයක් ඇති වුණු බොහෝ අවස්ථාවල මාධ්‍ය විසින් ඒක වචාගෙන කන්න, මාර්කට් කරගත් අවස්ථා තිබෙනවා. ඇතැම් දේශපාලන කඳවුරු ඒවා ඉපැයීම් මාර්ග බවට පත් කරගෙන තිබුණා. සුනාමිය ගත්තත්, කොවිඩ් වසංගත තත්ත්වය ගත්තත් එහෙමයි. ඇතැම් අයට මේ ඊශ්‍රායල-ඉරාන යුද්ධයෙනුත් යම් වාසියක් ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා කියා මම හිතනවා. ඒ වාගේ දෙයක් තමයි විපක්ෂයේ අය නඟපු හඬින් අපට තේරුණේ. මා හිතන විධියට, අද එම කාරණය විවාදයට ගන්න නියමිත වෙලා තිබෙනවා.

මම තව එක් කාරණයක් මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අද උදෑසන අපේ ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරනවා මට ඇහුණා, "අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා" කියලා. ඇත්තටම එතුමා ඒක තමාටම කියාගෙන ඒ අනුව කටයුතු කළා නම්, මීට වඩා හොඳ විපක්ෂයක් එක්ක එතුමාට කටයුතු කරන්න ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ මතක් කිරීමත් කරමින්, ආණ්ඩුව විධියට විශේෂයෙන්ම හොඳ රාජ්‍ය සේවයක් බිහි කරන්න අප කැපවීමෙන් කටයුතු කරන බවත් මම සඳහන් කරනවා.

අද දවසේ විවාදයට ගනු ලබන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වන නියමයන්ට අදාළ කටයුතු කරගෙන යෑම සඳහා ගරු අධිකරණ අමාත්‍යවරයාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.37]

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைதினம் நடைபெறுகின்ற வெளிநாட்டு தீர்ப்புகளைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவு செய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சி அடைகின்றேன்.

இன்று இச்சபையில் விசேடமாக உள்ளூராட்சி மன்றத் தேர்தல் முடிவுகள் பற்றியும் அதன் தாற்பரியம் பற்றியும்தான் அதிகமாகப் பேசப்படுகின்றது. நடந்து முடிந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின் முடிவானது, அரசாங்கத்துக்கும் அரசியல் கட்சிகளுக்கும் நல்ல பாடங்களைப் புகட்டியிருக்கிறது. அத்துடன், அரசாங்கம் சார்பான கட்சி எல்லோராலும் ஏற்றுக்கொள்ளப்பட்ட கட்சியா? எந்தக் கட்சிக்கு மக்கள் விரும்பி வாக்களித்து இருக்கிறார்கள்? போன்ற விடயங்களையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கிறது. இந்தத் தேர்தலில் அகில இலங்கை மக்கள் காங்கிரஸ் 13 மாவட்டங்களில் தனித்தும் வேறு கட்சிகளுடன் இணைந்தும் போட்டியிட்டு, 140 ஆசனங்களைப் பெற்றிருக்கிறது. அகில இலங்கை மக்கள் காங்கிரஸோடு அதிகமான மக்கள் இருக்கிறார்கள் என்ற நல்ல செய்தியையே இது எடுத்துக் காட்டுகின்றது.

கடந்த பொதுத் தேர்தலைவிட, இந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸ் அதிகளவான வாக்குகளைப் பெற்றிருக்கிறது. நான் இந்தக் கட்சியின் பிரதித் தவிசாளர் என்ற வகையில், எங்களுடைய கட்சிக்கு வாக்களித்த மக்களுக்கு நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றேன். அந்த வகையில், வவுனியா, மன்னார், முல்லைத்தீவு, அநுராதபுரம், குருணாகல், புத்தளம், கண்டி, களுத்துறை, கொழும்பு, யாழ்ப்பாணம், அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை ஆகிய மாவட்டங்களைச் சேர்ந்த மக்களுக்குக் கட்சி சார்பில் நான் நன்றி கூறுகின்றேன். அத்துடன், கட்சியின் மாவட்டத் தலைவர்கள், அமைப்பாளர்கள், உயர்பீட உறுப்பினர்கள், கட்சிப் போராளிகள், பாராளுமன்ற உறுப்பினர்கள் என அனைவருக்கும் நன்றி கூறுகின்றேன். நாங்கள் கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் காலத்தில் பல்வேறு சவால்களை எதிர்கொண்டோம். குறிப்பாக, அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியின் துரித வளர்ச்சியைத் தடுப்பதற்குப் பல்வேறு முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. அவற்றைக் கட்சியின் ஆதரவாளர்களும் போராளிகளும் முறியடித்து சாதனை படைத்திருக்கிறார்கள்.

நடைமுறையிலுள்ள உள்ளூராட்சி மன்றத் தேர்தல் முறைமையில் குளறுபடிகளும் பல்வேறு பிரச்சினைகளும் இருக்கின்றன. கடைசி நேரத்தில் ஒரு சபையில் ஆட்சி அமைப்பதற்காக நான் எங்களுடைய உறுப்பினர் ஒருவருடைய வீட்டுக்கு இரவு 7.00 மணியளவில் சென்றிருந்தேன். அப்பொழுது அந்த வீட்டில் ஓர் அமைச்சரும் ஒரு பாராளுமன்ற உறுப்பினரும் அமர்ந்திருந்ததை நான் பார்த்தேன். அதனால் எங்களுடைய உறுப்பினரைச் சந்திக்க முடியாமல் நான் திரும்பி விட்டேன். அடுத்த நாள் உள்ளூராட்சிச் சபையில் ஆட்சியமைக்க முற்படும்பொழுது, அந்த இரண்டு உறுப்பினர்களும் அரச வாகனத்தில் வந்திறங்கி, எங்களுக்கு எதிராக வாக்களித்ததைப் பார்த்தோம். இவ்வாறு இந்தத் தேர்தல் முறைமை ஊடாக ஒவ்வொரு கட்சியினரும் வாக்காளர்களும் பல்வேறு சவால்களையும் பிரச்சினைகளையும் சந்திக்கவேண்டி இருக்கிறது. எனவே, இந்தத் தேர்தல் முறைமை மாற்றப்பட வேண்டும்.

நடந்து முடிந்த உள்ளூராட்சி மன்றத் தேர்தலின் முடிவுகளின்படி, ஆட்சியமைக்கப்பட்டு இருக்கின்ற சபைகள் எல்லாம் அரசாங்கத்துக்குச் சார்பான சபைகளா? அல்லது எதிர்க்கட்சிகளுக்குச் சார்பான சபைகளா? என்று நாங்கள் பார்த்தால், வட மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் அதிகமான சபைகளில் எதிர்க்கட்சியைச் சார்ந்தவர்களே ஆட்சியமைத்து இருக்கின்றார்கள். அந்தச் சபைகள் ஊடாக மக்களுக்கு அபிவிருத்திப் பணிகளைச் செய்வதற்கு நிதி கிடைக்குமா? அரசாங்கத்தின் ஆதரவு கிடைக்குமா? என்ற சந்தேகம் எழுந்துள்ளது. ஏனெனில், தேர்தல் காலத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களும் கௌரவ அமைச்சர் அவர்களும் இவ்வாறான சபைகளுக்கு நிதி வழங்க மாட்டோம் என்றும் இவ்வாறான சபைகளை அமைப்பவர்கள் கள்வர்கள் என்றும் பகிரங்கமாகச் சொல்லியிருந்தார்கள். அப்படியென்றால், ஏன் நீங்கள் இந்த உள்ளூராட்சி மன்றத் தேர்தலை பெருந்தொகைப் பணத்தைச் செலவழித்து நடத்தினீர்கள்? எனக் கேட்கின்றேன். பெருந்தொகைப் பணத்தைச் செலவுசெய்து இந்தத் தேர்தலை நடத்தியிருக்கின்ற

நிலையில், அந்தச் சபைகள் ஊடாக மக்களுக்கு நன்மை கிடைக்கச் செய்யாமல் இருந்தால், நாட்டு மக்களுடைய அவ்வளவு பணமும் வீண்விரயமாகும் என்றே நான் நினைக்கின்றேன்.

உள்ளூராட்சி மன்றங்களின்கீழ் அரசுக்குச் சொந்தமான நிறைய வளங்கள் இருக்கின்றன. அவற்றை நாங்கள் அந்தந்தப் பிரதேசங்களிலுள்ள மக்களின் வாழ்வாதாரத்தை வளப்படுத்துவதற்குப் பயன்படுத்த வேண்டும். எனவே, நீங்கள் இந்த விடயத்தை மீளாய்வு செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். மேலும், நாங்கள் உள்ளூராட்சிச் சபைகளுடைய தேவைகளைக் கருத்திற்கொள்ள வேண்டும். அந்தந்தப் பிரதேச மக்களுடைய வாழ்க்கைக்கு முன்னுரிமை அளிக்க வேண்டும். பாதைகள், பாலர் பாடசாலைகள், மலசலகூட வசதிகள் போன்றவற்றை அமைத்துக் கொடுக்க வேண்டும். விசேடமாக, யுத்தத்தால் அழிவுற்ற வடக்கு, கிழக்கு மாகாணங்களில் அவற்றை அமைத்துக் கொடுக்க வேண்டும்.

உதாரணத்துக்கு, ஒரு பாடசாலையில் 100 மாணவர்கள் பரீட்சைக்குத் தோற்றுகின்றார்கள் என்று வைத்துக் கொள்வோம். அதில் 60 மாணவர்களே சித்தியடைகின்றார்கள். இந்நிலையில், சித்தியடைந்த 60 மாணவர்கள்தான் தன்னுடைய பாடசாலை மாணவர்கள் என்றும் சித்தியடையாத 40 மாணவர்களும் தன்னுடைய பாடசாலை மாணவர்கள் அல்ல என்றும் அந்தப் பாடசாலையின் அதிபர் கூற முடியாது. இதுபோன்றுதான் எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் கௌரவ அமைச்சர்களுக்கும் பொறுப்பு இருக்கின்றது. ஏனெனில், நீங்கள் எல்லோரும் இந்த நாட்டு மக்களால் தெரிவு செய்யப்பட்டவர்கள். எனவே, நீங்கள் எல்லோரும் இந்த நாட்டு மக்களுக்குப் பொறுப்புக் கூறவேண்டியவர்கள் என்பதை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். எல்லா சபைகளிலுமுள்ள உறுப்பினர்களை நாங்கள் கள்வர்களாகவும் கயவர்களாகவும் நோக்க முடியாது. நடந்து முடிந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் ஊடாக நல்லவர்களும் படித்தவர்களும் பண்புள்ளவர்களும் அதிகாரத்துக்கு வந்திருக்கிறார்கள். அவர்களுக்குச் சந்தர்ப்பத்தை வழங்கி, அந்தந்தப் பிரதேசங்களை அபிவிருத்தி செய்யவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

2008, 2009ஆம் ஆண்டு காலப்பகுதியில் கோப்பாய் ஆசிரியர் கலாசாலை, அட்டாளைச்சேனை ஆசிரியர் கலாசாலை, மட்டக்களப்பு ஆசிரியர் கலாசாலை, கொட்டகலை ஆசிரியர் கலாசாலையில் பயிற்சியை முடித்த 1,000க்கும் அதிகமான ஆசிரியர்களுக்கு இன்னும் அதற்கான மூலச் சான்றிதழ்கள் வழங்கப்படவில்லை. அவர்கள் பயிற்சிபெற்று 15 வருடங்களாகின்றன. இதனால் இந்த ஆசிரியர்கள் பதவி உயர்வு மற்றும் சம்பள உயர்வைப் பெறமுடியாது இருப்பதுடன், ISA போன்ற பதவிகளுக்கான நேர்முகப் பரீட்சைக்குத் தோற்ற முடியாமலும் இருக்கின்றார்கள். நான் இதனை கௌரவ கல்வி அமைச்சரின் கவனத்துக்குக் கொண்டு வருகின்றேன்.

அடுத்து, மன்னார் மாவட்டத்திலுள்ள உப்பளம் பற்றி சொல்ல வேண்டும். நாட்டில் உப்புக்குத் தட்டுப்பாடு நிலவுகின்ற இந்தக் காலத்தில், மிகப் பழைமை வாய்ந்த அந்த உப்பளத்தை அபிவிருத்தி செய்யவேண்டிய தேவை இருக்கின்றது. அண்மையில் கௌரவ அமைச்சர் அவர்கள் ஆனையிறவு உப்பளத்தைத் திறந்து வைத்தார். அதற்கு நாங்கள் அவருக்கு நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றோம். நவீன முறைகளைப் பயன்படுத்தி மன்னாரிலுள்ள உப்பளத்தை அபிவிருத்தி செய்து, அதன்மூலம் எமது நாட்டுக்கு வருமானத்தை ஈட்டக்கூடிய வகையில் நடவடிக்கைகளை எடுக்க வேண்டுமென அன்பாகவேண்டி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සුනිල් රත්නසිරි මහතා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ ගෙනෙන නියමයන් පිළිබඳව මෙම උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා අදහස් දක්වන මේ අවස්ථාවේ විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ පනතත් සමඟ අපි ලෝකයේ රටවල් 53ක අධිකරණවලින් ගනු ලබන තීන්දු තීරණ අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීමට බැඳෙන බව. ඒ අනුව අපි ඕස්ට්‍රේලියාව, කැනඩාව ඇතුළුව ලෝකයේ විවිධ රටවල ඒ නීති රීති, අණ පනත් අපේ රටේ යම් යම් කාරණා සම්බන්ධයෙන් අනුගත කර ගැනීමේ හැකියාව අත්පත් කර ගත් රාජ්‍යයක් බවට පරිවර්තනය වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විදේශීය රටවල නඩු තීන්දු සම්බන්ධයෙන් කථා කිරීමට වාගේම, මම මේ මොහොත අවස්ථාවක් කර ගන්නවා, අපේ රටේ නීති පද්ධතිය 2024 සැප්තැම්බර් මාසයේ 21වැනි දාට පෙරාතුව කවර තත්ත්වයකද තිබුණේ කියන එක මතක් කරන්නටත්. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ නීතිය දීර්ඝ කාලයක් මුළුල්ලේ එක් එක් පාර්ශ්වවලට අවශ්‍ය පරිදි ඒ ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වෙමින් තිබුණු බව. ඒ සම්බන්ධයෙන් අපේ රටේ දුක් විඳින ජනතාවගෙන් විශාල චෝදනාවක් තිබුණා. මොකද, කුඩා වරදක් කළ කෙනාට, කන්න දෙයක් නැති නිසා කොස් ගෙඩියක් කඩා ගත්ත මනුස්සයෙකුට, පොල් ගෙඩියක් කඩා ගත්ත මනුස්සයෙකුට, පාන් ගෙඩියක් හොරකම් කළ මනුස්සයෙකුට නීතියේ දණ්ඩනය උපරිමයෙන් ක්‍රියාත්මක වුණා. හැබැයි, රටේ ජනතාවගේ ධනය කෝටි ප්‍රකෝටි ගණන්වලින් හොරකම් කරපු හොර තක්කඩි නිදොස් කොට නිදහස් වෙන තත්ත්වයක් දක්නට ලැබුණා.

මට මතකයි, අපේ ගරු ජනාධිපතිතුමා විපක්ෂයේ සිටි කාලයේ මේ උත්තරීතර සභාවේදී කිව්වා, නඩුව කාගේද කියා දන්නවා නම් තීන්දුව මොකක්ද කියලා කියන්න පුළුවන් තැනට අපේ රටේ අධිකරණ පද්ධතියේ බිඳ වැටීමක් තිබෙනවා කියලා. ඒ නඩුව රාජපක්ෂවරුන්ගේ නම්, ඒ නඩුව වික්‍රමසිංහලාගේ නම්, ඒ නඩුව ප්‍රේමදාසලාගේ නම් නිදොස් කොට නිදහස් කරන තත්ත්වයක් තිබුණා. ඒ නිසා අපේ රටේ නීති පද්ධතිය බිඳ වැටීමට ලක් වුණා. හැබැයි, ඒ බිඳ වැටීමට ලක් වුණේ අධිකරණ පද්ධතියේ තිබුණු දෝෂ තත්ත්වය නිසා නොවෙයි. ඒ නඩු ගොනු කරනකොට, එක්කෝ දුර්වල සාක්ෂි සහිතව, එක්කෝ තාක්ෂණික දෝෂ සහිතව ගොනු කිරීම නිසා බොහොමයක් වංචනිකයන් එම නඩු තීන්දුවලදී නිදොස් කොට නිදහස් වුණු තත්ත්වයක් ඇති වුණා.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

විශේෂයෙන්ම පසුගිය කාලයේ, - අපි බලයට එන්න පෙරාතුව- බොහෝ අවස්ථාවල අපි දැක්කා, විවිධ දූෂිත දේශපාලනඥයන් රක්ෂිත බන්ධනාගාරගත කරනකොට ඔවුන් මාංචු දාපු අත් දෙක උස්සලා අර ඉන්දියානු නිදහස් සටනනට උර දීපු, කර දීපු වීරයෝ වාගේ තමයි කැ ගහගෙන බන්ධනාගාරය තුළට ගියේ කියන එක. ඇයි? ඒගොල්ලන් දන්නවා, බන්ධනාගාරය ඇතුළේ දවසයි දෙකයි, උපරිම සති දෙකයි; ඊට පස්සේ නිරුපද්‍රිතව වීරයෝ වාගේ එන්න පුළුවන් කියලා. නමුත් අද තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අද කවුරුවත් අත් දෙකට දාපු මාංචු සහිතව කැ කෝ ගහගෙන අධිකරණ පද්ධතිය තුළ බන්ධනාගාරගත වෙන්නේ නැහැ. අද සෑම පුරවැසියෙකුම නීතියට බය වෙලා තිබෙනවා. වෙනදා බන්ධනාගාරය ඇතුළේ ඒගොල්ලන්ගේ ගීත, ඒගොල්ලන්ගේ බයිලා, ඒගොල්ලන්ගේ බජව්ව ඇහුණා. හැබැයි, අද නීතිය ක්‍රියාත්මක වෙනකොට අන්න බන්ධනාගාර ඇතුළේ කෙඳිරිල්ල, ඇඬිල්ල පටන් ගෙන තිබෙනවා. මේ කෙටි කාලය තුළ ජාතික ජන බලවේගය ආණ්ඩුවට අපේ රට නීතිය ක්‍රියාත්මක වන රාජ්‍යයක් බවට පරිවර්තනය කර ගන්න හැකියාව ලැබුණා.

පසුගිය කාලයේ පැවැති පළාත් පාලන මැතිවරණයත් එක්ක, අර පෙර පැවති කළු රාජ්‍යය නැවත අපේ රටේ ස්ථාපිත කර ගන්නට විපක්ෂය නැවත උත්සාහ කරමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි දැක්කා, 2024 සැප්තැම්බර් මාසයේ 21වෙනි දා වෙනතුරු අපේ රටේ ජනාධිපති වෙයි කියලා හීන දැක්කේ සජිත් ප්‍රේමදාස මහත්තයා බව. හැබැයි, 22වෙනි දාට එළිවෙනකොට එතුමාගේ ඒ හීනය බොඳ වෙලා තිබුණා. ඊට පස්සේ 2024 නොවැම්බර් මාසයේ 14වෙනි දා වෙනතුරු ඒගොල්ලන් හිතාගෙන හිටියා, විශාල සංඛ්‍යාවකින් ශක්තිමත්ම විපක්ෂය හදනවා, මන්ත්‍රීවරුන්ගෙන් මේ පාර්ලිමේන්තුව පුරවනවා කියලා. හැබැයි, නොවැම්බර් මාසයේ 15වෙනි දා වෙනකොට ඒ හීනයත් කඩාගෙන වැටුණා. ඒ අවස්ථා දෙකේදීම ඒගොල්ලන්ගේ තර්කයක් තිබුණා, අපි එකතු වෙලා ආවා නම්, ජනාධිපතිවරණයත් අපි දිනනවා; මහ මැතිවරණයත් අපි දිනනවා කියලා. මැයි මාසයේ 06වෙනි දා අපි පළාත් පාලන මැතිවරණය පැවැත්වූවා. අපි ඒගොල්ලන්ට කිව්වා, ඔයගොල්ලෝ තනි තනිව බැරි නම්, එකතු වෙලා ඇවිල්ලා අපිව පරාජය කරන්න කියලා. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට තනි පක්ෂයකට ලැබුණු වැඩිම පළාත් පාලන ආයතන සංඛ්‍යාව, එනම් පළාත් පාලන ආයතන 340කින් 267ක් ජාතික ජන බලවේගයට ලබා දෙන්නට මේ රටේ ජනතාව තීන්දු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒකෙන් 152ක් සම්පූර්ණ බහුතර අතිවිශාල සාතිශය බලයක් සහිතව ජනතාව අපට භාර දෙනවා. තවත් 115ක් තිබුණා, අපට වැඩි බලයක් සහිත ස්ථාන. විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාව ගත්තොත්, එතැන ලොකු යුද්ධයක් කළා වාගේම අපටත් තිබුණා, ගම් ඇතුළේ ලොකු යුද්ධයක් කරන්න. මොකද, එදාම තමයි වැලිකන්ද ප්‍රාදේශීය සභාව පිහිටුවනු ලැබුවේ. වැලිකන්ද ප්‍රාදේශීය සභාව පසුගිය 16වෙනි දා පිහිටුවන්නට තිබුණා. ඉතින් 15වෙනි දා රාත්‍රියේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයා පළාත් පාලන ආයතන නියෝජනය කරපු විපක්ෂයේ මන්ත්‍රීවරු ඔක්කෝම අරගෙන ගියා, වැලිකන්දේ තිබෙන හෝටලයකට. හෝටලයට අරගෙන ගිහිල්ලා රාත්‍රියේ කන්න බොන්න දීලා දැඩි ආරක්ෂාවක් සහිතව රැකවල් දාගෙන හිටියා. ඊට පස්සේ උදේ පාන්දර ලැහැස්ති කරගෙන වෑන් එකක දාගෙන වැලිකන්ද ප්‍රාදේශීය සභාවට ඔක්කෝම ටික අරගෙන ආවා. අරන් ඇවිල්ලා, කිසි කෙනෙකුට කථා කරන්න දෙන්නේ නැතුව සභාව ඇතුළට රිංගෙව්වා. ඔන්න, විපක්ෂය කථා කරන ප්‍රජාතන්ත්‍රවාදය. හැබැයි, අපි ඉතාම ආදරණීයව සෙනෙහසින් කිව්වා, හෘදය සාක්ෂියට එකඟව, රහසිගතව ඔයගොල්ලන් ඡන්දය දෙන්න කියලා. රහසිගතව ඡන්දය දෙන්න කියලා. රහසිගතව දෙන්නේ නැතුව විවෘතව ඡන්දය දුන්නා නම්, මේ විපක්ෂය තමයි ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම තියන්නේ. ඡන්දය විවෘත වුණා නම්, වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ අපි වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරපු; අපේ සභාපතිවරයා පත් කර ගන්න ඡන්දය ප්‍රකාශ කරපු ඒ මන්ත්‍රීවරුන්ට මේගොල්ලන් පන්න පන්න ගහනවා කියලා අපි දන්නවා. අත පය කඩාවි. මිනී මරපු ඉතිහාසයක් විපක්ෂයට තිබෙන්නේ. ඒ නිසා මේ පළාත් පාලන ආයතනවල අපි වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරන්න සිටි විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට හදවතේ බයක් තිබුණා; භීතියක් තිබුණා, මේ සාහසික විපක්ෂය තමන්ට මොන වාගේ දෙයක් අත්පත් කරයි ද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසා තමයි තමන්ගේ කැමැත්ත ස්වාධීනව ප්‍රකාශ කරන්න රහස් ඡන්දයක් දෙන්න කියලා අපි ඉල්ලුවේ.

දැන් මොකක්ද වෙන්නේ? අද පළාත් පාලන ආයතන විශාල ගණනක් ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ගෙන් පිරෙද්දී ඒගොල්ලන් කියනවා, මේකම තමයි රාජපක්ෂලාත් කළේ කියලා. රාජපක්ෂලා ගිය අඩිපාරේ තමයි අපිත් යන්නේ කියලා ඒගොල්ලන් කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රාජපක්ෂලාගේ අවසාන පුරුක තමයි ගෝඨාභය රාජපක්ෂ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා සහ අනුර කුමාර දිසානායක ගරු ජනාධිපතිතුමා අතර වෙනස මේ විපක්ෂයට අපි කියලා දෙන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ඇවිල්ලා මුලින්ම කරපු දේ තමයි තමන්ටත්, තමන්ගේ සනුහරේ අයටත් ඒ වෙනකොට දාලා තිබුණු නඩුවලින් නිදහස් වෙන්න කටයුතු කරපු එක. හැබැයි, අපේ පක්ෂයේ නායකයා මේ උත්තරීතර සභාව දශක දෙකහමාරකට ආසන්න කාලයක් නියෝජනය කරලා සමථ මණ්ඩලයකවත් අයින් කර ගන්න නඩුවක් තිබුණේ නැහැ කියන එක අපි බොහොම ආඩම්බරයෙන් කියනවා. ගෝඨාභය මහත්මයා එනකොට කිව්වා, "මහින්ද වාගේ නොවෙයි, ගෝඨා. ගෝඨා පවුලට සලකන්නේ නැහැ; ගෝඨා හරි කෙළින් මිනිහා" කියලා. හැබැයි, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වෙද්දි අගමැති වුණේ මහින්ද රාජපක්ෂ; මුදල් ඇමති බැසිල් රාජපක්ෂ; ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂ; වාරිමාර්ග ඇමති චමල් රාජපක්ෂ; නියෝජ්‍ය ඇමති ශෂීන්ද්‍ර රාජපක්ෂ. ඔන්න, ඒ අය පවුලට සලකපු විදිය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා තමන්ගේ සනුහරේ ගැව්ව්ච කෙනෙකුටවත් කිසිදු වරදානයක්, නිල නාමයක් දීලා නැහැ. එහෙම තිබෙනවා නම් පෙන්වන්න කියලා අපි අදත් අභියෝග කරනවා. ඒ ආදර්ශය අපිත් අරන් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ මන්ත්‍රීවරු 159දෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපේ කියලා කෙනෙකුට රියැදුරු හෝ කිසිම තනතුරක් දීලා නැහැ; අපේ සනුහරේ ගැව්ව්ච කෙනෙකුට අපි කිසිම දෙයක් දීලා නැහැ. අපි මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට අභියෝග කරනවා, පුළුවන් නම් තමන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ ලේඛනය මේ සභාවට දෙන්න කියලා. අපි දෙන්නම්, අපේ ලේඛනය. ඒ නිසා දෙවැනියටත් අපේ ගරු ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට වඩා ගව් ගණනක් උඩින් ඉන්නවා කියලා පෙන්නුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට ඇවිල්ලා තුන්වෙනුව කරපු දේ තමයි, එතෙක් තමන්ට බලයට එන්න උදව් කරපු වෞර කල්ලියට විශාල වශයෙන් බදු සහන දීපු එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

හැබැයි, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා බලයට ඇවිල්ලා බදු වංචා කරපු අයට බදු දැල එළලා, ඒගොල්ලන් සිරගත කරන්න අවශ්‍ය, ඒ අයට දඬුවම් කරන්න අවශ්‍ය නීති-රීති අණ පනත් ටික හැදුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. දශකයක් නොවෙයි, තව දශක ගණනාවක් ගියත් මේ රට පාලනය කරන අපි, අපේ ජීවිත කාලයේ දකින එකම දේශපාලන පක්ෂය තමයි ජාතික ජන බලවේගය.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථමයෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[2.56 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I am thankful that I am given the opportunity to speak in relation to the Orders under the Reciprocal Recognition, Registration and Enforcement of Foreign Judgments Act. Prior to this law, there was an Ordinance in the 1920s. With the repeal of that law, this Act came into being and under it, I believe, judgments of 53 countries would be allowed to be enforced here. The Hon. Minister of Justice and National Integration as well as the Hon. Minister of Women and Child Affairs are here in this House at this moment.

We know that with regard to divorce, there is a major problem of recognition of foreign judgments. I think this clears the path with regard to recognition of divorce proceedings in those 53 countries and thereby, the enforcement of foreign judgments.

Sir, I would also like to make an appeal to the Hon. Minister of Justice and National Integration and the Hon. Minister of Women and Child Affairs regarding this.

අද ලංකාවේ දික්කසාදයක් එකඟතාවකින් ගන්න බැහැ. අපි රෝම-ලන්දේසි නීතිය අනුගමනය කරන නිසා, ස්වාමියා, භාර්යාවගේ දෝෂයක් වෙනවා; භාර්යාව, ස්වාමියාගේ දෝෂයක් වෙනවා. ඒ නිසා උසාවියකින් වුණත් දික්කසාදය ගන්න සාක්ෂි මෙහෙයවන්න වෙනවා. අද අනෙකුත් රටවල කැමැත්තෙන් දික්කසාදයක් ගන්න පුළුවන්. ඒ නිසා, මේ රටෙත් ඒ සංශෝධනය ඇති කරලා දෙදෙනාට - ස්වාමියාටයි, බිරිඳටයි - කැමැත්තෙන් දික්කසාදයක් ලැබීමේ වරම ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. අද වනවිට පිට රට ඉන්න හුඟක් උදවිය දික්කසාද නඩු තීන්දු සහ අනෙකුත් නඩු තීන්දු එම රටවලින් ලබා ගත්තත්, ඒවායේ ප්‍රතිලාභ ලබා ගැනීමට ඔවුන්ට නොහැකි වෙලා වෙලා තිබෙනවා.

හැබැයි, with these Orders, I am sure this problem would be solved.

Sir, I would also like to emphasize another very important matter to this House. We have a proud judicial system. Parliament exercises its judicial powers through courts. So, we have a fundamental duty to protect our judges. Recently, the Kaduwela Magistrate was suspended because, unfortunately, there was a sex tape about her. That is not only an indictment against her, but against the system because it was a false and malicious statement. At various times, you could also see judges being attacked on social media. So, I appeal to the Hon. Minister of Justice to form a Select Committee and also this Government to take steps against persons who attack judges on social media. Unfortunately, today, such attacks against persons and judges take place not only in our jurisdiction, but also outside our jurisdiction. Therefore, if we are going to protect the integrity of our judicial system, we have to protect our judges from those malicious slander and defamatory statements.

In addition, Sir, there is another issue with regard to the Contempt of a Court, Tribunal or Institution Act in our country. We saw that a lawyer was locked up recently and the Bar Association of Sri Lanka had to intervene and seek his release. We also saw that a person was locked up because his phone rang in the court, which resulted in his death. The Bar Association of Sri Lanka has also expressed their concerns with regard to that. The lawyers too, in certain instances, find the Contempt of a Court, Tribunal or Institution Act an intimidation on the system; it intimidates them. Therefore, I appeal to this Government to revisit the Contempt of a Court, Tribunal or Institution Act and also to look at the report the Bar Association of Sri Lanka is preparing now. If you look at it, you would see that there are various reforms needed to the Act.

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

Sir, if you take our judicial system, there are only three career Judges in the Supreme Court today. So, we need to look at things differently and I believe that the NPP Government pledged to this country to look at things differently, that they will look at these issues in a holistic manner and at the concerns expressed by all quarters, in a positive manner.

In addition, Sir, our life expectancy is 75 years today.

Therefore, if you take our Judiciary, we need to increase the retirement age of the Judges of the Supreme Court and the Court of Appeal and also of the employees of the Public Service because when they are in their 60s, they are in their prime and it is sad to take them out of the system, which prevents them from contributing more towards the judicial system of this country. Therefore, we have to look at things differently.

Then, the question of law's delays. The law's delays in this country have been an issue for a long period of time. And, I, as a practising lawyer, would say that infrastructure - buildings and facilities - is not the only issue, but, today, clerical staff, stenographers, computers, photocopies, all these have also become an issue. Therefore, if we are to improve and have an expeditious justice system, we need to improve the facilities in the judicial system. At the moment, if you take courts, there is a greater shortage in staff required. Therefore, I would appeal to the Minister of Justice and National Integration to look at this matter and address it expeditiously.

Sir, we have a lot of laws to protect women in this country. Unfortunately, in Sri Lanka, domestic violence is on the rise. So, I appeal to the Minister, who is here, to educate the police and have a mechanism with regard to domestic violence.

There is another fundamental issue which I would like to bring to the notice of the House. The law of Sri Lanka is based on the presumption of innocence; until you are convicted, you are presumed innocent. අද අපේ බන්ධනාගාර දිහා බලනකොට, වැසිකිළි කැසිකිළි පහසුකම්වල අඩුවක් තිබෙනවා. The ratio of toilets to our prisoners is low. Also, they do not have the liberty of having a pillow and a mat. Especially, at remand prisoners, the prison officials should look as persons against whom investigations are pending. Also, those officials should be taught that the presumption of innocence is operated in favour of the prisoners and therefore, they should not be treated as convicts.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.05]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් විශේෂ කාරණයක් කියන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ විදෙස් නඩු තීන්දුවලට අදාළ නියමයන් දීර්ඝ කාලයක් තිස්සේ අපෙන් ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඉල්ලා සිටි දෙයක්. අද ඒක අධිකරණ අමාත්‍යාංශය මඟින් නිවැරැදි කරනවා. ඇත්තටම මේ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද නියමයන් අද අනුමත කළාට පස්සේ, විදෙස් නඩු තීන්දු නීත්‍යනුකූල කර ගැනීමට අදාළ කාරණාව සම්පූර්ණ වෙනවා. මම හිතන විධියට, සැලකිය යුතු ප්‍රජාවක් මේ සම්බන්ධව අපෙන් ඉල්ලීම් කළා, ඒ ඉල්ලීම් අද සනිටුහන් වෙනවා, ස්ථිර වෙනවා. ඒක තමයි මූලිකව මට කියන්න තිබෙන්නේ.

ඊළඟට, මේ අවස්ථාවේ තවත් කාරණයක් කියන්න තිබෙනවා. විපක්ෂය මේ විදෙස් නඩු තීන්දු ගැන කථා කරනවා වෙනුවට, පැවති පළාත් පාලන මැතිවරණයත්, ඒ වාගේම සියයට 50 සම්පූර්ණ කිරීමට නොහැකි වූ පළාත් පාලන ආයතනවල මේ දවස්වල ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳවත් විශාල කතිකාවක් කරනවා. ඒ කතිකාව තීව්‍ර වුණේම කොළඹ මහ නගර සභාව සම්බන්ධයෙන්. තමන්ගේ මතය පරාජයට පත් වුණාට පස්සේ ඒ තීන්දු තීරණ ගත් රාජ්‍ය නිලධාරිනිය වන පළාත් පාලන කොමසාරිස්වරියට ඇති තරම් පහර ගහන්න පටන් අරගෙන තිබෙනවා. දැන් ඒක අනෙකුත් රාජ්‍ය සේවයටත් කාන්දු කරන්න යනවා, දැන් බලන්නකෝ, අපි දැන් නඩු දමන්න යනවා, ඔබතුමන්ලා මාර භයකින් ඉන්න ඕනෑය කියලා. මොකක්ද මේ කථාව? මේ අවස්ථාවේදී මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට වාගේම විපක්ෂයටම යමක් කියන්න මා කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and HON. DEPUTY SPEAKER took the Chair.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැලකිය යුතු මට්ටමකට තමන්ගේ මතය පරාජයට පත් වුණාට පස්සේ, ඒ පරාජය හමුවේ වියරු වැටිලා, රාජ්‍ය නිලධාරිනියකගේ වැරැද්දක් කිය කියා විපක්ෂය දැන් මේ පාර්ලිමේන්තුව දෙවනත් කරන්න පටන් ගෙන තිබෙනවා. දැන් මෙතැනදී මතක් කර ගන්නවා, නයි-මුගටි, ඊට පස්සේ සමාජවාදයද, ධනවාදයද වැනි දේවල්. මේ වාගේ විවිධ කථා මේ ගරු සභාවේ පවත්වමින්, එම රාජ්‍ය නිලධාරිනිය ගත් තීරණය වැරදි බව කියන්න මෙතුමන්ලා උත්සාහයක් ගන්නවා. මම අහන්නේ, සරල ප්‍රශ්නයයි.

ඊයේ "දෙරණ" රූපවාහිනී නාලිකාවේ "වාද පිටිය" වැඩසටහනට අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ආවා. ඒ ආපු වෙලාවේ ගත් stand එකම තමයි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මෙතැනදී පිටපතක් විධියට කියෙව්වේ. අපි එක දෙයක් අහනවා. මෙතුමන්ලා එල්ලෙන්නේ මේ රෙගුලාසි මාලාවේ නේ. රාජ්‍ය නිලධාරිනිය කියන්නේ පනත ගැන, මෙතුමන්ලා කියන්නේ රෙගුලාසි මාලාව ගැන. පෙන්වා-පෙන්වා කියනවා, රෙගුලාසිවලට විරුද්ධව කටයුතු කළා කියලා. විපක්ෂයට මේ විවාදයට තව කාල වේලාව තිබෙනවා. අපි එක දෙයක් අභියෝගාත්මකව අහනවා. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 48 වගන්තියේ 66ඇ. (6) මඟින් මොකක්ද කියන්නේ? එහි කියනවා, විවෘත හෝ රහස් ඡන්දයක් පැවැත්වීම පිළිබඳව. ඒකම රෙගුලාසිගත කරලා එවලා තිබෙන එකක් තමයි දැන් ඔය පෙන්වන්නේ. ඔය රෙගුලාසි මාලාව ඇතුළේ කොහේ හරි තැනක තිබෙනවාද කියලා මට පෙන්වන්න, පූර්ව පවත්වන ඡන්දය විවෘතව ගන්න ඕනෑය කියලා. "විවෘත" කියන වචනය රෙගුලාසි මාලාවේ තිබෙනවාද කියලා පෙන්වන්න. මේක අභියෝගයක්. විපක්ෂය ඒ අභියෝගය භාර ගන්නවාද? "විවෘත" කියන වචනය එහි සඳහන්ව තිබෙනවාද? ඇත්තවශයෙන්ම පනතේ තිබෙන තත්ත්වය තමයි, නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා පත් කිරීම සඳහා විවෘත හෝ රහස් ඡන්දයක් විමසන්න ඕනෑය කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් අවස්ථාව පනතේ විස්තර කරලා නැහැ. පනතේ විස්තර කරලා නැති සෑම අවස්ථාවකම, අදාළ නිලධාරියාට ඒකේ අභිමතය යනවා.

ඒ නිලධාරියා ගත්ත තීරණය පිළිබඳව තමයි දැන් මේ අභියෝගාත්මක කාරණය තිබෙන්නේ. දැන් කොළඹ මහ නගර සභාව නේ පාදක කර ගන්නේ. අභියෝගය cancel වෙනවා නේ. මොකක්ද අභියෝගය? අභියෝගය cancel වෙනවා. සජිත් ප්‍රේමදාස මහත්මයාගේම පක්ෂයේ කෙනෙක් කැමති වෙලා රහස්‍ය ඡන්දයට ගියා. ඉතින්, කොහොමද නීතිමය ක්‍රියාමාර්ග ගන්නේ? එහෙම කළේ කැමැත්තෙන් නේ. ඒක නේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. අජිත් පී. පෙරේරා මහත්මයා නම් කියන්නේ එතැනදී නම් අඬගහන්න ඕනෑය කියලා. ඉතින්, නම් අඬගැහුවා නේ. කොළඹ මහ නගර සභාවේ රහස්‍ය ඡන්දය විමසූ අවස්ථාවේදී 117දෙනාගේම නම් අඬ ගහලා ඡන්දය ලකුණු කරන්න කිව්වා. ඡන්දය ගණන් කරනකොට තමයි දැක්කේ 62ක ලේඛනය 54 වෙලා, අපේ ලේඛනය 61 වෙලා කියලා. එතකොට මේ අයට කේන්ති ගියා. කේන්ති ගිහින් මේ ගරු සභාවට ඇවිල්ලා කථානායකතුමාට බැණ වැදුණා. පාර්ලිමේන්තු රැස්වීම් දවසක් වර්ජනය කළා. දවසක් වර්ජනය කරමින් ඉඳලා ඊට පසුව දා face කරන්න පුළුවන් වෙයි කියා හිතලා මේ ගරු සභාවට ආවා. අනේ! මෙතැනට ඇවිත් වාඩි වෙනකොට කොළොන්නාව නගර සභාව ගහලා ගිහිල්ලා. කවුද ඡන්දය දීලා තිබෙන්නේ? සමගි ජන බලවේගයේම කෙනෙක්. ඊට පසුව කියනවා, "නයි-මුගටි", "නයි-මුගටි" කියලා. මාර වැඩක් නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ව හරියට බලා ගන්න බැරි වුණාම වාගේම සමහර දෙමව්පියන් කරන වැරැදි වැඩ නිසාත් දරුවෝ දෙමව්පියන් දාලා යනවා. ඒකට කරන්න දෙයක් නැහැ. තමන්ගේ යහපත තකා සමහර අවස්ථාවලදී එවැනි තීන්දු තීරණ ගන්න වෙනවා. මේවා තාත්තලා, අම්මලා කරන වැරැදි. තමන්ගේ දරුවන්ව බලා ගන්න අසමත් වෙනකොට, තමන්ගේ මන්ත්‍රීවරයාව බලා ගන්න බැරි වෙනකොට ඒ අය දාලා යනවා. ඒකට කරන්න දෙයක් නැහැ. කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරු එහෙම දාලා ගියේ ඇයි? නගරාධිපති අපේක්ෂකයාට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිල්ලක් තිබෙන නිසා. ඉතින්, හෘදය සාක්ෂියට එකඟව ඇතැම් මන්ත්‍රීවරුන්ට ඔහුට ඡන්දය දෙන්න බැහැ. අපට විවෘතවමත් ඔවුන් කිව්වා, දූෂිතයෙක් නගරාධිපති කරන්න අපට කිසිසේත්ම හැකියාවක් නැහැ කියලා. දැන් කොළොන්නාව නගර සභාවේ මොකද වෙලා තිබෙන්නේ? වැඩිම ඡන්ද ගත්ත අපේක්ෂකයා නගරාධිපතිකම ඉල්ලුවාම ඔහුව පැත්තකට දාලා ලැයිස්තුවෙන් ආපු කෙනෙකුට දීලා. මම දැක්කා, ඒ මන්ත්‍රීවරයා ඒ සම්බන්ධයෙන් අදහස් පළ කරලා තිබෙනවා. ඔහු කියන්නේ මොකක්ද? "මමයි සුදුස්සා. මේ පක්ෂයේ සුදුස්සාට සුදුසු තැන නැහැ. ඒ නිසා හෘදය සාක්ෂියක් තිබෙන කෙනෙක් ළඟට යන්න තීරණය කරනවා" කියලා ඔහු කිව්වා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව තමයි ඔහු ජාතික ජන බලවේගයට සහයෝගය පළ කරලා තිබෙන්නේ.

ඒකට "නයි-මුගටි" කියලා විවිධ කථා කියනවා. කොළඹ මහ නගර සභාවේ රැල්ල ආරංචි විධියට අද කොළොන්නාවට ගිහිල්ලා තිබෙනවා; නුවරඑළිය නගර සභාවත් ජයග්‍රහණය කරලා තිබෙනවා. ඊට පස්සේ කොහේටද, අර toss එක දැම්මේ? Toss එක දාලා තිබෙනවා, දෙහිඕවිටයි, මැදගමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අනිවාර්යයෙන්ම තර්කයක් අරගෙන එයි, "මාර ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ, දෙහිඕවිටයි, මැදගමයි toss එක දාපු රුපියලේ කාසියේ ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ජාතික ජන බලවේගය පැත්තට මේක කැරකිලා තිබෙන්නේ. දාපු-දාපු හැම toss එකම අපට ආවා. ජාතික ජන බලවේගය කියන්නේ, වාසනාවන්ත දේශපාලන ව්‍යාපාරයක්. අයුක්තියට, අසාධාරණයට එරෙහිව සටන් කරනකොට ඒ ව්‍යාපාරය වටා ස්වභාව ධර්මයත් එකතු වෙනවා. රුපියලේ කාසියත් උඩ දැම්මාට පස්සේ කැරකෙන්නේ අපේ පැත්තට. ඒ නිසා දැන් රුපියලට තළන්න හදන්න එපා. තේරුණාද? අපි දැක්කා, මේ සභා ගර්භයේ ඇති වුණු කථා re-repeat යනවා.

දැන් ඒගොල්ලන් ඇති තරම් කියලා ඉවරයි, රහස්‍ය ඡන්දය, විවෘත ඡන්දය සම්බන්ධයෙන්. ඒ රාජ්‍ය සේවකයා ඉස්කෝලේ ගියේ කොහේද, ඒ කොමසාරිස්වරිය ඉස්කෝලේ ගියේ කොහේද කියලා හොයනවා; "එතුමියගේ profile එකේ ලියවිලා තිබෙන දේවල් අපි දන්නවා" කියනවා. ඒ වාගේ දේවල් හොයන්න ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමියම ගිහිල්ලා තමයි බොහොම පැහැදිලිව කොළොන්නාව නගර සභාවේ ඡන්දය පැවැත්වුවේ. මොකක්ද සිද්ධ වුණේ? බොහොම ප්‍රජාතන්ත්‍රවාදී විධියට එතුමිය ඊට අදාළ මැදිහත් වීම සිදු කළා; ඒගොල්ලන් සභා ගර්භයෙන් නැඟිටලා ගියා; හෘදය සාක්ෂියට වග කියන කෙනා රැඳී සිටියා; ඡන්දය ඉවරයි; ජාතික ජන බලවේගය දිනුවා. එතකොට ඒකට වග කියන්න ඕනෑද, කොමසාරිස්වරිය? කොමසාරිස්වරිය කරන්නේ, ව්‍යවස්ථාපිත කාර්යය; නීතියේ තිබෙන එක; පනතේ තථ්‍යය. පනත සක්‍රිය කරන්න හදනකොට ඒ නිලධාරියාට තළන්න හදනවා නම්, මොකක්ද ඒකේ තිබෙන තත්ත්වය? ඒ නිසා මම විශේෂයෙන්ම කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ ව්‍යවස්ථාපිත කාර්යය කරන්න කිසිදු රාජ්‍ය සේවකයෙක් භය වෙන්න එපා කියන එකයි. කිසිදු රාජ්‍ය සේවකයෙක් ඒ වෙනුවෙන් භය වෙන්න එපා. අපි රජයක් විධියට රාජ්‍ය සේවය ආරක්ෂා කරනවා; ආරක්ෂා කරන්න ඕනෑ. මොකද, විපක්ෂය දැන් මත වපුරවන්නේ, "ඒගොල්ලන්ට දෙන්නම්කෝ වැඩේ" කියලා. ඊළඟ වතාවේ නොවෙයි, තව අවුරුදු 10කින් හෝ මේ රජය පෙරළෙනවා, පෙරළුණාට පස්සේ කොමසාරිස්වරියට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවාය කියනවා. අනේ පව්! හීන දකින්න පුළුවන්. හැබැයි, ඒ කථාව ඇතුළේම terms දෙකක් අපට දීලා තිබෙනවා. Terms දෙකක් නොවෙයි, සිහින දැක-දැක ඉන්න. ඔබතුමන්ලාට පුළුවන්කමක් නැහැ, අපට වඩා හොඳ වෙන්න. ඒ නිසා ජන වරම ඇතුළේ තිබෙන්නේ මොකක්ද? ජන වරම කියන්නේ, දූෂිතයන්ට දඬුවම් කරන්න කියලා. දැන් ආයතන ස්වාධීන වෙලා, සක්‍රිය වෙලා වැඩේ පටන් අරගෙන යනකොට මොකක්ද වෙන්නේ? දූෂිතයෝ බියට පත් වෙලා දැන් කෙටි

[ගරු නිතිඥ සුනිල් වටගල මහතා]

කාලීන ක්‍රම මඟින් විසඳුම් හොයන්න හදනවා, අපේ ආණ්ඩුව පෙරළන්න. මාර වැඩේ! ජනාධිපතිවරණයේ ඡන්ද ප්‍රතිශතය මෙච්චරයි, පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද ප්‍රතිශතය මෙච්චරයි, මෙච්චරක් down වෙලා, අච්චරට මෙච්චර නම් මෙච්චරට කොච්චරද කියලා ගණන් හදනවා. සජිත් මහත්මයා කිව්වේ දෙසැම්බර් මාසයේ වාගේ බලය ගන්නවා කියලා නේ. ගණන් හද-හදා ඉන්න. අපි දැන් වැඩේ පටන් අරගෙන තිබෙන්නේ. මේ රට හදන වැඩේ අපි පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා ජාතික ජන බලවේගය එක වතාව නොවෙයි, දෙවතාවක් නොවෙයි, ස්ථාවර ආණ්ඩුවක් බවට පත් වුණාට පස්සේ විපක්ෂයට හුස්ම ගන්නවත් බැරිව යනවා. ඒ නිසා විපක්ෂය "නයි-මුගටි" ආදී වශයෙන් විවිධ කථා කියමින් ඉන්නවා. කොළඹ මහ නගර සභාවේ පැවති රහස්‍ය ඡන්දයේදී ඡන්ද 62, 54 වුණාට පස්සේ මොකක්ද කිව්වේ? "කළු බැටළුවෝ" කිව්වා.

එතකොට, ඒගොල්ලන් කළු බැටළුවෝ. තමන්ට පක්ෂ නොවෙනකොට කළු බැටළුවෝ. ඒ හින්දා විවිධ කථා; සමාජවාදය, ධනවාදය ගැන කියමින් විසිරිච්ච කථා ටිකක් අද කියමින් ඉන්නවා. පරාජයෙන් වියරු වැටිච්ච විපක්ෂය අද කරකියා ගන්න දෙයක් නැතුව නන්නත්තාර වෙලා තමන්ගේ කණ්ඩායම රැකගන්න බැරුව ඉන්නවා. එවැනි තත්ත්වයක් තුළ අපි රාජ්‍ය තන්ත්‍රය, රාජ්‍ය නිලධාරියාව රකින ක්‍රියාමාර්ගය අනිවාර්යයෙන් ගන්නවා. ව්‍යවස්ථාපිත කාර්යය රකින රාජ්‍ය නිලධාරියාව අපි රකිනවා කියලා මේ අවස්ථාවේදී අපි සහතික කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Lakshman Nipuna Arachchi, you have 14 minutes.

[අ.භා. 3.19]

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි සාකච්ඡා කරන්නේ අංක 2429/51 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලැබූ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යටතේ වන නියමයන් ගැනයි. ඊට අදාළව රටවල් 53ක් ඇතුළත් කර ගැනීම සම්බන්ධවත් සාකච්ඡා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සංවර්ධනය පැත්තෙන් බැලුවොත්, කවදා හරි ලෝකයම තනි යායක් බවට පත් වෙන්න ඕනෑ. ඒ නිසා අපට රටක් හැටියට අද රට ඇතුළේ විතරක් නොවෙයි, අනෙකුත් රටවල සම්මත වන සමහර නීති රීති, අණ පනත් -විශේෂයෙන්ම අපි ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා ඉන්න නිසා, ලංකාවේ පුරවැසියන් විදෙස්ගත වෙලා ඉන්න නිසා- අදාළ කර ගන්න වෙනවා. අපේ රටේ සංවර්ධන ස්වභාවය අනුව අපේ අණ පනත් තවමත් ඒ තරමටම ලෝකයට අදාළ නොවුණත්, ලෝකයට අදාළ වෙන අණ පනත්, රෙගුලාසි අපට අදාළ කරගත යුතු වෙනවා. ඒ අනුව තමයි මේ නියමයන් ඇතුළත් ගැසට් එක නිර්මාණය වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදෙස්ගත වෙලා ඉන්න සමහර අය ඉස්සර අපට කථා කරලා අහනවා, "කොහොමද ඉතින්?" කියලා. අපි කියනවා, "හොඳින්" කියලා. හැබැයි, හොඳින් කිව්වාට ඇත්තටම අපි හොඳින් නැහැ. හැබැයි, අපට කථා කරලා කොහොමද කියලා ඇහුවා පස්සේ "අවුල්" කියලා කියන්න බැහැ නේ; "අප්සට්" කියලා කියන්න බැහැ නේ. ඒ නිසා අපි කියනවා හොඳින් කියලා. හැබැයි, අද එහෙම නොවෙයි. අද අපට කථා කරලා ඇහුවොත්, "කොහොමද ඉතින්?" කියලා, අපි කියනවා, "ඉතා හොඳින්" කියලා. ඇයි? අපි හදා ගත්තු, ගොඩ නඟා ගත්තු මේ පාලන ක්‍රමය ඇතුළේ අපට විවෘතව කියන්න හැකියාව තිබෙනවා, "ඉතා හොඳයි" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මෙහෙම නොවෙයි නේ හිතුවේ. අපි පෝය වැඩසටහන් කරනවා; පෙරහැර කරනවා. අපේ ගමේ පෙරහැර කරනවා. ඒ වාගේම අනෙකුත් ආගම්වල අය ඒගොල්ලන්ගේ ආගම්වලට අනුව -මුස්ලිම් ජනතාව මුස්ලිම් ජනතාවට අදාළ සංස්කෘතික කටයුතු කරනවා. කතෝලික ජනතාව ඒ අයට අදාළ සංස්කෘතික කටයුතු කරනවා- හැමෝම ඒ ඒ සංස්කෘතික කටයුතු කරනවා. අපි වෙසක් වැඩසටහන් කළා; පොසොන් වැඩසටහන් කළා. දන්සැල් තිබ්බා. දන්සැල්වලට යනවා. දන්සැල් දෙනවා. දන්සැල් වැහි වැහැලා තිබුණා මේ වතාවේ පොසොන් එකට. පාරේ යන්න බැහැ, හැම තැනම දන්සැල්. මේ තුළින් මොකක්ද කියන්නේ? මේ පාලනයේ ඇති වෙච්ච වෙනසත් එක්ක අද අපේ රටේ පුරවැසියා සංස්කෘතික ජීවිතයක් ගත කරනවා. ඒ සංස්කෘතිය භුක්ති විඳිනවා. ඒ තුළ හැමෝම හොඳින් ඉන්නවා.

අපි උදේට මේ පාර්ලිමේන්තුවට පිවිසෙනකොට පාර්ලිමේන්තු පිවිසුමේ ඉන්න පොලිස් රාළහාමිලා අපට කියනවා, "Good Morning" කියලා. ඉස්සරත් අපට "Good Morning" කිව්වා. අපිත් කියනවා, "Good Morning" කියලා. හැබැයි, Good Morning එකක් නැහැ. ඇත්තම කියනවා නම් නැහැ. සුබ උදෑසනක් නැහැ. දැන් එහෙම නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි එනකොට රාළහාමිලා "Good Morning" කියනවා. අපිත් "Good Morning" කියනවා. දැන් ඇත්තටම, ජීවිතය ඇතුළේ Good Morning එකක් තිබෙනවා. උදේ මෙතැනට ආවාට පස්සේ කිහිප දෙනෙක් -තුන් හතර දෙනෙක්- හින්දා ඔය "Good" එක පොඩ්ඩක් නැති වෙනවා. හැබැයි ඇත්තටම බැලුවොත්, ඒ දේවල්වල, ඒ ආශීර්වාදාත්මක කථාවල හරය අද අපේ ඇත්ත ජීවිත ඇතුළේ තිබෙනවා.

අපි රාජ්‍ය පොසොන් උත්සවය මිහින්තලය පූද බිම කේන්ද්‍ර කරගනිමින් කළා. සමහර අය හිතුවා, ඒක එහෙම වෙන එකක් නැහැ කියලා. හැබැයි අපි ඒක කළා. ඒක තමයි මේ වෙනස. හැබැයි සමහර වෙලාවට විපක්ෂයට ඒ වෙනස දැනිලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම කොළඹ මහ නගර සභාවේ ජයග්‍රහණය ඇතුළේ තිබෙන්නේ මොකක්ද? අද කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ ජීවත්වන සියලු ජනතාවට තමන්ගේ සංස්කෘතික ජීවිතය ගත කරන්න හැකියාව ලැබී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ජීවත් වෙන්නේ කොළඹ. ඔබතුමාත් දන්නවා, කොළඹ ඒ මිනිස්සු හරි කැමැත්තෙන් සංස්කෘතික ජීවිතය ගත කරනවා කියලා. සිංහල අලුත් අවුරුද්දට ආයේ භේදයක් නැහැ, ජාතිකත්ව භේදයක් නැහැ, ආගම් භේදයක් නැහැ, හැමෝම සිංහල අලුත් අවුරුද්ද සමරනවා. ඒ වාගේම මුස්ලිම් ජනතාවගේ ඉස්ලාම් ආගමත් එක්ක බැඳිලා තිබෙන නෝම්බි කාලය ආවාට පස්සේ ඒ උත්සවය සමරන්න සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා භේදයක් නැහැ, කොළඹ නගරයේ ඉන්න මුස්ලිම් ජනතාව අපිට ආරාධනා කරනවා, "නෝම්බි උත්සවයට එන්න, රාත්‍රියට කෑම ටිකක් කාලා යන්න එන්න" කියලා. අපි එනවා.

ඒ වාගේම තමයි නත්තල සැමරීමේදීත්. නත්තල සැමරීමේදී කොළඹ මිනිස්සු ඒ සංස්කෘතික ජීවිතය ගත කරනවා. ඒ මිනිසුන් තුළ ඒ සංස්කෘතික ජීවිතය තිබෙනවා. ඒ එකට එකතු වීම, ඒ ස්වීකරණය තිබෙනවා. හැබැයි, ඒක නැති වෙන්නේ කොතැනදිද?

ඒක නැති වෙන්නේ ඡන්දයත් එක්ක. හැම ඡන්දයකදීම ජාතිවාදීව හැසිරෙන; මේ තිබිච්ච මැතිවරණයත් එක්ක මෙතැන ඇවිල්ලා එක එක ජාතියේ කථා කියපු ඔය කිහිපදෙනා තමයි ඡන්දය ආපු ගමන් අර මිනිස්සුන්ගේ තිබෙන සංස්කෘතික ජීවිතය විනාශ කර දමන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මිනිසුන්ව බෙදනවා, "නුඹලා අයිති අපිට. නුඹලා ඉන්න ඕනෑ අපිත් එක්ක. නුඹලා ඡන්දය දෙන්න ඕනෑ අපිට; අපේ පක්ෂවලට, අපි නියෝජනය කරන්නේ අසවල් පක්ෂය. අපි නියෝජනය කරන්නේ අසවල් තැන" කියලා. අන්න ඒකත් එක්ක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ ජනතාවගේ සංස්කෘතික ජීවිතය විනාශ වෙන්නේ; විනාශ මුඛයට ඇදලා දැම්මේ. සතුට තිබෙන්නේ එතැනයි. මේක තේරුම් ගත්තා කොළඹ ජනතාව. කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ ඉන්න ඒ සියලු ජනතාව මේක තේරුම් ගත්ත තත්ත්වයක් මේ තිබෙන්නේ. ඒ තේරුම් ගත්ත තත්ත්වය ඇතුළේ තමයි, පළාත් පාලන මැතිවරණයේ ස්වභාවය මෙහෙම වෙද්දිත්, අපිට; ජාතික ජන බලවේගයට සභික ධුර 48ක් දුන්නේ. ඒ 48ට එරෙහිව දැඟලුවේ කවුද? සභික ධුර 29ක් ලැබුණු අය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, 48ද ලොකු, 29ද කියලා.

ඒක 48 නම්, 48ට සීමා වුණේ ඇයි? මම මේ, කොළඹ මහ නගර සභාවම උදාහරණයට ගන්නේ මේක ගැන සාකච්ඡා වෙච්ච නිසා. ඇයි එහෙනම් අපි සභික ධුර 48ට සීමා වුණේ? අපිට ගන්න තිබුණා නේ, හැට ගණනක්. ඒක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඡන්දයේ ස්වභාවය; පළාත් පාලන මැතිවරණයක තිබෙන ස්වභාවය. ඒකත් ඒ ජීවත් වෙන මිනිස්සුන්ගේ සංස්කෘතිය අනුව සිදුවන දෙයක්. තමන්ගේ අල්ලපු වත්තේ ඉන්න කෙනා ඡන්දය ඉල්ලනවා. එතකොට සමහර වෙලාවට ඒගොල්ලන්ගේ දේශපාලන පක්ෂය අදාළ කරගන්නේ නැහැ. සමහර විට අදාළ කරගන්නේ නැහැ ඔහු ස්වාධීන වීම. ස්වාධීන වුණත් ඒකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පළාත් පාලන මැතිවරණයේදී ගොඩක් තැන්වල ඡන්ද ටික බෙදා ගන්න ඇයි මෙච්චර ස්වාධීන කණ්ඩායම් බිහි වුණේ? ඇයි ස්වාධීනව ඡන්දය ඉල්ලුවේ? දැන් ඔය එකට එකතු වෙන්න හදපු පක්ෂ එකතු වෙලා ඒවායින් ඡන්දය ඉල්ලුවා නම් ඡන්ද හම්බ වෙන්නේ නැහැ. හැබැයි අපේ රටේ ජනතාවගේ සංස්කෘතිය ඇතුළේ තිබෙනවා, එහෙම නොවෙයි නෑදෑකමට සලකන්න ඕනෑය කියන අදහස. අපේ රටේ ජනතාවගේ ඒ සංස්කෘතිය ඇතුළේ අදහසක් තිබෙනවා, "අල්ලපු වත්තේ කෙනාට සලකන්න ඕනෑ, එයා ඉල්ලන්නේ මොන පක්ෂයෙන් වුණත් කමක් නැහැ, එයාට ඡන්දය දෙන්න ඕනෑ" කියලා. මොකද, මේක පළාත් පාලන මැතිවරණයක්. මේක රටේ ජාතික දේශපාලනය තීරණය කරන එකක් නොවෙයි. ඒ නිසා අපි කොච්චර කිව්වත්, ඔය බෙදුණු මිනිස්සු මාලිමාවට විරුද්ධව බෙදුණා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මාලිමාවට විරුද්ධව බෙදුණා නොවෙයි.

ඒ නිසා අර රහස් ඡන්දයට මුහුණ දෙන අපේක්ෂකයා දන්නවා, තමන්ට ඡන්දය දුන්නු ඡන්ද දායකයාගේ හෘදය සාක්ෂිය මොකක්ද කියලා. රහස් ඡන්දය ඇතුළේ තිබෙන වටිනාකම ඕකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ඡන්ද දායකයාගේ හෘදය සාක්ෂිය සමහර වෙලාවට නියෝජනය කරන්න බැහැ, විවෘත ඡන්දයකදී. මේක තමයි විවෘත ඡන්දයයි, රහස් ඡන්දයයි අතර තිබෙන වෙනස; වෙන මුකුත් නොවෙයි. ඇත්තම කියනවා නම් රහස් ඡන්දය ඇතුළේ තිබෙන්නේ ඡන්දය දීපු ජනතාවගේ හෘදය සාක්ෂිය. ඒ ඡන්දය දුන් ජනතාවගේ ඇත්ත හෘදය සාක්ෂිය නියෝජනය කරන්න පුළුවන් රහස් ඡන්දයකදී විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නැතිව මේක වෙන සෙල්ලමක් නොවෙයි. වෙන ගේම් එකක් නොවෙයි, මේක ඇතුළේ තිබෙන්නේ. ඇත්තටම ඡන්දය දුන් ඡන්ද දායකයාගේ හෘදය සාක්ෂිය නියෝජනය වෙන්නේ ඡන්දය දිනපු ඒ නියෝජිතයන්ගේ රහස් ඡන්දය හරහායි. මෙය තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා අපට ඇත්තටම කාර්යභාරයක් තිබෙනවා. දැන් බොහෝ දේවල් සම්පූර්ණ වෙලා තිබෙන්නේ. ජනතාව අපට ජාතික මට්ටමෙනුත්, ප්‍රාදේශීය මට්ටමෙනුත් රට භාර දීලා තිබෙනවා, ඒ වෙනුවෙන් අපි වැඩ කරමු. ඒ සඳහා සියලුදෙනා එකතු වෙන්න කියන ආරාධනාව මම කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Then, the Adjournment Motion on a matter of urgent public importance, to be moved by Hon. - *[Interruption.]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Deputy Speaker.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
No, you cannot move it.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Why not? It is perfectly fine. Under Standing Order No. 19, it was brought up by the Leader of the Opposition and the Chief Opposition Whip and 20 of us stood up in agreement. I am one of them. So, why can I not do it?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I rise to a point of Order.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
No, there is no point of Order in that. You should not deny me that opportunity.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chief Opposition Whip, I have the list of speakers for the Opposition. The Hon. Ajith P. Perera is listed as the first speaker for today.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
The others cannot move that Motion.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
No, the Hon. Leader of the Opposition is here. He can always do it. - *[Interruption.]*

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
No, no. - *[Interruption.]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Why not?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Can I explain that? - *[Interruption.]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Standing Order No. 19 does not say that it has to be moved by a particular Member. The Hon. Deputy Speaker mentioned my name. Why are you fighting shy to face this? - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Vijitha Herath.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ නමින්. ඉතින්, එතුමාම තමයි එය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒක තමයි රීතිය. වෙනත් මන්ත්‍රීවරයකුට ඒක ඉදිරිපත් කරන්න බැහැ. රීති උල්ලංඝනය,- *[බාධා කිරීමක්]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු විපක්ෂ නායකතුමාට, -

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
නැහැ, එහෙම ක්‍රමයක් නැහැ. කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ යුතු මන්ත්‍රීවරයා මේ ගරු සභාවේ නැත්නම්, කල් තැබීමේ යෝජනාවක් නැහැ. මේක අලුතින් උගන්වන්න දෙයක් නොවෙයි; මේක හරි සරල දෙයක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 19ට පසුව 20 කියලා එකක් තිබෙනවා. පළමුවෙනි කාරණය මේකයි. මෙම කල් තැබීමේ යෝජනාවට අදාළ මාතෘකාවට විශාල ජාතික වැදගත්කමක් තිබෙනවා කියලා විපක්ෂය මේ පාර්ලිමේන්තුවේ දිගින් දිගටම කිව්වා. මෙය වැදගත් කාරණයක් වන නිසාම අපි උදේ ආණ්ඩු පක්ෂය විධියට මේ යෝජනාවට කැමැත්ත දුන්නා. ඒ, මෙම කාරණය ගැන ඊයේ විවාද කර තිබියදීයි. මේ අවස්ථාවේ ඒ අදාළ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ නැහැ. ඔබතුමා දන්නවා, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවලදී අදාළ මන්ත්‍රීතුමා නැතිව කවදාවත් ඒ Motion එක ගන්න බැහැ කියලා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එහෙම ගන්න ක්‍රමයක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, එහෙම ක්‍රමයක් නැහැ. ස්ථාවර නියෝග 20 බලන්න. ඒ අනුව හරිම පැහැදිලියි, අදාළ මන්ත්‍රීවරයා නැතිව එය ඉදිරිපත් කරන්න බැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, this Adjournment Motion had been submitted by the Hon. Ajith P. Perera. Since he is not in the House - *[Interruption.]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Please, hear me out, Sir.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
But, that has been the practice. - *[Interruption]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
No, I was reading out Standing Order No. 19.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
You all always go by the Standing Orders.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Do not waste time. If you want to carry on with the debate - *[Interruption.]*

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
No, Standing Order No. 19 (1) does not refer to a particular person; it speaks in general. - *[Interruption.]* Standing Order No. 19 (2) (a) is very clear. එහි මෙසේ සඳහන් වනවා:

> "එවැනි ඕනෑම යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කර ඇති දිනයේ රැස්වීම් පටන් ගැනීමට පෙර ඒ යෝජනාව පිළිබඳව කථානායකවරයාට ලිඛිතව දැනුම් දී, කථානායකවරයාගේ එකඟත්වය ලබා ඇත්නම්; සහ"

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He had given the Motion in writing and signed it.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Do not waste time, please.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Deputy Speaker, I rise to a point of Order, please.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එනකල් ද ? - *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, would you be kind enough to - [*Interruption.]* Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, I will give you a minute, Hon. (Dr.) Harsha de Silva.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එනකල් ඉන්නවා නම්, ඒක වෙනම දෙයක්. *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
With due respect to you, Sir, would you be kind enough to tell us exactly by which Standing Order you are not allowing the Leader of the Opposition to present this Motion? - *[Interruption.]*

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
There is no such particular Standing Order.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයට කියලා අමුතු නීතියක් නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - [Interruption.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Deputy Speaker, - [Interruption.]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, it is the convention that the Hon. Member who had submitted the Adjournment Motion has to be here to move it. - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please settle down? - [*Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න. - *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Can only one Hon. Member speak?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, Order, please! - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. - *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, can you give me the mike, please? - *[Interruption.]* Sir, I rise to a point of Order!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, now, this is going out of order. - *[Interruption.]* There is no point of Order.

According to the convention, I am compelled to adjourn the House now.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
No, no! Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, there is a point of Order being raised. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members of both sides of the House, I hereby adjourn the House until 9.30 a.m. on Thursday, 19th June, 2025.- *[Interruption.]*

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.36ට, 2025 ජූනි 19 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 3.36 மணிக்கு பாராளுமன்றம், 2025 யூன் 19, வியாழக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 3.36 p.m. until 9.30 a.m. on Thursday, 19th June, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.